Australian Government
Department of Social Services

# ඕස්ට්‍රේලියාවෙහි ජීවිතයක් ආරම්භ කිරීම
# (Beginning a Life in Australia)

## ඕස්ට්‍රේලියාවට සාදරයෙන් පිළිගනිමු

DSS1690.12.15



Sinhalese edition

සංස්කරණ දිනය: 2016

**වගකීමෙන් නිදහස් වීම:** Department of Social Services සහ එහි සහදායකයන් මෙම පොත් පිංචෙහි අඩංගු කරුණු, එය ප්‍රකාශයට පත් කරන අවස්ථාව වන විට නිවැරදි බවට සහතික කිරීමට උත්සාහ ගත්තද, නිරන්තරයෙන් වෙනස් වීමට ලක්විය හැකි කරුණු ගණනාවක් මෙම පොත් පිංචෙහි අඩංගු වේ. මෙම පොත් පිංචෙහි අඩංගු කරුණු මත යැපීම හේතුවෙන් කවරෙකුට හෝ අලාභයක් හෝ පාඩුවක් සිදු වුවහොත් ඊට හේතු විය හැකි ප්‍රමාද දෝෂයක් හෝ එවැනි වෙනත් කාරණයක් සම්බන්ධ වගකීම දෙපාර්තමේන්තුව හෝ එහි සම්පත් දායකයින් විසින් භාරගනු නොලැබේ.

බාහිර වෙබ් අඩවි පිළිබඳව නිර්දේශයන් මෙහි ඇතුළත් කරන්නේ පාඨකයාගේ පහසුව සඳහා පමණි. ඒ හැරුණු කොට එම වෙබ් අඩවිවල අඩංගු කරුණු තහවුරු කිරීමේ අදහසින් හෝ ඊට සම්බන්ධ ආයතනයක්, භාණ්ඩයක් හෝ සේවාවක් හුවා දැක්වීමේ අරමුණින් නොවේ. මෙම පොත් පිංචෙහි නිර්දේශිත බාහිර වෙබ් අඩවිවල අන්තර්ගත කරුණුවල නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය හෝ වළංගුභාවය පිළිබඳ කිසිදු වගකීමක් Department of Social Services විසින් දරනු නොලැබේ.

ISBN 978-1-925318-13-5

Copyright notice

This document, *Beginning a Life in Australia*, is licensed under the Creative Commons Attribution 4.0 International Licence

Licence URL: creativecommons.org/licenses/by/4.0/legalcode

Please attribute: © Commonwealth of Australia (Department of Social Services) 2016

Notice:

1. If you create a derivative of this document, the Department of Social Services requests that the following notice be placed on your derivative: Based on Commonwealth of Australia (Department of Social Services) data.
2. Inquiries regarding this licence or any other use of this document are welcome. Please contact: Branch Manager, Communication and Media Branch, Department of Social Services. Phone: 1300 653 227. Email: communications@dss.gov.au

Notice identifying other material or rights in this publication:

1. Australian Commonwealth Coat of Arms — not Licensed under Creative Commons, see www.itsanhonour.gov.au/coat-arms/index.cfm
2. Certain images and photographs (as marked) — not licensed under Creative Commons

# පෙරවදන

*ඕස්ට්‍රේලියාවෙහි ජීවිතයක් ආරම්භ කිරීම* (BaLIA) පොත් පිංච Department of Social Services (DSS) හි සම්පාදනයක් වන අතර එය ජාලගත ප්‍රකාශනයක් ලෙස www.dss.gov.au/our-responsibilities/settlement-services/beginning-a-life-in-australia හි පළ කෙරේ.

ඔබ මෙම පොත්පිංච කියවිය යුත්තේ පරිගණකයක හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක ආධාරයෙනි. මන්ද, බොහෝ වෙබ් අඩවි සඳහා වන ඇඳුම් එහි අඩංගු වන හෙයිනි. ඔබ නිල්පාටින් යටිඉරි කර ඇති පාඨයක් මත ක්ලික් කළහොත්, එය අදාළ වෙබ් අඩවියට හෝ ඈඳුමට ඔබව ගෙන යනු ඇත. ඔබ BaLIAහි මුද්‍රිත පිටපතක් පරිහරණය කරන්නේ නම් එහි සම්පූර්ණ වෙබ් ලිපිනයම සපයා ඇත.

ඔබට භාෂණ පරිවර්තකයකු අවශ්‍ය වන්නේ නම්, 131 450 ඔස්සේ භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවාව (TIS National) අමතන්න. වැඩි විස්තර සඳහා 3 වන පරිච්ඡේදය, *ඉංග්‍රීසි භාෂාව* බලන්න. BaLIAහි පරිවර්තන www.dss.gov.au/our-responsibilities/settlement-services/beginning-a-life-in-australia වෙබ් අඩවියෙහි අන්තර්ගත වේ.

පොත් පිංච පහත සඳහන් මාතෘකාවලට අදාළව තොරතුරු සපයනු ඇත:


1. පැමිණි වහාම කළයුත්තේ මොනවාද?
2. උපකාර ලබාගන්න
3. ඉංග්‍රීසි භාෂාව
4. අධ්‍යාපනය සහ පුහුණුව
5. රැකියාව
6. ඕස්ට්‍රේලියානු නීතිය
7. නිවාස
8. ප්‍රවාහනය
9. සෞඛ්‍යය සහ යහපැවැත්ම
10. ඔබේ පවුල
11. මුදල්
12. ප්‍රජා සහභාගීත්වය


*ඕස්ට්‍රේලියාවේ ජීවිතය* පොත් පිංච පිළිබඳව අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා http://www.dss.gov.au/contact/feedback-compliments-complaints-and-enquiries හි ඇති ජාලගත ප්‍රතිපෝෂණ ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

# පටුන/අන්තර්ගතය


පෙරවදන ..... 3

පටුන/අන්තර්ගතය ..... 4

හැඳින්වීම ..... 12

1 පැමිණි වහාම කළ යුත්තේ මොනවාද? ..... 13

මෙම කොටස තුළදී ..... 13

ඔබ දැනගත යුතු දෑ ..... 13

ඕස්ට්‍රේලියාවේ රජය ..... 13

දුරකථන - ඇමතුමක් ලබා ගැනීම ..... 13

දුරකථන නාමාවලී ..... 14

කාල/වේලා කලාප ..... 14

ස්වයං-සේවා ..... 15

බදු ලිපිගොනු අංකයක් සඳහා අයදුම් කිරීම ..... 15

බදු ලිපිගොනු අංකයක් සඳහා ඉල්ලුම් කිරීම ..... 15

Medicare සමගින් ලියාපදිංචි වන්න ..... 16

Medicare සමගින් ලියාපදිංචි වන්නේ කෙසේද? ..... 16

Centrelink අමතන්න ..... 16

Health Undertaking Service හා සම්බන්ධ වන්න ..... 18

ඉංග්‍රීසි භාෂා පන්ති සඳහා ලියාපදිංචි වන්න ..... 18

ඔබේ දරුවා/දරුවන් පාසලකට ඇතුළත් කරන්න ..... 18

රියදුරු බලපත්‍රයක් සඳහා අයදුම් කරන්න ..... 18

බැංකු ගිණුමක් විවෘත කිරීම ..... 19

පවුලේ වෛද්‍යවරයකු තෝරා ගන්න ..... 20

මූලික සබැඳියන් ..... 20

කළයුතු දෑ පිළිබඳ පිරික්සුම් ලැයිස්තුව ..... 20

2 උපකාර ලබා ගන්න ..... 21

මෙම කොටසෙහිදී ..... 21

හදිසි සේවා ..... 21

පොලීසිය ..... 21

ගිලන්රථ ..... 22

ගිනි නිවන හමුදාව ..... 23

ස්වාභාවික විපත් ..... 23

වෙනත් හදිසි සේවා අංක ..... 24

ත්‍රස්තවාදී තර්ජන ... 25
පදිංචිය සඳහා උපකාර ... 25
මානුෂීය පදනම මත පැමිණි සංක්‍රමණිකයන් පදිංචි කිරීමේ සේවා ... 25
සංකීර්ණ කාරණා සම්බන්ධ උපකාර වැඩසටහන ... 26
පදිංචි සේවා දීමනා ... 26
භාරකරුවකු නොමැති බාල වයස්කාර ළමුන් සඳහා උපකාර ... 27
පදිංචිය/ස්ථාවර වීම පිළිබඳ DVD ... 27
ප්‍රාන්ත සහ පළාත් ස්ථාපන සහාය ... 27
ප්‍රාදේශීය රජයේ සේවාවන් ... 28
ජනවාර්ගික සහ ප්‍රජා සංවිධාන ... 29
අර්බුදයකදී උපකාර ... 29
දුරකථනය ඔස්සේ අර්බුද උපදේශන ... 30
3 ඉංග්‍රීසි භාෂාව ... 31
මෙම කොටසේදී ... 31
පරිවර්තන හෝ කථා/භාෂණ පරිවර්තන සේවා (TIS National) ... 31
කථා/භාෂණ පරිවර්තනය ... 31
TIS National සඳහා සේවය කිරීම ... 31
ඔබේ වැදගත් ලියකියවිලි පරිවර්තනය කර ගැනීම ... 31
'මට භාෂණ පරිවර්තකයකු අවශ්‍යය' කාඩ්පත් ... 32
භාෂණ පරිවර්තක සංකේතය/ලකුණ ... 32
ඉංග්‍රීසි භාෂා ඉගෙනුම ... 32
Adult Migrant English Program (AMEP) ... 32
Skills for Education and Employment (SEE) ... 34
4 අධ්‍යාපනය සහ පුහුණුව ... 35
මෙම කොටසේදී ... 35
ළමා සුරැකුම් ... 35
AMEP ළමා සුරැකුම ... 36
ළමා සුරැකුම් සේවාවේ වැඩ කිරීම ... 36
කෙළිහවුල් ... 37
පාසැල් සහ පෙර පාසැල් ... 37
ලියාපදිංචිය ... 38
ඉංග්‍රීසි භාෂාව කථා නොකරන පාසැල් ළමුන් ... 38
පාසැලේදී කථා පරිවර්තකයන් ... 38

තෘතීයික අධ්‍යාපනය සහ පුහුණුව ........ 38
National Training Complaints Hotline ........ 40
විශ්වවිද්‍යාල ........ 40
අන්තර්ජාතික ශිෂ්‍ය උපකාර ........ 41
අධ්‍යාපන සහ පුහුණු අවශ්‍යතා සඳහා සුදුසුකම් පිළිගැනීම ........ 41
ශිෂ්‍ය උපකාර ගෙවීම් ........ 41
ශිෂ්‍ය සහන ගාස්තු කාඩ්පත ........ 42
කෙටිකාලීන ප්‍රජා පාඨමාලා ........ 42
5 රැකියාව ........ 43
මෙම කොටසේදී ........ 43
රැකියාවක් සොයා ගැනීම ........ 43
Centrelink ........ 43
jobactive ........ 44
සුදුසුකම් සහ නිපුණතා පිළිගැනීම ........ 45
පූර්වකාලීන ඉගෙනුම් පිළිගැනීම ........ 45
නිපුණතා ඇගයුම් අධිකාරීන් ........ 46
Trades Recognition Australia - නිපුණතා පිළිගැනීම ........ 46
තෘතීයික සුදුසුකම් පිළිගැනීම ........ 47
වැඩබිමෙහි අයිතිවාසිකම් සහ ආරක්ෂාව ........ 47
අවම වැටුප ........ 48
රැකියාවේ කොන්දේසි ........ 48
නියෝජනයට ඇති අයිතිය ........ 48
වෙනස්කම් සැලකීමට එරෙහි රැකවරණය ........ 48
වෙනත් වැඩපළ අයිතිවාසිකම් ........ 49
වැඩි විස්තර ........ 49
සේවාස්ථානයේ සෞඛ්‍ය සහ නිරාපදාව ........ 49
විශ්‍රාම පාරිතෝෂික ........ 50
6 ඔස්ට්‍රේලියානු නීතිය ........ 51
මෙම කොටසේදී ........ 51
සාපරාධී වැරදි ........ 51
ප්‍රචණ්ඩත්වය ........ 51
ගෘහස්ථ සහ පවුල් ප්‍රචණ්ඩත්වය සහ ලිංගික අඩන්තේට්ටම් ........ 52
නීත්‍යානුකූලව ලිංගික සේවනය සඳහා කැමති වියහැකි වයස ........ 54

ළමා අයිතිවාසිකම් ....................................................................................................... 54
ළමාරක්ෂාව ............................................................................................................... 55
බලහත්කාර විවාහය ....................................................................................................... 55
වනිතා ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම් ....................................................................... 56
ගිනි අවි සහ කිනිසි ....................................................................................................... 59
සතුන් සහ වනසතුන් ..................................................................................................... 59
දුම්බීම, මත්පැන් පානය සහ මත්ද්‍රව්‍ය ................................................................................ 60
පැල සහ සතුන් ආනයනය පිළිබඳ සීමා ............................................................................. 61
වෙනත් නීති ................................................................................................................ 61
අසල්වැසියන් සමග ආරවුල් ............................................................................................ 61
නීතිමය ආධාර ............................................................................................................. 62
7 නිවාස ..................................................................................................................... 64
මෙම කොටසේදී ............................................................................................................ 64
කෙටිකාලීන වාසස්ථාන .................................................................................................. 64
පුද්ගලික නිවාසයක් හෝ තට්ටු නිවාසයක් කුලියට ගැනීම ..................................................... 64
නිවාස සම්බන්ධ උපකාර ............................................................................................... 65
මහජන නිවාස ............................................................................................................. 65
නිවාසස්ථාන නැති පුද්ගලයන් සඳහා උපකාර ..................................................................... 66
කුලී නිවැසියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ..................................................................... 67
නිවසක් හෝ තට්ටු නිවසක් මිලදී ගැනීම ............................................................................ 68
අත්‍යවශ්‍ය ගෘහස්ථ සේවා ............................................................................................... 68
විදුලිය සහ ගෑස් ............................................................................................................ 69
Centrepay ................................................................................................................. 69
දුරකථන සහ අන්තර්ජාලය ............................................................................................. 69
ගෘහස්ථ කසළ එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය ................................................................... 70
තැපැල ...................................................................................................................... 70
8 ප්‍රවාහනය ................................................................................................................. 72
මෙම කොටසේදී ............................................................................................................ 72
පොදු ප්‍රවාහන සේවා .................................................................................................... 72
කුලීරථ සේවා .............................................................................................................. 72
පාපැදි ....................................................................................................................... 73
ඇවිදීම ...................................................................................................................... 73
පුද්ගලික වාහන ........................................................................................................... 73

රියදුරු බලපත්‍ර ....................................................................................73
රියදුරන්ට බලපාන නීති ...............................................................................74
ආසන පටි සහ ළමාරක්ෂක පටි .........................................................................74
මෝටර් රථයක් මිලදී ගැනීම.............................................................................75
9 සෞඛ්‍ය සහ යහපැවැත්ම ..............................................................................77
මෙම කොටසේදී.............................................................................................77
හැඳින්වීම....................................................................................................77
Medicare....................................................................................................77
Health Care Card........................................................................................78
පෞද්ගලික සෞඛ්‍ය රක්ෂණ ..............................................................................78
දිරි දීමනා....................................................................................................79
වෛද්‍ය සහාය ................................................................................................80
පවුලේ වෛද්‍යවරයකු සොයා ගැනීම ...................................................................80
දිගුකාලීන සෞඛ්‍ය තත්වයන් ............................................................................80
ක්ෂය රෝගය ................................................................................................80
විශේෂඥ වෛද්‍යවරු........................................................................................80
වෛද්‍යවරුන්ගේ භාෂණ පරිවර්තන ප්‍රමුඛතා සේවාව ...............................................80
හදිසි වෛද්‍ය තත්වයන්....................................................................................81
දුරකථනමාර්ගික සෞඛ්‍ය තොරතුරු සහ උපදෙස් සේවාව ..........................................81
ගිලන්රථ ගාස්තු.............................................................................................81
ඖෂධ..........................................................................................................81
ප්‍රාන්ත සහ පළාත් සෞඛ්‍ය සේවා ........................................................................82
ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන ...................................................................................82
කුඩා දරුවන් සහිත පවුල් සඳහා සෞඛ්‍ය සේවා......................................................82
කාන්තා සෞඛ්‍ය සේවා .....................................................................................82
විවිධ පසුබිම් සහිත පුද්ගලයන් සඳහා සේවා.........................................................82
ආබාධිත සේවා .............................................................................................83
මානසික සෞඛ්‍ය සේවා.....................................................................................84
වධ හිංසා සහ කම්පනය සඳහා උපදේශන .............................................................85
ළමා නිරාපදාව සහ අනතුරු වැළැකීම ...............................................................86
ප්‍රතිශක්තිකරණය .........................................................................................86
දන්ත වෛද්‍ය සේවා ........................................................................................86
ඕස්ට්‍රේලියාවේ වැඩිහිටි සාත්තු සේවා..................................................................87

වැඩිහිටි සත්කාර සේවා හෝ සෞඛ්‍යාරක්ෂක සේවා පිළිබඳ පැමිණිලි....87
මරණයකින් පසුව....88
10 ඔබේ පවුල ....90
මෙම කොටසේදී....90
විවාහය සහ වෙනත් සම්බන්ධතා....90
යෞවන/යෞවනියන් සඳහා සේවා....91
දෙමාපියෝ ....92
ළමා උපකාර ....93
ජ්‍යෝෂ්ඨ පුරවැසියෝ ....93
නෑදෑයින් සොයා ගැනීම....93
ඔබේ පවුල සහ Centrelink ....95
මෙම කොටසේදී....95
ඔබේ අනන්‍යතාව තහවුරු කිරීම....95
වෙනත් භාෂාවලින් උපකාර....95
වෙනත් භාෂාවලින් තොරතුරු ....95
බහුභාෂා දුරකථන සේවය ....96
භාෂණ පරිවර්තකයෝ (තෝල්කයෝ)....96
ඔබේ ලියකියවිලි පරිවර්තනය කර ගැනීම ....96
බහුසංස්කෘතික සේවා නිලධාරීන් ....96
Centrelink වෙතින් ලැබෙන ලිපි....96
Centrelink සමග ගනුදෙනු කිරීම සඳහා උපකාර ....96
Centrelink පොරොත්තු කාල ....97
Newly Arrived Resident's Waiting Period පිළිබඳ ව්‍යතිරේක....97
පදිංචිය සඳහා සුදුසුකම් ලැබීමේ අවශ්‍යතා....97
Centrelink දීමනා ඉල්ලා සිටීම/ලබා ගැනීම ....98
පවුල් සඳහා ගෙවීම් ....100
නවසීලන්ත පුරවැසියන් (ඕස්ට්‍රේලියානු පුරවැසියන් නොවන) ....101
සරණාගතයින් සහ මානුෂීය පදනම මත පැමිණියවුන් සඳහා වන Crisis Payment ....101
වෙනත් Centrelink සේවා ....101
අඩු ආදායම්ලාභීන් සඳහා සහන ගාස්තු....102
වාතාවරණය වෙනස් වීම ....102
සහකරු/සහකාරිය අර්ථ ගැන්වීම ....102
පුනරීක්ෂණ සහ අභියාචනා ....102

ඔබේ තොරතුරුවල රහස්‍යභාවය ........ 103
තරුණ/තරුණියෝ ........ 103
අනුග්‍රහය පිළිබඳ ආරක්ෂණය ........ 103
11 මුදල් ........ 104
මෙම කොටසෙහි අඩංගු දෑ ........ 104
මූල්‍ය සේවා ........ 104
මුදල් තේරුම් ගැනීම ........ 104
බැංකුකරණය ........ 104
බදු අය කිරීම ........ 105
භාණ්ඩ සහ සේවා බද්ද ........ 105
බදු ලිපිගොනු අංකය ........ 105
ඔබ රැකියාවක් ලබා ගන්නා අවස්ථාව වන විට ඔබට TFN එකක් නොතිබුණොත් කුමක් සිදු වේද? ........ 106
ආදායම් බදු ප්‍රතිලාභ ........ 106
බදු උපකාර ........ 106
විදේශ දේපළ, ආයෝජන සහ ආදායම් ........ 107
කුඩා ව්‍යාපාර ........ 107
ණය සහ ණය මුදල් ........ 109
රක්ෂණය ........ 109
මූල්‍ය උපදෙස් ලබා ගැනීම ........ 109
මූල්‍ය ප්‍රශ්න සම්බන්ධ උපකාර ........ 109
පාරිභෝගික ආරක්ෂණය ........ 110
12 ප්‍රජා සහභාගීත්වය ........ 112
මෙම කොටසෙහි අන්තර්ගතය ........ 112
ඕස්ට්‍රේලියාව ගැන ........ 112
වගකීම් සහ සාරධර්ම ........ 113
සමානාත්මතාව සහ වෙනස්කම් සැලකීමට විරුද්ධ වීම ........ 113
ස්වේච්ඡා සේවය ........ 115
පුද්ගලයන් හමු වීම ........ 116
ආචාරශීලී හැසිරීම් ........ 116
ඇඳුම්-පැළඳුම් ........ 116
ඕස්ට්‍රේලියාවේ බහුල/පොදු කියමන් ........ 117
එළිමහන් ක්‍රියාකාරකම් සහ නිරාපදාව ........ 117
පිහිනීම සහ එළිමහන් නිරාපදාව ........ 117

නිවසේදී නිරාපදාව ........ 118
නිවසේ ආරක්‍ෂාව ........ 118
ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය ........ 119
නිවසේදී ගිනි නිරාපදාව ........ 119
ලැව්ගිනි නිරාපදා සැලසුම් ........ 120
පරිසරය ........ 120
සතුන් සහ සුරතල් සතුන් ........ 121
පුවත්පත්, රූපවාහිනිය සහ ගුවන්විදුලිය ........ 122
සුදුව ........ 122
අධික ශබ්දය/ඝෝෂාව ........ 123
පළාත් පාලන සේවා ........ 123
පුස්තකාල ........ 123
කසල එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය ........ 123
පොදු වැසිකිළියක් ........ 124
වතුර භාවිතය ........ 124
වීසා ........ 124
Resident Return (නිත්‍ය පදිංචිකරුවන් නැවත පැමිණීමේ) වීසා ........ 124
ඕස්ට්‍රේලියාව නැරඹීමේ වීසා ........ 125
නිත්‍ය පදිංචිය සඳහා සංක්‍රමණය වීමට වීසා ........ 125
ලියාපදිංචි සංක්‍රමණ නිලධාරීන් ........ 125
ජාලගතව ඔබේ වීසා තත්වය පරීක්‍ෂා කිරීම ........ 125
ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ........ 125
අනාගත දරුවන් සහ ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ........ 126
ඡන්දය දීම ........ 126

# හැඳින්වීම

ඕස්ට්‍රේලියාවට ඔබව සාදරයෙන් පිළිගනිමු.

මෙම පොත්පිංච ඕස්ට්‍රේලියාවට පැමිණීමටබලාපොරොත්තු වන සහ අලුතින් පැමිණි ස්ථිර සහ තාවකාලික සියලු සංක්‍රමණිකයන් සඳහාය. අනුග්‍රාහකයන්ටද මෙම පොත්පිංච ප්‍රයෝජනවත් වනු ඇත. සරණාගතයන් සහ මානවවාදී පදනම මත පැමිණි අය Department of Immigration and Border Protection (DIBP) සහ Department of Social Services (DSS) මගින් ඔවුන් සඳහාම සපයා ඇති තොරතුරු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

රජය සහ ප්‍රජා සංවිධාන ඕස්ට්‍රේලියානු වැසියන් සඳහා බොහෝ සේවා සපයයි. මෙම පොත්පිංච දැනට පවත්නා එවැනි සේවාවන් සහ ආධාර-උපකාර මෙන්ම උපදෙස් සඳහා යායුත්තේ කොහේටද/කවුරුන් ළඟටද යන්න පිළිබඳ හැඳින්වීමක් සපයයි.

සමහර නිත්‍ය සංක්‍රමණිකයන් සේම බොහොමයක් තාවකාලික වීසා හිමියන් මෙහි දක්වා ඇති සියලුම සේවාවන් සඳහා සුදුසුකම් නොලබන අතර සමහර සේවාවන් සඳහා මුදල් ගෙවීමට ඔවුනට සිදු විය හැකිය.

මෙම පොත්පිංච සැලකිල්ලෙන් කියවන්න. ඕස්ට්‍රේලියාවෙහි ජීවත්වීම ආරම්භ කරන ඔබට එය බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. ඔබ http://www.dss.gov.au/our-responsibilities/settlement-services/beginning-a-life-in-australia හි ඇති 'Settle in Australia' වෙබ් පිටුවල ඇති සංස්කරණය භාවිත කළ යුතුය.

1-2 පරිච්ඡේදයන් ඕස්ට්‍රේලියාවෙහි ඔබ ගත කරන පළමු සති කිහිපය තුළ වැදගත් වන කරුණු සාකච්ඡා කරයි. ඉංග්‍රීසි භාෂාව, අධ්‍යාපනය සහ රැකියාව වැනි සාර්ථක පදිංචි වීමක් සඳහා අවශ්‍ය කරන මූලිකාංග සම්බන්ධයෙන් ඔබට උපකාර ලබාගත හැක්කේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු 3-5 පරිච්ඡේදවලින් අනාවරණය කෙරෙයි.

ඕස්ට්‍රේලියාවේ ඔබ ආරම්භ කරන නව දිවිය තුළ මතුවිය හැකි ගැටලු ඔබේ මව්රටේදී මුහුණ පෑ ගැටලුවලට වඩා හාත්පසින්ම වෙනස් විය හැකිය. කෙසේ වුවද, ඔබට පෙර ඕස්ට්‍රේලියාවට පැමිණි මිලියන ගණනක් පුද්ගලයන් මෙන් සාර්ථකව පැලපදියම් වීමට සහ ඕස්ට්‍රේලියානු සමාජයේ අගනා සාමාජිකයකු වීම සඳහා ඔබට උපකාර වන බොහෝ සේවාවන් ඇත.

# 1 පැමිණි වහාම කළ යුත්තේ මොනවාද?

## මෙම කොටස තුළදී

ඕස්ට්‍රේලියාවට පැමිණි පසු හැකි පමණ ඉක්මණින් ඔබ විසින් කළ යුතු වැදගත් කරුණු කිහිපයක් මෙම පරිච්ඡේදයෙහි දැක්වේ. මේ සියල්ලම ඔබට අදාළ විය නොහැකිය, එසේ වුවත් ඔබ ඒවා පිළිබඳ සලකා බැලීම වැදගත්ය.

- ඔබ දැනගත යුතු දෑ
- බදු ලිපිගොනු අංකයක් සඳහා අයදුම් කිරීම
- Medicare සමගින් ලියාපදිංචි වන්න
- Centrelink අමතන්න
- Health Undertaking Service හා සම්බන්ධ වන්න
- ඉංග්‍රීසි භාෂා පන්ති සඳහා ලියාපදිංචි වන්න
- ඔබේ දරුවා/දරුවන් පාසලකට ඇතුළත් කරන්න
- රියදුරු බලපත්‍රයක් සඳහා අයදුම් කරන්න
- බැංකු ගිණුමක් විවෘත කරන්න
- පවුලේ වෛද්‍යවරයකු තෝරා ගන්න
- ප්‍රධාන ඇඳුම්
- කළයුතු දෑ පිළිබඳ පිරික්සුම් ලැයිස්තුව

ඔබේ ලියකියවිලි පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය නම් හෝ භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම් 3 පරිච්ඡේදයේ, ඉංග්‍රීසි භාෂාව කොටස කියවන්න.

## ඔබ දැනගත යුතු දෑ

### ඕස්ට්‍රේලියාවේ රජය

ඕස්ට්‍රේලියානු රජය ස්තර තුනකින් සමන්විත වේ - පොදුරාජ්‍ය මණ්ඩලීය (හෝ ෆෙඩරල්), ප්‍රාන්ත හෝ පළාත් සහ ප්‍රාදේශීය වශයෙනි. මේ ආණ්ඩු තුනම සංක්‍රමණිකයන්ට සහ පුරවැසියන්ට සේවා සපයයි.

නිව් සවුත් වේල්ස් (New South Wales (NSW)), ක්වීන්ස්ලන්තය (Queensland (Qld)), දකුණු ඕස්ට්‍රේලියාව (South Australia (SA)), තස්මේනියාව (Tasmania (Tas.)), වික්ටෝරියාව (Victoria (Vic.)), බටහිර ඕස්ට්‍රේලියාව (Western Australia (WA)) සහ උතුරු පළාත (Northern Territory (NT)) යන ප්‍රාන්ත තවදුරටත් ප්‍රාදේශීය ආණ්ඩු විශාල ප්‍රමාණයකට බෙදී ඇති අතර ඒවා පාලනය කරනු ලබන්නේ පළාත් පාලන අයතන මගිනි. කැන්බරාවල, ඕස්ට්‍රේලියානු කැපිටල් ටෙරිටරි (Australian Capital Territory (ACT)) ආණ්ඩුව පළාත් පාලන සේවා මෙන්ම සාමාන්‍යයෙන් ප්‍රාන්ත රජයන් විසින් සපයනු ලබන බොහෝ සේවාවන් සපයයි.

ඕස්ට්‍රේලියානු රජය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ වැඩි විස්තර සඳහා http://www.australia.gov.au/about-government වෙබ් අඩවිය බලන්න.

### දුරකථන - ඇමතුමක් ලබා ගැනීම

ඕස්ට්‍රේලියාව තුළදී, ස්ථාවර දුරකථන (බිම් දුරකථන,) ගෙවන දුරකථන කුටි හෝ ජංගම දුරකථන ඔස්සේ දුරකථන ඇමතුම් ලබාගත හැකිය. දුරකථන අංකයන් පහත දැක්වෙන ආකාරයෙන් ආරම්භ විය හැකිය:

- 13/1300 (ප්‍රාදේශීය ඇමතුම් ගාස්තු)
- 1800 (ගාස්තු රහිත ඇමතුම්)
- 04 (ජංගම දුරකථන) නැත්නම්
- 02, 03, 07, 08 (ප්‍රාදේශීය හෝ භූගෝලීය කළාප සංකේතය).

සමාන ප්‍රාදේශීය අංකය සහිත දුරකථන අංකයකට ඇමතුමක් ලබා ගැනීමේදී ප්‍රාදේශීය කේතය සටහන් කිරීම අවශ්‍ය නොවේ. එක් ජංගම දුරකථනයකින් තවත් ජංගම දුරකථනයකට ඇමතුමක් ලබා ගැනීමේදීද ප්‍රාදේශීය කේතය භාවිත කිරීමක් අවශ්‍ය නොවේ.

දුරකථන ඇමතුමක් සඳහා වැයවන ගාස්තුව ඔබ ඇමතුම ලබා ගන්නා දුරකථන වර්ගය, ඔබට දුරකථන සේවාව සපයන ආයතනය සහ ඔබ මිලදීගෙන ඇති දුරකථන සැලසුම යන කරුණු මත පදනම්ව වෙනස් වේ. දුරකථන ඇමතුම් ගාස්තු පිළිබඳව ඔබට සැකයක් ඇත්නම් ඒ පිළිබඳව ඔබේ දුරකථන සැපයුම් ආයතනයෙන් විමසා සිටින්න.

13/1300 හෝ 1800 අංක සහිත ඕස්ට්‍රේලියානු දුරකථන සඳහා වන ඇමතුම් ගාස්තු පිළිබඳ වැඩි විස්තර සඳහා www.acma.gov.au/Citizen/Consumer-info/All-about-numbers/Special-numbers/charges-for-calls-to-13-1300-and-1800-numbers-i-acma වෙබ් පිටුව පරීක්ෂා කරන්න.

13, 1300 හෝ 1800 අංකවලින් ආරම්භ නොවන දුරකථන අංකයකට ඇමතුමක් ලබා ගැනීම සඳහා:

- ඔබ ඇමතුම ලබා ගන්නේ ඕස්ට්‍රේලියාව තුළ සිට නම්, පළමුව ප්‍රාදේශීය කේතය ඇතුළත් කර ඊළඟට අංකය යොදන්න. උදාහරණයක් වශයෙන්, මෙල්බර්න් සිට සිඩ්නිවලට ඇමතුමක් ලබා ගැනීම සඳහා පළමුව ප්‍රාදේශීය කේතය 02ද අනතුරුව අංකයද ඩයල් කළ යුතුය.
- ඕස්ට්‍රේලියාවෙන් පිටතදී ඇමතුමක් ලබා ගන්නේ නම්:
    - බිම් දුරකථනයක් භාවිත කරන්නේ නම්, ඔබ ඇමතුම ලබා ගන්නා රට සඳහා වන අන්තර්ජාතික ඩයල කේතය ඇතුළත් කර, ඊළඟට ඕස්ට්‍රේලියාවට අදාළ කේතය වන 61 සහ 0 රහිත ප්‍රාදේශීය කේතය යොදා අනතුරුව අංකය ඩයල් කරන්න.
    - ජංගම දුරකථනයක් භාවිත කරන්නේ නම්, +61 මුලට යොදා 0 රහිත ප්‍රාදේශීය කේතය සහ අංකය ඩයල් කරන්න.
    - ඕස්ට්‍රේලියානු ජංගම දුරකථන අංක සඳහා, ඔබේ ප්‍රාදේශීය සේවා සැපයුම්කරු අමතා අන්තර්ජාතික ඩයල කේතයක් අවශ්‍යද යන්න තහවුරු කරගන්න. අනතුරුව +61 මුලට යොදා 0 රහිත ප්‍රාදේශීය කේතය සහ අංකය ඩයල් කරන්න.

ඔබට ඕස්ට්‍රේලියාවේ සිට අන්තර්ජාතික අංකයකට ඇමතුමක් ලබා ගැනීමට අවශ්‍ය නම්, ඕස්ට්‍රේලියාවේ අන්තර්ජාතික ඩයල කේතය වන 0011 භාවිත කරන්න.

### දුරකථන නාමාවලී

ඕස්ට්‍රේලියානු දුරකථන නාමාවලී දෙකක් ඇත. Yellow Pages සාප්පු සහ වෙළඳ වෘත්තිකයන් වැනි ව්‍යාපාරික දුරකථන අංක, සේවාවෙහි හෝ භාණ්ඩයේ ප්‍රවර්ගය අනුව, ලැයිස්තුගත කරයි. White Pages ව්‍යාපාර සහ නිවැසියන් නම් පිළිවෙළින් ලැයිස්තුගත කරයි. ප්‍රාදේශීය, ප්‍රාන්ත හෝ පළාත් සහ ඕස්ට්‍රේලියානු රාජ්‍ය ආයතනවල සම්බන්ධතා විස්තර ඇතුළත් රාජ්‍ය ආයතන සඳහා වෙන්කළ කොටසක්ද White Pagesහි ඇත. මෙම පොත් පිංච පුරාවට ඒවා වෙත යොමු කිරීම සිදු කෙරේ.

මෙම නාමාවලී, ගාස්තු විරහිතව ලබාදෙන අතර සෑම වසරකම ඔබේ නිවසටම ගෙනවිත් භාර දේ. තැපැල් කාර්යාල සහ පුස්තකාලවලදීද ඒවා පරිහරණය කළ හැකිය. අන්තර්ජාලය ඔස්සේ Yellow Pages පරිහරණය සඳහා www.yellowpages.com.au වෙබ් අඩවියටද White Pages සඳහා http://www.whitepages.com.au වෙබ් අඩවියටද පිවිසෙන්න. නොඑසේ නම් දුරකථන නාමාවලී සහාය සඳහා 1223 අමතන්න (ගාස්තු විරහිත සේවාවකි.)

### කාල/වේලා කලාප

පෙරදිග ඕස්ට්‍රේලියානු සම්මත වේලාව (Australian Eastern Standard Time (AEST හෝ EST)), මධ්‍යම ඕස්ට්‍රේලියානු සම්මත වේලාව (Australian Central Standard Time (ACST)) සහ බටහිර ඕස්ට්‍රේලියානු සම්මත වේලාව (Australian Western Standard Time (AWST)) යනුවෙන් ඕස්ට්‍රේලියාවෙහි වේලා කලාප තුනක් පවතී.

දිවා ආලෝක සුරැකීමේ වේලාව සමහර ප්‍රාන්තවල ඔක්තෝබර් සිට අප්‍රේල් දක්වා ක්‍රියාත්මක කෙරේ. විස්තර සඳහා http://www.australia.gov.au/about-australia/facts-and-figures/time-zones-and-daylight-saving යන වෙබ් පිටුවට යන්න.

### ස්වයං-සේවා

බොහෝ ආයතනවලට විකල්ප ක්‍රම ඇති බැවින් ගැටලු නිරාකරණයට හෝ සේවා සඳහා ලියාපදිංචි වීමට ඔබට ඔවුන්ගේ කාර්යාලයට යාමට අවශ්‍ය වන්නේ නැත. ස්වයං-සේවා විකල්පයන්ට ඇතුළත් වන්නේ දුරකථන මාර්ග සහ ජාලගත (ඔන්ලයින්) ගිණුම්ය.

ඔබට ඔබේ Centrelink, Medicare සහ Child Support වලට අදාළ කටයුතු පහත සඳහන් වෙබ් අඩවි ඔස්සේ ස්වයං-සේවා භාවිතයෙන් සිදු කළ හැකිය:

- http://www.my.gov.au හි myGov
- www.humanservices.gov.au/expressplus හි Express Plus ඇති ජංගම දුරකථන යෙදවුම (ඇප්ස්)
- ස්වයං-සේවා සඳහා 136 240 අමතන්න නැත්නම්
- http://www.humanservices.gov.au/selfservice වෙබ් අඩවියට පිවිසෙන්න.

## බදු ලිපිගොනු අංකයක් සඳහා අයදුම් කිරීම

ඕස්ට්‍රේලියානු සේවකයෝ තම ආදායම අනුව රජයට බදු ගෙවති. ඕස්ට්‍රේලියාව තුළදී ආදායමක් ලැබීමට නම්, ඔබට බදු ලිපිගොනු අංකයක් (TFN) තිබීම අවශ්‍යය.

TFN (බදු ලිපිගොනු අංකයක්) යනු රජයට බදු පරිපාලනය සහ අනෙකුත් පරිපාලන වැඩසටහන් සඳහා උපකාර පිණිස පුද්ගලයන් සහ ව්‍යාපාරවලට නිකුත් කරන අනන්‍ය අංකයකි. බදු මගින් එකතු කරන මුදල් මහාමාර්ග, පාසැල් සහ රෝහල් වැනි රාජ්‍ය වැඩසටහන් සහ සේවාවලට අරමුදල් සැපයීමට භාවිත කරනු ලබයි.

ආදායම යන්නට රැකියවලින් ලැබෙන වැටුප් හෝ වේතන, රජයෙන් ලැබෙන දීමනා සහ ඉතිරි කිරීමේ ගිණුම්වලට ලැබෙන පොළියද ඇතුළත්ව ආයෝජනවලින් ලැබෙන මුදල් ඇතුළත් වේ.

### බදු ලිපිගොනු අංකයක් සඳහා ඉල්ලුම් කිරීම

ඔබ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන්නේ නම් හෝ ඕස්ට්‍රේලියාවේ රැකියාවක් කිරීමට ඉඩ ලබාදෙන තාවකාලිකව පදිංචි වීමේ වීසා ඔබට තිබේ නම් Australian Taxation Office (ATO) වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ ATO එකට දුරකථන ඇමතුමක් ලබාදීමෙන් හෝ ATO සේවා මධ්‍යස්ථානයකට යාමෙන් TFN (බදු ලිපිගොනු අංකයක්) සඳහා අයදුම් කිරීමට ඔබට පුළුවන. TFN (බදු ලිපිගොනු අංකයක්) ලබා ගැනීමට හැකි වේගවත්ම ක්‍රමය නම් http://www.ato.gov.au/tfn වෙබ් අඩවියට ගොස් ජාලගතව අයදුම් කිරීමයි. මේ සඳහා ඔබට ඔබේ විදේශ ගමන් බලපත්‍රය සහ ඕස්ට්‍රේලියානු ලිපිනයක් අවශ්‍ය වේ.

ඔබට ඉංග්‍රීසි භාෂාව හොඳින් කතා කිරීමට නොහැකි නම්, 450 131 ඔස්සේ භාෂා සහ භාෂණ පරිවර්තන සේවාව (TIS National) අමතන්න.

| Australian Taxation Office | ඇමතුම් විස්තර |
|---|---|
| දුරකථනය | 132 861 |
| කාර්යාලයකට පිවිසෙන්න | www.ato.gov.au/visitus |
| ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් විස්තර | www.ato.gov.au/General/Other-languages |
| ATO වෙබ් අඩවිය | www.ato.gov.au |

වැඩි විස්තර සඳහා 11 වන පරිච්ඡේදයේ, *මුදල්* කොටස කියවන්න.

## Medicare සමගින් ලියාපදිංචි වන්න

Medicare යනු ඕස්ට්‍රේලියානුවන්ට සහ ඕස්ට්‍රේලියාවෙහි ස්ථිර පදිංචිකරුවන්ට නොමිලයේ හෝ සහන පදනම යටතේ සෞඛ්‍ය උපකාර සේවා සපයන ඕස්ට්‍රේලියාවෙහි ජාතික සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතියයි. සමහරක් තාවකාලින සංක්‍රමණිකයන්ද Medicare සඳහා සුදුසුකම් ලබයි.

ඔබට Medicare හා සම්බන්ධ වීමට සුදුසුකම් ඇත්නම්, සෞඛ්‍ය රැකවරණ සේවා සහ වැඩසටහන්වලට සෘජුවම සම්බන්ධ වීමට පුළුවන. මෙම සේවා අතරට රජයේ රෝහල්වලින් නොමිලේ සැපයෙන වෛද්‍ය ප්‍රතිකාර, රෝහල්වලින් පිටතදී ලබාගන්නා සෞඛ්‍ය සේවාවල ගාස්තු පියවීම සඳහා ලැබෙන උපකාර සහ සහන පදනම යටතේ හිමිවන ඖෂධ ඇතුළත් වේ.

Medicare සේවා පිළිබඳ වැඩිවිස්තර සඳහා http://www.humanservices.gov.au/medicare වෙබ් අඩවියට පිවිසෙන්න, නැත්නම්, ළඟම ඇති Medicare සේවා ස්ථානයට යන්න.

## Medicare සමගින් ලියාපදිංචි වන්නේ කෙසේද?

Medicare සඳහා ලියාපදිංචි වීමට, ඔබගේ විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් සංචාරක ලියකියවිලි රැගෙන Medicare කාර්යාලයකට යන්න. ඔබට සියලු සුදුසුකම් ඇත්නම්, තාවකාලික Medicare අංකයක් ඔබට ලබාදෙනු ඇත. උපරිම සති තුනක කාලයක් ඇතුළත ඔබේ Medicare කාඩ්පත තැපැල් මාර්ගයෙන් ඔබට ලැබෙනු ඇත. ඔබේ නිවසේ ලිපිනය හෝ තැපැල් ලිපිනය වෙනස් කළහොත් ඒ බව ඔබ Medicare වෙත දැනුම් දිය යුතුය.

හදිසි ප්‍රතිකාර සඳහා රජයේ රෝහල්වල හදිසි ප්‍රතිකාර අංශය පැය 24 පුරාම විවෘතව පවතී.

| Medicare | ඇමතුම් විස්තර |
|---|---|
| Medicare වෙබ් අඩවිය | www.humanservices.gov.au/medicare |
| සංක්‍රමණිකයන්, සරණාගතයන් සහ සංචාරකයන් සඳහා විස්තර | www.humanservices.gov.au/multicultural |
| ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් විස්තර | www.humanservices.gov.au/yourlanguage |
| දුරකථන | 132 011 |
| කාර්යාලයකට පිවිසෙන්න | http://humanservices.gov.au/findus |

Medicare මගින් ආවරණය නොවන බොහෝ ප්‍රාන්තවල සහ ප්‍රදේශයන්හි ක්‍රියාත්මක බොහොමයක් දන්ත සෞඛ්‍ය සේවා, බොහොමයක් අක්ෂි සෞඛ්‍ය සේවා සහ ගිලන්රථ ප්‍රවාහනය සඳහා රක්ෂණාවරණ සපයන බොහෝ පෞද්ගලික රක්ෂණාවරණ ඇත.

වැඩි විස්තර සඳහා 9 වැනි පරිච්ඡේදයේ *සෞඛ්‍යය සහ යහපැවැත්ම* කොටස කියවන්න.

## Centrelink අමතන්න

Department of Human Services (සමාජ සේවා දෙපාර්තමේන්තුව) Centrelink හරහා සමාජ සුරක්ෂණ ගෙවීම් සහ සේවා සපයයි. රැකියා සොයා ගැනීමට, පාඨමාලා හෝ පුහුණුව ලබා ගත හැකි අවස්ථා සොයා ගැනීමට සහ එතෙරදී ලබාගත් කුසලතාවන් සඳහා මෙරටදී පිළිගැනීමක් ලබාගැනීමේ ක්‍රියාවලිය සඳහා Centrelink අලුතින් පැමිණි ස්ථිර සංක්‍රමණිකයන්ට උපකාර වෙයි. ඔබ සමාජ සුරක්ෂණ ගෙවීමකට හිමිකම් ලබන්නේද යන්න දැනගැනීම සඳහා Centrelink අමතන්න. ඔබේ වීසා පන්තිය අනුව, ගෙවීමක් ලබා ගැනීමට පෙර යම් කාලයක් බලා සිටීමට (පොරොත්තු කාලයකට යටත් වීමට) ඔබට සිදුවිය හැකිය.

ඔබට සුදුසුකම් ඇත්තේ නම්, ඔබ Centrelink ඇමතූ දින පටන් ගෙවීම් සිදු කෙරෙනු ඇත. ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණි දිනයේ පටන් ගෙවීම් ලබා ගැනීමට නම්, ඔබ හෝ ඔබ වෙනුවෙන් ඉදිරිපත් වන වෙනත් අයකු, උදාහරණයක් ලෙස, ඔබේ Humanitarian Settlement Services (HSS) හි සේවා සපයන්නා හෝ යෝජනා කරන්නා ඔබ පැමිණි දින ඒ බව Centrelink වෙත දැන්විය යුතු අතර පැමිණීමෙන් දින 14 ක් ඇතුළත ඉල්ලුම්පත්‍රයක් භාර දිය යුතුය.

මානුෂීය පදනම මත පැමිණෙන්නන් අනෙකුත් සමාජ සුරක්ෂණ දීමනාවලට අමතරව, Crisis Payment (අර්බුද දීමනා) සඳහා සුදුසුකම් ලැබිය හැකිය. ඔබ මානුෂීය වැඩසටහන් යටතේ පැමිණියේ නම්:

- ඕස්ට්‍රේලියාවට පැමිණ දින හතක් ඇතුළත ඉල්ලුම් කරන්න, නැත්නම්,
- පැමිණීමෙන් දින හතක් ඇතුළත ඉල්ලුම් පත්‍රයක් යොමු කිරීමේ අදහස ඇතිව Centrelink අමතා දින 14ක් ඇතුළත ඉල්ලුම් කරන්න.

ඔබට දරුවන් ඇත්නම්, ඔබ රජයෙන් අරමුදල් සපයන දරුවන් හදාවඩා ගැනීමේ පිරිවැය සඳහා වන ගෙවීමක් හෝ ළමා සුරැකුම් ගාස්තු සඳහා ඔබට සුදුසුකම් තිබිය හැකිය (http://www.humanservices.gov.au/ftb වෙබ් පිටුව බලන්න, නැත්නම්, www.humanservices.gov.au/childcare වෙබ් අඩවියට යන්න).

| Centrelink | ඇමතුම් විස්තර |
|---|---|
| Centrelink වෙබ් අඩවිය | www.humanservices.gov.au/centrelink |
| සංක්‍රමණිකයන්, සරණාගතයන් සහ සංචාරකයන් සඳහා විස්තර | www.humanservices.gov.au/multicultural |
| වෙනත් භාෂාවලින් විස්තර | www.humanservices.gov.au/yourlanguage |
| දුරකථන ස්වයං සේවා | 136 240 |
| රැකියා සොයන්නන් | 132 850 |
| ආබාධිත හෝ රැකබලාගන්නන් සහිත පුද්ගලයන් | 132 717 |
| ජ්‍යෝෂ්ට ඕස්ට්‍රේලියානු පුරවැසියන් | 132 300 |
| ශිෂ්‍යයන් සහ ආධුනිකයන් | 132 490 |
| ජාලස්ථ ගිණුම් සහාය | 132 307 |
| පැමිණිලි සහ ප්‍රතිචාර | 1800 132 468 |
| ඕස්ට්‍රේලියානු ආධුනිකයන් | 133 633 |
| පවුල් | 136 150 |
| වෙනත් භාෂාවලින් විස්තර ලබා ගැනීම සඳහා | 131 202 |
| කාර්යාලයකට යන්න | http://humanservices.gov.au/findus |
| අනෙකුත් Centrelink දුරකථන අංක සඳහා | www.humanservices.gov.au |

5 වන පරිච්ඡේදයෙහි *රැකියා* පිළිබඳ කොටස සහ 10 වන පරිච්ඡේදයෙහි *ඔබේ පවුල* කොටස බලන්න.

## Health Undertaking Service හා සම්බන්ධ වන්න

Department of Immigration and Border Protection හි ඉල්ලීම මත ඔබ Health Undertaking (Form 815) අත්සන් කළේ නම්, ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් දින 28ක් ඇතුළත ඔබේ මෙරට සම්බන්ධතා තොරතුරු Health Undertaking Service වෙත ලබා දීමට ඔබ එකඟ වී ඇත. වැඩි විස්තර සඳහා http://www.bupamvs.com.au/faqs වෙබ් අඩවියට පිවිසෙන්න.

ලියාපදිංචි වීම සහ හමුවීමේ දිනයක් නියම කරගැනීම සඳහා දින 28ක් ඇතුළත Health Undertaking සේවා සපයන්නකු වන Bupa Medical Visa Services (BUPA) ඇමතිය යුතුය. ඔබට 1300 794 919 දුරකථනයට ඇමතීමට (සඳුදා සිට සිකුරාදා දක්වා පෙ. ව. 8.00 සිට ප.ව. 6.00 දක්වා EST) හෝ hus@bupamvs.com.au ලිපිනයට ඊමේල් කිරීමට හැකිය. ඔවුන් ඔබව ළඟම ඇති Health Authority Clinic වෙත යොමු කරනු ඇති අතර හමුවක් යොදා ගැනීම සඳහා සායනය මගින් ඔබව අමතනු ඇත.

ඔබ මානුෂීය පදනම යටතේ වන වීසා බලපත්‍රයකින් පැමිණියේ නම්, ඔබ Health Undertaking පෝර්මයක් අත්සන් කළ බව ඔබේ Humanitarian Settlement Services සපයන්නාට පවසන්න. ඔවුන් BUPA ඇමතීමට ඔබට උදව් කරනු ඇත.

## ඉංග්‍රීසි භාෂා පන්ති සඳහා ලියාපදිංචි වන්න

සාර්ථක පැලපදියම් වීමක් සඳහා ඔබට ඉංග්‍රීසි භාෂාවෙන් කතාබහ කිරීම අත්‍යවශ්‍යය. ඔබට ඉංග්‍රීසි භාෂාව කතා කිරීමට නොහැකි නම්, හැකි පමණ ඉක්මණින් එය ඉගෙන ගන්නා ලෙස අපි ඔබව දිරිමත් කරමු.

Adult Migrant English Program (AMEP) වැඩසටහන ඕස්ට්‍රේලියාවට අලුතින් පැමිණෙන අය වෙනුවෙන් ඉංග්‍රීසි භාෂා පාඨමාලාවන් සපයයි. මේ යටතේ උපරිම වශයෙන් පැය 510ක් පමණ වූ, නොමිලේ සැපයෙන ඉංග්‍රීසි භාෂා උපකාරක පන්ති සඳහා ඔබට හිමිකම් තිබිය හැකිය. (AMEP) නම්‍යශීලී පාඨමාලා වේලාවන් සහ ළමා සුරැකුම් පහසුකම් ලබාදෙන බැවින්, ඔබට රාජකාරි, පවුල් හෝ වෙනත් වගකීම් තිබුණද ඉංග්‍රීසි ඉගෙනීම කළ හැකිය.

3 වන පරිච්ඡේදයෙහි, *ඉංග්‍රීසි භාෂාව* කොටස බලන්න

## ඔබේ දරුවා/දරුවන් පාසලකට ඇතුළත් කරන්න

ඔබ හැකිතාක් ඉක්මණින් ඔබේ දරුවා/දරුවන් පාසලකට ඇතුළත් කළ යුතුය. පාසලට ඇතුළත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම සඳහා ඔබ දරුවා/දරුවන් ඇතුළත් කිරීමට කැමති පාසල අමතන්න.

ඔබට ඔබේ විදේශ ගමන් ලියකියවිලි මෙන්ම දරුවාගේ/දරුවන්ගේ ප්‍රතිශක්තිකරණ වාර්තා පෙන්වීමට සිදු වනු ඇත. ළමයින්ට පාසලකට ඇතුළු වීම සඳහා නිර්දේශිත ප්‍රතිශක්තිකරණ ලබා තිබීම අනිවාර්යය. ඔවුන්ගේ කලින් අධ්‍යාපන කටයුතු සම්බන්ධ පාසල් වාර්තා සහ සහතික ඇත්නම්, ඒවාද රැගෙන එන්න.

ඕස්ට්‍රේලියාවේදී, ළමයින් වයස අවුරුදු පහේ සිට 10 වසර නිමා කරන තෙක් පාසල් පැමිණීම අනිවාර්යය. 10 වසර සම්පූර්ණ කළ යෞවනයන් පූර්ණකාලීන අධ්‍යාපනයට, වෘත්තීය පුහුණුවට හෝ රැකියාවට (අඩුම තරමින් සතියට පැය 25ක් වත්) යොමු විය යුතුය, නොඑසේ නම්, අවුරුදු 17 වන තෙක් මේ හැම එකකටම අදාළ ක්‍රියාකාරකම්වලට සහභාගී විය යුතුය.

ඉංග්‍රීසි භාෂාව හැදෑරීමට අවශ්‍ය දරුවන් සඳහා කඩිනම් ඉංග්‍රීසි භාෂා උපකාර සේවාවන් ක්‍රියාත්මක වේ.

4 වන පරිච්ඡේදයෙහි *අධ්‍යාපනය සහ පුහුණුව* කොටස බලන්න

## රියදුරු බලපත්‍රයක් සඳහා අයදුම් කරන්න

ඕස්ට්‍රේලියාවේදී වාහනයක් පැදවීමට නම් ඔබට රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර ඔබ පදවන වාහනය ලියාපදිංචි කරන ලද්දක් විය යුතුය. ඔබ රියදුරු බලපත්‍රයක් රහිතව වාහනයක් පැදවූවොත් හෝ ලියාපදිංචි නොකළ වාහනයක් පැදවූවහොත් දඩයකට හෝ රියදුරු බලපත්‍රය අවලංගු කිරීමකට යටත් වීමට ඔබට සිදු වනු ඇත. රියදුරු බලපත්‍ර සහ වාහන ලියාපදිංචිය නිකුත් කරනු ලබන්නේ ප්‍රාන්ත සහ පළාත් රජයන් මගිනි.

ඔබ ස්ථිර පදිංචිකරුවකු නම් සහ වෙනත් රටකින් නිකුත් කරන ලද ඔබේ වත්මන් රියදුරු බලපත්‍රය ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂා පරිවර්තනයක් සහිතව ඇත්නම්, ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් පසු තුන් මසක් යනතුරු වාහන පැදවීම සඳහා එම රියදුරු බලපත්‍රය භාවිත කිරීමට බොහෝ ප්‍රාන්ත සහ පළාත් ඔබට ඉඩ ලබා දෙයි. ලියකියවිලි පරිවර්තනය සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා 3 වන පරිච්ඡේදයේ *ඉංග්‍රීසි භාෂාව* කියවන්න.

මෙම මූලික කාලසීමාවට අනතුරුව, ඔබට වාහන පැදවීමට අවශ්‍ය නම්, ඔබට අදාළ ඕස්ට්‍රේලියානු රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට සිදු වේ. ඔබට දැනුම් පරීක්ෂාවකට, ප්‍රායෝගික රිය පැදවීමේ පරීක්ෂණයකට සහ ඇස් පෙනීමේ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු වේ. ඕස්ට්‍රේලියාව තුළ ඉතා දැඩි මාර්ග නීති සහ බීමත්ව රිය පැදවීමට එරෙහි නීති ක්‍රියාත්මක වන අතර ඔබට මෙම නීතිවලට අවනත වීමට සිදු වේ.

ඔබ නිරතුරුවම ඔබේ ප්‍රාන්තයේ හෝ ප්‍රදේශයේ ප්‍රවාහන අධිකාරිය විමසිය යුතුය:

| ප්‍රාන්තය/පළාත | බලපත්‍ර සහ රථවාහන ලියාපදිංචි කිරීමේ ආයතන | දුරකථනය | වෙබ් අඩවි |
|---|---|---|---|
| ACT | Road Transport Authority | 02 6207 7000 | www.rego.act.gov.au |
| NSW | Roads and Maritime Services | 13 2213 | www.rms.nsw.gov.au |
| NT | Department of Transport | 1300 654 628 | https://nt.gov.au/driving |
| Qld | Department of Transport and Main Roads | 13 2380 | http://www.tmr.qld.gov.au/ |
| SA | Transport | 13 1084 | www.transport.sa.gov.au |
| Tas. | Transport Tasmania | 1300 851 225 | www.transport.tas.gov.au |
| Vic. | VicRoads | 13 1171 | www.vicroads.vic.gov.au |
| WA | Department of Transport | 13 1156 | www.transport.wa.gov.au/index.asp |

රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට උපකාරී වීම සඳහා රාජ්‍ය නිලධාරියෙකුට ත්‍යාගයක් හෝ අල්ලසක් ලබා දීම නීතිවිරෝධීය.

8 වන පරිච්ඡේදයෙහි *ප්‍රවාහනය* යන්න බලන්න

## බැංකු ගිණුමක් විවෘත කිරීම

ඕස්ට්‍රේලියානුවන්, ඔවුන්ගේ මුදල්, බැංකුවක, ගොඩනැගිලි සමිතියක හෝ ණය සමාගමක තැන්පත් කරති. පඩිය, වේතනය සහ රාජ්‍ය දීමනා ඇතුළත් බොහෝ ආදායම් සෘජුවම ඔබේ නමින් ඇති බැංකු ගිණුමකට බැර කෙරේ. ඕස්ට්‍රේලියානුවන් ඔවුන්ගේ බැංකු ගිණුමෙන් මුදල් ලබා ගැනීමට සහ භාණ්ඩ මිල දී ගැනීම සඳහා ඩෙබිට් (හර) කාඩ්පත් භාවිත කරති.

හැකි නම්, ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් සති හයක් ඇතුළත බැංකුවක, ගොඩනැගිලි සමිතියක හෝ ණය සමාගමක ගිණුමක් විවෘත කරන්න. මේ කාලය ඇතුළත ඔබට අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා බොහෝ විට අවශ්‍ය වන්නේ ඔබේ විදේශ ගමන් බලපත්‍රය පමණි. සති හයකට පසුව මේ සඳහා අමතර ලියකියවිලි අවශ්‍ය වනු ඇත. ඔබේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා බොහෝ ලියකියවිලි නැත්නම්, මෙය දුෂ්කර වනු ඇත. බැංකු තැන්පතුවලින් ලැබෙන පොලියට ඉහළ අනුපාතයකට ආදායම් බදු අයකිරීම වැළැක්වීම සඳහා බැංකුවට ඔබේ බදු ලිපිගොනු අංකය (TFN) ලබා දෙන්න.

11 වන පරිච්ඡේදයෙහි *මුදල්* කොටස කියවන්න.

## පවුලේ වෛද්‍යවරයකු තෝරා ගන්න

පවුලේ වෛද්‍යවරයා ඔබේ පවුලේ අයව සහ ඔවුන්ගේ සෞඛ්‍යමය අවශ්‍යතා හඳුනාගනු ලබන අතර වෛද්‍ය කාරණාවලදී ඔබ උපදෙස් පැතිය යුතු පළමු පුද්ගලයා ද වෙයි. මෙම වෛද්‍යවරුන් General Practitioners හෝ GP ලා වශයෙන් හැඳින්වෙති. ඔවුහු පොදු රෝගී තත්වයන් සඳහා මෙන්ම නිධන්ගත රෝගී තත්වයන් සහිතව ගෘහාශ්‍රිතව වාසය කරන පුද්ගලයන්ට සාමාන්‍ය වෛද්‍ය උපකාර සපයයි.

සමහර රටවල වෛද්‍යවරයකු හමු වීම සඳහා රෝහලකට යායුතු වුවත්, ඕස්ට්‍රේලියානු GPලා සාමාන්‍යයෙන් නගරාසන්නයේ පිහිටා ඇති වෛද්‍ය මධ්‍යස්ථාන (ශෛල්‍යාගාර) හෝ සායන මධ්‍යස්ථානවල සේවය කරති. මිනිසුන් සාමාන්‍යයෙන් ඔවුන් වාසය කරන ප්‍රදේශයට ආසන්න වෛද්‍ය මධ්‍යස්ථානයකදී වෛද්‍යවරුන් හමු වෙති. ඔබ යම් වෛද්‍යවරයකු හමුවීමේදී අපහසුතාවකට පත් වන්නේ නම් හෝ ඔබට සැපයෙන සේවාව පිළිබඳ තෘප්තිමත් නැත්නම් වෙනත් වෛද්‍යවරයකු වෙත යාමට ඔබට අවස්ථාව ඇත.

9 වන පරිච්ඡේදයෙහි *සෞඛ්‍ය සහ යහපැවැත්ම* කොටස කියවන්න.

## මූලික සබැඳියන්

| අන්තර්ගතය | වෙබ් අඩවිය |
|---|---|
| TIS National වෙබ් අඩවිය | www.tisnational.gov.au |
| හදිසි අවස්ථා තොරතුරු | www.triplezero.gov.au |
| රාජ්‍ය තොරතුරු සහ සේවා | www.australia.gov.au |
| ඕස්ට්‍රේලියානු ඉතිහාසය, සංස්කෘතිය, සමාජය සහ පුරුෂාර්ථ | www.border.gov.au/Trav/Life/Aust/Life-in-Australia-book |

## කළයුතු දෑ පිළිබඳ පිරික්සුම් ලැයිස්තුව

- ☐ මම *ඕස්ට්‍රේලියාවෙහි ජීවිතයක් ආරම්භ කිරීම* කියවා ඇත්තෙමි
- ☐ මම බදු ලිපිගොනු අංකයක් (TFN) සඳහා අයදුම් කළෙමි/මෙය මට අදාළ නොවේ
- ☐ මම Medicare සඳහා ලියාපදිංචි වීමි/ මෙය මට අදාළ නොවේ
- ☐ මම Centrelink ඇමතුවෙමි/ මෙය මට අදාළ නොවේ
- ☐ මම Health Undertaking Service ඇමතුවෙමි/ මෙය මට අදාළ නොවේ
- ☐ මම ඉංග්‍රීසි භාෂා පන්ති සඳහා ලියාපදිංචි වීමි/මෙය මට අදාළ නොවේ
- ☐ මම මගේ දරුවා/දරුවන් පාසලකට ඇතුළු කළෙමි/මෙය මට අදාළ නොවේ
- ☐ මම රියදුරු බලපත්‍රයකට අයදුම් කළෙමි/මෙය මට අදාළ නොවේ
- ☐ මම බැංකු ගිණුමක් විවෘත කළෙමි
- ☐ මම පවුලේ වෛද්‍යවරයකු තෝරා ගතිමි

# 2 උපකාර ලබා ගන්න

## මෙම කොටසෙහිදී

- [හදිසි සේවා]
- [පදිංචි වීම සඳහා උපකාර]
- [ආපදා අවස්ථාවකදී උපකාර]

## හදිසි සේවා

හදිසි අවස්ථාවකදී පහත සඳහන් සේවා සඳහා **000** අමතන්න:

- **පොලිසිය**
- **ගිලන්රථ**
- **ගිනි නිවන හමුදාව**

(ලැව් ගිනි, /ගංවතුර, කුණාටු සහ භූමිකම්පා වැනි) ස්වාභාවික ආපදා හෝ (රසායනික අනතුරු, රිය අනතුරු හෝ ප්‍රධාන පෙළේ සාපරාධී හිංසන ක්‍රියා) වැනි ස්වාභාවික නොවන හදිසි අවස්ථා, කවර හෝ ප්‍රජාවක් තුළ අනපේක්ෂිත ලෙස ඇති විය හැකිය. යම් කෙනෙකුට හදිසි උපකාර අවශ්‍ය නම් ඔබ **000** ඇමතිය යුතුය.

**000** (triple zero) වෙත ගනු ලබන ඇමතුම් ගාස්තුවෙන් නිදහස් වන අතර, ඕස්ට්‍රේලියාවේ ඇති ඕනෑම දුරකථනයකින් ඔබට මෙම අංකය ඇමතිය හැකිය. ඔබේ නම, ඔබ සිටින්නේ කොතැනද යන වග සහ ඔබට අවශ්‍ය වන්නේ කවර ආකාරයේ සේවාවක්ද යන්න පැවසීමට සූදානම් වන්න.

ඔබට ඉංග්‍රීසි භාෂාවෙන් කතා කළ නොහැකි නම්, දුරකථන ක්‍රියාකරුට පළමුව ඔබට අවශ්‍ය සේවාව **"Police"**, **"Ambulance"** හෝ **"Fire"** අතරින් කුමක්දැයි දන්වන්න - ඊළඟට ඔබේ භාෂාව කුමක්දැයි කියන්න. ඔබව භාෂණ පරිවර්තකයෙකුට සම්බන්ධ කෙරෙනු ඇති, එමනිසා **දුරකථනය විසන්ධි නොකරන්න**. භාෂණ පරිවර්තකයා ඔබට පොලිසිය, ගිලන්රථ සේවාව හෝ ගිනි නිවන සේවාව ඇමතීම සඳහා උපකාර කරනු ඇත.

ඔබ ගෘහස්ථ දුරකථනයක් භාවිත කරන්නේ නම්, ඔබේ දුරකථනයේ රැඳී සිටින අතරතුර හදිසි සේවා නිලධාරීන්ට ඔබ සිටින ස්ථානය සොයා ගැනීමට පහසු වන බැවින්, එය විසන්ධි නොකර සිටින්න.

ඔබ ස්මාර්ට්ෆෝන් දුරකථනයක් භාවිත කරන්නේ නම්, http://play.google.com/store/apps/details?id=com.threesixtyentertainment.nesn හි ඇති [ගූගල් ස්ටෝර්] හරහා හෝ http://www.triplezero.gov.au/Pages/EmergencySmartphoneApp.aspx [ඇප්ල් ස්ටෝර්] වලට ගොස් *Emergency+* යෙදවුම බාගත කරගත හැකිය. මෙම යෙදවුම හදිසි සේවාවන්ට ඔබ සිටින ස්ථානය පිළිබඳව තොරතුරු සපයයි.

[**000**] (triple zero) පිළිබඳ වැඩි විස්තර (ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවන්ද ඇතුළත්ව) සඳහා www.triplezero.gov.au වෙබ් අඩවියට පිවිසෙන්න.

### පොලිසිය

පොලිසියේ සහාය අවශ්‍ය වන හදිසි අවස්ථාවකදී, **000** අමතා **"Police"** ය ඉල්ලා සිටින්න. ඔබ ඉංග්‍රීසි කතා නොකළත්, දුරකථනය විසන්ධි නොකිරීමට මතක තබා ගන්න, - ඔබේ භාෂාව දුරකථන ක්‍රියාකරුට පවසන්න, භාෂණ පරිවර්තකයෙකුට ඔබව සම්බන්ධ කෙරෙනු ඇති.

හදිසි අවස්ථාවක් නොවන කාරණාවලදී, 13 1444 අංකයට හෝ ඔබේ ප්‍රදේශයේ පොලිස් ස්ථානය අමතන්න. එම පොලිස් ස්ථානවල අංක [White Pages] දුරකථන නාමාවලියේ 'පොලිස් ස්ථාන' යටතේ දක්වා ඇත. පොලිස් සේවා ගාස්තුවලින් නිදහස් වේ.

පොලීසිය ප්‍රජාවගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කිරීමත්, අපරාධ වැළැක්වීම සහ අනාවරණය කරගැනීමත්, සාමය ආරක්ෂා කිරීමත් අරමුණු කොටගෙන ක්‍රියාත්මක වේ. ගෘහස්ථ කළහයක් හෝ ශාරීරික, ලිංගික හෝ මානසික අපයෝජනයක් සිදුවෙතැයි සැක සිතෙන අවස්ථාවලදී පොලිසිය පවුල් ආරවුල්වලට මැදිහත් විය හැකිය. පොලීසිය සන්නද්ධ හමුදාවලට සම්බන්ධයක් නොමැත. එසේම, පොලීසිය දේශපාලනයටද සම්බන්ධයක් නොදක්වයි.

වැඩි විස්තර සඳහා:

| කළාපය | පොලිස් සේවාව | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | ACT Policing | www.police.act.gov.au |
| NSW | New South Wales Police Force | www.police.nsw.gov.au |
| NT | Northern Territory Police | www.pfes.nt.gov.au/police.aspx |
| Qld | Queensland Police | www.police.qld.gov.au |
| SA | South Australia Police | www.sapolice.sa.gov.au |
| Tas. | Tasmania Police | www.police.tas.gov.au |
| Vic. | Victoria Police | www.police.vic.gov.au |
| WA | Western Australia Police | www.police.wa.gov.au |
| ජාතික | Australian Federal Police | www.afp.gov.au |

## ගිලන්රථ

තදබල අසනීප තත්වයක් හෝ තුවාල ලැබීමක් වැනි ක්ෂණික වෛද්‍ය උපකාර අවශ්‍ය **හදිසි අවස්ථාවකදී, 000** අමතා “**Ambulance**” (ගිලන්රථ) ඉල්ලන්න. ගිලන්රථ හදිසි අවස්ථාවකදී රෝහල් වෙත ප්‍රවාහනය කිරීම සහ හදිසි වෛද්‍ය ප්‍රතිකාර සපයනු ඇත. මතක තබා ගන්න, ඔබ ඉංග්‍රීසි භාෂාව කතා කරන්නේ නැති නමුත් **දුරකථනය විසන්ධි කරන්න එපා -** ඔබ කතා කරන භාෂාව දුරකථන ක්‍රියාකරුට දන්වන්න. ඔබව භාෂණ පරිවර්තකයෙකුට සම්බන්ධ කෙරෙනු ඇති.

ඔබ ජීවත් වන්නේ කොහිද, ගිලන්රියෙන් ඔබව කොපමණ දුරක් ප්‍රවාහනය කරන්නේද, ඔබේ අසනීප තත්වයේ ස්වභාවය සහ ඔබ සහන ගාස්තුවකට හිමිකම් කියන්නේද යන කරුණු මත ඔබට ගිලන්රථ සේවාව භාවිත කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීමට සිදු විය හැකිය. Medicare මගින් ගිලන්රථ ගාස්තු ආවරණය නොවන නමුත් සමහර පුද්ගලික සෞඛ්‍ය රක්ෂණ සහ ගිලන්රථ සාමාජිකත්වය මගින් එය ආවරණය වෙයි. (9 වන පරිච්ඡේදයෙහි *සෞඛ්‍යය සහ යහ පැවැත්ම* බලන්න).

හදිසි අවස්ථා නොවන වෛද්‍ය කරුණු සඳහා 9 වන පරිච්ඡේදයෙහි *සෞඛ්‍යය සහ යහ පැවැත්ම* බලන්න.

වැඩි විස්තර සඳහා:

| ප්‍රාන්තය හෝ පළාත | ගිලන්රථ සේවාව | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | ACT Ambulance Service | www.ambulance.act.gov.au |
| NSW | Ambulance Service of NSW | www.ambulance.nsw.gov.au |
| NT | St John Ambulance Australia | www.stjohn.org.au |
| Qld | Queensland Ambulance Service | www.ambulance.qld.gov.au |
| SA | SA Ambulance Services | www.saambulance.com.au |
| Tas. | Tasmanian Ambulance Service | www.dhhs.tas.gov.au |

| ප්‍රාන්තය හෝ පළාත | ගිලන්රථ සේවාව | වෙබ් අඩවිය |
|---|---|---|
| Vic. | Ambulance Victoria | www.ambulance.vic.gov.au |
| WA | St John Ambulance Australia | www.stjohn.org.au |

### ගිනි නිවන හමුදාව

ගෙවල් ගිනි ගැනීම් සහ ගෑස් කාන්දු වීම වැනි ගින්න අනතුරුදායක වන හදිසි අවස්ථාවකදී, **000** අමතා "**Fire brigade**" ඉල්ලන්න. මතක තබා ගන්න, ඔබ ඉංග්‍රීසි භාෂාව කතා කරන්නේ නැති නමුත් **දුරකථනය විසන්ධි කරන්න එපා -** ඔබ කතා කරන භාෂාව දුරකථන ක්‍රියාකරුට දන්වන්න. ඔබව භාෂණ පරිවර්තකයෙකුට සම්බන්ධ කෙරෙනු ඇති.

ගිනි නිවන භටයන් ගින්න පාලනය කරනු ඇත, දැවෙන ගොඩනැගිලිවලින් මිනිසුන් බේරා ගනු ඇත, එසේම ගෑස් හෝ රසායනික ද්‍රව්‍ය අනතුරුදායක විය හැකි තත්වයන්හිදී උපකාරී වනු ඇත.

ගිනි නිවීම් සේවා නොමිලේ සැපයේ.

ගිනි ගැනීම වැළැක්විය හැක්කේ කෙසේද සහ ගින්නක් ඇති වුවහොත් කළයුත්තේ කුමක්ද යන්න පිළිබඳව වැඩි විස්තර සඳහා 12 වන පරිච්ඡේදයේ *ප්‍රජා සහභාගිත්වය* සහ ඔබේ ප්‍රාන්තයේ හෝ පළාතේ ගිනි නිවන සේවා වෙබ් අඩවි කියවන්න:

| ප්‍රාන්තය/පළාත | ගිනි නිවීම් සේවාව | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | ACT Fire & Rescue | www.esa.act.gov.au/actfr |
| NSW | Fire and Rescue NSW | www.fire.nsw.gov.au |
| | NSW Rural Fire Service | www.rfs.nsw.gov.au |
| NT | NT Police, Fire and Emergency Service | www.pfes.nt.gov.au/fire-and-rescue.aspx |
| Qld | Queensland Fire and Emergency Services | www.fire.qld.gov.au |
| SA | SA Metropolitan Fire Service | http://www.mfs.sa.gov.au/site/home.jsp |
| | SA Country Fire Service | www.cfs.sa.gov.au |
| Tas. | Tasmania Fire Service | www.fire.tas.gov.au |
| Vic. | Metropolitan Fire Board | www.mfb.vic.gov.au |
| | Country Fire Authority | www.cfa.vic.gov.au |
| WA | Department of Fire and Emergency Services | www.fesa.wa.gov.au |

### ස්වාභාවික විපත්

ලැව් ගිනි, ගංවතුර හෝ සුළිකුණාටු වැනි ස්වභාවික විපතක් ඇති වුවහොත්, ප්‍රාන්ත සහ පළාත් රාජ්‍ය අධිකාරීන් එක්ව හදිසි සේවා ක්‍රියාත්මක කරයි. ප්‍රාන්ත සහ පළාත් හදිසි සේවා (SES) වැනි ස්වේච්ඡා සේවා සහ ග්‍රාමීය ගිනි නිවීම් සේවා වෘත්තීය ගිනි නිවීම්, පොලිස් සහ ගලවා ගැනීමේ සේවාවන්ට සහාය විය හැකිය.

ස්වාභාවික විපත් සහ වෙනත් හදිසි අවස්ථාවලදී, ඕස්ට්‍රේලියානු ආරක්ෂක හමුදාව ඇතුළු ඕස්ට්‍රේලියානු රාජ්‍ය ආයතන උපකාර සපයනු ඇත. ඕස්ට්‍රේලියාවේ ආරක්ෂක හමුදාව දේශපාලන ක්‍රියාකාරකම්වල කොටසක් නොවේ.

ස්වාභාවික විපතකින් යථා තත්වයට පත්වීම සඳහා ඔබට උපකාර ලබා ගත හැකි වනු ඇත. වැඩි විස්තර සඳහා http://www.triplezero.gov.au වෙබ් අඩවියට පිවිසෙන්න.

ඕස්ට්‍රේලියාවේ රජයේ සෑම ස්ථරයක්ම ස්වභාවික විපත් හෝ ආපදා සඳහා සූදානම්ව සිටිති. වැඩි විස්තර සඳහා ප්‍රාන්ත හෝ පළාත් වෙබ් අඩවි බලන්න:

| හදිසි සේවා මධ්‍යස්ථානය | වෙබ් අඩවිය |
|---|---|
| ACT | http://esa.act.gov.au/emergency-management/emergency-arrangements |
| NSW | www.emergency.nsw.gov.au |
| NT | www.pfes.nt.gov.au/Emergency-Service/Publications-and-forms.aspx |
| Qld | www.disaster.qld.gov.au |
| SA | www.safecom.sa.gov.au/site/home.jsp |
| Tas. | www.ses.tas.gov.au |
| Vic. | www.igem.vic.gov.au |
| WA | www.fesa.wa.gov.au |
| National Crisis Co-ordination | www.ag.gov.au/EmergencyManagement/About-us-emergency-management/Australian-Government-Crisis-Coordination-Centre/Pages/default.aspx |
| ස්වභාවික විපත් පිළිබඳ තොරතුරු | www.australia.gov.au/about-australia/australian-story/natural-disasters |

***ලැව් ගිනි***

ලැව් ගින්නක් යනු තණකොළ, ළඳු හෝ කැලෑ දවන ගින්නක වන අතර එය ජීවිතයට, දේපළවලට මෙන්ම පරිසරයටද බලපෑම් කළ හැකිය. ලැව්ගිනි වසරේ ඕනෑම කාලයක ඇති විය හැකි නමුත් තණකොළ, ළඳු සහ කැලෑ වියළි බවට පත්වන දැඩි උෂ්ණත්වයක් සහිත මාසවලදී ගිනි හටගැනීමේ අවදානම වැඩිය. ගිනි අධික උණුසුම් විය හැකිය; වේගවත් සහ ක්ෂණිකව පැතිරිය හැකිය. ගිනි මගින් ඇති කරන ඝණ දුමාරය දැකීම හෝ හුස්ම ගැනීම අපහසු කරවනු ඇත. ඕස්ට්‍රේලියාව දැඩි ලැව්ගිනි සඳහා ප්‍රසිද්ධය.

ඔබ ලැව්ගිනි අවදානම සහිත ප්‍රදේශයක ජීවත් වේනම්, ලැව්ගින්නෙන් ආරක්ෂා වීමේ සැලසුමක් සකස් කර ගන්න. මෙය ගින්නක් ඇති වූ අවස්ථාවක පිටත් විය යුතු වේලාව, ගෙන යා යුතු දෑ සහ සතුන් සම්බන්ධයෙන් කළ යුත්තේ කුමක්ද වැනි ඉතා වැදගත් තීරණ ගැනීමට ඔබට උපකාරී වෙයි.

සූදානම් වන්නේ කෙසේද යන්නත් ඇතුළත්ව ලැව්ගිනි පිළිබඳ ඉතා වැදගත් තොරතුරු සඳහා ඉහත වගුවෙහි දක්වා ඇති ප්‍රාන්ත හෝ පළාත් ගිනි නිවීම් සේවා බලන්න.

## වෙනත් හදිසි සේවා අංක

White Pages පහත සඳහන් දුරකථන අංකද ඇතුළත්ව, හදිසි සේවා දුරකථන අංක ලැයිස්තුගත කොට ඇත:

| හදිසි සේවාව | දුරකථනය පැය 24 පුරා | වෙබ් අඩවිය |
|---|---|---|
| Poisons Information Centre | 13 1126 | http://www.poisonsinfo.nsw.gov.au |
| Child Abuse Prevention Service | 1800 688 009 | www.childabuseprevention.com.au/reporting-abuse.html |

### ත්‍රස්තවාදී තර්ජන

ප්‍රචණ්ඩකාරී අන්තගාමීත්වය වැළැක්වීමට ඕස්ට්‍රේලියාව කැප වී ක්‍රියා කරයි. ප්‍රචණ්ඩකාරී අන්තගාමීත්වය මතවාදමය, ආගමික හෝ දේශපාලනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය භාවිත කිරීම හෝ එය උපකාර කර ගැනීමයි. ප්‍රචණ්ඩකාරී අන්තගාමීත්වය පිළිබඳ අවදියෙන් සිටීමෙන් හෝ එහි තර්ජනය තේරුම් ගැනීමෙන් සැමටම ඕස්ට්‍රේලියාවේ ආරක්ෂාවට උරදිය හැකිය.

වැඩි විස්තර සොයා ගැනීමට හෝ ඔබේ අවධානයට යොමු වූ දෙයක් වාර්තා කිරීමට පහත වෙබ් අඩවිවලට පිවිසෙන්න:

| ජාතික | දුරකථනය | වෙබ් අඩවිය |
| --- | --- | --- |
| National Security Hotline | 1800 1234 00 | www.nationalsecurity.gov.au/WhatAustraliaisdoing/Pages/TheNationalSecurityHotline.aspx |
| Living Safe Together | | www.livingsafetogether.gov.au/pages/home.aspx |
| Report Online Extremism | | www.reportextremism.livingsafetogether.gov.au/ |

### පදිංචිය සඳහා උපකාර

ඕස්ට්‍රේලියානු රජය ඕස්ට්‍රේලියාවේ විවිධත්වයෙන් යුත් සමාජයට අනුග්‍රහ දක්වයි. වැඩි විස්තර සඳහා http://www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/a-multicultural-australia වෙබ් අඩවියට යන්න.

ඕස්ට්‍රේලියාවේ පදිංචි වීමට සහ එහි සමාජයේ ක්‍රියාකාරී සාමාජිකයන් වීමට මෑතකදී පැමිණි සරණාගතයන්ට සහ සුදුසුකම් ලත් සංක්‍රමණිකයන්ට උපකාර පිණිස ඕස්ට්‍රේලියානු රජය සේවා සපයයි. ඔවුන්ගේ ඉලක්කය වන්නේ පදිංචියෙහි පළමු වසර පහ පිළිබඳවයි.

- Settlement Service Grants
- Adult Migrant English Program (AMEP)
- පරිවර්තන සහ භාෂණ පරිවර්තන (TIS National) සේවා.

විශේෂයෙන් මානුෂීය පදනම මත පැමිණි පුද්ගලයන් සඳහා වන සේවාවලට ඇතුළත් වන්නේ:

- Humanitarian Settlement Services
- Complex Case Support Program
- භාරකරුවකු නොමැතිව මානුෂීය පදනම මත පැමිණි බාලවයස්කරුවන් සඳහා උපකාර

Humanitarian Settlement Services සහ Complex Case Support සේවා සපයන්නන්, පිළිබඳ සොයා ගැනීමට http://www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/settlement-services/settlement-services-locator වෙබ් අඩවියට යන්න.

පදිංචි වීම පිළිබඳ වෙනත් මූලාශ්‍ර www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/taking-the-initiative/resources වෙබ් පිටුවෙන් සොයා ගත හැකිය.

TIS National සහ AMEP පිළිබඳ වැඩි විස්තර සඳහා 3 වන පරිච්ඡේදයෙහි ඉංග්‍රීසි භාෂාව කොටස කියවන්න.

#### මානුෂීය පදනම මත පැමිණි සංක්‍රමණිකයන් පදිංචි කිරීමේ සේවා

Humanitarian Settlement Services (HSS) අලුතින් පැමිණි සරණාගතයන්ට සහ මානුෂීය පදනම මත පැමිණි අයට පැමිණි විගස සහ මූලික පදිංචි වීමේ කාලය තුළදී කඩිනම් පදිංචි වීම් උපකාර සේවා සපයයි.

HSS වැඩසටහන සකසා ඇත්තේ යෞවන/යෞවනියන්ගේ විශේෂ අවශ්‍යතා ඇතුළු, පුද්ගලික අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයටයි. සේවාග්‍රාහකයින්ට ඕස්ට්‍රේලියාවේ සමාජ සහ ආර්ථික ජීවිතයට ක්‍රියාකාරීව සහභාගී වීමට HSS උපකාර

වෙයි. අනාගතයේදී ස්වාධීනව මෙම සේවාවන් පරිශීලනය කිරීම සඳහා එය දැනුමින් සහ නිපුණතාවලින් සන්නද්ධ කරවයි.

HSS යටතේ සැපයෙන සේවාවන් අතරට පහත සඳහන් දෑ ඇතුළත් විය හැකිය:

- පැමිණීමේදී ගුවන් තොටුපළ පිළිගැනීම සහ කෙටිකාලීන ඉඳුම්-හිටුම්
- දිගුකාලීන වාසස්ථාන සොයා ගැනීම සඳහා සහාය
- ප්‍රධාන ප්‍රවාහයේ ආයතන, ප්‍රජා වැඩසටහන්, සෞඛ්‍ය සහ වෙනත් පැළපදියම් වීමේ සේවා පිළිබඳ තොරතුරු සැපයීම සහ ඒවාට යොමු කිරීම
- රට තුළදී සංස්ථාපන වැඩසටහනක්

සේවාලාභියෝ සාමාන්‍යයෙන් මාස 6-12 අතර කාලයක් HSS වැඩසටහන යටතේ සිටිති.

වැඩි විස්තර සඳහා කියවන්න:

| Humanitarian Settlement Services තොරතුරු | වෙබ් අඩවි |
|---|---|
| Humanitarian Settlement Services | www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/settlement-services/humanitarian-settlement-services-hss |
| වර්තමාන HSS සේවා සපයන්නන්ගේ ලැයිස්තුව | www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/settlement-services/settlement-services-locator |

### සංකීර්ණ කාරණා සම්බන්ධ උපකාර වැඩසටහන

Complex Case Support (CCS) වැඩසටහන වෙනත් පදිංචි සේවාවල පරාසයෙන් ඔබ්බට ගිය අවශ්‍යතා සහිත සුදුසුකම් ලත් මානුෂීය සංක්‍රමණිකයන්ට විශේෂිත සහ කඩිනම් තත්ව කළමනාකරණ සේවා සපයයි. පැමිණීමෙන් වසර 5ක් යනතුරු සේවාලාභීන් CCS වැඩසටහනේ ප්‍රතිලාභ ලැබීමට සුදුසු වෙයි. CCS පිළිබඳව වැඩි විස්තර සඳහා http://www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/settlement-services/complex-case-support-programme වෙබ් අඩවියට පිවිසෙන්න.

මෙවැනි ස්වභාවයේ උපකාර අවශ්‍ය වන යම් අයෙක් ඔබ දන්නේ නම්, හෝ ඔබ එවැනි පුද්ගලයෙකු නම්, 1300 855 669 ඔස්සේ Complex Case Support කණ්ඩායම අමතන්න.

### පදිංචි සේවා දීමනා

මෙම වැඩසටහන අලුතින් පැමිණි අයට ඕස්ට්‍රේලියාවේ පැලපදියම් වීම සඳහා උපකාර කිරීමට ආයතනවලට මූල්‍යාධාර සපයයි.

ඔබ ඕස්ට්‍රේලියාවේ නිත්‍ය පදිංචිකරුවකු නම් සහ පසුගිය වසර පහ ඇතුළත ඕස්ට්‍රේලියාවට පැමිණි පහත සඳහන් අයෙකු නම්, Settlement Grants යටතේ ඇති සේවා ලබා ගැනීමට ඔබට හැකිය:

- මානුෂීය පදනම යටතේ පැමිණි අය
- අඩු ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව සහිත පවුල් දහරාවේ සංක්‍රමණිකයෝ
- දුෂ්කර හෝ පළාත්බද ප්‍රදේශයක පදිංචිව සිටින, අඩු ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව සහිත, නිපුණතා පදනම යටතේ සංක්‍රමණය වූවකුගේ යැපෙන්නෙක්.

පසුගිය පස්වසර තුළ පැමිණි, එසේම අඩු ඉංග්‍රීසි නිපුණතාවක් සහිත සමහර තාවකාලික පදිංචිකරුවන් (අනාගත විවාහක සහ තාවකාලික සහකරු වීසා දරන්නන් සහ ඔවුන්ගෙන් යැපෙන්නන්) ග්‍රාමීයව හෝ පළාත්බදව ජීවත් වේනම්, ඔවුන්ද මේ සඳහා සුදුසුකම් ලබති.

නව සංක්‍රමණිකයන් සැලකිය යුතු ප්‍රමාණයක් ඇතුළත්වන එ හෙයින්, සංවිධානයට, සැලසුම් කිරීමට සහ සේවා සැපයීමට උපකාර අවශ්‍ය වන අලුතින් පැමිණි ප්‍රජාවන්ටද Settlement Grants උපකාරී වෙයි.

නිවාස පිළිබඳ සහාය, ළමා සුරකුම්, රැකියා සහ පාසැල් වැනි ප්‍රධාන ධාරාවේ සේවා ලබා ගැනීමට සේවා සපයන්නෝ ඔබට උපකාරී වෙත්. ඔබට ප්‍රජාව තුළ ස්ථාපනය වීමට, ඉංග්‍රීසි භාෂා පුහුණුව, අධ්‍යාපනය සහ රැකායාවක් ලබා ගැනීමට උදව් කරන උපකාර සේවාවලට ඔවුන් ඔබව සම්බන්ධ කරනු ඇත.

වැඩි විස්තර සඳහා:

| පදිංචිවීම් සේවා අරමුදල් තොරතුරු | වෙබ් අඩවි |
|---|---|
| Settlement Services grants Program පිළිබඳව | www.dss.gov.au/grants-funding/grant-programmes/settlement-services-fact-sheet |
| DSS Grants Service Directory | http://serviceproviders.dss.gov.au |

### භාරකරුවකු නොමැති බාල වයස්කාර ළමුන් සඳහා උපකාර

මෙම වැඩ සටහන සුදුසුකම් සහිත (නිත්‍ය පදිංචිකරුවකු, තාවකාලික මානවවාදී සංක්‍රමණිකයකු, තාවකාලික රැකවරණලාභියකු හෝ ඒ හා සමාන තාවකාලික වීසා බලපත්‍රයක් සහිත) ළමුන්ට ආරක්ෂණය, අධීක්ෂණය සහ උපකාර සම්බන්ධයෙන් සහාය වෙයි.

භාරකරුවකු නොමැති මානවවාදී ළමුන් පිළිබඳ වැඩි විස්තර සඳහා www.border.gov.au/about/corporate/information/fact-sheets/uhm-programme වෙබ් අඩවියට යන්න.

### පදිංචිය/ස්ථාවර වීම පිළිබඳ DVD

Department of Immigration and Border Protection ය අප්‍රිකාවේ සහ ආසියාවේ සිට අලුතින් පැමිණි සරණාගතයන් සඳහා *ඕස්ට්‍රේලියාව - නව නිවහන* මැයෙන් DVD පටයක් පිළියෙළ කොට ඇත. මෙම DVD තැටියෙහි නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනය, මුදල්, රැකියා, පවුල, ඕස්ට්‍රේලියානු නීතිය සහ ඕස්ට්‍රේලියාවේ ජීවත් වීම යනාදිය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

අප්‍රිකානු සරණාගතයන් සඳහා වන DVD තැටිය අම්හාරික්, ඩින්කා, කිරුන්ඩි, සුඩාන, අරාබි, ස්වාහිලි සහ ටිග්රින්යා යන භාෂාවලින් ලබා ගත හැකිය.

අසියානු සරණාගතයින් සඳහා වන DVD තැටිය බුරුම, චීන (හකා), කාරෙන්, නේපාල සහ රොහින්ග්යා භාෂාවලින් ඇත.

DVD දෙකෙහිම ඉංග්‍රීසි භාෂා වරණය ඇතුළත් වන අතර ඉංග්‍රීසි උපසිරැසිවලින්ද යුක්ත වේ. මෙහි කොටස් දේශසීමා රූපවාහිනිය (Border TV) ඔස්සේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්ද නැරඹිය හැකිය. www.youtube.com/user/ImmiTV වෙබ් අඩවියට ගොස් 'orientation information' (අනුස්ථාපන තොරතුරු) යන්න සොයන්න.

DVD පටයේ පිටපත් සඳහා, ස්ථාපන සේවා සපයන්නා විමසන්න. විද්‍යුත් ලිපිනය: DVD.Requests@border.gov.au, නැත්නම්, www.border.gov.au/about/contact/offices-locations/australia හි Department of Immigration and Border Protection අමතන්න.

### ප්‍රාන්ත සහ පළාත් ස්ථාපන සහාය

බහුසංස්කෘතික සහ සංක්‍රමණ සම්බන්ධතා පිළිබඳ කාර්යාල සෑම ප්‍රාන්ත සහ පළාත් ආණ්ඩුවකටම ඇත. ප්‍රාදේශීය ආණ්ඩුද නව පදිංචිකරුවන්ට උපකාර සපයනු ඇත. 12 පරිච්ඡේදයේ *සිවිල් සහභාගීත්වය* බලන්න.

වැඩි විස්තර සඳහා:

| ප්‍රාන්තය/පළාත | ආයතනය | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | Office of Multicultural Affairs | http://www.communityservices.act.gov.au/multicultural |
| | Multicultural Services | www.communityservices.act.gov.au/multicultural/services |
| NSW | Multicultural NSW language services | www.crc.nsw.gov.au/services |
| | Multicultural NSW Settlement Portal | http://multicultural.nsw.gov.au/communities/new_arrivals_to_nsw/ |
| | NSW Community Organisations | http://multicultural.nsw.gov.au/communities/communities/ |
| NT | Office of Multicultural Affairs | http://dcm.nt.gov.au/strong-community/multicultural-affairs |
| | NT Multicultural Information Directory | https://nt.gov.au/community/multicultural-communities/Contact-a-multicultural-service-or-community-group |
| Qld | Multicultural Affairs Queensland | www.multicultural.qld.gov.au |
| | Queensland Multicultural Resource Directory | www.communities.qld.gov.au/multicultural/multicultural-communities/multicultural-resource-directory |
| SA | Multicultural SA | www.multicultural.sa.gov.au/new-migrants |
| | Multicultural Communities Council of SA Directory | www.mccsa.org.au |
| Tas. | Multicultural Tasmania | www.multicultural.tas.gov.au |
| Vic. | Victorian Multicultural Commission | www.multicultural.vic.gov.au |
| | ප්‍රජා නාමාවලිය | www.multicultural.vic.gov.au/resources/community-directory |
| WA | Office of Multicultural Interests | www.omi.wa.gov.au |
| | WA Culturally and Linguistically Diverse (CaLD) community services directory | www.omi.wa.gov.au/omi_db_msd.cfm |

## ප්‍රාදේශීය රජයේ සේවාවන්

ඔබේ ප්‍රාදේශීය කවුන්සිලය ඔබ ජීවත් වන ප්‍රදේශය බලා ගන්නා අතර ප්‍රාදේශීය ප්‍රජාවට අයත් පුද්ගලයන්ට බොහෝ වැදගත් සේවා සපයයි. කවුන්සිලවලට ප්‍රතිපාදන ලැබෙන්නේ ප්‍රාදේශීය දේපළ අයිතිකරුවන් ගෙවන වරිපණම් මගිනි. ප්‍රාදේශීය ආණ්ඩුවේ සේවා ලබා ගැනීමට ඔබට දේපළක් අයිති වීම අවශ්‍ය නොවේ.

බොහෝ කවුන්සිල, ප්‍රාදේශීය කවුන්සිල සේවා සහ පහසුකම් (කසළ එකතු කිරීමේ වේලාවල්, මහජන සෞඛ්‍යය සහ විනෝද පහසුකම් ඇතුළත්ව) පිළිබඳ තොරතුරු ඇතුළත් පොත්පිංචවල් හෝ නව පදිංචිකරුවන්ගේ කට්ටල ලබා දෙයි. ඔබට මේවා කවුන්සිලවලින් ලබා ගැනීමට හෝ ඒවා ඔබ තැපැල් මගින් ගෙන්වා ගැනීමට හැකිය.

වැඩි විස්තර සඳහා ප්‍රාදේශීය කවුන්සිල හෝ පුස්තකාලයට යන්න. කවුන්සිල දුරකථන අංක සහ ලිපිනයන් White Pagesවල දිස්ත්‍රික්කයේ නම යටතේ ලැයිස්තුගතකර දක්වා ඇත.

වැඩි විස්තර සඳහා:

| පළාත | ප්‍රාදේශීය රජයන් පිළිබඳ තොරතුරු | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | ACT Government – Canberra Connect | www.act.gov.au |
| NSW | Office of Local Government | www.olg.nsw.gov.au |
| NT | Department of Local Government and Community Services | www.localgovernment.nt.gov.au/council_information |
| Qld | Department of Infrastructure, Local Government and Planning | http://dilgp.qld.gov.au |
| SA | Department of Planning and Local Government | www.dpti.sa.gov.au/local_govt |
| Tas. | Local Government Division | www.dpac.tas.gov.au/divisions/local_government |
| Vic | Local Government Victoria | www.delwp.vic.gov.au/local-government/find-your-council |
| WA | Department of Local Government and Communities | www.dlgc.wa.gov.au/Pages/default.aspx |
| ජාතික | Australian Local Government Association - සබැඳි | http://alga.asn.au/?ID=275&Menu=56,199,219 |

### ජනවාර්ගික සහ ප්‍රජා සංවිධාන

විවිධ සංස්කෘතික, භාෂා සහ ආගමික පසුබිම් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් නියෝජනය කරන සහ ඔවුන්ගේ සුබසිද්ධිය පිණිස කටයුතු කරන බොහෝ ජනවාර්ගික සහ ප්‍රජා සංවිධාන ඕස්ට්‍රේලියාවේ ඇත. මෙම සංවිධානවලට ඔබට උපකාරී වීමට හෝ නැත්නම්, උපකාර විය හැකි වෙනත් අය වෙත ඔබව යොමු කිරීමේ හැකියාව ඇත. ජනවාර්ගික සහ ප්‍රජා සමාජ, සංගම්, ආගමික සංවිධාන Yellow Pagesවල 'Clubs' (සමාජ) සහ 'Organisations' (සංවිධාන) යටතේ දක්වා ඇත.

බොහෝ ප්‍රදේශවල සංක්‍රමණ සම්පත් මධ්‍යස්ථාන ඇතුළුව, ස්ථාපන සේවා සපයන්නෝ සිටිති. මෙම ආයතන පවත්වාගෙන යනු ලබන්නේ රජයෙන් නොවේ, නමුත්, සමහර ආයතන ස්ථාපන සේවා සැපයීම සඳහා රජයෙන් අරමුදල් ලබයි. එම ආයතනවලට ඔබට උපකාර කිරීමට හෝ ඔබේ අවශ්‍යතාවලට සහ වුවමනාකම්වලට ගැළපෙන ආයතන සොයා ගැනීමට සහාය වීමට හැකිය.

වැඩි විස්තර සඳහා:

| පළාත | ආයතනය | වෙබ් අඩවිය |
|---|---|---|
| ජාතික | Federation of Ethnic Communities' Councils of Australia (FECCA) | www.fecca.org.au |
| ජාතික | Settlement Council of Australia | www.scoa.org.au |
| ජාතික | Multicultural Youth Advocacy Network | www.myan.org.au/ |

## අර්බුදයකදී උපකාර

ඔබට ආහාර, ඇඳුම්, ඉඳුම්-හිටුම් හෝ ගෘහ භාණ්ඩ පිළිබඳ හදිසි අවශ්‍යතාවක් වේනම්, ඔබට රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලබාගත හැකිය. උදව් ඉල්ලීමට පසුබට නොවන්න.

සමහර සේවා ලබා ගැනීමට ඔබ සුදුසුකම් ලැබිය යුතු අතර යම යම් අවශ්‍යතා සම්පූර්ණ කිරීමටද සිදු විය හැකිය.

වැඩි විස්තර සඳහා:

| ජාතික ආයතන | වෙබ් අඩවිය |
|---|---|
| The Salvation Army | www.salvos.org.au |
| St Vincent de Paul Society | www.vinnies.org.au |
| The Smith Family | www.thesmithfamily.com.au |
| Mission Australia | www.missionaustralia.com.au |
| Anglicare Australia | www.anglicare.asn.au |
| Red Cross | www.redcross.org.au/contact-us.aspx |
| Department of Human Services | www.humanservices.gov.au/crisis |

### දුරකථනය ඔස්සේ අර්බුද උපදේශන

දවසේ පැය 24 පුරාමත්, සතියේ දින හතේමත් නොමිලේ අර්බුද සම්බන්ධ උපදේශන සේවා සපයන දුරකථන උපදේශන සේවා ඇත.

ඔබට බලාපොරොත්තු සුන්වූ බවක් දැනේ නම්, යමෙකුට කතා කිරීමේ අවශ්‍යතාවක් ඇත්නම් හෝ ඔවුන්ගේ විශේෂඥ උපදේශන සේවාව ලබා ගැනීමට අවශ්‍ය යැයි හැගේ නම් හෝ ඔවුනට කතා කරන්න.

| ජාතික ආයතනය | දුරකථනය<br>පැය 24 පුරා | වෙබ් අඩවිය |
|---|---|---|
| Lifeline Helpline | 13 1114 | www.lifeline.org.au |
| Kids Helpline | 1800 551 800 | www.kidshelp.com.au |
| Child Abuse Prevention Service | 1800 688 009 | www.childabuseprevention.com.au |
| Relationships Australia Crisis Line | 1300 364 277 | www.relationships.org.au |
| 1800 RESPECT | 1800 737 732 | www.1800respect.org.au |

# 3 ඉංග්‍රීසි භාෂාව

## මෙම කොටසේදී

- පරිවර්තන සහ කථා/භාෂන පරිවර්තන සේවා (TIS National)
- ඉංග්‍රීසි ඉගෙනීම

## පරිවර්තන හෝ කථා/භාෂණ පරිවර්තන සේවා (TIS National)

### කථා/භාෂණ පරිවර්තනය

පරිවර්තන සහ කථා/භාෂණ පරිවර්තන සේවා (TIS National) එසැණ දුරකථන පරිවර්තන සේවා සපයයි. භාෂා සහ උපභාෂා 160කට වැඩි ප්‍රමාණයකින් පරිවර්තකයෝ සිටිති. ඔබේ භාෂාවෙන් කතා නොකරන අයෙකු සමග සන්නිවේදනය කිරීමට ඔබට අවශ්‍ය නම්, TIS National සේවාවට ඔබට උදව් කිරීමට හැකිය.

දුරකථන පරිවර්තකයන්ගේ සේවය දවසේ පැය 24මත් සතියේ දින හතේමත් ලබා ගත හැකි අතර, ඔවුන්ට හදිසි අවස්ථාවකදී ද ඔබට උපකාර කළ හැකිය. ඔබට රාජ්‍ය ආයතන, ප්‍රජා කණ්ඩායම් සහ ව්‍යාපාර සමග සන්නිවේදනය කිරීමට TIS National සේවාව භාවිත කළ හැකිය.

සාමාන්‍යයෙන්, TIS National සේවාව ඉංග්‍රීසි කතා නොකරන අයට නොමිලේ සැපයේ. ඔබ රාජ්‍ය දෙපාර්තමේන්තුවක් සමග සන්නිවේදනය කරන්නේ නම්, එම ආයතනය පරිවර්තකයාගේ ගාස්තුව දැරිය යුතු වේ. සමහර ව්‍යාපාර සහ ප්‍රජා සේවා ද භාෂා පරිවර්තන සේවා නොමිලේ සපයයි.

TIS National පරිවර්තකයකු සම්බන්ධ කරගැනීම සඳහා 131 450 අමතා දුරකථන ක්‍රියාකරුට ඔබ කථා කරන භාෂාව දන්වන්න. දුරකථන ක්‍රියාකරු පරිවර්තකයකු අමතනු ඇත. ඔබ පරිවර්තකයාට සම්බන්ධ කෙරුණු පසු, ඔබට ඇමතීමට අවශ්‍ය ආයතනය සහ එහි දුරකථන අංකය ඔහුට දන්වන්න.

ඔබට ඇමතීමට අවශ්‍ය ආයතනය විවෘතව පවතින වේලාවන් තුළ (කාර්යාල වේලාවන්) දුරකතන ඇමතුම ගැනීමට ඔබට සිදු වනු ඇත.

ඔබට වෛද්‍ය හමුවක් සඳහා භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම්, දුරකථන පරිවර්තකයකු පිළියෙළ කරගැනීමට දොස්තරවරුන්ගේ ප්‍රමුඛතා සේවාව (Doctor’s Priority Line) ඔස්සේ TIS National අමතන ලෙස ඉල්ලා සිටින්න. දොස්තරවරයෙකුට වෛද්‍ය මධ්‍යස්ථානය තුළදීම පරිවර්තකයකු පිළියෙළ කළ හැකිය. ඔසුසල්වලටද ඖෂධ පිළිබඳව ඔබ සමග කතා කිරීම සඳහා දුරකථන පරිවර්තකයකු භාවිත කළ හැකිය. මෙය රජය විසින් නොමිලේ සපයනු ලබන සේවාවකි.

පහත සඳහන් කණ්ඩායම් සමග සන්නිවේදනය කිරීම සඳහා නිදහස් දුරකථන පරිවර්තන සේවාව භාවිත කළ හැකිය:

- ලාභ ඉපයීම් සඳහා නොවන, රාජ්‍ය නොවන, ප්‍රජා සංවිධාන
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
- ප්‍රාදේශීය රාජ්‍ය අධිකාරීන් (වරිපණම්, කසළ එකතු කිරීම, සහ නාගරික සේවා පිළිබඳ ගැටලු සම්බන්ධයෙයන්)
- වෘත්තීය සමිති
- දේපළ වෙළඳ ආයතන

### TIS National සඳහා සේවය කිරීම

TIS National කොන්ත්‍රාත් පරිවර්තකයන් වශයෙන් සේවය කිරීමට කැමති ඕස්ට්‍රේලියානු නිත්‍ය පදිංචිකරුවන්ගෙන් සහ පුරවැසියන්ගෙන් අයදුම්පත් භාර ගනී. වැඩි විස්තර සඳහා www.tisnational.gov.au/en/Interpreters හි ඇති TIS National වෙබ් අඩවිය බලන්න.

### ඔබේ වැදගත් ලියකියවිලි පරිවර්තනය කර ගැනීම

සුදුසුකම් සහිත සංක්‍රමණිකයන්ට, තම ස්ථාපනයට අදාළ පෞද්ගලික ලියකියවිලි ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරවා ගැනීමට (උදාහරණ ලෙස උප්පැන්න හෝ මරන සහතික, රියදුරු බලපත්‍ර, සහ අධ්‍යාපන සහ වෘත්තීය ලියකියවිලි) හැකිය.

ඕස්ට්‍රේලියාවට පැමිණි පළමු වසර දෙක තුළ හෝ නිත්‍ය පදිංචිය ලැබීමෙන් වසර දෙකක් යනතුරු මෙම සේවාව නොමිලේ සැපයේ.

වැඩි විස්තර සඳහා බලන්න:

| TIS National සේවය | ඇමතුම් විස්තර |
|---|---|
| පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවය (TIS National) පැය 24 සේවය | 131 450 |
| TIS National වෙබ් අඩවිය | www.tisnational.gov.au/en/Non-English-speakers |
| ලියකියවිලි පරිවර්තන පිළිබඳ තොරතුරු | www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/settle-in-australia/help-with-english/free-translating-service |

### 'මට භාෂණ පරිවර්තකයකු අවශ්‍යයි' කාඩ්පත්

ඉංග්‍රීසි භාෂාව කතා නොකරන අයට රාජ්‍ය ආයතන, ප්‍රජා කණ්ඩායම් සහ ව්‍යාපාර සමග සන්නිවේදන කටයුතු කිරීමට අවශ්‍ය වූ විටෙකදී, පරිවර්තකයකු ඉල්ලීම සඳහා 'I need an interpreter' කාඩ් භාවිත කළ හැකිය. මෙම කාඩ්පතෙහි TIS National හි ඇමතුම් අංක ඇතුළත් වන අතර ඔබ කැමති භාෂාව ලියා තැබීමටද ඉඩක් වෙන්කොට ඇත. ඔබට භාෂණ පරිවර්තකයකු අවශ්‍ය වූ විටෙක මෙම කාඩ්පත පෙන්වන්න.

TIS National, තමන්ගේ සේවාදායකයින්ට ලබා දීම සඳහා, මෙම කාඩ්පත් රාජ්‍ය ආයතන, ප්‍රජා කණ්ඩායම් සහ ලාබ තකා ක්‍රියාත්මක නොවන සංවිධානවලට ලබා දේ.

ඔබට කාඩ්පතක් තැපැල් කරනු ලැබීමට කැමති නම්, tispromo@border.gov.au ලිපිනය ඔස්සේ TIS National වෙත විද්‍යුත් පණිවුඩයක් එවන්න.

### භාෂණ පරිවර්තක සංකේතය/ලකුණ

භාෂණ පරිවර්තන ලකුණ (ඉහත සහ මෙම පොතෙහි සෑම පිටුවකම ඇති) සීමිත ඉංග්‍රීසි දැනුමක් සහිත පුද්ගලයන්ට රාජ්‍ය සේවා භාවිත කිරීමේදී භාෂා සහාය ඉල්ලිය හැකි බව දන්වයි.

මෙම ලකුණ රජයේ රෝහල්වල, පොලිස් ස්ථානවල, රජයේ පාසැල්වල, ප්‍රජා මධ්‍යස්ථානවල, නිවාස සහ වෘත්තීය කාර්යාල, ප්‍රාදේශීය කවුන්සිල, සහ සංක්‍රමණ තොරතුරු මධ්‍යස්ථාන වැනි ස්ථාපන සේවා සපයන ආයතනවලත් ඔබට හමු වනු ඇත.

## ඉංග්‍රීසි භාෂා ඉගෙනුම

## Adult Migrant English Program (AMEP)

ඉංග්‍රීසි යනු ඕස්ට්‍රේලියාවේ ජාතික භාෂාවයි. ඕස්ට්‍රේලියාවේ ජීවත් වන මිනිසුන් බොහෝ භාෂා කථා කරති; එහෙත් ඕස්ට්‍රේලියානු ජීවිතයෙහි කොටස්කරුවකු වීමට නම් ඔබට ඉංග්‍රීසි භාෂාව කථා කිරීමට සහ තේරුම් ගැනීමට පුළුවන් විය යුතුය. ඉංග්‍රීසි භාෂාවෙන් තොරව, වැදගත් සේවා ලබා ගැනීමට මෙන්ම ස්වාධීන වීමටද ඔබට දුෂ්කර වනු ඇත. ඔබ ඕස්ට්‍රේලියාවේ රැකියාවක් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ද ඉංග්‍රීසි භාෂා නිපුණතාව ඉතා වැදගත් වනු ඇත.

ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියකු වීමට අදහස් කරන්නේ නම් ඉංග්‍රීසි කථා කරන්නේ කෙසේදැයි ඔබ උගත යුතු වනු ඇත.

Adult Migrant English Program (AMEP) යනු ඕස්ට්‍රේලියානු රජයේ අරමුදල් මත සුදුසුකම් සහිත සංක්‍රමණිකයන්ට සහ මානුෂීය පදනම මත පැමිණියවුන්ට පැය 510ක් දක්වා නොමිලේ ඉංග්‍රීසි භාෂා පාඨමාලා වැඩසටහනකි.

ඔබ වැඩිහිටි සංක්‍රමණිකයකු හෝ මානුෂීය පදනම මත පැමිණි ඕස්ට්‍රේලියාවේ ස්ථාපනය වන පුද්ගලයකු නම්, නිත්‍ය වීසා හෝ යෝග්‍ය තාවකාලික වීසා සහිත, ඉංග්‍රීසි භාෂාව ටිකක් කථා කරන හෝ කොහෙත්ම කථා නොකරන අයෙකු නම්, ඔබ AMEP සඳහා සුදුසු විය හැකිය. අවුරුදු 15-17 අතර සමහර සංක්‍රමණික යෞවන/යෞවනියන්ටද මේ සඳහා සුදුසුකම් තිබිය හැකිය. ඔබට වැඩි විස්තර සපයන [තොරතුරු පත්‍රිකාවක්](https://docs.education.gov.au/node/37165) https://docs.education.gov.au/node/37165 හි ඇත.

AMEP පන්තියකදී, ඔබ ඉංග්‍රීසි භාෂාව මෙන්ම ඕස්ට්‍රේලියානු සමාජය පිළිබඳව ද උගනිනු ඇත. ඔබට සමාන පසුබිම් සහිත, සමාන අත්දැකීම් සහ අරමුණු සහිත තවත් සංක්‍රමණිකයන් හමුවිය හැකි අතර අලුත් යහළුවන්ද හඳුනාගනු ඇත.

AMEP සේවාව ඕස්ට්‍රේලියානු රජයේ අනුමත සේවා සපයන්නන් හරහා සපයනු ලැබේ. වෙනත් භාෂාවන් කථා කරන පුද්ගලයන්ට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට පුහුණු කරනු ලැබූ ගුරුවරුන් පිරිසක් විසින් මෙම පන්තිවල ඉගැන්වීම් කටයුතු සිදු කරයි.

ඔබ මෙම සේවාවෙන් උපරිම ප්‍රතිඵල ලබා ගන්නේද යන්න තහවුරු කරනු වස් ඔබේ අවශ්‍යතාවන්ට වඩාත්ම ගැළපෙන පන්තිය තෝරා ගැනීමට සේවා සපයන්නා ඔබට උපකාරී වෙයි. දවසේ විවිධ කාලයන්හි (දිවා, සන්ධ්‍යා සහ සති අන්ත) පැවැත්වෙන, එසේම විවිධ ස්ථානයන්හි පැවැත්වෙන, පූර්ණකාලීන සහ අර්ධකාලීන පාඨමාලා ඇති හෙයින් ඔබට පහසු වේලාවක ඔබට සුදුසු තැනකදී ඉගෙනීමට හැකියාව ඇත. දුරස්ථ පාඨමාලා, ජාලගත පාඨමාලා සහ ගෙදරට පැමිණ ඉගැන්වීමේ අවස්ථා ද ඇත.

ඔබට ළමුන් ඇත්නම්, [AMEP child care](AMEP child care) ද බලන්න.

### *AMEP සඳහා වන වැදගත් කාලපරාස*

AMEP හරහා ඉංග්‍රීසි භාෂා උපකාරක පාඨමාලා ලබා ගැනීමට, ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් සය මසක් ඇතුළත හෝ ඔබ ඕස්ට්‍රේලියාවේ සිටීනම් වීසා ආරම්භ වීමෙන් සය මසක් ඇතුළත අනුමත AMEP සේවා සපයන්නකු සමග ඔබ ලියාපදිංචි විය යුතුය. ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් වසරක් ඇතුළත හෝ ඔබ ඕස්ට්‍රේලියාවේ සිටීනම් වීසා ආරම්භ වීමෙන් වසරක් ඇතුළත ඉංග්‍රීසි භාෂා පන්ති ආරම්භ කළ යුතුය.

AMEP හරහා ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් හෝ වීසා ලැබීමෙන් අනතුරුව වසර පහක කාලයක් ඇත. ඔබට විශේෂ අවශ්‍යතා ඇත්නම්, සීමිත පාසල් අධ්‍යාපනයක් හෝ දුෂ්කර පූර්ව-සංක්‍රමණ අත්දැකීම් ඇත්නම්, ඔබ අතිරේක පාඩම් සඳහා සුදුසුකම් ලැබිය හැකිය.

වැඩි විස්තර සඳහා:

| AMEP | ඇමතුම් විස්තර |
|---|---|
| Telephone | 13 38 73 |
| AMEP වෙබ් අඩවිය | www.education.gov.au/amep |
| ඊමේල් | skilling@education.gov.au |
| ඉංග්‍රීසි නොවන භාෂාවලින් තොරතුරු | www.education.gov.au/amep-information-other-languages |
| මට ඉංග්‍රීසි ඉගෙන ගත හැක්කේ කොහෙද? AMEP සපයන්නෝ සහ ඉගෙනුම් ආයතන | www.education.gov.au/adult-migrant-english-program-service-providers |

| AMEP | ඇමතුම් විස්තර |
|---|---|
| AMEP ජාලගතව (online) | http://amepdl.net.au |

AMEP සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වැඩිදුර අධ්‍යයන කටයුතු සැලසුම් කිරීමට ඔබේ සේවා සපයන්නාට උපකාර කළ හැකිය.

## Skills for Education and Employment (SEE)

ඔබ රැකියාවක් අපේක්ෂා කරන්නේ නම්, Skills for Education and Employment (SEE) වැඩසටහනට ඔබට සහාය විය හැකිය. අඩු සාක්ෂරතාව හෝ අඩු ඉංග්‍රීසි භාෂා දැනුම හේතුවෙන් රැකියාවක් සොයා ගැනීමටනොහැකි වැඩ කරන වයසේ රැකියා අපේක්ෂකයන්ට SEE පැය 800ක් දක්වා සාක්ෂරතාව, සංඛ්‍යා දැනුම සහ වෘත්තීය පුහුණුව නොමිලේ සපයයි. මෙම වැඩසටහන වසර දෙකක් දක්වා කාලයක් ඔබට උපකාර සපයයි.

සක්‍රියව රැකියාවක් අපේක්ෂා කරන සහ යෝග්‍ය ආදායම් සහන ගෙවීම් හෝ දීමනා ලබන පුද්ගලයන් පමණක් SEE සඳහා සුදුසුකම් ලබයි. සමහර පුද්ගලයෝ Adult Migrant English Program (AMEP) සම්පූර්න කිරීමෙන් අනතුරුව හෝ ඔවුන්ට AMEP සඳහා සුදුසුකම් නැතිනම් SEE පරිශීලනය කරති.

වැඩි විස්තර සඳහා Centrelink අමතන්න, නැතිනම් කාර්යාලයකට යන්න, ඔබේ වෘත්තීය සේවා සපයන්නාහට කතා කරන්න, නැත්නම් www.education.gov.au/skills-education-and-employment හි ඇති SEE වෙබ් අඩවියට යන්න.

5 වන පරිච්ඡේදය. රැකියාව කොටසද කියවන්න.

# 4 අධ්‍යාපනය සහ පුහුණුව

## මෙම කොටසේදී


- ළමා සුරැකුම්
- කෙළිහවුල්
- පාසල් සහ පෙරපාසල්
- තෘතීයික අධ්‍යාපනය සහ පුහුණුව
- National Training Complaints Hotline
- විශ්වවිද්‍යාල
- අධ්‍යාපන හෝ පුහුණු අවශ්‍යතා සඳහා සුදුසුකම් සහ නිපුණතා පිළිගැනීම
- ශිෂ්‍ය උපකාර ගෙවීම්
- ශිෂ්‍ය සහන කාඩ්පත්
- ප්‍රජාව සඳහා කෙටිකාලීන පාඨමාලා


ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම පිළිබඳ තොරතුරු අවශ්‍ය නම්, 3 වන පරිච්ඡේදයේ ඉංග්‍රීසි භාෂාව. කොටස කියවන්න.

## ළමා සුරැකුම්

ඔබට රැකියාවට යාමට. ඉගෙනීමට හෝ වෙනත් කටයුත්තකට යාමට අවශ්‍ය නම්, යමෙකුගේ විධිමත් ආරක්ෂාව යටතේ ඔබේ දරුවා තබා යා යුතුය - එය ළමා සුරැකුම යැයි හැඳින්වේ. හොඳම ළමා සුරැකුම හෝ පූර්ව ඉගෙනුම් සේවාවක් තෝරා ගැනීම පවුල්වලට දුෂ්කර කාර්යයක් විය හැකිය. එය ඔබේ පවුලේ අවශ්‍යතාවන්ට සහ ඔබ සහ ඔබේ දරුවාට වඩා හිතකර පරිසරය කුමක්ද යන්න මත තීරණය වේ. සියලු ළමා සුරැකුම් සපයන්නෝ සුදුසුකම් සහිත විය යුතුය; නොඑසේ නම්, සුදුසුකම් ලබා ගැනීම සඳහා ක්‍රියා කරමින් සිටිය යුතුය.

අලුතින් පැමිණි ළමුන්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට ළමා සුරැකුම බොහෝ ප්‍රතිලාභ ලබා දෙයි. බොහෝ ඕස්ට්‍රේලියානු පවුල් මෙම සේවාව ලබා ගනියි.

ළමුන්ගේ සමාජ, ආධ්‍යාත්මික සහ අධ්‍යාපන නිපුණතා වර්ධනය කරවීමට ළමා සුරැකුම් සහ පූර්ව ඉගෙනුම් සේවා උපකාරී වෙයි. විවිධ පසුබිම් සහිත ළමුන් ඉංග්‍රීසි ඉගෙන ගන්නා අතර ඔවුන්ගේ අලුත් පරිසරයට ද අනුගත වෙයි. උසස් තත්වයේ පූර්ව ළමාවිය ඉගෙනුම් සහ ළමා සුරැකුම් වැඩසටහන් ළමයාගේ සමස්ත වර්ධනය, අධ්‍යාපනය සහ පසුකාලීන දිවියේ වෘත්තීය ප්‍රතිඵල වැඩි කිරීමට හේතු වෙයි.

ළමා සුරැකුම හේතුවෙන් ඔබට පුහුණුවලට සහභාගී වීමට, අධ්‍යාපනය ලැබීමට හෝ රැකියාව සඳහා යාමට හැකි වෙයි; මෙය ඔබේ පවුලට උපකාරී වන අතර ඔබේ ස්ථාපනය සාර්ථක වීමටද හේතු වෙයි.

විවිධ ආකාරයේ ළමා සුරැකුම් සේවා ඇත. දිගුකාලීන දිවා සුරැකුම්, පවුල් දිවා සුරැකුම්, ප්‍රස්තාවික සුරැකුම් සහ ගෘහස්ථ සුරැකුම්, මෙන්ම නිවාඩු කාල සුරැකුම් සහ ප්‍රාථමික පාසැලි ශිෂ්‍යයන් සඳහා පාසැල් වේලාවෙන් පිටත සුරැකුම් ආදිය ඊට ඇතුලත් වේ.

- දිගුකාලීන දිවා සුරැකුම් (Long Day Care) සාමාන්‍යයෙන් මධ්‍යස්ථාන ආශ්‍රිත සුරැකුම් වන අතර ඒවා ළමා සුරැකුම් මධ්‍යස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා පිළියෙළ කළ ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිල්ලක කොටසක පවත්වාගෙන යනු ලැබේ.
- පවුල් දිවා සුරැකුම් (Family day care) යනු ලියාපදිංචි පාලිකාවක විසින් අනෙකුත් අයගේ ළමයින් සඳහා තමාගේ නිවසේදීම පවත්වාගෙන යන ළමා සුරැකුම් මධ්‍යස්ථානයි.
- ප්‍රස්ථාවික සුරැකුම (Occasional care) සුදුසු වන්නේ සෑම දිනකම ළමා සුරැකුම් අවශ්‍ය නොවන පවුල් සඳහාය.
- ගෘහස්ථ සුරැකුම (In-home care) යනු අනුමත පාලිකාවක ළමයාගේ නිවසටම පැමිණ සපයන නම්‍යශීලී සුරැකුම් සේවාවකි. යම් යම් තත්වයන්වල සිටින ළමුන් සඳහා පමණක් මෙම සේවාව සැපයේ.

- ළමා සුරැකුම් මධ්‍යස්ථාන තුළදී ළමයින් පාසැල් අධ්‍යාපනය සඳහා සූදානම් කරන පෙරපාසැල් හෝ බාලාංශ වැඩසටහන්වලටද ළමුන්ට සහභාගි විය හැකිය. මේවා [White Pages](#) දුරකථන නාමාවලියෙහි ලැයිස්තුගත කොටඇත.

1800 670 305 ඔස්සේ National Child Care Access Hotline අමතන්න, නැත්නම්, පහත සඳහන් දේ පිළිබඳව දැන ගැනීමට www.mychild.gov.au හි ඇති [MyChild](#) (මගේ දරුවා) වෙබ් අඩවියට යන්න.

- ඔබේ ප්‍රදේශයේ ඇති අනුමත ළමා සුරැකුම් සේවා
- ළමා සුරැකුම් වර්ග සහ පවතින පුරප්පාඩු
- අනුමත ළමා සුරැකුම් සඳහා රාජ්‍ය උපකාර/දීමනා
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා සේවා
- විවිධ සංස්කෘතික පසුබිම් සහිත ළමුන් සඳහා වන සේවා

| ජාතික ළමා සුරැකුම් තොරතුරු | වෙබ් අඩවිය |
|---|---|
| [ළමාසුරැකුම් මධ්‍යස්ථානයක් සොයා ගන්න](#) | www.mychild.gov.au |
| [ළමාසුරැකුම් ගාස්තු සඳහා](#) රාජ්‍ය සහාය | www.humanservices.gov.au/childcare |
| රාජ්‍ය දීමනා පිළිබඳ [වෙනස්කම්](#) | www.education.gov.au/jobsforfamilies |
| Department of Education and Training, [පූර්ව ළමාවිය සහ ළමා සුරැකුම්](#) | www.education.gov.au/early-childhood-and-child-care |
| ඔබේ පවුලට [සුදුසු සුරැකුම තෝරා ගැනීම](#) | https://docs.education.gov.au/node/29716 |

## AMEP ළමා සුරැකුම

Adult Migrant English Program (AMEP) වැඩ සටහන, AMEP පන්තිවලට සහභාගී වන දෙමාපියන්ගේ පාසැල් යන වයසට අඩු ළමයින් සඳහා, දෙමාපියන් අදාළ පන්තිවලට සහභාගී වන අතරතුර, නොමිලේ ළමා සුරැකුම් සේවා සපයයි. වෙනත් වැඩසටහන්වලින් මෙම සේවාව නොසපයන හෙයින් AMEP සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔබට ළමා වෙනත් සුරැකුම් විධිවිධාන සලසා ගැනීමට සිදු වනු ඇත.

## ළමා සුරැකුම් සේවාවේ වැඩ කිරීම

ළමයාට හොඳම රැකවරණය ලැබෙන්නේද යන්න තහවුරු කරනු වස්, ඕස්ට්‍රේලියාවේ ළමා සුරැකුම් සේවාව ඉතා හොඳින් නියාමනය කෙරේ. ඕස්ට්‍රේලියානු මධ්‍යම රජය සහ ප්‍රාන්ත සහ පළාත් ආණ්ඩු ළමා සුරැකුම සම්බන්ධයෙන් පොදුවේ වගකිව යුතුය.

ළමා සුරැකුම් සේවා සහ ඒවායේ සේවය කරන ගුරුවරුන්ට ළමා අධ්‍යාපනය, නිරාපදාව (safety) සහ යහපැවැත්ම (well being), සහ ළමා සුරැකුම් ගෙවීම් ඇතුළු විවිධ නීති-රීතිවලට අනුගත වීමට සිදු වේ.

විධිමත් ළමා සුරැකුම් ක්‍රියාකාරකමක යෙදීමට ඔබට සිදු වුවහොත්, මෙම නීති-රීති සහ වෙනත් වගකීම් පිළිබඳව සැලකිලිමත් වන්න. ඉගැන්වීම සහ සුරැකුම පිළිබඳ අනුමත සුදුසුකමක් ඔබට තිබීම හෝ ලබා ගැනීමට ක්‍රියා කිරීම ද වැදගත්ය; ආදර්ශ වශයෙන් Technical and Further Education (TAFE) වැනි Registered Training Organisation හරහා ලබා ගන්නා Certificate III in Children's Services (ළමා කටයුතු පිළිබඳ තෙවැන පෙළ සහතිකය) තිබිය යුතුය.

ඔබ ඔබේ ආදායම Centrelink එකට සහ Australian Taxation Officeට දැන්විය යුතුය. මෙම අවශ්‍යතා සියලුම ආකාරයේ ළමා සුරැකුම්වලට අදාළය.

ඔවුන්ගේ වගකීම්වලට අනුගත නොවන ළමා සුරැකුම් සේවා සහ ගුරුවරුන්ට දැඩි දඬුවම් හිමි වේ; මූල්‍යමය දඬවල සිට අපරාධ පරීක්ෂණය සහ අධිකරණ ක්‍රියාමාර්ග දක්වා වන දඬුවම් මීට ඇතුළත් වේ.

ළමා සුරැකුම් ගුරුවරයෙකු වීම සම්බන්ධයෙන් වැඩි විස්තර දැන ගැනීම සඳහා, ඔබේ ප්‍රාන්ත හෝ පළාත් රජයේ අධ්‍යාපන දෙපාරත්මේන්තු වෙබ් අඩවියට යන්න.

## කෙළිහවුල්

කෙළිහවුල යනු මව්වරුන්, පියවරුන්, ආච්චි-සීයා, ළමා සුරැකුම් සේවකයන්, ළමුන් සහ ළදරුවන් නිස්කලංක පරිසරයක එකට එකතු වන අවිධිමත් සැසියකි.

නවමු අත්දැකීම්වලට සහභාගී වීම සහ වෙනත් ළමුන් සමගින් එකතු වීම මගින් ළමයාගේ ඉගෙනීමට සහ සංවර්ධනයට කෙළිහවුල් උපකාරී වේ. ක්‍රමානුකූල සමාජ ක්‍රියාකාරකම්වලට සහ ප්‍රාදේශීය ප්‍රජාව සමග සම්බන්ධ වීමට අවස්ථාව සපයන බැවින් කෙළිහවුලකට සහභාගී වීමෙන් පවුල් හුදෙකලා වීම අඩු වේ.

කෙළිහවුල් විවිධ ස්ථානවලදී හමු වන අතර ඒවා සංවිධානය කරනු ලබන්නේ දෙමාපියන් සහ සුරැකුම් සපයන්නන් විසිනි. මෙම හවුල්වලට එක් වීමට තීරණය කිරීමට පෙර එවැනි හමුවකට නොමිලේ සහභාගී වී බැලීමට ඔබට හැකිය. එක් එක් කණ්ඩායමේ හැටියට, කෑම බීම වියදම සහ චිත්‍ර උපකරණ සඳහා සෑම හමුවකදීම සුළු මුදලක් ගෙවීමට ඔබට සිදු විය හැකිය.

1800 171 882 ඔස්සේ Playgroup Australia අමතන්න, නැතිනම්, කෙළිහවුලක් සොයා ගැනීම සඳහා www.playgroupaustralia.com.au/ වෙබ් අඩවියට යන්න.

## පාසැල් සහ පෙර පාසැල්

පාසැලට ඇතුළත් වීමට වසරකට පෙර සියලුම ළමුන්ට පෙරපාසැල් හෝ බාලාංශ පාසැල් (kindergarten) යා හැකිය. පාසැලට ඇතුළත් වීමට පෙර ළමයාට ශාරීරිකව, මානසිකව සහ ආධ්‍යාත්මිකව සංවර්ධනය වීමට පෙරපාසැල් උපකාරී වෙයි.

අවුරුදු පහේ සිට 10 වන වසර සම්පූර්ණ කරන තෙක් සියලු ළමුන් අනිවාර්යයෙන් පාසැල් යා යුතුය. 10 වන වසරට පසුව, වයස අවුරුදු 17 ක් වන තුරු ඔවුහු පූර්ණකාලීන අධ්‍යාපනය, පුහුණුව හෝ රැකියාවක නැත්නම්, මේ දෙකෙහිම (අඩුම තරමින් සතියකට පැය 25ක්) නිරත විය යුතුය.

සාමාන්‍යයෙන්, අවුරුදු 12 ක් හෝ 13ක් වනතුරු ළමෝ ප්‍රාථමික පාසැල් යන අතර ඊළඟට අවුරුදු 17 හෝ 18 වනතෙක් උසස් පාසැල (ද්විතීයික පාසැල) ට යති. සමහර කොලීජි (ජ්‍යෝෂ්ට ද්විතීයික පාසැල්) උසස් පාසැල් අවසාන විභාගය සඳහා පෙනී සිටින සිසුන් සඳහා පමණි.

ඔබට ඔබේ දරුවා රාජ්‍ය හෝ රාජ්‍ය-නොවන පාසැලකට යැවිය හැකිය. පාසැල් White Pages වල ලැයිස්තුගත කර ඇත.

රාජ්‍ය පාසැල් නොමිලේ අධ්‍යාපනය සපයයි. කෙසේ වුවත්, බොහෝමයක් පාසල් අධ්‍යාපන සහ ක්‍රීඩා වැඩසටහන් සඳහා කුඩා වාර්ෂික ගාස්තුවක් අය කරයි. දෙමාපියන්ට පෑන්, පැන්සල්, පෙළපොත් සහ නිල ඇඳුම් වැනි අතිරේක කළමනා සැපයීමට සිදු වනු ඇත.

තාවකාලික වීසාධාරී ශිෂ්‍යයන්ට සම්පූර්ණ පාසල් ගාස්තු ගෙවීමට සිදු වේ - අදාළ පැසලෙන් අසා දැන්ගන්න.

රාජ්‍ය-නොවන පාසල් ගාස්තු අය කරයි; එසේම ඔවුන්ට ආගමික සම්බන්ධතාවක් හෝ විශේෂිත අධ්‍යාපන දර්ශනයක් තිබිය හැකිය. පෞද්ගලික අධ්‍යාපනය පිළිබඳ දැන ගැනීමට, තෝරාගත් පාසල සෘජුවම අමතන්න, නැත්නම් අදාළ රාජ්‍ය නොවන අධයාපන අධිකාරිය සමග හමුවක් යොදා ගන්න.

ඔබට පූර්ව-පාසැල් හෝ අපර-පාසල් හෝ පාසැල් නිවාඩු දිනවල ළමා සුරැකුම් අවශ්‍ය නම්, පාසැලෙන් විමසන්න.

## ලියාපදිංචිය

ඔබේ දරුවා පාසලකට ඇතුළත් කරගැනීම සඳහා, අදාළ පාසලට දුරකථනයෙන් කථා කරන්න, නැත්නම් පාසලට යන්න. ඔබට ඔබේ වීසා බලපත්‍රය හෝ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමේ ලියකියවිලි, දරුවාගේ උප්පැන්න සහතික, සහ පාසැල් වාර්තා ඇතුළු ඔවුන්ගේ පූර්ව අධ්‍යාපනයට සම්බන්ධ ඕනෑම ලියවිල්ලක් ඇත්නම් ඒවා ගෙන යා යුතුය. ඔබට ඔබේ දරුවාගේ ප්‍රතිශක්තිකරණ වාර්තාද පෙන්වීමට සිදු වේ. 9 වන පරිච්ඡේදයේ *සෞඛ්‍යය සහ යහ පැවැත්ම* කියවන්න.

පාසැලක් තේරීම දුෂ්කර ක්‍රියාවක් විය හැකිය. ප්‍රාදේශීය පාසැල් පිළිබඳව www.myschool.edu.au/ හි ඇති MySchool වෙබ් අඩවියෙන් වැඩි විස්තර දැන ගත හැකිය.

## ඉංග්‍රීසි භාෂාව කථා නොකරන පාසැල් ළමුන්

ඕස්ට්‍රේලියාව තුළ ඉංග්‍රීසි ඉගෙනීමට ඇති උපකාර සේවා විවිධය. වැඩි විස්තර සඳහා ප්‍රාන්ත හෝපළාත් අධ්‍යාපන අධිකාරිය හෝ ඔබේ දරුවාගේ පාසැල අමතන්න.

| ප්‍රාන්තය හෝ පළාත | තොරතුරු | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | Education and Training Directorate | www.det.act.gov.au/teaching_and_learning/english-as-an-additional-language-or-dialect |
| NSW | Department of Education | www.schools.nsw.edu.au/gotoschool/a-z/esl.php |
| NT | Department of Education | https://nt.gov.au/learning/international-students-and-migrants/english-as-a-second-language-students |
| Qld | Department of Education and Training | http://education.qld.gov.au/schools/about/support.html |
| SA | Department for Education and Child Development | www.sa.gov.au/topics/education-skills-and-learning/schools/curriculum-and-learning/student-support-programs/english-as-a-second-language |
| Tas. | Multicultural Access Point | www.multicultural.tas.gov.au/education_and_english |
| Vic. | Department of Education and Training | www.education.vic.gov.au/school/teachers/teachingresources/diversity/eal/Pages/ealnewstudent.aspx |
| WA | Department of Education | http://det.wa.edu.au/curriculumsupport/eald/detcms/navigation/program-information/eal-d-school-programs/ |

## පාසැලේදී කථා පරිවර්තකයන්

ඉංග්‍රීසි භාෂාව යම්තම්න් කතා කන හෝ කොහොමවත් කතා නොකරන දෙමාපියන් සහ භාරකරුවන්ට ඔවුන්ගේ දරුවන් පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමේදී, පරිවර්තකයකුගේ සහාය ලබාගත හැකිය. පාසැල සමග කතා කිරීමට කලින්, 131 450 (දවසේ පැය 24ම, සතියේ දින හතේම) ඔස්සේ TIS National අමතන්න, නැත්නම්, www.tisnational.gov.au වෙබ් අඩවියට යන්න.

## තෘතීයික අධ්‍යාපනය සහ පුහුණුව

Vocational Education and Training (VET) (තෘතීයික අධ්‍යාපනය සහ පුහුණු) පාඨමාලා පැවැත්වෙන්නේ තාක්ෂණික හෝ ශිල්පීය නිපුණතා, හෝ විශේෂිත රැකියාවක් සඳහා නිපුණතා අවශ්‍ය පුද්ගලයන් සඳහාය. තොරතුරු

තාක්ෂණය, ව්‍යාපාරික සේවා, කලා සහ මාධ්‍ය, සංචාරක සහ සත්කාරක, ළමා සුරැකුම්, ප්‍රවාහන සහ බෙදාහැරීම්, ගොඩනැගිලි, කැණීම්, නිෂ්පාදන සහ පිටිසර කර්මාන්ත වැනි ක්ෂේත්‍රවලට අදාළ බොහෝ තෘතීයික පුහුණු පාඨමාලා ඇත.

VET අධ්‍යාපනය ලබා ගැනීමට පෙර, ඔබ හැදෑරීමට කැමති පාඨමාලා පිළිබඳ සොයා බැලීමක් කළ යුතු අතර, ඕස්ට්‍රේලියාවේ රැකියා සඳහා දැනට ඉල්ලීමක් ඇත්තේ කවර නිපුණතාවලටදැයි ද බැලිය යුතුය. MySkills වෙබ් අඩවිය www.myskills.gov.au හිලා මෙම පර්යේෂණය සඳහා උපකාර වන තොරතුරු සපයයි.

MySkills වෙබ් අඩවිය ඕස්ට්‍රේලියාවෙහි VET පාඨමාලා ලබා දෙන පුහුණු ආයතන පිළිබඳ තොරතුරු සපයයි. මීට ඇතුළත් වන්නේ Technical and Further Education (TAFE) ආයතන, Adult and Community Education (ACE) සමාගම්, සහ Private Registered Training Organisations (RTOs) ය.

ද්විතීයික පාසැල් ළමුන්ට පාසැලේ අවසන් වසරවලදී VET පාඨමාලා හැදෑරීමට අවස්ථාව ඇත. VET පාඨමාලා සඳහා ගාස්තුවක් අය කෙරෙන අතර ශිෂ්‍යයන්ට පොත්පත්, උපකරණ සහ ආම්පන්න මිලදී ගැනීමට සිදු වෙයි. සමහර පාඨමාලා සඳහා සුදුසුකම් ලැබීමට ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම අනිවාර්යය.

ඩිප්ලෝමා මට්ටමේ සහ ඊට ඉහළ VET පාඨමාලාවලට අනුයුක්ත වී ඇති සුදුසුකම් සහිත ශිෂ්‍යයන් සඳහා ඕස්ට්‍රේලියානු රජය VET FEE-HELP ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙයි. VET FEE-HELP ශිෂ්‍යයන්ට මූල්‍යාධාර සපයන හෙයින් ඔවුන්ට මුලින් පාඨමාලා ගාස්තු ගෙවීමට සිදු නොවේ. VET FEE-HELP ලබන ශිෂ්‍යයන් ඔවුන්ගේ ආදායම ආපසු ගෙවීමේ සීමාවට පැමිණි පසු බදු ගෙවීම් හරහා VET FEE-HELP ණය ආපසු ගෙවිය යුතුය. මෙම ණය සඳහා අයදුම් කිරීමේදී, ඊට අත්සන් කිරීමට පෙර, සියලුම වගකීම් සහ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම ඔබේ වගකීමයි. VET FEE-HELP පිළිබඳ වැඩි විස්තර සඳහා http://studyassist.gov.au/sites/studyassist/helppayingmyfees/vet-fee-help/pages/vet-fee-help වෙබ් අඩවියට යන්න.

| කළාපය | VET තොරතුරු | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ජාතික | My Skills Training Directory | | www.myskills.gov.au |
| ACT | Skilled Capital | 02 6205 8555 | www.skills.act.gov.au/?q=skills-training-act |
| NSW | Smart and Skilled | 1300 772 104 | www.smartandskilled.nsw.gov.au |
| NT | Northern Territory Training Entitlement | | https://nt.gov.au/learning/adult-education-and-training/vocational-education-and-training-VET |
| | Department of Business | 08 8999 5511 | http://www.vet.nt.gov.au/ |
| Qld | Skills Gateway | 1300 369 935 | www.skillsgateway.training.qld.gov.au |
| SA | Work Ready | 1800 506 266 | www.skills.sa.gov.au/training-learning |
| Tas. | Skills Tasmania | | http://www.skills.tas.gov.au/learners |
| Vic. | Victorian Training Guarantee | 13 1823 | www.education.vic.gov.au/training/learners/vet/pages/funding.aspx |

| කලාපය | VET තොරතුරු | දුරකථනය | වෙබ් අඩවිය |
| --- | --- | --- | --- |
| WA | Future Skills | 08 6551 5000 | www.futureskillswa.wa.gov.au/studentsparents/Pages/default.aspx |

සුදුසුකම් සහ නිපුණතා පිලිගැනීම සම්බන්ධ වැඩි විස්තර සඳහා 5 වන පරිච්ඡේදයෙහි රැකියාව කියවන්න.

## National Training Complaints Hotline

National Training Complaints Hotline යනු පාරිභෝගිකයන්ට තෘතීයික අධ්‍යාපනය සහ පුහුණුව සම්බන්ධ පැමිණිලි ලියාපදිංචි කිරීමට හැකි ජාතික සේවාවකි. මෙම සේවාව පාරිභෝගිකයන් ඔවුන්ගේ පැමිණිලිවලට අදාළව සහය දීම සඳහා අදාළ ආයතනය/අධිකාරිය/අධිකරණය වෙත යොමු කරයි.

ඕස්ට්‍රේලියානු, ප්‍රාන්ත සහ පළාත් රජයන්ද ඇතුළත්ව බොහෝ ආයතන සම්බන්ධ හෙයින් තෘතීයික අධ්‍යාපනය සහ පුහුණුව අංශය සංකීර්ණය. පාරිභෝගිකයන්ට සිය පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අනාකූලිත සහ සරල මාර්ගයක් තිබිය යුතුය.

Hotline පැමිණිලි ගැන පරීක්ෂණ නොපවත්වයි; එහෙත්, වඩාත්ම සුදුසු ආයතනයට, අධිකාරියට හෝ අධිකරණයට එම පැමිණිලි සලකා බැලීම සඳහා යොමු කරවයි. Hotline පිළිබඳ වැඩි විස්තර https://www.education.gov.au/NTCH හි ඇත.

Hotline සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 8.00 සිට ප.ව. 6.00 දක්වා දීපව්‍යාප්තව ක්‍රියාත්මක වේ. දුරකථන අංකය වන්නේ 13 38 73ය. ලිඛිත පැමිණිලි skilling@education.gov.au ලිපිනයට යොමු කළ හැකිය. ඔබේ ඇමතුම් විස්තර ද ඇතුළත්ව ඔබට හැකි පමණ විස්තර ඇතුළත් කරන්න. එවිට ඔබේ පැමිණිල්ල හොඳින් විභාග කළ හැකිය.

131 450 ඇමතීමෙන් TIS National හරහා භාෂණ පරිවර්තන සේවාව ලබා ගත හැකිය. National Training Complaints Hotline ඉල්ලන්න.

### විශ්වවිද්‍යාල

ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාල ලෝකයේ හොඳම විශ්වවිද්‍යාල අතර සිටී. උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට සාමාන්‍යයෙන් වසර තුනක් ගත වේ; එහෙත් වැඩි කාලයක් වැය වන ද්විත්ව උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලාද ඇත. සමහර පාඨමාලා දුරස්ථව (ජාලගතව) සහ අර්ධකාලීනව ඉගෙනීමේ අවස්ථාවද ඇත. විශ්වවිද්‍යාල කෙටිකාලීන වෘත්තීය සංවර්ධන පාඨමාලා අවස්ථාද ලබා දේ.

ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපන බද්ධතිය පිළිබඳ වැඩිදුර හැදෑරීම සඳහා:

- ඔබ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට හෝ අධ්‍යාපනය ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලැබීමට සැලසුම් කරන්නේ නම්, www.studyinaustralia.gov.au වෙබ් අඩවියට යන්න.
- ඔබ දේශීය ශිෂ්‍යයකු හෝ මානුෂීය පදනම මත වීසා ලැබූවකු නම්, www.studyassist.gov.au වෙබ් අඩවියට පිවිසෙන්න.

ඔබට ඕස්ට්‍රේලියානු උසස් අධ්‍යාපන ආයතන සහ අධ්‍යයන ක්ෂේත්‍ර සංසන්දනය කිරීමට අවශ්‍ය නම්, www.qilt.edu.au වෙබ් අඩවියට යාමෙන් එසේ කළ හැකිය.

ඇතුළු වීමට සම්පූර්ණ කළයුතු අවශ්‍යතා, ඇතුළු වීමේ ගාස්තු සහ පාඨමාලා පිළිබඳ තොරතුරු සඳහා ඔබ ඇතුළු වීමට අපේක්ෂා කරන විශ්වවිද්‍යාලය හෝ ඔබේ ප්‍රාන්තයේ හෝ පළාතේ තෘතීයික අධ්‍යාපනයට ඇතුළත් කරගැනීමේ මධ්‍යස්ථානය අමතන්න. (http://studyassist.gov.au/sites/studyassist/mytertiarystudyoptions/courses_quals/pages/enrolling-in-a-course හි ඇත).

සීමිත ඉංග්‍රීසි දැනුමක් සහිත ශිෂ්‍යයෝ ඔවුන්ගේ විශ්වවිද්‍යාලය අමතා පාඨමාලාවට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා මට්ටම කුමක්දැයි විමසිය යුතුය. ඉගෙනීම් කටයුතු කරගෙන යාමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා දැනුම ඇති බවට සනාථ කර ගැනීම සඳහා ඔබ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇරඹීමට පෙර ඉංග්‍රීසි භාෂා පාඨමාලාවකට ලියාපදිංචි වීම අවශ්‍ය විය හැකිය.

විශ්වවිද්‍යාලය සහ පාඨමාලාව අනුව විශ්වවිද්‍යාල පාඨමාලා ගාස්තු වෙනස් වේ. ලියාපදිංචි වීමට පෙර, සම්පූර්ණ පාඨමාලා ගාස්තුව කොපමණද, ඔබ එය ගෙවන්නේ කෙසේද, පොත්පත් වියදම්, වාසස්ථාන සහ දෛනික ජීවන වියදම් දරන්නේ කෙසේද යන්න සිත බැලිය යුතුය.

අභ්‍යන්තර ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීම සඳහා උපකාරී වීමට, රජය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සහන සලසන අතර සුදුසුකම් සහිත ශිෂ්‍යයන්ට Higher Education Loan Program (HELP) ලබා දේ. සුදුසුකම් ලදහොත්, ඔබට පාඨමාලා ගාස්තු මුලින් ගෙවීමට සිදු නොවේ; නමුත් ඔබේ ආදායම අවම ආපසු ගෙවීමේ සීමාවට පැමිණි විට බදු ගෙවීම් හරහා ඔබේ HELP ණය පියවිය හැකිය. මෙම සීමාවන් වාර්ෂිකව දැනුම් දෙන අතර StudyAssist (www.studyassist.gov.au) ඔස්සේ දැනගත හැකිය.

## අන්තර්ජාතික ශිෂ්‍ය උපකාර

ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලබන අතරතුර ආධාර-උපකාර සඳහා ඔබ ඇමතිය යුතු පළමු ස්ථානය ඔබේ අධ්‍යාපන සහ පුහුණු ආයතනයයි. අන්තර්ජාතික ශිෂ්‍යයන් සඳහා ස්ථාපන විස්තර සොයා ගැනීමට www.studyinaustralia.gov.au/global/live-in-australia වෙබ් අඩවියට පිවිසෙන්න. පහත සඳහන් වෙබ් අඩවිද තොරතුරු සපයයි:

| අන්තර්ජාතික ශිෂ්‍ය තොරතුරු | වෙබ් අඩවිය |
|---|---|
| Department of Education and Training | www.internationaleducation.gov.au/ |
| Future Unlimited | www.studyinaustralia.gov.au/ |
| Immigration information | www.border.gov.au/Trav/Stud |

## අධ්‍යාපන සහ පුහුණු අවශ්‍යතා සඳහා සුදුසුකම් පිළිගැනීම

ඔබ ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය හැදෑරීමට හෝ පුහුණුවක් ලැබීමට කැමති නම්, පුහුණු පාඨමාලා සපයන්නකු, විශ්වවිද්‍යාලයක් හෝ නිපුණතා ඇගයුම් අධිකාරියක් හරහා ඔබේ සුදුසුකම් සහ විදේශ රැකියා පළපුරුද්ද විධිමත් පිළිගැනීමක් ලබා ගැනීම සුදුසුය. පාඨමාලාවට ඇතුළත් කරගැනීමේ සුදුසුකම් සැපිරීමට හෝ පුහුණුව සඳහා වැය වන කාලය අඩු කරගැනීම සඳහා ඔබට මෙය උපකාරී වනු ඇත.

සුදුසුකම් සහ නිපුණතා පිළිගැනීම පිළිබඳ වැඩි විස්තර සඳහා 5 වන පරිච්ඡේදයේ රැකියාව කොටස කියවන්න.

## ශිෂ්‍ය උපකාර ගෙවීම්

Youth Allowance (16-24 අතර වයස් කාණ්ඩයේ පුද්ගලයන් සඳහා) සහ Austudy (අවුරුදු 25 සහ ඊට වැඩි පුද්ගලයන් සඳහා) අනුමත පාඨමාලා හදාරන පූර්ණකාලීන ශිෂ්‍යයන් වන, එමෙන්ම ආදායම සහ වත්කම් යම් සීමාවකට වඩා අඩු ඕස්ට්‍රේලියානු නිත්‍ය පදිංචිකරුවන්ට මූල්‍යමය උපකාර සපයයි.

බොහෝ අලුතින් පැමිණි සංක්‍රමණිකයන්ට පොරොත්තු කාලයක් අදාළ වේ. සරණාගතයන් සහ මානුෂීය පදනම මත පැමිණියවුන් මෙම පොරොත්තු කාලයෙන් නිදහස් වේ. වැඩි විස්තර සඳහා www.humanservices.gov.au/customer/subjects/payments-students-and-trainees වෙබ් අඩවියෙහි ඇති Centrelink අමතන්න.

10 වන පරිච්ඡේදයෙහි ඇති ඔබේ පවුල කොටසද කියවන්න.

## ශිෂ්‍ය සහන ගාස්තු කාඩ්පත

සමහර ප්‍රාන්ත සහ පළාත්වල, පාසැල් සහ උසස් අධ්‍යාපන ශිෂ්‍යයන් පොදු ප්‍රවාහනය වැනි සේවා සඳහා ගෙවීම් කිරීමේදී වට්ටම් ලබා දෙන ශිෂ්‍ය කාඩ්පතක් සඳහා සුදුසුකම් ලබනු ඇත. ශිෂ්‍ය කාඩ්පතක් ලබා ගැනීමට ඔබේ පාසල හෝ ආයතනය අමතන්න.

## කෙටිකාලීන ප්‍රජා පාඨමාලා

Adult and Community Education (ACE) ප්‍රාදේශීය ප්‍රජාවන්හි වයස අවුරුදු 15 ට වැඩි පුද්ගලයන් සඳහා අධ්‍යාපන පාඨමාලා ලබා දෙයි. ACE පාඨමාලා සාමාන්‍යයෙන් ඉතා නම්‍යශීලී වන අතර විවිධ හැකියාවන් සහ පසුබිම් සහිත පුද්ගලයන්ට සුදුසු වේ. ආදර්ශ වශයෙන්, මෙම පාඨමාලාවක කාලය සතියකට පැය දෙකක් හෝ තුනක්, සති හයක් හෝ අටක් හෝ මුලුදින වැඩමුළු ආදි වශයෙන් වේ. නිරතුරුවම පාහේ මෙම පාඨමාලා සවස් කාලයේ හෝ සති අන්තවලදී පැවැත්වේ.

ACE පාඨමාලා සුදුසුකම් ලබානොදේ, එහෙත්, වඩා විධිමත් අධ්‍යාපනය සහ රැකියා සම්බන්ධ පුහුණුව සඳහා මාර්ගය විවර කරයි. ACE ට රැකියාවලට සම්බන්ධ නිපුණතා සහ සහතික ලබා දීමටත්, එමෙන්ම පුද්ගලික, ජීවන හෝ සමාජ අවශ්‍යතා සපිරීමටත් හැකිය.

සමහර කෙටිකාලීන පාඨමාලා පිළිගත් පාඨමාලා වන අතර මේවා දැනුම සහ නිපුණතා ලබා දීම සඳහා සැලසුම් කර ඇත; උදාහරණයක් වශයෙන්, තොරතුරු තාක්ෂණය, කුඩා ව්‍යාපාර සහ භාෂා සහ ක්‍රීඩා කලා විෂයයන්ට අනුගගත වේ.

Technical and Further Education (TAFE) සහ Vocational Education Training (VET) ආයතන පිළිගත් කෙටිකාලීන පාඨමාලා මෙන්ම විධිමත් ඇගයීම් නොමැති පිළිගැනීමක් රහිත කෙටිකාලීන පාඨමාලා ද ලබා දේ.

# 5 රැකියාව

## මෙම කොටසේදී

- රැකියා සෙවීම
- Centrelink
- සුදුසුකම් සහ නිපුණතා පිළිගැනීම
- වැඩබිමේදී අයිතිවාසිකම් සහ ආරක්ෂාව
- වැඩපළේදී සෞඛ්‍ය සහ නිරාපදාව
- විශ්‍රාම පාරිතෝෂික

## රැකියාවක් සොයා ගැනීම

ඕස්ට්‍රේලියානු කම්කරු වෙළඳපළ අතිශයින් තරඟකාරී විය හැකිය. ආර්ථික තත්වයන්, ඔබේ සුදුසුකම්, නිපුණතා සහ ඉංග්‍රීසි කථා කිරීමේ හැකියාව සහ ඔබ සොයන රැකියාවේ ස්වභාවය යන කරුණු ඔබට කොතරම් ඉක්මණින් රැකියාවක් සොයාගත හැකිවේද යන්නට බලපායි. ඕස්ට්‍රේලියාවේ විවිධ පළාත්වල රැකියා ලබා ගැනීමේ හැකියාව වෙනස් විය හැකිය.

දෛනික පුවත්පත් සාමාන්‍යයෙන් 'Job Vacancies' (හෝ 'Positions Vacant') පළ කරයි. රැකියා පුරප්පාඩු ජාලගතව (online)ද ලැයිස්තුගත කෙරේ. පුද්ගලික රැකියා ආයතන දුරකථන නාමාවලියෙහි සහ ජාලගත බඳවා ගැනීම කරන වෙබ් අඩවිවලත් ලැයිස්තුගත කෙරේ.

ඔබට ඕස්ට්‍රේලියාව පුරා ඇති රැකියා පුරප්පාඩු jobactive ඔස්සේ සෙවිය හැකිය; www.jobactive.gov.au/ හි ඇති jobactive ඕස්ට්‍රේලියාවේ විශාලතම ජාලගත රැකියා වෙබ් අඩවිවලින් එකකි.

ස්වේච්ඡා සේවයද රැකියාවක් සඳහා මංපෙත් හෙළි කරයි: 12 වන පරිච්ඡේදයේ *සිවිල් සහභාගීත්වය* කියවන්න.

## Centrelink

**Centrelink** රැකියා අපේක්ෂකයන් සඳහා ගෙවීම් සහ සේවා සපයයි. ඔබ රැකියාවක් සොයන්නේ නම් හෝ, අනුමත අධ්‍යාපන කටයුත්තක් සම්පූර්ණ කරමින් සිටින්නේ නම් හෝ, අනුමත ක්‍රියාකාරකමක යෙදෙමින් සිටින්නේ නම් ඔබට ආදායම් සහනාධාරයක් ලබා ගැනීමේ
හැකියාව ඇත.

| Centrelink | ඇමතුම් විස්තර |
|---|---|
| Centrelink වෙබ් අඩවිය | www.humanservices.gov.au |
| සංක්‍රමණිකයන්, සරණාගතයන් සහ ආගන්තුකයන් සඳහා උපකාර | www.humanservices.gov.au/multicultural |
| වෙනත් භාෂාවලින් තොරතුරු | http://humanservices.gov.au/yourlanguage |
| වෙනත් භාෂාවලින් විස්තර | 131 202 |
| දුරකථනමාර්ගිකව රැකියා සොයන්නෝ | 132 850 |

ඔබට රැකියාවක් සොයා ගැනීමට උපකාර වීම පිණිස Centrelink ඔබව jobactive හෝ Disability Employment Services වැනි රැකියා සේවා සපයන්නකු(Employment Services Provider) වෙත යොමු කළ හැකිය. ඔබ ජීවත් වන්නේ දුරබැහැර ප්‍රදේශයක නම්, ප්‍රජා සංවර්ධන සේ වාසපයන් (Community Development Program) නකු වෙත යොමු කෙරේ.

## jobactive

jobactive රැකියා අපේක්ෂකයෝ සේවායෝජකයන් සමග සම්බන්ධ කරති; මෙම සේවාව ඕස්ට්‍රේලියාව පුරා ස්ථාන 1700ක සිටින සේවා සපයන්නන් හරහා ලබා දෙනු ලැබේ. jobactive සේවා සපයන්නෝ ඔවුන්ගේ සේවාව සේවාලාභීන්ගේ අවශ්‍යතා අනුව සිදු කරති. සේවාලාභීන්ට රැකියාවක් සොයා ගැනීමට උදව් වනු පිණිස ඔවුහු ප්‍රාදේශීය සේවායෝජකයන්, ලියාපදිංචි පුහුණු ආයතන, රජය සහ ප්‍රජා සහ සෞඛ්‍ය සංවිධාන සමග කටයුතු කරති.

ඔබට පුහුණුව සහ රැකියා පළපුරුද්ද, නැවත පදිංචි වීමේ සහාය, වේතන සහනාධාර, පුහුණුව, ආධුනිකත්ව හෝ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා New Enterprise Incentive Scheme පරිශීලනය සඳහා උපකාර ලබාගත හැකිය. Help for jobseekers (රැකියා සොයන්නන් සඳහා උපකාර) www.employment.gov.au/jobactive-help-job-seekers වෙබ් අඩවියෙහි ඇත.

රැකියාවවක් සොයා ගැනීමට සහ එය තබා ගැනීමට නම් කළ යුත්තේ මොනවාදැයි දැක්වෙන රැකියා සැලසුමක් (Job Plan) සකස් කර ගැනීමට ඔබේ jobactive සැපයුම්කරු ඔබට උපකාර කරනු ඇත.

ඔබ සරණාගතයකු හෝ මානුෂීය පදනම මත පැමිණියකු නම්, පැමිණි දින සිටම රැකියා සේවා සඳහා ඔබ සුදුසුකම් ලබයි. අනෙක් සංක්‍රමණිකයෝ වඩා සීමිත රැකියා සේවා සඳහා සුදුසුකම් ලැබිය හැකිය. වැඩි විස්තර සඳහා Centrelink අමතන්න.

ඔබේ ප්‍රාදේශීය jobactive සපයන්නන් සොයා ගැනීම සඳහා www.jobactive.gov.au වෙබ් අඩවියට යන්න.

ඕස්ට්‍රේලියාවෙහි වැඩ කිරීමට නීතිමය හිමිකම් සහිත සියලු දෙනාට (අදාළ වෘත්තීය අවසරය සහිත ආගන්තුකයින්ද ඇතුළත්ව) ඇත ප්‍රදේශවල පළතුරු කැඩීමේ සහ වෙනත් අස්වනු නෙලීම ඇතුළත් භෝග නෙලීමේ රැකියා කළ හැකිය. Harvest Labour Services ඔවුන්ගේ සේවා jobactive හරහා ලබා දේ.

| jobactive | ඇමතුම් විස්තර |
|---|---|
| Job Seeker Hotline | 136 268 |
| jobactive වෙබ් අඩවි | www.jobactive.gov.au |
| jobactive ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂාවලින් විස්තර | www.employment.gov.au/translated-jobactive-factsheets |
| ඕස්ට්‍රේලියානු Labour Market Update ප්‍රකාශනය | http://employment.gov.au/australian-labour-market-update-publication |
| Harvest Labour Services Information | www.harvesttrail.gov.au |

පහත දැක්වෙන සේවාවන් ද උපකාරී විය හැකිය:

| ආයතනය හෝ සේවාව | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| Australian Apprenticeships | 13 3873 | www.australianapprenticeships.gov.au |
| Jobguide – තරුණ රැකියා සඳහා | | www.education.gov.au/job-guide |
| Experience+ –පරිණත වයසේ රැකියා | 13 1764 | www.employment.gov.au/job-seekers-0 |
| MyFuture – රැකියා සෙවීමේ උපදෙස් සපයන වෙබ් අඩවියකි | | http://myfuture.edu.au |

| ආයතනය හෝ සේවාව | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට උපකාර | 13 62 68 | www.employment.gov.au/self-employment-new-enterprise-incentive-scheme-neis |
| JobAccess – ආබාධ සහිත වෘත්තිකයන් සඳහා | 1800 464 800 | www.jobaccess.gov.au/people-with-disability |

## සුදුසුකම් සහ නිපුණතා පිළිගැනීම

ඔබට සුදුසුකම්, නිපුණතා හෝ කිසියම් රැකියාවක් සම්බන්ධ වෘත්තීය පළපුරුද්ද ඇත්නම්, ඔබට ඕස්ට්‍රේලියාව තුළදී රැකියාවක් ලබා ගැනීම සඳහා මෙම ප්‍රවීණතාවන් පිළිගනු ලැබීමට කැමති විය හැකිය. ඔබේ දැනුම සහ නිපුණතා පිළිගනු ලැබීම ඔබේ අනාගත රැකියා අවස්ථා සහ වෘත්තීය දියුණුව සඳහාද උපකාරී වනු ඇත.

ඔබ ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය හෝ පුහුණුවක් ලැබීමට සැලසුම් කරන්නේ නම්, පාඨමාලාවට ඇතුළත් වීමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා හෝ අධ්‍යයන කාලය අඩු කර ගැනීම සඳහා, ඔබේ සුදුසුකම් හෝ විදේශීය වෘත්තීය පළපුරුද්ද පිළිගනු ලැබීමට ඔබ කැමති විය හැකිය.

සුදුසුකම් පිළිගැනීමේ තොරතුරු සඳහා http://internationaleducation.gov.au/services-and-resources/pages/qualifications-recognition.aspx වෙබ් අඩවියට යන්න.

ඔබේ නිපුණතා සහ සුදුසුකම් අගයනු ලැබීමට සහ පිළිගනු ලැබීමට ක්‍රම කිහිපයක් ඇත:

### පූර්වකාලීන ඉගෙනුම් පිළිගැනීම

Recognition of Prior Learning (RPL) යනු යම් පුද්ගලයෙකු අධ්‍යාපනය, පුහුණුව, රැකියාව හෝ ජීවිත අත්දැකීම තුළින් ලබාගත් දැනුම සහ නිපුණතාව ඇගයීමේ සහ පිළිගැනීමේ ක්‍රියාවලියයි. ඔබට පූර්ණ හෝ අර්ධ ඕස්ට්‍රේලියානු සුදුසුකම් සැපයීමට ඊට හැකි වෙයි.

RPL ඇගයීම් මෙහෙයවනු ලබන්නේ ඕස්ට්‍රේලියානු Registered Training Organisations (RTOs) මගිනි. RTOවලට රජයට අයත් හෝ පුද්ගලික සේවා සපයන්නන් විය හැකි උසස් අධ්‍යාපනය සපයන ආයතන (විශ්වවිද්‍යාල) සහ වෘත්තීය අධ්‍යාපන ආයතන ඇතුළත් වේ.

ඔබට පහත සඳහන් දේ ඇත්නම් ඔබ RPL සඳහා සුදුසු විය හැකිය:

- විදේශීය සුදුසුකමක්.
- අදාළ අධ්‍යාපන ප්‍රකාශයක්.
- පඩි සහිත හෝ රහිත රැකියාවකින් ලත් පළපුරුද්ද, ජීවන අත්දැකීම් හෝ ප්‍රජා කටයුතුවලින් ලද රැකියා නිපුණතාව සහ දැනුම සම්බන්ධ සාක්‍ෂ්‍ය.

RTO එකකට හෝ ඒ වෙනුවෙන් ක්‍රියා කරන ඕස්ට්‍රේලියානු සුදුසුකම් ලත් ඇගයුම්කරුවෙකුට (පරීක්‍ෂකවරයෙකු) RPL ඇගයීමක් සිදු කළ හැකිය. ඔබ යම් විශේෂිත කාර්යයක් කරන අතරතුර පරීක්‍ෂකවරයා ඔබව නිරීක්‍ෂණය කරනු ඇති අතර ඔබේ නිපුණතාව පිළිබඳව ඔබ හා කතා කරනු ඇත. ඔවුහු ඔබේ සාක්‍ෂ්‍ය, පළපුරුද්ද සහ නිපුණතා (විධිමත් අධ්‍යාපනය සහ වෘත්තීය පළපුරුද්ද ඇතුළත්ව) අදාළ ඕස්ට්‍රේලියානු සුදුසුකම් හා සසඳනු ඇත. ඕස්ට්‍රේලියාවට ජාතික සුදුසුකම් රාමුවක් ඇත; එමනිසා සුදුසුකම් හෝ තීරණ පිළිගනු ලබන්නේ සියලු RTO මගිනි.

ඔබ විසින් සම්පාදනය කළ යුත්තේ කවර සාක්ෂ්‍යදැයි ඇගයුම්කරු විසින් දැනුම් දෙනු ඇත - උදාහරණයක් ලෙස, ඔබේ සුදුසුකම් හෝ පුහුණුවට අදාළ සහතික, සේව්‍යයාගේ නිර්දේශ, රැකියා විස්තර ප්‍රකාශය සහ රැකියා සාම්පල ඊට ඇතුළත් විය හැකිය.

සුදුසු අභ්‍යාස ආයතනයක් හඳුනාගත් පසු, ඔබේ RPL විකල්ප පිළිබඳ සහ ඔබේ නිපුණතා සහ පළපුරුද්ද ඇගයීමට සහ පිළිගැනීමට අදාළ යම් ගාස්තුවක් වේනම් ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට ඔබ අදාළ ආයතනය ඇමතිය යුතුය.

RTOවල ඇමතුම් විස්තර සහ පිහිටා ඇති ස්ථාන පහත සඳහන් වෙබ් අඩවිවලින් ඔබට සොයාගත හැකිය:

- MySkills – www.myskills.gov.au - ඔබේ ක්ෂේත්‍රයට අදාළය අගයනු ලැබිය හැකි වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු (VET) පාඨමාලා සොයා ගැනීමට.
- MyFuture – www.myfuture.edu.au විශ්වවිද්‍යාල ඇතුළත්ව සියලුම ඕස්ට්‍රේලියානු RTO වල ඇමතුම් විස්තර සහ RPL අයදුම්පත් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා

### නිපුණතා ඇගයුම් අධිකාරීන්

ඕස්ට්‍රේලියාවේ ප්‍රමිතීන්ට අනුගතව රැකියාවක හෝ වෘත්තීයක නිරත වීමට අවශ්‍ය නිපුණතා සහ පළපුරුද්ද යම් සංක්‍රමණිකයෙකුට ඇතිදැයි පරීක්ෂා කිරීම සඳහා නිපුණතා ඇගයුම් අධිකාරිය ඇගයීම් සහ පරීක්ෂණ පවත්වයි. මෙම සේවා සාමාන්‍යයෙන් සපයනු ලබන්නේ සංක්‍රමණ කාරණා සම්බන්ධයෙන් වන අතර, බොහෝ ආධිකාරීන් මගින් වෙනත් කාරණා සම්බන්ධයෙන්ද ඇගයීම් සහ පරීක්ෂණ ඉදිරිපත් කරනු ලබයි. මෙවා පහත කාරණා සම්බන්ධයෙන් ඔබට උපකාරී වෙයි:

- Australian Qualification Framework සුදුසුකමක් ලබා ගැනීමට.
- විශේෂිත රැකියාවන්හි නිරතවීමට අවශ්‍ය බලපත්‍ර සහ ලියාපදිංචිය ලබා ගැනීමට.
- වෘත්තීය ආයතනවල පිළිගැනීම ලබා ගැනීමට.

යම් යම් විශේෂිත වෘත්තීන් සම්බන්ධයෙන් විදේශයන්හිදී ලබාගත් සුදුසුකම්, නිපුණතා සහ පළපුරුද්ද අගයීමේ බලය සහිත ආයතන 37 ක් දැනට ඕස්ට්‍රේලියාවේ ඇත. ඔබේ රැකියාව හෝ වෘත්තිය යම් අධිකාරියක් මගින් ආවරණය වන්නේද යන්න සොයා බැලීම සඳහා www.border.gov.au/Trav/Work/Work/Skills-assessment-and-assessing-authorities හි දක්වා ඇති අධිකාරීන්ගේ ලැයිස්තුව බලන්න.

### Trades Recognition Australia - නිපුණතා පිළිගැනීම

Trades Recognition Australia (TRA) යනු ඕස්ට්‍රේලියානු රජයේ Department of Education and Training යටතේ පිහිටා ඇති ව්‍යාපාර ඒකකයකි. Australian Department of Immigration and Border Protection (DIBP) හි ලැයිස්තුගත කර ඇති තාක්ෂණික සහ කාර්මික රැකියා 130ක් පමණ ප්‍රමාණයක නිපුණතා ඇගයුම් අධිකාරියයි. අයදුම්කරුගේ තත්වය සහ ඔවුන්ගේ සංක්‍රමණ අවශ්‍යතාව මත වෙනස් වන විවිධ නිපුණතා ඇගයුම් සේවා රැසක් TRA ක්‍රියාත්මක කරයි.

TRA Trades Recognition Service සහ TRA Optional Skills Assessment Service වෘත්තීය සහ බලපත්‍ර කාරණා සම්බන්ධයෙන් නිපුණතා පිළිගැනීම සිදු කරයි. TRA මගින් අනුමත කළ Registered Training Organisations (RTOs) මෙම සේවා ඕස්ට්‍රේලියාව පුරා බෙදා හරියි. ඇගයීමකට පසුව, ඔබේ නිපුණතාව සුදුසුකමක් සමග හෝ, Offshore Technical Skills Record සමග හෝ සමර්ථතා සහතිකයක් මගින් විධිමත්ව පිළිගැනේ. ඒ අනුව ඔබට ඕස්ට්‍රේලියානු වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූල වීමට අවශ්‍ය අමතර පුහුණු පාඨමාලාවක් හැදෑරීමට හෝ බලපත්‍රයක් ලබා ගැනීමට සිදු වනු ඇත.

TRA නිපුණතා ඇගයීම ඔබට ගැළපෙන්නේදැයි දැන ගැනීමට www.tradesrecognitionaustralia.gov.au/PathFinder/Pages/default.aspx හි ඇති TRA Pathfinder වෙබ් අඩවියට පිවිසෙන්න.

ඔබ TradeSET පිළිබඳව සොයා බැලීමටද කැමති වනු ඇත. TradeSET යනු www.tradeset.com.au හි ලා ඔබට විධිමත් නිපුණතා ඇගයීමක් සිදු කළ යුතුද යන්න තීරණය කිරීමට ඔබට උපකාර කරන ගාස්තු විරහිත සේවාවකි.

| Trade Recognition Australia | ඇමතුම් විස්තර |
|---|---|
| දුරකථන (ඕස්ට්‍රේලියාවෙන් පිට) | +61 2 6240 8778<br>සඳුදා-සිකුරාදා, පෙ. ව. 10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා සහ ප.ව. 1.00 සිට ප.ව. 5.00 දක්වා AEST, රජයේ නිවාඩු දින හැර (ග්‍රිනිච් මධ්‍යාහ්න වේලාව + පැය 10) |
| දුරකථන (ඕස්ට්‍රේලියාව තුළ) | 1300 360 992<br>කාර්යාල වේලාවන් ඉහත පරිදිය |
| ඊ මේල් | traenquiries@education.gov.au |
| TRA වෙබ් අඩවිය | www.tradesrecognitionaustralia.gov.au |

### තෘතීයික සුදුසුකම් පිළිගැනීම

ඕස්ට්‍රේලියානු ප්‍රාන්තවල සහ පළාත්වල පිහිටුවා ඇති Overseas Qualification Units පොදු කාරණා (උදා: අත්‍යවශ්‍ය අධ්‍යාපන, සංක්‍රමණ හෝ වෘත්තීය අවශ්‍යතා සඳහා නොවේ) සඳහා විදේශීය සුදුසුකම් පිළිගැනීම සිදු කරයි. Australian Qualification Framework භාවිතයෙන් ඔබේ සුදුසුකම ඊට සමාන ඕස්ට්‍රේලියානු සුදුසුකමක් හා ගළපන ගාස්තු විරහිත සේවාවක් OQU සපයයි.

Department of Education and Training (DET) විදේශීය සුදුසුකම් සංසන්දනය පිළිබඳ සාමාන්‍ය තොරතුරු සහ උපදෙස් සපයයි. DET ඇමතීමට පෙර, ඔබේ ප්‍රාන්තයේ හෝ පළාතේ OQU වෙතින් මේ පිළිබඳව විමසා බලන්න. අවශ්‍ය වෙතොත් OQU ඔබව DET වෙත යොමු කරනු ඇත.

| ආයතනය | වෙබ් අඩවිය |
|---|---|
| Department of Education and Training | http://internationaleducation.gov.au/Services-And-Resources/services-for-individuals/Pages/Services-for-individuals.aspx |
| State and territory Overseas Qualification Units | http://internationaleducation.gov.au/services-and-resources/pages/qualifications-recognition.aspx |

ඔවුන්ගේ සුදුසුකම පිළිගනු ලැබීමට උපකාරක පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය විදේශීය සුදුසුකම් සහිත වෘත්තිකයෝ පාඨමාලා ගාස්තු සම්බන්ධ ආධාරයකට හිමිකම් කිව හැකිය. 1800 020 108 ඔස්සේ FEE-HELP අමතන්න; නැත්නම්, http://studyassist.gov.au/sites/StudyAssist/HELPpayingMyFees/FEE-HELP වෙබ් අඩවියට යන්න.

### වැඩබිමෙහි අයිතිවාසිකම් සහ ආරක්ෂාව

ඕස්ට්‍රේලියාවේ රැකියාවල නියුතු සියලුම දෙනා මූලික අයිතිවාසිකම්වලට සහ රැකියාව කරන අතරතුර ආරක්ෂාව ලැබීමට හිමිකම් කියයි.

මීට ඇතුළත් වන්නේ අඩුම වැටුප ගෙවීම, විවේක කාල, අසනීප නිවාඩු සහ ඔබේ වෘත්තිය ආවරණය වන ප්‍රදානයෙහි හෝ ගිවිසුමෙහි දක්වා ඇති අවම හිමිකමය.

Fair Work Ombudsman ඕස්ට්‍රේලියාවේ සේව්‍යයන්ට සහ සේවකයන්ට අදාළ වෘත්තීය නීති සම්බන්ධ උපදෙස් සහ තොරතුරු www.fairwork.gov.au වෙබ් අඩවියෙහි ලා නොමිලේ සපයයි. මේ තොරතුරු ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවලින්ද ඇත.

## අවම වැටුප

ඕස්ට්‍රේලියාවේ සියලුම සේවකයෝ අඩුම තරමින් අවම වැටුපවත් ලැබීමට හිමිකම් ඇත. ඔබ වැඩ කරන්නේ කිනම් ප්‍රාන්තයේද නැත්නම් පළාතේද, ඔබේ වයස, අදාළ වන සේවා ප්‍රදානය, සහ ඔබේ රැකියා කොන්ත්‍රාත්තුවේ ඇති විස්තර යන කාරණා මත ගනණ තීරණය වේ.

ඔබේ සේවායයා ක්‍රමානුකූලව ගෙවීම් සිදු කළ යුතු අතර ඔබේ වැටුපෙන් අනවශ්‍ය අඩුකිරීම් (බදු සහ විශ්‍රාම පාරිතෝෂික හැර) නොකළ යුතුය. ඔබ රැකියාවක් ආරම්භ කිරීමේදී අඩු කිරීම් පිළිබඳව පැහැදිලි කරන ලෙස ඔබේ සේවායයාගෙන් ඉල්ලා සිටින්න. ඔබේ වැටුපෙන් අඩු කිරීම් ඔබටද සැලසුම් කළ හැකිය.

පඩි ගෙවීමෙන් පසු කාර්යාල දිනක් ඇතුළත ඔබට වැටුප් වාර්තාවක් ලැබිය යුතුය.

## රැකියාවේ කොන්දේසි

ඕස්ට්‍රේලියාවේ සියලුම සේවකයන්ට අඩුම රැකියා කොන්දේසි සඳහා හිමිකම් ඇත. වැඩ කරන පැය ගණන, අතිකාල දීමනා, විවේක කාලයන්, ලෙඩ නිවාඩු සහ නිවාඩු දින මෙම ප්‍රමිතීන් මගින් ආවරණය වේ.

## නියෝජනයට ඇති අයිතිය

ඕස්ට්‍රේලියාවේ සියලුම සේවකයන්ට වෘත්තීය සමිතියකට සම්බන්ධ වීමට සහ ඒ මගින් නියෝජනය කරනු ලැබීමට අයිතියක් ඇත. කම්කරු සංගම් ඔවුන්ගේ සාමාජිකයන්ට පඩි, රැකියා කොන්දේසි සහ සේවාස්ථානයේ අයිතිවාසිකම් පිළිබඳව උපදෙස් සපයයි. ඔවුන් සේවාස්ථානයේ ප්‍රශ්න සම්බන්ධයෙන් උපකාරී වන අතර සාමාජිකයන්ගේ පඩි සහ රැකියා කොන්දේසි පිළිබඳව හාම්පුතුන් සමග කේවල් කරයි.

ඔබ වෘත්තීය සමිති සාමාජිකයෙකුද යන වග ඔබේ සේවායයාට කීම අවශ්‍ය නොවේ. ඔබ වෘත්තීය සමිතියක සාමාජිකයකු වීම හේතුවෙන් ඔබේ හාම්පුතා ඔබට අවාසිසහගත ලෙස සැලකීම හෝ ඔබව සේවයෙන් නෙරපීම හෝ නොකළ යුතුය.

ඔබට වෘත්තීය සමිතියකට බැඳීමට අවශ්‍ය නම් සහ බැඳිය යුත්තේ කිනම් සමිතියකටදැයි නොදනී නම්, www.australianunions.com.au වෙබ් අඩවියෙහි ඇති Australian Unions අමතන්න. Australian Unions යනු Australian Council of Trade Unions මගින් මෙහෙයවන සාමාජිකත්ව සහ උපදෙස් සේවාවකි. වැඩපළේදී ඔබේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව ඔබට ගැටලුවක් ඇත්නම් Australian Unions ට ඔබට උදව් කළ හැකිය.

## වෙනස්කම් සැලකීමට එරෙහි රැකවරණය

ඔබේ ජාතිය, ආගම, ස්ත්‍රී-පුරුෂ භාවය, ගර්භණීභාවය, ලිංගික මනාපය, ආබාධිතභාවය හෝ කම්කරු සංගමයක සාමාජිකයකු වීම වැනි හේතූන් පදනම් කරගෙන වැඩපළේදී සිදුවන වෙනස්කම් සැලකීමෙන් සහ 'පීඩාකාරී ක්‍රියාවන්ගෙන්' ඔබ ආරක්ෂිතය.

'පීඩාකාරී ක්‍රියාවන්' යනු යම් පුද්ගලයකු:

- රැකියාවට නොගැනීම
- රැකියාවෙන් පහ කිරීම
- පුහුණු අවස්ථා ලබා නොදීම
- උසස් වීම ලබා නොදීම
- අඩු වාසිසහගත රැකියා කොන්දේසි සහ වෘත්තීය නියමයන්ට යටත් කිරීමයි.

වෙනස්කම් සැලකීමට එරෙහි නීති පිළිබඳ වැඩිදුර විස්තර සඳහා www.humanrights.gov.au/employers/good-practice-good-business-factsheets/quick-guide-australian-discrimination-laws වෙබ් අඩවිය බලන්න.

පැමිණිල්ලක් කිරීම සඳහා www.humanrights.gov.au/complaints/complaint-guides/what-you-can-complain-about/complaints-about-discrimination-employment වෙබ් අඩවියට පිවිසෙන්න.

### වෙනත් වැඩපළ අයිතිවාසිකම්

ඔබේ රැකියාව පිළිබඳ යම් විමසීමක් හෝ පැමිණිල්ලක් (ඔබේ සේව්‍යයාට හෝ අදාළ අධිකාරියකට) කිරීම නිසා හෝ ඔබේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් නීති ක්‍රියාමාර්ග ගැනීම නිසා ඔබේ සේව්‍යයාට ඔබට අවාසිසහගත වන ආකාරයට කටයුතු කිරීමට හෝ සේවයෙන්
නෙරපීමට නොහැක.

### වැඩි විස්තර

ඔබට සුදුසු පඩිය, නිවැරදි කොන්දේසි සහ වැඩපළ අයිතිවාසිකම් ලැබෙන්නේද යන්න පිළිබඳව ඔබට සැකයක් ඇත්නම් හෝ ඔබේ සේව්‍යයා පිළිබඳ පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය නම්, ඒ සම්බන්ධ වැඩි විස්තර පහත සඳහන් ස්ථානවලින් ලබා ගත හැකිය:

| ජාතික ආයතන | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| Fair Work Ombudsman (ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂා) | 13 1394 | www.fairwork.gov.au/contact-us/language-help |
| Fair Work Ombudsman සංක්‍රමණිකයන් සහ වීසාධාරීන් සඳහා | | www.fairwork.gov.au/find-help-for/visa-holders-and-migrants |
| Australian Unions | 1300 486 466 | www.australianunions.com.au/ |
| Fair Work Commission | 1300 799 675 | www.fwa.gov.au/ |
| ඕස්ට්‍රේලියානු රජය | | www.australia.gov.au/information-and-services/jobs-and-workplace/working-conditions |
| Department of Immigration and Border Protection | | http://www.border.gov.au/Trav/Work/Work/workplace-rights |

### සේවාස්ථානයේ සෞඛ්‍ය සහ නිරාපදාව

සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂා සහිත සේවාස්ථානයක සේවය කිරීමට ඔබට අයිතියක් ඇත. සියලු සේවකයෝ ඔවුන්ගේ සේව්‍යයාගේ සෞඛ්‍ය සහ නිරාපදා පටිපාටීන් අනුගමනය කළ යුතුය.

ඔබ වැඩ කරන අතරතුර අනතුරකට ලක්වුයේ නම්, සේවකයන්ගේ වන්දි දීමනාවට ඔබ සුදුසුකම් ලැබිය හැකිය.

Work Health and Safety (WHS) නීති (Occupational Health and Safety යනුවෙන්ද හැන්වේ) සම්බන්ධ මූලික වගකීම ඇත්තේ ප්‍රාන්ත හෝ පළාත්වලටයි. මෙම නීති සේව්‍යයන්ගේ, රාජ්‍ය ආයතනවල සහ වැඩපළෙහි සෞඛ්‍යය සහ නිරාපදාව සම්බන්ධයෙන් වගකිව යුතු අනෙකුත් පාර්ශ්වවල කාර්යයන් නියම කරයි.

ඔබට ඔබේ වැඩපළ ආපදා සහිත වුවක් බව හැගේ නම්, අදාළ නියාමක හෝ වැඩපළෙහි සෞඛ්‍ය සහ නිරාපදා නියෝජිතයා (එවැන්නෙක් සිටී නම්) අමතන්න. ඔබේ සේවක සංගමය ඇමතීමටද ඔබට පුළුවන.

ප්‍රාන්ත සහ පළාත් නිරාපදා නියාමකයන් වන්නේ:

| කලාපය | සෞඛ්‍ය සහ නිරාපදා නියාමනය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | WorkSafe ACT | 02 6207 3000 | www.worksafety.act.gov.au |
| NSW | WorkCover NSW | 13 1050 | www.workcover.nsw.gov.au |

| කලාපය | සෞඛ්‍ය සහ නිරාපදා නියාමනය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| NT | NT WorkSafe | 1800 019 115 | www.worksafe.nt.gov.au |
| Qld | WorkCover Queensland | 1300 362 128 | www.worksafe.qld.gov.au |
| SA | SafeWork SA | 1300 365 255 | www.safework.sa.gov.au |
| Tas. | WorkSafe Tasmania | 1300 366 322 | www.worksafe.tas.gov.au |
| Vic. | WorkSafe Victoria | 1800 136 089 | www.worksafe.vic.gov.au |
| WA | WorkSafe Western Australia | 1300 307 877 | www.worksafe.wa.gov.au |
| ජාතික | Comcare | 1300 366 979 | www.comcare.gov.au |
| ජාතික | Safe Work Australia | 1300 551 832 | http://www.safeworkaustralia.gov.au/sites/swa/whs-information/working-safely-in-australia/pages/default |

පතල් කැණීම්, තෙල් සහ ගෑස් වැනි සමහර සමාගම්වලට වෙනස් නිරාපදා නියාමනයන් ඇත. රැකියා නියුක්තිකයන්ගේ වන්දි ගෙවීම් ඇතුළත් නියාමනයන් පිළිබඳ පූර්ණ ලැයිස්තුවක් සඳහා www.safeworkaustralia.gov.au/sites/swa/about/who-we-work-with/regulators/pages/whs-regulators වෙබ් අඩවියට යන්න.

## විශ්‍රාම පාරිතෝෂික

විශ්‍රාම පාරිතෝෂිකය යනු ඔබේ විශ්‍රාමය සඳහා ඉතිරි කරන ආකාරයකි. ඔබ සහ/හෝ ඔබේ සේව්‍යයා/ස්වාමියාට විශ්‍රාම පාරිතෝෂික අරමුදලට මුදල් බැර කළ හැකිය; මෙම මුදල් ඔබට වයස අවුරුදු 60 වූ විට ලබා ගත හැකිය.

බොහෝ අවස්ථාවලදී, ඔබේ ඉපයීම්වලින් සියයට නවයකට සමාන වන මුදලක් ඔබ තෝරාගත් විශ්‍රාම පාරිතෝෂික අරමුදලකට ගෙවීමට ඔබේ සේව්‍යයා නීතියෙන් බැඳී සිටී. මීට අමතරව ඔබටද ඔබේ විශ්‍රාම පාරිතෝෂිකයට මුදල් බැර කළ හැකිය. ඔබේ සේව්‍යයා නියමිත මුදල් ප්‍රමාණය ගෙවන්නේද යන්න දැන ගැනීම සඳහා ඔබේ විශ්‍රාම පාරිතෝෂික අරමුදල අමතන්න.

ඔබ ස්වයංරැකියාවක් කරන්නේ නම්, ඔබේ විශ්‍රාමය සඳහා අරමුදලකට මුදල් දැමීම ගැන ඔබ සිතිය යුතුය.

වැඩි විස්තර සඳහා:

| විශ්‍රාම පාරිතෝෂික තොරතුරු | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| Australian Taxation Office | 13 1020 | www.ato.gov.au/super |
| Australian Securities and Investments Commission | 1300 300 630 | www.moneysmart.gov.au/superannuation-and-retirement |

# 6 ඕස්ට්‍රේලියානු නීතිය

## මෙම කොටසේදී

ඕස්ට්‍රේලියාවේ සිටින සියලුම දෙනා ඕස්ට්‍රේලියානු නීතියට අවනත වීම අපේක්ෂා කෙරේ. වෙනත් රටවල නිවැරදියැයි පිළිගැණෙන සමහර දේ ඕස්ට්‍රේලියාවේදී නීතිවිරෝධී විය හැකි අතර ඒවාට දැඩි දඬුවම් ද නියම විය හැකිය.

ඕස්ට්‍රේලියානු නීති පිළිබඳ දැනීම ඕස්ට්‍රේලියානු ප්‍රජා ජීවිතයට අනුගත වීමට සහ ප්‍රශ්න ඇතිවීම වැළැක්වීමටත් ඔබට උපකාරී වනු ඇත.

- සාපරාධී වැරදි
- ප්‍රචණ්ඩත්වය
- ගෘහස්ථ සහ පවුල් ප්‍රචණ්ඩත්වය සහ ලිංගික අඩන්තේට්ටම්
- නීත්‍යානුකූලව ලිංගික සේවනය සඳහා කැමති වියහැකි වයස
- ළමා අයිතිවාසිකම්
- ළමා රැකවරණය
- බලහත්කාර විවාහය
- කාන්තා ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම්
- ගිනි අවි සහ පිහියා
- සතුන් සහ වනසතුන්
- දුම්බීම, මත්පැන් පානය සහ මත්ද්‍රව්‍ය
- පැළ හෝ සතුන් ආනයනය පිළිබඳ සීමා
- වෙනත් නීති
- නීති ආධාර

## සාපරාධී වැරදි

අපරාධයක් යනු නීතියට පටහැනි, දඬුවමට හේතු වන හැසිරීමක් හෝ ක්‍රියාවකි.

දරුණ අපරාධවලට ඇතුළත් වන්නේ මිනී මැරුම්, පහර දීම්, ලිංගික අඩන්තේට්ටම්, දේපළ හානි හෝ සොරකම්, ආයුධ සන්නද්ධ මංකොල්ලකෑම්, නීත්‍යානුකූලව ලිංගික සේවනයෙහි යෙදිය නොහැකි බාලවයස්කරුවන් සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීම, අනතුරුදායක ලෙස රිය පැදවීම, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම, භාවිතය හෝ විකිණීම සහ වංචාවයි. පොලීසිය හෝ ෆෙඩරල්, ප්‍රාන්ත හෝ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරියෙකුට අල්ලස් දීම (මුදල් ලබා දීම) හෝ දීමට තැත් කිරීම දැඩි දඬුවම් ලැබිය හැකි වරදකි. ඔබට වාසි සහගත වන සේ තීරණයක් ගැනීමට පෙළඹවීම සඳහා මහජන සේවකයන්ට තෑගි හෝ අල්ලස් ලබා දීම නීතිවිරෝධී වන අතර එවැනි ක්‍රියා වාර්තා කරනු ලැබේ.

තුවක්කු වැනි අවි ආයුධ බලපත්‍රයක් නොමැතිව හිමි කර ගැනීම හෝ රැගෙන යාම නීතිවිරෝධීය. බොහෝ ප්‍රාන්ත සහ පළාත්වල පිහියා වැනි වෙනත් ආයුධ පොදු ස්ථානවලට රැගෙන යාම පිළිබඳවද සීමා ඇත.

හදිසි අවස්ථාවකදී හෝ ඔබ හෝ වෙනත් අයෙකු අනතුරුදායක තත්වයක සිටිනම්, **000** අමතා “**Police**” ඉල්ලන්න. 2 වන පරිච්ඡේදයෙහි *උපකාර ලබා ගන්න* ද කියවන්න.

ඔබ අපරාධයක් දුටුවේ නම් හෝ අපරාධයක් විසඳීමට හෝ වැළකීමට පොලීසියට උපකාර විය හැකි තොරතුරක් ඔබ සතුව ඇත්තේ නම්, ඔබ www.crimestoppers.com.au හි ඇති Crime Stoppers ඇමතිය යුතුය, නැත්නම් 1800 333 000 අමතන්න. ඔබට ඔබේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

## ප්‍රචණ්ඩත්වය

වෙනත් පුද්ගලයකුට හානිකර ප්‍රචණ්ඩත්වය ඕස්ට්‍රේලියාව තුළ නීතිවිරෝධී වන අතර එය බරපතළ අපරාධයක් ලෙස සැලකේ. ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නා පිරිමියකු හෝ ගැහැණියක වේවා, සිරගත වීමට සිදු වනු ඇත.

ගෘහාශ්‍රිත ප්‍රචණ්ඩත්වය (ගෘහස්ථ හිංසනය සහ පවුල් හිංසනය) ඇතුළත් අපරාධ හෝ ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු වූවන්ට උපකාර කරන විවිධ සේවා ඇත.

## ගෘහස්ථ සහ පවුල් ප්‍රචණ්ඩත්වය සහ ලිංගික අඩන්තේට්ටම්

ගෘහස්ථ සහ පවුල් හිංසනය යනු බිය වැද්දීම හෝ ඔවුන්ගේ ආරක්‍ෂාවට තර්ජනය කිරීම මගින් සහකරුවා/සහකාරිය පාලනය කිරීමට උපයෝගී කරගන්නා හැසිරීම් හෝ ගර්ජනාය. ගෘහස්ථ සහ පවුල් හිංසනය ඕස්ට්‍රේලියාවේ නීතියට පටහැනිය. පහත දෑ ඊට ඇතුළත් විය හැකිය:

- පවුලේ සාමාජිකයකුට හෝ සහකරුවා/සහකාරියට පහර දීම, බෙල්ල මිරිකීම හෝ පීඩා කිරීම
- පවුලේ සාමාජිකයකුට හෝ සහකරුවා/සහකාරියට අත්‍යවශ්‍ය මුදල් නොදීම
- සහකරුවා/සහකාරිය මිතුරන් සහ පවුලේ උදවියගෙන් හුදකලා කිරීම
- සහකරුවා/සහකාරියට නිරතුරුව බැණ වැදීම සහ විවේචනය කිරීම
- ළමුන්ට හෝ සුරතල් සතුන්ට තර්ජනය කිරීම

ලිංගික අඩන්තේට්ටමක් යනු ඔවුන්ගේ කැමැත්තෙන් තොරව අනෙක් පුද්ගලයකු වෙත කරන ලිංගික බලපෑමය. මීට ඇතුළත් විය හැක්කේ:

- යමෙකුට ලිංගික කාර්ය හෝ ඒ හා සම්බන්ධ ක්‍රියාවක් සඳහා බල කිරීම
- යමෙකුට නිල් චිත්‍රපටි බැලීම සඳහා බල කිරීම
- ළමුන් සමග ලිංගික කාර්යයෙහි හෝ ඒ හා සම්බන්ධ ක්‍රියාවක යෙදීම

ඕස්ට්‍රේලියාවෙහිදී, කිසිවෙකුට හෝ ලිංගික අඩන්තේට්ටම් කිරීම නීතිවිරෝධීය. ලිංගික අඩන්තේට්ටම් කරන්නා පිරිමියකු හෝ ගැහැණියක වේවා, ඔවුන්ට සිරගත වීමට සිදු වනු ඇත. අඹුසැමි සම්බන්ධයක් ඇති, විවාහක හෝ පවුලේ සාමාජිකයන් වන පුද්ගලයන් අතර සිදුවන ලිංගික අඩන්තේට්ටම් ද නීතියට පටහැනිය.

කාන්තාවන්ටද පිරිමින්ට හා සමාන අයිතිවාසිකම් ඇත. ඕස්ට්‍රේලියානු නීතිය කාන්තාවන් සහ පුරුෂයන් සමාන කොට සලකයි. සියලු දෙනාටම ප්‍රචණ්ඩත්වයෙන් තොරව ජීවත් වීමටත්, ප්‍රීතිමත් සබඳතාවක මෙන්ම ප්‍රජාවක ජීවත් වීමට අයිතියක් ඇත.

ඔබ හෝ ඔබ දන්නා වෙනත් අයෙකු අනතුරුදායක තත්වයක සිටීනම්, **000** අමතා **“Police”** ය ඉල්ලන්න. ඕස්ට්‍රේලියාවේ පොලීසිය ආරක්‍ෂා සහිත වන අතර විශ්වාසදායකද වේ.

Family Safety Pack ඔබේ අයිතිවාසිකම් තේරුම් ගැනීමට සහ අවශ්‍ය වුවහොත් යායුතු තැන් සම්බන්ධයෙන් ඔබට උපකාර කරයි. සංස්කෘතික සංවේදී උපදේශන සේවාවන් ඕස්ට්‍රේලියාවේ ඇති අතර ඔවුන්ගෙන් උපකාර ඉල්ලීම අනුමත කෙරේ. www.dss.gov.au/family-safety-pack වෙබ් අඩවියෙන් මෙම ලිපිගොනුව භාෂා ගණනකින් ලබා ගත හැකිය.

1800 RESPECT ගාස්තු රහිත, විශ්වාසදායී දුරකථන සහ ජාලගත උපදේශන සහ තොරතුරු සපයයි. උපදේශකයෝ ඔබට ඇහුම්කන් දෙනු ඇත; ඔබේ ප්‍රශ්නවලට පිළිතුරු සපයනු ඇත; එසේම ඔබේ ප්‍රදේශයේ ඇති වෙනත් උපකාරක සේවාවලට යොමු කරනු ඇත. 1800 737 732 අමතන්න, නැත්නම් www.1800respect.org.au වෙබ් අඩවියට පිවිසෙන්න.

MensLine යනු ප්‍රචණ්ඩත්වය ඇතුළු පවුල් සහ සබඳතා ගැටලු විසඳා ගැනීමට පිරිමින්ට උපකාර කරන උපදේශන සේවාවකි. 1300 789 732 අමතන්න, නැත්නම් www.mensline.org.au වෙබ් අඩවියට පිවිසෙන්න.

ඔබට පරිවර්තකයකු අවශ්‍ය නම් පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවාව (TIS National) ලබා ගැනීම සඳහා 131 450 අමතන්න. TIS National උපදේශන සේවා නොසපයන නමුත් වෙනත් සේවා හා සම්බන්ධ වීමට ඔබට උපකාරී වෙයි.

| කලාපය | ගෘහස්ථ සහ පවුල් හිංසන සේවා | දුරකථනය |
|---|---|---|
| ජාතික | Domestic Violence and Sexual Assault - පැය 24 උපකාරක සේවය<br>www.1800respect.org.au | 1800 200 526<br>නැත්නම්<br>1800 737 732 |
| ජාතික | Child Abuse Prevention Service<br>- පැය 24 උපකාරක සේවය හෝ<br>www.childabuseprevention.com.au/reporting-abuse.html | 1800 688 009 |
| ජාතික | Mensline Australia - පැය 24 උපකාරක සේවය<br>www.mensline.org.au | 1300 789 978 |
| ජාතික | Men's Referral Service<br>http://mrs.org.au | 1300 766 491 |
| ACT | Domestic Violence Crisis Line<br>http://dvcs.org.au | 02 6280 0900 |
| NSW | Domestic Violence Advocacy Service - Sydney Advice Line<br>www.wlsnsw.org.au/legal-services/domestic-violence-legal-service | 02 8745 6999 |
| | Domestic Violence Advocacy Service - සිඩ්නිවලින් පිට නොමිලේ ඇමතුම් | 1800 810 784 |
| | Community Services Domestic Violence Line<br>www.community.nsw.gov.au/parents,-carers-and-families/domestic-and-family-violence/domestic-violence-line | 1800 656 463 |
| NT | Crisis Line<br>www.ncsmc.org.au/wsas/resources/res_nt.htm | 1800 019 116 |
| | Domestic Violence Counselling Service<br>www.dawnhouse.org.au/domestic-violence-counselling-service | 08 8945 6200 |
| Qld | Women's Help Line<br>www.dvconnect.org/womensline | 1800 811 811 |
| | Men's Help Line<br>www.dvconnect.org/mensline/ | 1800 600 636 |
| SA | Domestic Violence Crisis Services<br>www.sa.gov.au/topics/emergencies-and-safety/safety-at-home-and-in-the-community/domestic-violence | 1300 782 200 |
| | Domestic Violence Help Line<br>www.1800respect.org.au/common-questions/who-can-i-talk-to-about-domestic-family-violence-or-sexual-assault/south-australia-counselling-services/ | 1800 800 098 |
| Tas. | Family Violence<br>www.dpac.tas.gov.au/safehomessafefamilies | 1800 633 937 |
| | Response and Referral – උපදේශන සහ උපකාරක සේවා<br>www.dhhs.tas.gov.au/service_information/children_and_families/family_violence_counselling_and_support_service | 1800 608 122 |
| Vic. | Eastern Domestic Violence Service<br>සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 9.00 - ප.ව. 5.00<br>http://edvos.org.au/what-we-do | 03 9322 3555 |

| කලාපය | ගෘහස්ථ සහ පවුල් හිංසන සේවා | දුරකථනය |
|---|---|---|
| | Immigrant Women’s Domestic Violence Service<br>www.iwss.org.au | 1800 755 988 |
| | Immigrant Women’s Domestic Violence Service<br>සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 9.00 - ප.ව. 5.00 | 03 9898 3145 |
| | උපදේශනය සහ උපකාර<br>www.safesteps.org.au | 1800 015 188 |
| | Men’s Referral Service, Richmond,<br>වික්ටෝරියාව තුළ නොමිලේ ඇමතුම්.<br>http://mrs.org.au/about | 1800 065 973 |
| | Men’s Referral Service, Richmond,<br>සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 9.00 - ප.ව. 5.00 | 03 9428 2899 |
| WA | Women’s Domestic Violence Crisis Service<br>www.dcp.wa.gov.au/CrisisAndEmergency/Pages/Women%27s-Domestic-Violence-Helpline.aspx | 1800 007 339 |
| | Women’s Domestic Violence Crisis Service<br>පර්ත්වලට බැහැරින් එන ඇමතුම් | 08 9223 1188 |
| | Men’s Domestic Violence Helpline<br>www.dcp.wa.gov.au/CrisisAndEmergency/Pages/Men%27s-Domestic-Violence-Helpline.aspx | 1800 000 599 |

ගෘහස්ථ හෝ පවුල් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔබට නීති ආධාර අවශ්‍ය වනු ඇත. වැඩි විස්තර සඳහා මෙම පරිච්ඡේදයෙහි අවසානය බලන්න.

## නීත්‍යානුකූලව ලිංගික සේවනය සඳහා කැමති වියහැකි වයස

නීත්‍යානුකූලව ලිංගික සේවනය සඳහා කැමති වියහැකි වයස යනු ඔබට වෙනත් අයෙකු හා ලිංගිකව එක් වීමට කැමැත්ත දිය හැකි නීත්‍යානුකූල වයසයි.

බොහෝ ප්‍රාන්ත සහ පළාත්වල ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වයටම නීත්‍යානුකූලව ලිංගික සේවනය සඳහා කැමති වියහැකි වයස අවුරුදු 16 වේ. දකුණු ඕස්ට්‍රේලියාවේ (South Australia) සහ තස්මේනියාවේ (Tasmania) මෙම වයස අවුරුදු 17 වේ.

වැඩිහිටියෙකුට, නීත්‍යානුකූලව ලිංගික සේවනය සඳහා කැමති වියහැකි වයසට වඩා අඩු බාලවයස්කරුවන් සමග ලිංගික කාර්යයෙහි යෙදීම නීතිවිරෝධීය. මෙම නීති කඩකරන ඕනෑම කෙනෙකුට දැඩි දඬුවම්වලට යටත් වීමට සිදු වේ; ළමයා කැමති වීද නැතිද යන කාරණය මෙහිදී නොසැලකේ. මෙම නීති කුඩා ළමුන් ලිංගික අපයෝජනයෙන් ආරක්‍ෂා කරයි.

ඔබට වෛද්‍යවරයෙකුට කතා කිරීමෙන් හෝ ලිංගික සෞඛ්‍ය සායනයක් ඇමතීමෙන් හෝ White Pages හි දක්වා ඇති පවුල් සැලසුම් සායනයක් ඇමතීමෙන් වැඩි විස්තර
සොයා ගත හැකිය.

## ළමා අයිතිවාසිකම්

ළමා අයිතිවාසිකම් සුරැකීමට ඕස්ට්‍රේලියාව ඇප කැප වී ක්‍රියා කරයි.

නීතිය මගින් ශාරීරික, ලිංගික සහ හැඟීම් අපයෝජනය මෙන්ම නිවසේදී සහ පාසැලේදී යන දෙකේදීම සිදුවන නොසලකා හැරීම සහ ප්‍රචණ්ඩත්වයෙන් ළමුන් ආරක්‍ෂා කෙරෙයි. ළමා සුපරීක්‍ෂාව සහ රැකවරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධානයන් යෙදිය යුතුය. කායික තැලීම වැනි කායික දඬුවම් මගින් හික්මවීම අනුමත නොකෙරේ; එවැනි ක්‍රියාවකින් සැලකිය යුතු හානියක් සිදු වුවහොත්, එය නීතිවිරෝධීය. පාසැල්වලදී කායික දඬුවම් දීමට අවසර නැත.

ළමයෙකුට හිංසාවක් සිදුව ඇති බවට සැකයක් ඇත්නම්, ඒ බව ප්‍රාන්ත හෝ පළාත් ළමාරක්‍ෂක අධිකාරියට දැනුම් දීම දොස්තරවරුන් සහ ගුරුවරුන් වැනි සමහර පුද්ගලයන්ගෙන් අපේක්‍ෂා කෙරේ.

## ළමාරක්‍ෂාව

යම්කිසි පිළිවෙතක් ළමුන්ට හානිකර හෝ හානිකර වීමේ අවදානමක් සහිත නම්, ළමයින්ගේ ආරක්‍ෂාව සහ යහපැවැත්ම තහවුරු කරනු වස් ළමාරක්‍ෂණ සේවා ඉදිරිපත් විය හැකිය. ඔබට හෝ ඔබ දන්නා වෙනත් අයෙකුට ප්‍රචණ්ඩත්වයෙන් හෝ අපයෝජනයෙන් ආරක්‍ෂාව අවශ්‍ය නම්, ඔබ පොලීසිය හෝ ළමාරක්‍ෂක සේවය ඇමතිය යුතුය.

වැඩි විස්තර සඳහා:

| පළාත | ළමාරක්‍ෂණ ආයතන සහ වෙබ් අඩවි | දුරකථන පැය 24ම |
|---|---|---|
| ජාතික | Child Abuse Prevention Services<br>www.childabuseprevention.com.au | 1800 688 009 |
| ACT | Office for Children, Youth and Family Support<br>www.communityservices.act.gov.au/ocyfs | 1300 556 729 |
| NSW | Community Services Helpline<br>www.community.nsw.gov.au/preventing-child-abuse-and-neglect | 132 111 |
| NT | Department of Children and Families<br>https://nt.gov.au/law/crime/report-child-abuse | 1800 700 250 |
| Qld | Department of Communities, Child Safety and Disability Services<br>www.communities.qld.gov.au/childsafety/child-safety-services | 1800 811 810 |
| SA | Department for Education and Child Development<br>www.families.sa.gov.au/pages/protectingchildren/HowToNotify | 131 478 |
| Tas. | Department of Health and Human Services Hotline<br>www.dhhs.tas.gov.au/children/child_protection_services | 1300 737 639 |
| Vic. | Department of Human Services – Child Protection<br>www.dhs.vic.gov.au/for-individuals/children,-families-and-young-people/child-protection | 131 278 |
| WA | Department for Child Protection and Family Support<br>www.dcp.wa.gov.au/pages/home.aspx | 1800 199 008 |

## බලහත්කාර විවාහය

ඕස්ට්‍රේලියාවේ සිටින සියලු දෙනාටම ඔවුන් විවාහ වන්නේද නැද්ද යන්න තීරණය කිරීමට නිදහසක් ඇත. කාට හෝ විවාහ වන ලෙස බල කිරීම ඕස්ට්‍රේලියාවේ නීතියට අනුව අපරාධයකි. බලහත්කාර විවාහය යනු කෙනෙකුගේ ස්ව කැමැත්තෙන් තොරව බිය ගැන්වීමෙන්, බලපෑම් කිරීමෙන් හෝ රැවටීමෙන් විවාහගත කිරීමයි.

තවත් අයෙකුට විවාහ වන ලෙස ශාරීරිකව, මානසිකව හෝ භාවාත්මකව (emotionally) බලපෑම් කිරීමට කිසිවෙකුට අවසරයක් නොමැත. පුද්ගලයකුගේ ආගමික හෝ වාර්ගික පසුබිම, ඔවුන්ගේ ස්ත්‍රීපුරුෂ භාවය හෝ ලිංගික දිශානතිය හෝ වයස කුමක් යන්න මෙහිදී අදාළ නොවේ.

බලහත්කාර විවාහයක් සඳහා පුද්ගලයෙකු වෙනත් රටකට ගෙනයාම, යැවීම හෝ එය වෙනත් අයෙකු ලවා සංවිධානය කරවීම ද නීතිවිරෝධීය.

වයස අවුරුදු 16ට අඩු ළමුන්ට විවාහය තහණමිය. වයස අවුරුදු 16-18 අතර පුද්ගලයන්ට විවාහ විය හැක්කේ දෙමාපියන්ගේ අවසරය ඇතිව සහ විනිශ්චයකාරවරයකු හෝ මහේස්ත්‍රාත්වරයකුගේ බලය පිට ඕස්ට්‍රේලියානු අධිකරණ නියෝගයක් මත පමණි.

යෝජිත විවාහ ඕස්ට්‍රේලියාව තුළ නීත්‍යානුකූලය.

බලහත්කාර විවාහයන් පිළිබඳ වැඩි විස්තර සහ උපකාර සෙවීමේදී ඔබ සහ වෙනත් අයව ඉන් ආරක්ෂා වන්නේ කෙසේදැයි දැන ගැනීමට www.ag.gov.au/forcedmarriage වෙබ් අඩවියට පිවිසෙන්න.

Family Safety Pack -(www.dss.gov.au/family-safety-pack) මීට බලහත්කාර විවාහය සහ බාලවයස්කාර විවාහයන් පිළිබඳ තොරතුරු පත්‍රිකාව ඇතුළත්.

ඔබ හෝ වෙනත් අයෙකු බලහත්කාර විවාහයක සිටින්නේ නම් හෝ ඊට ගොදුරු වීමේ අවදානමක සිටින්නේ නම් 131 237 ඔස්සේ Australian Federal Police ය අමතන්න.

පහත සඳහන් ආයතනවලටද ඔබට උපකාරී විය හැකිය:

| කලාපය | ආයතනය සහ වෙබ් අඩවිය | දුරකථනය |
|---|---|---|
| ජාතික | National Sexual Assault, Domestic and Family Violence Counselling Service<br>www.1800respect.org.au | 1800 737 732 |
| ජාතික | Family Law Information<br>http://www.familycourt.gov.au/wps/wcm/connect/fcoaweb/family-law-matters/getting-help/migrants-refugees-language-support | 1300 352 000 |
| ජාතික / NSW | Anti-Slavery Australia<br>www.antislavery.org.au | 02 9514 9662 |
| ජාතික / NSW | My Blue Sky<br>www.mybluesky.org.au | 02 9515 8815 හෝ<br>0481 070 844 (කෙටි පණිවුඩ) |
| Vic. | Australian Muslim Women's Centre for Human Rights<br>www.ausmuslimwomenscentre.org.au | 03 9481 3000 |

## වනිතා ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම්

ඕස්ට්‍රේලියාව තුළ කාන්තා ලිංග විකෘතය හෝ ඡේදනය (FGM/C) තහනම්ය.

බාහිර ස්ත්‍රී ලිංගේන්ද්‍රිය කොටසක් හෝ මුළුමණින්ම කපා ඉවත් කිරීම හෝ වෛද්‍ය අවශ්‍යතාවක් නොවන වෙනත් හේතුවක් මත ස්ත්‍රී ලිංගේන්ද්‍රියන්ට කරන කවර හෝ හානියක් FGM/C යන්නට ඇතුළත් වේ.

යම් පුද්ගලයෙකු FGM/C කරගැනීම සඳහා වෙනත් රටකට ගෙනයාම හෝ යැවීමත්, එය කිරීම සඳහා වෙනත් අයෙකු යෙදවීමත් නීතිවිරෝධීය.

FGM/C මගින් බරපතළ සහ දිගුකාලීන අහිතකර බලපෑම් ඇති විය හැකිය. මෙම සිරිත හේතුවෙන් ඕස්ට්‍රේලියාවට පැමිණෙන කාන්තාවන්ට සහ ගැහැනු ළමුන්ට සෞඛ්‍ය ප්‍රශ්න තිබිය හැකිය.

පහත දැක්වෙන විශේෂඥ සේවාවන්ට ඒ සඳහා උපකාර කළ හැකිය:

| කලාපය | කාන්තා ප්‍රජනන අයිතිය පිළිබඳ සේවා | දුරකථනය |
|---|---|---|
| ජාතික | National Education Toolkit for FGM/C in Australia<br>www.netfa.com.au | |
| ACT | Sexual Health and Family Planning<br>www.shfpact.org.au | 02 6247 3077 |
| | Women's Health Service<br>www.health.act.gov.au/our-services/women-youth-and-children/womens-health-service | 02 6205 1078 |
| NSW | Women's Information and Referral Service<br>www.women.nsw.gov.au | 1800 817 227 |
| | Education Program on FGM<br>http://www.dhi.health.nsw.gov.au/NSW-Education-Program-on-Female-Genital-Mutilation/NSW-Education-Program-on-Female-Genital-Mutilation/default.aspx | 02 9840 3877 |
| NT | Sexual Assault Referral Centre<br>www.health.nt.gov.au/sexual_assault_services<br>Darwin<br>Alice Springs | <br><br>08 8922 6472<br>08 8955 4500 |
| | Family Planning Welfare Association<br>www.fpwnt.com.au | 08 8948 0144 |
| Qld | Family Planning Queensland (True)<br>www.fpq.com.au නැත්නම්<br>www.true.org.au | 07 3250 0240 |
| | Multicultural Women's Health – FGM<br>www.true.org.au/resources/resources-overview/multicultural-womens-health-female-genital-mutilation-fgm | 07 3250 0240 |
| SA | Women's Information Service<br>www.wis.sa.gov.au | 1800 188 158 |
| | Women's Health Service<br>www.whs.sa.gov.au | 08 8444 0700 |
| Tas. | Red Cross - Bicultural Community Health Program<br>www.redcross.org.au/bi-cultural-health.aspx | |
| | Child protection service<br>www.dhhs.tas.gov.au/children/child_protection_services | 1300 737 639 |
| | Tasmania police<br>www.police.tas.gov.au | 131 444 |
| | Crime stoppers<br>http://crimestopperstas.com.au | 1800 333 000 |

| කලාපය | කාන්තා ප්‍රජනන අයිතිය පිළිබඳ සේවා | දුරකථනය |
|---|---|---|
| Vic. | Royal Women's Hospital<br>https://www.thewomens.org.au/health-information<br>ග්‍රාමීය නිදහස් ඇමතුම් | 03 8345 3058<br><br>1800 442 007 |
| | South Eastern Centre Against Sexual Assault<br>www.secasa.com.au<br>පැය 24 - නොමිලේ ඇමතුම්<br>අර්බුද | 1800 806 292<br>03 9594 2289 |
| | Australian Muslim Women's Centre for Human Rights<br>http://ausmuslimwomenscentre.org.au/2014/a-guide-for-responsible-reporting-on-female-genital-cutting | 03 9481 3000 |
| WA | Women's Information Service<br>www.communities.wa.gov.au/communities-in-focus/women/womens-information-service/Pages/default.aspx<br>නොමිලේ ඇමතුම්, සඳුදා - සිකුරාදා පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 1800 199 174 |
| | WA Health, FGM Program<br>www.kemh.health.wa.gov.au/health_professionals/WHCSP/gbv.php | 08 9340 1557 |

## ගිනි අවි සහ කිනිසි

ගිනි අවි සහ පිහියා/කිණිසි වැනි ආයුධ ළඟ තබා ගැනීම ඕස්ට්‍රේලියානු නීතියට පටහැනිය. ගිනි අවියක් ළඟ තබා ගැනීමට ඔබට අවසරපත්‍රයක් තිබිය යුතුය.

ගිනි අවි භාවිතය සහ බාල වයස්කරුවන්ට ගිනි අවි හෝ ආයුධ විකිණීම සම්බන්ධ නීතිමය සීමා ඇත. ගිනි අවි භාවිතය සහ හිමිකාරිත්වය සම්බන්ධයෙන් ඒ ඒ ප්‍රාන්තවලට සහ පළාත්වලට වෙන වෙනස් වූ විධිවිධාන ඇත.

## සතුන් සහ වනසතුන්

ඕස්ට්‍රේලියාවට ආවේණික සතුන් දඩයම් කිරීම සහ ජාතික වනෝද්‍යානවල හෝ වෙනත් සොබාදම් රක්ෂිතවල සිටින කවර හෝ සතෙකු දඩයම් කිරීම තහණමිය.

දඩයම් කිරීම සහ මාළු බෑමට අදාළ නීති ප්‍රාන්තයෙන් ප්‍රාන්තයටත්, පළාතෙන් පළාත්ටත් වෙනස්ය; එමනිසා ඔබට බලපාන නීති මොනවාදැයි පරීක්ෂා කර බලන්න. සමහර ප්‍රදේශවලදී ඔබට ප්‍රචණ්ඩ සතුන් දඩයම් කළ හැකිය. දඩයම් කිරීම සඳහා ඔබට අවසරපත්‍රයක් හෝ බලපත්‍රයක් තිබිය යුතුය; නැත්නම්, දඩයම සඳහා ගාස්තුවක් ගෙවිය යුතුය. එසේම ඔබ පාවිච්චි කරන ඕනෑම ආයුධයක් ලියාපදිංචි කොට තිබිය යුතුය.

බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සහිතව විනෝදය සඳහා මුහුදේ හෝ ගංගාවල මාළු ඇල්ලීමට අවසර ඇත. සාමාන්‍යයෙන් ඔබට ඇල්ලිය හැකි මාළු ගණන සහ ඔවුන්ගේ දිග-පළල පිළිබඳ සීමාවන් ඇත.

කුරිරුකම්වලින් සහ නොසලකා හැරීමෙන් සතුන් ආරක්ෂා කිරීමට ඕස්ට්‍රේලියාවෙහි නීති ඇත. සතුන්ට නොමනා ලෙස සලකන පුද්ගලයන්ට දඩ ගෙවීමට හෝ සිරගත වීමට හෝ මේ දෙකම අත් විඳීමට සිදුවනු ඇත. ප්‍රාදේශීය නීතියෙන් නිවෙස් ආශ්‍රිතව සතුන් ඇති කිරීමට අවසර ලැබුණත්, ඕස්ට්‍රේලියාවට ආවේණික සතුන් නිවෙසේ තබා ගැනීමට විශේෂ අවසර පත්‍රයක් ලබා ගත යුතුය.

ඔබේ ගෙවත්තේදී සතුන් මැරීම තහණමිය.

12 වන පරිච්ඡේදයේ සිවිල් සහභාගීත්වය ද කියවන්න.

## දුම්බීම, මත්පැන් පානය සහ මත්ද්‍රව්‍ය

දුම්බීම යනු සෞඛ්‍ය තර්ජනයක් වන අතර, එය ඕස්ට්‍රේලියාවේ මරණ සහ රෝග සම්බන්ධ ප්‍රමුඛතම හේතූන් අතරින් එකකි.

දුම්කොළ සහ දුමුබීම නවත්වන්නේ කෙසේද? යන්න පිළිබඳ තොරතුරු දොස්තරවරුන් සහ ඖෂධවේදීන් වැනි සෞඛ්‍ය වෘත්තිකයන්ගෙන් ලබාගත හැකිය. 13 7848 (13 Quit) ඔස්සේ ඇමතිය හැකි Quitline වෙතින් සහ www.quitnow.gov.au වෙබ් අඩවියෙන්ද තොරතුරු ලබාගත හැකිය.

ළමුන් සිටින අවස්ථාවලදී මෝටර් රථ තුළ දුම්පානය තහණමය; එසේම, කාර්යාල, සේවාස්ථාන, සාප්පු සංකීර්ණ, රෝහල්, සෞඛ්‍ය සායන, විනෝදස්ථාන සහ ආපන ශාලා වැනි පොදු ස්ථානවලද දුම්බීමට අවසර නැත.

අවුරුදු 18 ට අඩු පුද්ගලයන්ට දුම්කොළ නිෂ්පාදන අලෙවි කිරීමද නීතිවිරෝධීය.

මත්පැන් පානයට ඕස්ට්‍රේලියාවේ නීතිමය අවසරය ඇත; එහෙත්, ඒ යම් ස්ථානවලදී සහ වේලාවන් ඇතුළතදීය. මත්පැන් පානය පිළිබඳ මාර්ගෝපදේශනවලට අනුව ඕනෑම දවසක පානය කිරීමට සුදුසු වන්නේ ප්‍රමිත වීදුරු දෙකකට අඩු මත්පැන් ප්‍රමාණයකි.

කවුරුන් විසින් වුවත්, බාලවයස්කරුවෙකුට මත්පැන් විකිණීම හෝ සැපයීම නීතියට පටහැනිය. පුද්ගලික නිවසක් වැනි පෞද්ගලික දේපළකදී හැරුණු කොට, අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු මත්පැන් පානය කිරීමද නීතිවිරෝධීය. බොහෝ පොදු ස්ථානවලදී මත්පැන් පානයද තහණමය.

පුද්ගලයන් මත්ද්‍රව්‍ය භාවිත කිරීම, ළඟ තබා ගැනීම සහ විකිණීම වැළැක්වීමට නීති ඕස්ට්‍රේලියාවට ඇත. මත්ද්‍රව්‍ය සම්බන්ධ නීති කඩ කිරීම අධික දඩවලට යටත් වීම සහ සිරගත වීම වැනි දඬුවම්වලට යටත් වීමට හේතුවකි. ඕස්ට්‍රේලියාවේ මත්ද්‍රව්‍ය නීති නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් සහ ඒවා සැපයීම, නිෂ්පාදනය හෝ විකිණීම කරන පුද්ගලයන් වෙන් කොට හඳුනා ගනී.

මත්ද්‍රව්‍ය හෝ මත්පැන් පානය කොට රිය පැදවීම නීතිවිරෝධීය. ඔබ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පසුව හෝ මත්පැන් පානය කිරීමෙන් අනතුරුව රිය පැදවුවහොත්, රියදුරු බලපත්‍රය අහිමි වීම, දඩ ගැසීම, සිරගත වීම යනාදියෙන් එකක් හෝ සියල්ලටම හෝ යටත් වීමට ඔබට සිදු වේ. 8 වන පරිච්ඡේදයෙහි ප්‍රවාහනය කියවන්න.

ඔබට හෝ ඔබ දන්නා අයෙකුට නීතිවිරෝධ මත්ද්‍රව්‍ය සම්බන්ධ හෝ මත්පැන් බීම සම්බන්ධ ප්‍රශ්න ඇත්නම්, ඔබේ වෛද්‍යවරයාට හෝ, ප්‍රජා සෞඛ්‍ය සේවාවට හෝ ඔබේ ප්‍රාන්තයේ/පළාතේ මත්ද්‍රව්‍ය උපකාර අංශයට කතා කරන්න.

| ප්‍රාන්තය හෝ පළාත | ඇල්කොහොල්/මත්ද්‍රව්‍ය තොරතුරු සේවාවෙහි දුරකථනය |
|---|---|
| ACT | 02 6207 9977 |
| NSW | 02 9361 8000 (Sydney)<br>1800 422 599 (නිව් සවුත්වේල්ස් පිටිසර) |
| NT | 08 8922 8399 (Darwin)<br>08 8951 7580 (මධ්‍යම ඕස්ට්‍රේලියාව)<br>1800 131 350 (පළාත පුරා) |
| Qld | 1800 177 833 |
| SA | 1300 131 340 |
| Vic. | 1800 888 236 |
| Tas. | 1800 811 994 |

| ප්‍රාන්තය හෝ පළාත | ඇල්කොහොල්/මත්ද්‍රව්‍ය තොරතුරු සේවාවෙහි දුරකථනය |
|---|---|
| WA | 08 9442 5000 (Perth)<br>1800 198 024 (බටහිර ඕස්ට්‍රේලියාව - පිටිසර) |

වැඩි විස්තර සඳහා:

| ආයතනය හෝ ව්‍යාපාරය | වෙබ් අඩවිය |
|---|---|
| National Tobacco Campaign | www.quitnow.gov.au |
| Department of Health | www.alcohol.gov.au/ |
| National Drugs Campaign | www.drugs.health.gov.au/ |
| Australian Drug Information Network | www.adin.com.au/content.asp?Document_ID=38 |

## පැල සහ සතුන් ආනයනය පිළිබඳ සීමා

ඔබ ජාලගතව භාණ්ඩ මිලදී ගන්නේ නම්, හෝ ඕස්ට්‍රේලියාවේ සිට හෝ ඕස්ට්‍රේලියාවට ගමන් කරන්නේ නම්, ඔබට මිලදී ගත හැකි සහ ගෙන යා/ආ හැකි පැළ සහ සතුන් පිළිබඳ රීතීන් ඇත. www.environment.gov.au/biodiversity/wildlife-trade/travellers-shoppers වෙබ් අඩවියට යන්න.

ඔබේ ගමන් මල්ල වනසත්ව නීති කඩ කරන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා www.environment.gov.au/biodiversity/wildlife-trade/travellers-shoppers/tourist-souvenirs වෙබ් අඩවියට යන්න.

ඕස්ට්‍රේලියාව තුළ ප්‍රවාහනය කළ හැකි පැළ සහ සතුන් පිළිබඳවද නීති ඇත. ඔබ ඕස්ට්‍රේලියාව තුළ සංචාරය කිරීමට සැලසුම් කරන්නේ නම්, www.quarantinedomestic.gov.au/ වෙබ් අඩවියට ගොස් අදාළ අවශ්‍යතා පරීක්ෂා කරන්න.

## වෙනත් නීති

ඕස්ට්‍රේලියාවේ මරණ දඬුවම ක්‍රියාත්මක නොවේ.

කුණු දැමීම, දූෂණය කිරීම හෝ අවසරයකින් තොරව කුණු-කසළ දැමීම හෝ අධික ශබ්ද කිරීමට එරෙහි නීති ඇත.

### අසල්වැසියන් සමග ආරවුල්

අසල්වැසියන් සමග ඇති වන මතභේද සම්බන්ධ බොහෝ අංශ නීතිවලට යටත් වේ. උසාවියට යාම වෙනුවට මෙවැනි ප්‍රශ්න විසඳා ගැනීම සඳහා උපකාර කරන ආරවුල් නිරාකරණ සහ මැදහත්වීම් සේවා ඇත.

වැඩි විස්තර සඳහා:

| ප්‍රාන්තය හෝ පළාත | සේවාව | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | Conflict Resolution Service | www.crs.org.au/pdf/Healthy_neighbourhoods_brochure.pdf |
| NSW | Information about the law in NSW | www.legalanswers.sl.nsw.gov.au/guides/neighbours/ |

| ප්‍රාන්තය හෝ පළාත | සේවාව | වෙබ් අඩවිය |
|---|---|---|
| NT | Community Justice Centre | www.cjc.nt.gov.au/ |
| Qld | Queensland Government | www.qld.gov.au/law/housing-and-neighbours/ |
| SA | Legal Services Commission of SA | www.lawhandbook.sa.gov.au/ch31s01.php |
| Tas. | Hobart Community Legal Service | www.hobartlegal.org.au/tasmanian-law-handbook/community-and-environment/neighbourhood-disputes/introduction |
| Vic. | Victoria Legal Aid | www.legalaid.vic.gov.au/find-legal-answers/disputes-with-neighbours |
| WA | Legal Aid WA | www.legalaid.wa.gov.au/InformationAboutTheLaw/Homes/neighbours/Pages/NeighboursCommonProblems.aspx |

12 වන පරිච්ඡේදයේ *සිවිල් සහභාගීත්වය* ද කියවන්න.

## නීතිමය ආධාර

සියලුම ප්‍රාන්ත සහ පළාත්වල පුද්ගලයන්ගේ නීතිමය අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳව දැනුවත් කරන සහ ඔවුන් අධිකරණ පද්ධතියෙහි භාවිතය වැඩි කරන ආයතන ඇත.

අපරාධ සම්බන්ධ කාරණා, පවුල් බිඳ වැටීම්, ගෘහස්ථ හිංසනය, සංක්‍රමණය, මානසික සෞඛ්‍යය, සමාජ ආරක්ෂණය, ණය සහ රථවාහන නීති උල්ලංඝණය යනාදිය සම්බන්ධයෙන් සුදුසුකම් සහිත පුද්ගලයන්ට Legal Aid ආයතන මගින් නීතිමය උපදෙස් සහ ආධාර සපයයි.

| ප්‍රාන්තය හෝ පළාත | නීති ආධාර ආයතනය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | Legal Aid ACT | 1300 654 314 | www.legalaidact.org.au/ |
| NSW | Legal Aid NSW | 1300 888 529 | www.legalaid.nsw.gov.au/ |
| NT | Northern Territory Legal Aid Commission | 1800 019 343 | www.nt.gov.au/ntlac |
| Qld | Legal Aid Queensland | 1300 651 188 | www.legalaid.qld.gov.au/ |
| SA | Legal Services Commission of South Australia | 1300 366 424 | www.lsc.sa.gov.au/ |
| Tas. | Legal Aid Commission of Tasmania | 1300 366 611 | www.legalaid.tas.gov.au/ |
| Vic. | Victoria Legal Aid | 1300 792 387 | www.legalaid.vic.gov.au/ |
| WA | Legal Aid Western Australia | 1300 650 579 | www.legalaid.wa.gov.au/ |

ප්‍රජා නීති මධ්‍යස්ථාන විවිධ කාරණා සම්බන්ධයෙන් නීති උපදෙස් සහ ආධාර සපයයි. සමහර මධ්‍යස්ථාන මගින් ඔබට ඔබේ නීතිමය අයිවාසිකම් සහ වගකීම් පිළිබඳව උගත හැකි ප්‍රජා නීති පන්ති පවත්වති.

| ජාතික නෛතික සංවිධාන | වෙබ් අඩවිය |
| --- | --- |
| National Association of Community Legal Centres | www.naclc.org.au/ |
| Children’s and Youth Law Centre | www.lawstuff.org.au/ |
| Women’s Legal Services | www.wlsa.org.au/ |

# 7 නිවාස

## මෙම කොටසේදී

ඕස්ට්‍රේලියාවේ නිවසක් සොයා ගැනීම දුෂ්කර විය හැකි අතර ගෙවල් කුලියද මිල අධික විය හැකිය. විශාල පවුල්වලට, ඔවුන්ගේ සියලුම අවශ්‍යතාවලට ගැළපෙන දිගුකාලීන වාසස්ථානයක් සොයා ගැනීම විශේෂයෙන් දුෂ්කර විය හැකිය. ඔබට සම්මුතියකට පැමිණීමට සිදු වන අතර කුලියට දීම සඳහා තිබෙන කවර හෝ නිවසක් ගැනීමට සිදුවනු ඇත.

- කෙටිකාලීන වාසස්ථාන
- පුද්ගලික නිවසක් හෝ මහල් නිවාසයක් කුලියට ගැනීම
- නිවාස සම්බන්ධ උපකාර
- කුලී නිවැසියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්
- නිවසක් හෝ තට්ටු නිවාසයක් මිලදී ගැනීම
- අත්‍යවශ්‍ය ගෘහස්ථ සේවා
- ගෘහාශ්‍රිත අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය
- තැපැල

## කෙටිකාලීන වාසස්ථාන

ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණි අලුත සැලකිලිමත් විය යුතු කෙටිකාලීන වාසස්ථානවලට පහත දෑ ඇතුළත් වේ:

- නේවාසිකාගාර සහ නේවාසිකාගාර සඳහා වට්ටම් ගාස්තු
- ඔබ ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලබන්නේ නම්, ඕස්ට්‍රේලියාවට හුරු වන තුරු තාවකාලික ශිෂ්‍ය නේවාසිකාගාරවල සිටීමට ඔබට හැකි වනු ඇත. ඔබේ අධ්‍යාපන ආයතනයේ අන්තර්ජාතික (ශිෂ්‍ය) උපකාරී කාර්යමණ්ඩලයට කතා කරන්න.; නැත්නම්, ඔවුන්ගේ වෙබ් අඩවිය පරීක්ෂා කරන්න. අන්තර්ජාතික ශිෂ්‍යයන් සඳහා වාසස්ථාන විකල්ප සඳහා www.studyinaustralia.gov.au/global/live-in-australia/accommodation වෙබ් අඩවියට පිවිසෙන්න.
- ශිෂ්‍ය තත්වයේ අයෙකුගේ ජීවන වියදම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා www.studyinaustralia.gov.au/global/live-in-australia/living-costs වෙබ් අඩවියට පිවිසෙන්න.

## පුද්ගලික නිවාසයක් හෝ තට්ටු නිවාසයක් කුලියට ගැනීම

නිවාසයක් හෝ තට්ටු නිවාසයක් කුලියට ගැනීම සාමාන්‍යයෙන් සිදු වන්නේ දේපළ හිමිකරුවන් වෙනුවෙන් කටයුතු කරන දේපළ වෙළඳ ආයතන හරහාය. ඔබට පුද්ගලික දේපළ හිමියකුගෙන් සෘජුවමත් කුලී නිවසක් ලබාගත හැකිය. කුලියට දීමට ඇති දේපළ ජාලගතව මෙන්ම පත්තරවල ‘To let’ සහ ‘Accommodation vacant’ තීරුවල ප්‍රසිද්ධ කෙරේ. ඔබට දේපළ වෙළඳ කාර්යාලයකට ගොස් කුලියට දීම සඳහා ඇති ඔවුන්ගේ දේපළවල ලැයිස්තුවක් ලබාගත හැකිය.

‘බද්ද’ (lease) හෝ ‘නේවාසික කුලී නිවැසියන්ගේ ගිවිසුම‘ (residential tenancy agreement) යනු දේපළ හිමියා සහ කුලී නිවැසියන් අතර ඇති කර ගන්නා ලිඛිත සහ නෛතික කොන්ත්‍රාත්තුවකි. ගිවිසුමට එළඹීමට පෙර, කාලය සම්බන්ධයෙන් කතාබහ කරගැනීමට හැකි නමුත්, මෙවැනි කොන්ත්‍රාත්තුවක් සාමාන්‍යයෙන් අත්සන් කරනු ලබන්නේ මාස හයක් හෝ දොළහක් වැනි නිශ්චිත කාලයකටය. මූලික කාලය අවසානයේදී බද්ද අලුත් කිරීමට ඔබට හැකි වේ. කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීමෙන් අදහස් වන්නේ ගෙවල් කුලිය, එය ගෙවිය යුතු දිනය, ගෘහාශ්‍රිත සේවා (විදුලිය, ජලය, ගෑස්, කසළ එකතු කිරීම සහ වෙනත් සේවා) සඳහා ගෙවන්නේ කවරෙක්ද, පරීක්ෂා කරන වාර ගණන, සුරතල් සතුන් ඇති කිරීමට අවසර තිබේද සහ ඔබට කොපමණ කාලයක් සිටිය හැකිද යන කරුණු පිළිබඳව දෙපාර්ශ්වයම එකඟතාවකට පැමිණෙන බවයි.

ඔබට වාසය කිරීමට අවශ්‍ය කාලයට වඩා දීර්ඝ බද්දකට අත්සන් කිරීමෙන් වළකින්න; ඊට හේතුව, එකඟ වූ කාලයට පෙර දේපළ හැරයාමේදී සැලකිය යුතු ගාස්තුවක්(Breaking a lease - බදු එකඟතාවය උල්ලංඝණය කිරීම) ගෙවීමට සිදු විය හැකි බැවිනි.

කුලී නිවෙසක ජීවත් වීම ආරම්භ කිරීමේදී මාසයක ගෙවල් කුලිය කලින් ගෙවීම සහ බදු ඇප තැන්පත් කිරීම සාමාන්‍යයෙන් සිදු කෙරේ. ඇපය යනු නිවෙස් හිමියාට ගෙවන තැන්පතුවකි. ගෙවිය යුතු ගණන ප්‍රාන්තයෙන් ප්‍රාන්තයට සහ පළාතෙන් පළාතට වෙනස් වේ. නිවෙස් හිමියා හෝ දේපළ වෙළඳ ආයතනය ඔබේ ඇපය ඒ ඒ ප්‍රාන්තයේ හෝ පළාතේ කුලී නිවැසියන්ගේ ඇප සම්බන්ධයෙන් වගකිවයුතු අධිකාරියක තැන්පත් කළ යුතු වේ. ඔබ කුලී නිවෙසකින් ඉවත්ව යාමේදී, ගෙවල් කුලිය පිළිබඳ හිඟයක් නැත්නම් සහ දේපළට හානියක් නැත්නම් මෙම ඇප මුදල ඔබට ආපසු ගෙවනු ලැබේ.

කුලී නිවෙසක වාසයට පැමිණීමට පෙර, දේපළෙහි භෞතික තත්වය සහ දැනට සිදුව ඇති හානි ‘තත්ව වාර්තාව’ (condition report) නම් වූ ලියවිල්ලක සටහන් කරනු ලැබේ. මෙය සම්පූර්ණ කරනු ලබන්නේ ඔබ සහ ඔබේ කුලී නිවෙස් හිමියා හෝ ඔවුන් වෙනුවෙන් කටයුතු කරන දේපළ වෙළඳ ආයතනයයි. මෙය ඔබ ඉවත්ව යන අවස්ථාවේදී ඇති විය හැකි අනවබෝධතා මග හරවයි. දේපළට සිදුවන කවර හෝ හානියක් නිවෙස් හිමියාට දැන්විය යුතුය අතර දේපළ සම්බන්ධ කිසිදු වෙනස්කමක් කිරීමට පෙර ඔවුන්ගේ අවසරය ගත යුතුය. අලුත්වැඩියා කටයුතුවල වගකීම සාමාන්‍යයෙන් පැවරෙන්නේ නිවෙස්හිමියාටය.

*ඔබ කුලියට ගන්නා දේපළ පරීක්ෂා කර බලන තුරු සහ ලියවිල්ලෙහි ඇතුළත් නියමයන් සහ කොන්දේසි හරියාකාරව අවබෝධ කරගන්නා තෙක්, බදු ඔප්පුවට අත්සන් කිරීමෙන් වළකින්න, මන්ද, අත්සන් කළ පසුව ඔබ නීතිමය බැඳීනයකට යටත් වන බැවිනි.*

ඔබට කුලී නිවෙස අතුරු බදු දීමට (බදු ඔප්පුවේ ඇතුළත් නොවන වෙනත් පුද්ගලයෙකුට නැවතත් බදු දීමට) අවසර නොමැත; ආගන්තුකයන් දිගු කලක් රඳවා ගැනීමටද නොහැකිය; ඊට හේතුව ඉහත කාරණා මගින් නීතියෙන් අවසර ලත් පදිංචිකරුවන් ගණන ඉක්මවීමයි. සාමාන්‍යයෙන් කෙටිකාලීන ආගන්තුකයින් සම්බන්ධයෙන් මෙම ගැටලුව ඇති නොවේ.

කුලී නිවසින් ඉවත්ව යාමට ඔබ සැලසුම් කරන්නේ නම්, ඒ බව නිවෙස් හිමියාට කල් තියා (අඩුම වශයෙන් සති හතරක් හෝ බදු ගිවිසුමේ සඳහන් කර ඇති පරිදි) දැනුම් දිය යුතුය.

## නිවාස සම්බන්ධ උපකාර

අඩු ආදායම්ලාභී පුද්ගලයන් තාවකාලික වාසස්ථාන සඳහා හෝ කුලී ඇප (rental bond) සහ පළමු මාසයේ ගෙවල් කුලිය ගෙවීම සඳහා රජයෙන් මූල්‍ය උපකාර ලැබීමට සුදුසුකම් ලැබිය හැක.

Rent Assistance යනු අඩු ආදායම්ලාභී පුද්ගලයන්ට ඔවුන්ගේ ගෙවල්කුලිය ගෙවීම සඳහා උපකාර පිණිස රජයෙන් ලැබෙන ගෙවීමකි (www.humanservices.gov.au/rentassistance).

### මහජන නිවාස

ඔබ Centrelink ගෙවීම් ලබන්නෙකු නම් හෝ අඩු ආදායම්ලාභියකු නම්, ඔබට රජයට අයිති මහජන නිවාසයක් කුලියට ගැනීම සඳහා අයදුම් කළ හැකිය.

ඔබ මහජන නිවාසයක වාසය කරන විට, ඔබට ගෙවීමට සිදු වන්නේ පෞද්ගලික කුලී නිවෙසකට වඩා අඩු සහන ගාස්තුවකි.

ඔබට ජීවත් වීමට අවශ්‍ය වන ප්‍රදේශය, ඔබේ කුටුම්බයෙහි ප්‍රමාණය, ඔබට කෙතරම් ඉක්මණින් නිවසක් අවශ්‍ය වන්නේද යන කරුණු මත මහජන නිවාසයක් සඳහා වන පොරොත්තු කාලය තීරණය වේ. මෙම පොරොත්තු කාලයන් ඉතා දිගු විය හැකිය.

වැඩි විස්තර සඳහා:

| ප්‍රාන්තය හෝ පළාත | නිවාස අධිකාරීන් | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | Housing and Community Services | 133 427 | www.communityservices.act.gov.au/hcs |
| NSW | Housing NSW | 1300 468 746 | www.housing.nsw.gov.au |

| ප්‍රාන්තය හෝ පළාත | නිවාස අධිකාරීන් | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| NT | Department of Housing | 08 8999 8814 | https://nt.gov.au/property/public-housing |
| Qld | Department of Housing and Public Works | 13 74 68 | www.qld.gov.au/housing/public-community-housing |
| SA | Housing SA | 131 299 | www.housing.sa.gov.au |
| Tas. | Housing Tasmania | 1300 135 513 | www.dhhs.tas.gov.au/housing |
| Vic. | Office of Housing | 1300 650 172 | www.housing.vic.gov.au/public-housing |
| WA | Department of Housing | 1800 093 325 | www.housing.wa.gov.au |

### නිවාසස්ථාන නැති පුද්ගලයන් සඳහා උපකාර

ඔබ නිවාසස්ථානයක් නැති පුද්ගලයකු හෝ නැතිවීමේ අවදානමක් සහිත පුද්ගලයකු නම්, පහත සඳහන් ආයතනවලට හදිසි වාසස්ථාන සැපයීමට හෝ ඒවා සඳහා ඔබව යොමු කිරීමට හැකිය.

| කලාපය | සේවා සහ වෙබ් අඩවිය | දුරකථනය |
|---|---|---|
| ජාතික | Homelessness Australia<br>www.homelessnessaustralia.org.au/index.php/are-you-homeless | 02 6247 7744 |
| ACT | FirstPoint<br>www.firstpoint.org.au | 1800 176 468 |
| NSW | Link2Home<br>www.facs.nsw.gov.au/about_us/news/link2home | 1800 152 152 |
| NT | ShelterMe<br>www.shelterme.org.au | |
| Qld | Homeless Hotline<br>www.qld.gov.au/housing/emergency-temporary-accommodation/homeless-persons-information-qld/ | 1800 474 753 |
| SA | Help in Crisis Situations<br>www.sa.gov.au/topics/housing-property-and-land/housing/emergency-shelter-and-homelessness/accessing-services | 1800 003 308 |
| Tas. | Housing Connect<br>www.dhhs.tas.gov.au/housing/housing_connect | 1800 800 588 |
| Vic. | Crisis and emergency accommodation<br>www.housing.vic.gov.au/crisis-and-emergency-accommodation | 1800 825 955 |
| WA | Homelessness Advisory Service<br>www.housing.wa.gov.au/housingoptions/homelessadvisoryservice | 1800 065 892 |

## කුලී නිවැසියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්

සෑම ප්‍රාන්තයකම සහ පළාතකම කුලී නිවැසියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව බොහෝ විට භාෂා කිහිපයකින් උපදෙස් සපයන රාජ්‍ය අධිකාරීන් ඇත:

| ප්‍රාන්තය හෝ පළාත | නිවාස සහ සාධාරණ වෙළඳ ගනුදෙනු පිළිබඳ අධිකාරිය | දුරකථනය |
|---|---|---|
| ACT | Access Canberra<br>www.accesscanberra.act.gov.au/app/answers/service/images/favicon.ico | 13 22 81 |
| NSW | NSW Fair Trading<br>www.fairtrading.nsw.gov.au/ftw/Tenants_and_home_owners/Renting_a_home.page | 13 32 20 |
| NT | Consumer Affairs<br>www.consumeraffairs.nt.gov.au/ForConsumers/ResidentialTenencies | 1800 019 319 |
| Qld | Residential Tenancies Authority<br>www.rta.qld.gov.au/ | 1300 366 311 |
| SA | Consumer and Business Services<br>www.sa.gov.au/topics/housing-property-and-land/housing/renting-and-letting/renting-privately | 131 882 |
| Tas. | Consumer Affairs and Fair Trading<br>www.consumer.tas.gov.au/renting | 1300 654 499 |
| Vic. | Consumer Affairs Victoria<br>www.consumer.vic.gov.au/housing-and-accommodation/renting/during-a-lease-or-residency/rent-and-other-payments/rent-receipts | 1300 558 181 |
| WA | Department of Commerce<br>www.commerce.wa.gov.au/publications/tenant-guide-renting-home-wa | 1300 304 054 |

කුලී නිවැසියන් සඳහා උපදෙස් සපයන රාජ්‍ය නොවන සංවිධානද ඇත:

| ප්‍රාන්තය හෝ පළාත | කුලී නිවැසියන්ගේ වෙබ් අඩවි | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | Tenants’ Union ACT | 02 6247 2011 | www.tenantsact.org.au/contactUs/Tenants-Advice-Service |
| NSW | Tenants NSW | | www.tenants.org.au |

| ප්‍රාන්තය හෝ පළාත | කුලී නිවැසියන්ගේ වෙබ් අඩවි | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| NT | NT Tenants' Advice Service | 1800 812 953 | www.dcls.org.au/legal-and-advocacy-services/tenants-advice |
| Qld | Tenants Queensland | 1300 744 263 | http://tenantsqld.org.au/info-for-tenants |
| SA | Tenants Information and Advisory Service | 1800 060 462 | www.syc.net.au/tias/overview |
| Tas. | Tenants Union of Tasmania | 1300 652 641 | http://tutas.org.au |
| Vic. | Tenants Union of Victoria | 03 9416 2577 | www.tuv.org.au |
| WA | Tenancy WA<br>ග්‍රාමීය නිදහස් ඇමතුම් | 08 9221 0088<br>1800 621 888 | www.tenancywa.org.au |
| ජාතික | Real Estate Institute of Australia | | https://reia.asn.au/consumers/renting-or-leasing-a-property |

## නිවසක් හෝ තට්ටු නිවසක් මිලදී ගැනීම

විකිණීමට ඇති නිවාස හෝ තට්ටු නිවාස සාමාන්‍යයෙන් පත්තරවල හෝ ජාලගතව ප්‍රසිද්ධ කෙරේ. දේපළ වෙළඳාම් ආයතනද විකිණීමට ඇති දේපළ ප්‍රදර්ශනය කරයි. ඔබ ඕස්ට්‍රේලියාවෙන් නිවසක් මිලදී ගන්නේ පළමු වරට නම්, ඔබට ප්‍රාන්ත හෝ පළාත් ආණ්ඩුවෙන් ලබාදෙන පළමු නිවෙස් හිමියන්ගේ දීමනාව ට හිමිකම් තිබිය හැකිය. (www.firsthome.gov.au බලන්න).

ඔබ ඕස්ට්‍රේලියානු නිත්‍ය පුරවැසියකු නොවේ නම්, නිවසක් මිලදී ගැනීම සඳහා ඔබට විදේශීය ආයෝජන අනුමැතිය තිබිය යුතුය. (කියවන්න www.firb.gov.au/real-estate).

දේපළක් මිලදී ගැනීම සඳහා ඔබට ණය මුදලක් ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔබේ බැංකුව හෝ වෙනත් මූල්‍ය ආයතනයකින් විමසන්න. ඕස්ට්‍රේලියාවේදී දේපළක් මිලදී ගැනීමේදී, සියලු දෙනාම ගනුදෙනු කළමනාකරණය සඳහා සාමාන්‍යයෙන් නීතිඥයකු හෝ නොතාරිස්වරයකු භාවිත කරති. සියලු නියමයන් සහ කොන්දේසි සම්පූර්ණයෙන්ම තේරුම් ගන්නා තුරු කිසිදු කොන්ත්‍රාත්තුවකට අත්සන් නොකරන්න.

දේපළක් මිලදී ගැනීම පිළිබඳ වැඩි විස්තර සඳහා www.australia.gov.au/information-and-services/family-and-community/housing-and-property වෙබ් අඩවියට පිවිසෙන්න.

## අත්‍යවශ්‍ය ගෘහස්ථ සේවා

ඔබ නිවසක් මිලදී ගත්තත්, කුලියට ගත්තත් වතුර, විදුලිය සහ ගෑස් වැනි ගෘහස්ථ සේවා ඔබේ දේපළට සම්බන්ධ කර ගැනීම වැදගත්ය. ඔබ වාසය කරන ප්‍රදේශය අනුව, සේවා සපයන්නෝ රාජ්‍ය ආයතන හෝ පෞද්ගලික සමාගම් විය හැකිය - දුරකථන නාමාවලිය බලන්න.

ඔබ අලුත් දේපළකට මාරු වීමට දින කිහිපයකටවත් කලින් සේවා සපයන්නන්ට දැනුම් දිය යුතුය.

ගෘහස්ථ සේවා සඳහා කොන්ත්‍රාත්තු අත්සන් කිරීමට ප්‍රථමයෙන්, එම සේවාව ඔබට අත්‍යවශ්‍යද යන්න තහවුරු කර ගන්න. උදාහරණයක් ලෙස, ඔබ තාවකාලික වාසස්ථානයකට යන්නේ නම්, විදුලිය සඳහා වසර තුනක ගිවිසුමකට අත්සන් නොකරන්න.

කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීමට මත්තෙන්, සැපයුම්කරුගේ ගිවිසුමෙහි ඇති නියමයන් සහ කොන්දේසි තේරුම් ගැනීම වැදගත්ය. ගෘහස්ථ බලශක්ති සේවා කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය උපකාර මාර්ගෝපදේශයක් www.accc.gov.au/publications/managing-energy-services-at-home හි ඇත. Australian Energy Regulator (ඕස්ට්‍රේලියානු බලශක්ති නියාමනය) ද www.aer.gov.au/consumers/aer-resources වෙබ් පිටුවෙහි ලා වැඩි විස්තර සපයයි.

බලශක්ති සමාගම සේවාවට අදාළ ගාස්තු ඇතුළත් බිල්පතක් කලින් කලට ඔබ වෙත එවයි. නියමිත කාලය තුළදී බිල ගෙවීමට නොහැකි නම්, හෝ විධිවිධාන වෙනස් කර ගැනීමට ඔබට අවශ්‍ය නම්, වහාම සමාගම අමතන්න.

ඔබේ බිල්පත් ගෙවීමට යම් දුෂ්කරතාවක් ඇත්නම්, ඔබේ සැපයුම්කරුට ඒ සඳහා උපකාර විය හැකි අතර එමගින් ඔබේ සේවාව විසන්ධි නොකර තබා ගැනීමට ඔබට හැකි වේ.

### විදුලිය සහ ගෑස්

විදුලි සහ ගෑස් සැපයුම්කරුවකු සොයා ගැනීමට මෙන්ම ඔබේ අයිතිවාසිකම් දැන ගැනීමටද අවශ්‍ය, වීඩියෝපටද ඇතුළත්, තොරතුරු සඳහා www.energymadeeasy.gov.au/ හි ඇති ඕස්ට්‍රේලියානු රජයේ Energy Made Easy වෙබ් අඩවියට යන්න.

සැපයුම්කරුවකු තෝරා ගැනීමේදී පහත සඳහන් දෑ පිළිබඳව සැලකිලිමත් වන්න.

- කොන්ත්‍රාත්තුව කොපමණ කලක් සඳහාද
- සේවාව සම්බන්ධ කිරීමට හෝ නියමිත කාලයට පෙර කොන්ත්‍රාත්තුවෙන් ඉවත් වීමට සිදු වුවහොත් ඒ සඳහා ගාස්තුවක් ගෙවීමට සිදු වේද
- ඔබට සහන හෝ ආදායම් සහාය (income support) ලැබෙන වග සැපයුම්කරු දැන සිටීද

ඔබේ විදුලි හෝ ගෑස් සැපයුම්කරු සමග යම් ගැටලුවක් නිරාකරණය කර ගැනීමට නොහැකි නම්, Energy Made Easy වෙබ් අඩවියෙහි විවිධ භාෂාවන් ගණනාවකින් පළවන තොරතුරු පත්‍රිකා (www.energymadeeasy.gov.au/publications-0) සහ බලශක්ති ඔම්බුඩ්ස්මන් ලැයිස්තුවක් (www.energymadeeasy.gov.au/useful-contacts) ඇත.

## Centrepay

Centrepay යනු Centrelink පාරිභෝගිකයන් සඳහා ස්වේච්ඡාවෙන් බිල්පත් පියවන සේවාවකි. (www.humanservices.gov.au/customer/services/centrelink/centrepay වෙබ් අඩවියට යන්න). ගෙවල් කුලිය, ගෑස්, විදුලි, වතුර සහ දුරකථන බිල්පත් යනාදිය සඳහා වන බිල්පත්, ගාස්තු සහ ගෘහස්ථ වියදම් ගෙවීමට ඔබේ Centrelink දීමනාවෙන් නිශ්චිත ගණනක් අඩු කිරීමේ වැඩපිළිවෙළක් සඳහා ඔබට Centrepay භාවිත කළ හැකිය. ඔබට මෙම අඩු කිරීම් ඕනෑම අවස්ථාවකදී ආරම්භ කිරීමටත්, වෙනස් කිරීමටත් හැකිය. මෙය කිරීමට පහසුම ක්‍රමය නම්, www.my.gov.au හි ඇති myGov ඔස්සේ ඔබේ ජාලගත Centrelink ගිණුමට පිවිසීමයි.

### දුරකථන සහ අන්තර්ජාලය

ඕස්ට්‍රේලියාවේදී, ජංගම දුරකථන හැඳින්වෙන්නේ 'mobile phones' වශයෙනි; ඔබේ නිවසේ සවිකර ඇති දුරකථන හැඳින්වෙන්නේ 'landline phones' (ගෘහස්ථ දුරකථන) හෝ 'landlines' (බිම් දුරකථන) වශයෙනි.

මෙම සේවාවන් සඳහා වන කොන්ත්‍රාත්තු සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ 'plans' (සැලසුම්) වශයෙනි. දුරකථන සහ අන්තර්ජාල සේවා ජාලගතව සංසන්දනය කිරීම සඳහා, 'mobile plan', 'landline plan' සහ 'internet plan' යන යෙදුම් සොයන්න.

සමාගමේ කොන්දේසි ඉතා සැලකිල්ලෙන් පරීක්ෂා කරන්න; කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමට පෙර *Critical Information Summary (තීරණාත්මක තොරතුරු පිළිබඳ සාරාංශය)* නම් වූ කෙටි ලියවිල්ල කියවන්න.

පහත සඳහන් වන්නේ ඕස්ට්‍රේලියානු දුරකථන සහ අන්තර්ජාල කොන්ත්‍රාත්තුවල පොදු ලක්‍ෂණයන්ය:

- මෙම සේවාවලට සම්බන්ධතා ගාස්තුවක් අය කෙරේ.
- ඔබට වසරක හෝ දෙකක කොන්ත්‍රාත්තුවකට එළඹීමට සිදු වේ.
- බොහෝ ජංගම දුරකථන සේවාවලට සෑම මසකටම අදාල ඇමතුම් දීමනාවක් හෝ ජංගම දුරකථන පුළුල් කලාප (mobile broadband) සඳහා දත්ත දීමනාවක් ඇතුළත් වේ; මෙම දීමනාවන්වල සීමා ඉක්මවා ගියහොත් ඔබට වැඩිපුර ගාස්තු ගෙවීමට සිදු වේ.
- බොහෝ සේවාවලට පාවිච්චිය කළමනාකරණ ඇඟවීම් - ඔබේ මාසික දීමනාවෙන් 50%ක්, 85%ක් හෝ 100%ක් ඉක්මවා ඇති බව දන්වන SMS හෝ විද්‍යුත් පණිවුඩ සේවාවක් ඇතුළත්ය.
- ඔබට පෙර-ගෙවුම් (පාවිච්චියට පෙර ගෙවන) හෝ පසු-ගෙවුම් (සැපයුම්කරු ඔබට මාස්පතා බිල්පත් එවයි) සේවා අතරින් එකක් තෝරා ගත හැකිය.

ඔබට දුරකථන හෝ අන්තර්ජාල බිල්පතක් ලැබුණහොත් සහ එය අදාළ දිනට පෙර ගෙවා දැමීමට නොහැකි නම්, සමාගම අමතන්න.

මාසික දුරකථන දීමනාවට සාමාන්‍යයෙන් වෙනත් රටවලට ගනු ලබන (අන්තර්ජාතික) ඇමතුම් ඇතුළත් නොවේ. මෙම ඇමතුම් මිල අධික විය හැකිය. ඔබට ඔබේ විදේශීය ඇමතුම් පිළිබඳව නිරතුරුව අවධානයෙන් සිටීමට සිදු වෙයි; නැත්නම්, පෙර-ගෙවුම් කාඩ්පතක් (වෙළඳසැල්වලින් ලබා ගත හැකිය) භාවිත කිරීම සුදුසුය.

ඔබට අන්තර්ජාල පහසුකම ඔබේ නිවසට ලබා ගැනීමට අවශ්‍ය නම් හෝ එය රැහැන් රහිත උපකරණයක් (wireless device) ඔස්සේ ලබා ගැනීමට අවශ්‍ය නම්, අන්තර්ජාල සේවා සපයන්නකු සමග කොන්ත්‍රාත්තුවකට එළඹීමට ඔබට සිදු වේ. කිසිදු කොන්ත්‍රාත්තුවකට අත්සන් කිරීමට පෙර, ඔබට එහි වියදම් දැරීමට හැකිද සහ එය ඔබේ අවශ්‍යතාවන්ට ගැළපේද යන්න සොයා බලා තහවුරු කරගන්න. ඔබට පෙර-ගෙවුම් අන්තර්ජාල සම්බන්ධතා ද ලබා ගත හැකිය.

අන්තර්ජාල පහසුකම් සහ ඒ සම්බන්ධ පුහුණුව නොමිලේ හෝ පහසු මිලකට ලබාදෙන වැඩසටහන් ගණනාවක් ඇත. උදාහරණයක් ලෙස, මහජන පුස්තකාල සහ ප්‍රාදේශීය කවුන්සිල අන්තර්ජාල සේවා නොමිලේ සැපයිය හැකිය.

ඔබ දුරකථන හෝ අන්තර්ජාල පහසුකම් ලබාගැනීම සඳහා (www.tio.com.au/members/members-listing හි ලැයිස්තුගත කොට ඇති) Telecommunications Industry Ombudsman (TIO) වැඩසටහනෙහි සාමාජිකත්වය දරන සමාගම් පමණක් භාවිත කළ යුතුය.

ඔබේ දුරකථනය හෝ අන්තර්ජාල සේවය සම්බන්ධ යම් ගැටලුවක් ඇත්නම් සහ ඔබේ සමාගමට එය විසඳීමට නොහැකි නම්, 1800 062 058 ඔස්සේ TIO ඇමතීමෙන් හෝ www.tio.com.au/making-a-complaint වෙබ් අඩවියට යාමෙන් ඔබට නොමිලේ පැමිණිල්ලක්
කළ හැකිය.

## ගෘහස්ථ කසළ එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය

සාමාන්‍යයෙන් කසළ එකතු කිරීම කළමනාකරණය කරනු ලබන්නේ ප්‍රාදේශීය රජයන් මගිනි. එමගින් ගෘහස්ථ කුණු-කසළ සහ බෝතල්, පත්තර, කාඩ්බෝඩ් වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි දේ සඳහා වෙන් වෙන් කසළ භාජන ලබා දේ.

කසළ එකතු කිරීමේ දින පරීක්‍ෂා කිරීම සඳහා, ඔබේ ප්‍රාදේශීය කවුන්සිලයෙන් විමසන්න, නැත්නම්, ඔබේ අසල්වැසියාගෙන් විමසන්න. 12 වන පරිච්ඡේදයේ *සිවිල් සහභාගීත්වය* ද කියවන්න.

### තැපැල

Australia Post ලියුම් පෙට්ටි හෝ කාර්යාල හරහා ඔබට ලියුම් හෝ පාර්සල් තැපැල් කළ හැකිය. දේශීය තැපැල් ගාස්තුවලට වඩා විදේශ මුද්දර මිලෙන් අධිකය. Australia Post බිල්පත් ගෙවීම සහ ගමන් බලපත්‍ර ඡායාරූප ගැනීම වැනි වෙනත් ප්‍රයෝජනවත් සේවාද සපයයි. (www.auspost.com.au වෙබ් අඩවියද බලන්න).

ඔබ ගෙවල් මාරු කරනවා නම්, ඔබේ නව ලිපිනයට ලියුම් යොමු කරගත හැකිය (www.auspost.com.au/parcels-mail/redirecting-your-mail.html වෙබ් අඩවියට යන්න). ගාස්තු සම්බන්ධ සහනයකට ඔබට සුදුසුකම් තිබිය හැකිය. වෙත් ආයතනවලට ඔබේ නව ලිපිනය ලබා දීමටද Australia Post වලට හැකිය.

# 8 ප්‍රවාහනය

## මෙම කොටසේදී

ඕස්ට්‍රේලියාව, එහි ප්‍රධාන නගර සහ කුඩා නගර ඉතා අධික දුර ප්‍රමාණවලින් වෙන් වී ඇති විශාල රටකි. නගර පුරා හෝ රට පුරා සංචාරය කිරීම සඳහා ප්‍රවාහන සේවා ගණනාවක් ඇත.

- පොදු ප්‍රවාහන
- කුලීරථ සේවා
- පාපැදි
- ඇවිදීම
- පුද්ගලික රථ-වාහන

## පොදු ප්‍රවාහන සේවා

බස්, දුම්රිය, ට්‍රෑම් සහ පාරුපාළම් ඕස්ට්‍රේලියාවේ පොදු ප්‍රවාහනය සේවාවට අයත් වේ. බොහෝ සේවා භාවිත කිරීම සඳහා ගාස්තුවක් ගෙවීමට හෝ ප්‍රවේශ පත්‍රයක් මිලදී ගැනීමට ඔබට සිදු වේ. ශිෂ්‍යයන්ට, ජ්‍යෙෂ්ට පුරවැසියන්ට සහ Health Care Card ධාරීන්ට සාමාන්‍යයෙන් සහන හිමි වේ. සතික හෝ මාසික ප්‍රවේශපත්‍ර, දෛනික හෝ එක් ගමන් වාරයක් සඳහා වන ප්‍රවේශපත්‍රවලට වඩා මිලෙන් අඩුය.

තොරතුරු සහ කාල සටහන් බොහෝ ප්‍රාදේශීය කවුන්සිල සහ නැරඹුම් මධ්‍යස්ථාන, ජාලගතව, දුම්රිය මධ්‍යස්ථාන, පුස්තකාල සහ මහජන තොරතුරු මධ්‍යස්ථානවලින් ලබා ගත හැකිය.

| ප්‍රාන්තය හෝ පළාත | පොදු ප්‍රවාහන ආයතනය | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | ACTION | www.action.act.gov.au |
| NSW | Transport NSW | www.transport.nsw.gov.au/ |
| NT | Department of Transport | https://nt.gov.au/driving/public-transport-cycling |
| Qld | Translink | www.translink.com.au |
| SA | Transport SA | www.sa.gov.au/topics/transport-travel-and-motoring/public-transport-and-travel |
| Tas. | Metro Tasmania | www.metrotas.com.au |
| Vic. | Metlink | www.metlinkmelbourne.com.au |
| WA | Public Transport Authority | www.pta.wa.gov.au |

## කුලීරථ සේවා

කුලීරථ හෝ 'cabs' ඕස්ට්‍රේලියාවේ බොහෝ ප්‍රදේශවල පැය 24හිම ක්‍රියාත්මක වේ. කුලීරථයෙහි උපකරණ පුවරුවෙහි ඇති මීටරයෙහි ගාස්තුව සටහන් වේ. කුලීරථ සමාගම් ජාලගතව සහ Yellow Pagesවල 'Taxi cabs' යටතේ ලැයිස්තුගත කර ඇත. රෝදපුටු භාවිත කරන හෝ ආබාධිත පුද්ගලයන් සඳහා විශේෂ කුළිරථ සෑම නගරයකම පාහේ ඇත. ඔබ කුඩා දරුවන් සමග ගමන් කරන්නේ නම්, කුලීරථයක් වෙන් කරවා ගැනීමේදී ළමා අසුනක් අවශ්‍ය බව සමාගමට දන්වන්න.

සමහර ප්‍රදේශවල Uber හෝ අනියම් මෝටර් රථ-සංසද වැනි විකල්ප කුලීරථ සේවා ද තිබිය හැකිය.

## පාපැදි

පාපැදිකරුවෝ සියලු මාර්ග නීති සහ සංඥාවලට කීකරු විය යුතු අතර, ඔබේ බයිසිකලයේ හොඳින් ක්‍රියා කරන තිරිංග සහ සීනුවක් තිබිය යුතුය. ඔබ බයිසිකලයක් ධාවනය කරන්නේ නම්, ඔබ සහ වෙනත් ඕනෑම මගියකු හිස් ආවරණ පැළඳ සිටිය යුතුය. රාත්‍රියේදී ධාවනය කරන විට, ඔබේ බයිසිකලයේ ඉදිරි සහ පසුපස ලාම්පු දැල්විය යුතුය. ඔබේ බයිසිකලය නවතා තබන හැම විටම එය අගුලු දමා යන්න.

ඔබේ ප්‍රදේශයේ හෝ නගරයේ පාපැදි භාවිතය වැඩි කිරීම සඳහා විශේෂ බයිසිකල් මංතිරු (පාර මත හෝ පාර අසබඩ), හෝ පොදු ප්‍රවාහන සේවාවන්ට ආසන්න පාපැදි නැවතුම්පළවල් වැනි වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක විය හැකිය.

සයිකල් මංතීරු ඇති විට, ඒවායේ පමණක් ඔබේ පාපැදිය ධාවනය කරන්න; මෙය වඩා ආරක්ෂාකාරී වන අතර, සමහර ප්‍රාන්තවල සහ පළාත්වල මෙය අනිවාර්යය. පාපැදි මංතීරුවක් නැතිනම්, ඔබ වඩා ආරක්ෂාකාරී ලෙස පාරේ හැකිතාක් වම්පසින් ඔබේ පාපැදිය ධාවනය කළ යුතුය. සාමාන්‍යයෙන් පාපැදිකරුවන් දෙදෙනෙකුට වඩා එකට යාබදව ගමන් නොකළ යුතුය.

## ඇවිදීම

ඇවිදීම ඕස්ට්‍රේලියාවේ ජනප්‍රිය විනෝදාත්මක ක්‍රියාවන් අතරින් එකකි.

පාර මාරු වීමේදී, මාර්ග සංඥා එළි හෝ පදික මාරු භාවිත කරන්න. වාහන පිළිබඳ සැලකිලිමත් වීම සඳහා පාරේ වම්පස සහ දකුණු පස බලන්න. මාවත්වල හෝ දුම්රිය මාර්ගවල ඇවිදීමෙන් වළකින්න.

ඔබ කැලයේ ඇවිදීමට යන්නේ නම්, ඔබ මනාව සූදානම්ව සිටින්නේද යන්න තහවුරු කරගන්න; යන තැන කාට හෝ පවසා යන්න.

## පුද්ගලික වාහන

පෞද්ගලික ප්‍රවාහනය යනු ඔබට අයත් සහ ඔබේ අවශ්‍යතාවට අනුව භාවිත වන වාහනයි. පුද්ගලික ප්‍රවාහනය සඳහා බොහෝ ඕස්ට්‍රේලියානුවෝ මෝටර් රථ හෝ යතුරු පැදි භාවිත කරති. මෝටර් රථයක් පරිහරණය කිරීම සුඛෝපභෝගී වුවත් මිල අධිකය. ඕස්ට්‍රේලියාවේදී මෝටර් රථයක් අයිති කරගැනීමට සහ පැදවීමට අදාළ බොහෝ වගකීම් ඇත.

Hitchhiking (නොමිලේ ප්‍රවාහනයක් ලබා ගැනීම) හෙවත් මෝටර් රථයක හෝ ට්‍රක් රථයක නොදන්නා අයෙකු හා ගමන් කිරීම, ආරක්ෂිත නැතිවා සේම නිර්දේශ කරන්නේද නැත.

### රියදුරු බලපත්‍ර

ඕස්ට්‍රේලියාවේදී මෝටර් රථයක් හෝ මෝටර් සයිකලයක් පැදවීමට ඔබට රියදුරු බලපත්‍රයක් අවශ්‍ය වේ. ඔබ රිය පදවන සෑම අවස්ථාවකම එය ළඟ තබා ගන්න.

ඔබට වෙනත් රටක රියදුරු බලපත්‍රයක් නැත්නම්, ඔබට Learner's Permit එකක් ලබා ගැනීම සඳහා Driver Knowledge Test (රියදුරු දැනුම් පරීක්ෂණය) සමත් වීමට සිදු වේ. Learner’s Permit එකක් විවෘත බලපත්‍රයක් සහිත රියදුරකු සමග රිය පැදවීමේ පුහුණුව ලබා ගැනීමට ඔබට ඉඩ සලසයි. Learner බලපත්‍රයක් මත රිය පැදවීමේදී ඔබේ මෝටර් රථයේ “L” තහඩුවක් ප්‍රදර්ශනය කොට තිබිය යුතුය.

යෝග්‍යතා ප්‍රවීනතාව ලබා ගත් පසුව, Provisional රියදුරු බලපත්‍රයක් සඳහා ඔබට අයදුම් කළ හැකිය. Provisional Licence එකක් ලබා ගැනීම සඳහා ඔබ වයසින් අවුරුදු 17ක් විය යුතු අතර, අඩුම තරමින් මාස හයක කාලයක් ආධුනික රියදුරු බලපත්‍රයක් දරා සිටීම හෝ ප්‍රාන්ත හෝ විදේශීය රියදුරු බලපත්‍රයක් දරා තිබිය යුතුය. Provisional බලපත්‍රයක් මත රිය පැදවීමේදී ඔබේ මෝටර් රථයේ “P” තහඩුවක් ප්‍රදර්ශනය කොට තිබිය යුතුය.

ඔබේ Provisional (ආධුනික) කාල සීමාව පසු කළේ නම්, ඔබට විවෘත බලපත්‍රය සඳහා අයදුම් කළ හැකිය.

1 වන පරිච්ඡේදයේ පැමිණි වහාම කළ යුත්තේ මොනවාද කොටස කියවන්න.

### රියදුරන්ට බලපාන නීති

රිය පැදවීමට අදාළ නීති පිළිබඳව ඔබ අවදියෙන් සිටිය යුතු අතර ඒවාට කීකරු විය යුතුය.
උදාරණ ලෙස:

- ඔබ පදවන වාහනය රජයේ ලියාපදිංචි කළ යුතුය.
- ඔබේ රථයේ ගමන් කරන සියලු දෙනාම ආසන පටි හෝ ළමා ප්‍රතිබාධන පැළඳ සිටිය යුතුය.
- රිය පදවන අතරතුර ජංගම දුරකථන භාවිතය නීතිවිරෝධීය.
- ඔබ මාර්ග අනතුරකට ලක්වුවහොත් වහාම පොලීසියට දැන්විය යුතුය.

ඕස්ට්‍රේලියාවේදී, රථ-වාහන නීති අතිශයින් දැඩිය. රියදුරන්ට බලපාන නීති-රීති ප්‍රාන්තයෙන් ප්‍රාන්තයට වෙනස් වේ. රථවාහන නීතිවලට අකීකරු වීමෙන් හෝ ඒවා කඩ කිරීමෙන් ඔබට අධික ගාස්තු සහිත දඩවලට යටත් වීමට, රියදුරු බලපත්‍රය අහිමි වීමට හෝ සිරගත වීමට සිදු විය හැකිය. නීතිවිරෝධී ලෙස වාහන නවතා තැබීමද විශාල දඩ ලැබීමට හේතුවකි. වේග සීමාවන් බලාත්මක වන අතර සීමාවන් ඉක්මවා යන රියදුරන් ඇල්ලීමට වේග මාපක කැමරා භාවිත කෙරේ.

රිය පදවන අතරතුර මත්පැන් පානය කිරීම හෝ මත් වී සිටීම, මත්ද්‍රව්‍ය භාවිත කර සිටීම නීතිවිරෝධීය. රුධිරයේ අඩංගු විය හැකි අනුමත ඇල්කොහොල් ප්‍රතිශතයන් ප්‍රාන්තය හෝ පළාතට අනුවත්, ඔබ දරන රියදුරු බලපත්‍රයේ පන්තිය අනුවත් වෙනස් වේ. පොලීසිය රියදුරන් නියමිත ඇල්කොහොල් සීමාව ඉක්මවා සිටීද යන්න විටින් විට පරීක්ෂා කරයි. 6 වන පරිච්ඡේදයේ *ඕස්ට්‍රේලියානු නීතිය*ද කියවන්න.

වැඩි විස්තර සඳහා:

| ප්‍රාන්තය හෝ පළාත | මාර්ග ප්‍රවාහන අධිකාරිය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | Road Transport Authority | 13 22 81 | www.rego.act.gov.au |
| NSW | Roads and Maritime Services | 13 22 13 | www.rms.nsw.gov.au |
| NT | Department of Transport | 1300 654 628 | https://nt.gov.au/driving |
| Qld | Department of Transport and Main Roads | 13 23 80 | www.tmr.qld.gov.au/ |
| SA | Transport | 13 10 84 | www.transport.sa.gov.au |
| Tas. | Transport Tasmania | 1300 135 513 | www.transport.tas.gov.au |
| Vic. | VicRoads | 13 11 71 | www.vicroads.vic.gov.au |
| WA | Department of Transport | 13 11 56 | www.transport.wa.gov.au/index.asp |

### ආසන පටි සහ ළමාරක්ෂක පටි

ඔබේ මෝටර් රථයේ සිටින සියලු දෙනාම ආසන පටි හෝ ළමාරක්ෂක පටි පැළඳ සිටිය යුතුය. ආසනපටි නොපැළඳ රිය පැදවීමට අදාළව දඩ ගසන අතර ඔබට ඔබේ රියදුරු බලපත්‍රය අහිමි වීමටද ඉඩ ඇත. වැඩිහිටියන් සහ ළමුන් සඳහා සියලුම මෝටර්රථවල ආසනපටි ඇත.

ළදරුවන් සහ වයස අවුරුදු හතට අඩු ළමුන් සඳහා විශේෂිත රාජ්‍ය අනුමැතිය ලත් ආරක්ෂක පටි අවශ්‍යය. ළමාරක්ෂක පටි ඕස්ට්‍රේලියානු ප්‍රමිතියට අනුකූල විය යුතුය; වාහනයට මනාව සවිකොට තිබිය යුතුය; ළමයාගේ වයසට ගැළපෙන ආකාරයට සකසා තිබිය යුතුය:

- මාස හය දක්වා වයස් කාණ්ඩයේ ළමුන් සඳහා වන අසුන්, උදාහරණයක් ලෙස ළදරු කැප්සියුල, පසුපසට මුහුණලා සිටින සේ සවිකළ යුතුය.
- මාස හයේ සිට අවුරුදු හතර දක්වා ළමුන් සඳහා වන අසුන්,උදාහරණයක් ලෙස ළමාරක්ෂක අසුන්, ඉදිරියට හෝ පසුපසට මුහුණලා සිටින සේ සවි කළ යුතුය.
- අවුරුදු හතරේ සිට අවුරුදු අට දක්වා වයස් කාණ්ඩයේ ළමුන් ඉදිරියට මුහුණලා සිටින සේ මනාව සවිකළ සහ ළමයාට ගැළපෙන සේ සකස් කළ ළමාරක්ෂක අසුනක හෝ හුවන අසුනක (booster seat) ආසන පටි හෝ ළමාරක්ෂක සන්නාහ තරකොට හිඳුවිය යුතුය.

ළමුන්ට වාහනයක ඉදිරි අසුනේ හිඳගෙන යාමට අවසර නැත. අවුරුදු හතරේ සිට අට දක්වා වයස ළමුන්ටද, වාහනයේ අනෙකුත් සියලුම පසුපස ආසනවල අවුරුදු හතට වඩා අඩු ළමුන් හිඳ සිටින අවස්ථාවක හැර, ඉදිරි අසුන්වල හිඳීමට අවසර නැත.

ළමාරක්ෂක ආසන කුලියට ගැනීම සඳහා www.kidsafe.com.au වෙබ් අඩවියට පිවිසෙන්න.

### මෝටර් රථයක් මිලදී ගැනීම

අලුත් සහ පාවිච්චි කරන ලද වාහන විකිණීම සඳහා පත්තරවල සහ ජාලගතව දැන්වීම් පළ කෙරේ. ඒවා අලුත් මෝටර් රථ ප්‍රදර්ශනාගාරවලින් සහ පාවිච්චි කළ වාහන අංගනවලින්ද ලබා ගත හැකිය.

වාහනයක කිණුම් මිලට ලියාපදිංචි ගාස්තු, මුද්දර ගාස්තු (විකිණීමේ බද්ද වැනි ගාස්තුවකි), සහ අනිවාර්ය රක්ෂණය ඇතුළත් නොවේ. මෙම ගාස්තු සාමාන්‍යයෙන් වෙනමම ගෙවීමට සිදු වේ.

වාහනයක් මිල දී ගැනීම සඳහා ණයමුදලක් ලබා ගැනීම සම්බන්ධ විස්තර සඳහා ඔබේ බැංකුව හෝ මූල්‍ය සමාගම අමතන්න. පිනැන්ස් පහසුකමක් සඳහා කිසිදු කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීමට පෙර සියලුම නියමයන් සහ කොන්දේසි අවබෝධ කර ගත්තේදැයි සැක හැර ගන්න.

ඔබ වාහනයක් මිලදී ගත් පසු, එහි පෙර හිමිකරු විසින් නොගෙවූ ණයක් එම වාහනයට ඇත්නම්, ණයහිමි සමාගමට එම වාහනය අයිති කර ගැනීමට හෝ නීත්‍යනුකූලව රැගෙන යාමට හැකිය. පූර්ව හිමිකරු විසින් නොගෙවූ ණයක් වාහනයකට ඇතිද යන්න දැන ගැනීම සඳහා Personal Property Securities Register (PPSR) අමතන්න.

වාහනය සොරකම් කරනු ලැබීම හේතුවෙන් පොලීසියට වාර්තා කරන ලද්දක්ද, නොගෙවූ රථවාහන දඩයක් හේතුවෙන් ලියාපදිංචියෙන් ඉවත් කරන ලද්දක්ද, ලියා අත්හරින ලද්දක් (write-off) ද, නැත්නම්, සැතපුම් මානය වෙනස් කරනු ලැබීම (සැතපුම් දර්ශකය කැඩීම) හේතුවෙන් Commissioner for Fair Trading හි වාර්තා කොට ඇත්තක්ද යන වග ඔබට දැන්වීමට PPSR ට පුළුවන. වැඩි විස්තර සඳහා 1300 007 777 ට අමතන්න, නැත්නම් www.ppsr.com.au/individuals වෙබ් අඩවියට යන්න.

පාවිච්චි කරන ලද වාහන මිලදී ගන්නා අය සඳහා වාහන පරීක්ෂණය, ගමන් තොරතුරු, රක්ෂණ, සහ මාර්ග සේවා (ඔබේ වාහනය කැඩුණු අවස්ථාවක නම්) වැනි සේවා සපයන මෝටර් රථ හිමියන්ගේ සංගම් සෑම ප්‍රාන්තයකම සහ පළාතකම ඇත. බොහෝ සේවා සාමාජිකයන්ට මෙන්ම සාමාජිකයන් නොවන අයටද ලබා ගත හැකිය.

| කලාපය | මෝටර් රථ හිමියන්ගේ සංගමය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ජාතික | Australian Automobile Association | 02 6247 7311 | www.aaa.asn.au |
| ACT | National Road Motorists Association (NRMA) | 132 132 | www.nrma.com.au |
| NSW | National Road Motorists Association (NRMA) | 132 132 | www.nrma.com.au |

| කලාපය | මෝටර් රථ හිමියන්ගේ සංගමය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| NT | Automobile Association of Northern Territory (AANT) | 08 8925 5901 | www.aant.com.au |
| Qld | Royal Automobile Club of Queensland (RACQ) | 13 1905 | www.racq.com.au |
| SA | Royal Automobile Association (RAA) | 08 8202 4600 | www.raa.net |
| Tas. | Royal Automobile Club of Tasmania (RACT) | 132 722 | www.ract.com.au |
| Vic. | Royal Automobile Club of Victoria (RACV) | 137 228 | www.racv.com.au |
| WA | Royal Automobile Club (RAC) | 131 703 | www.rac.com.au |

# 9 සෞඛ්‍ය සහ යහපැවැත්ම

## මෙම කොටසේදී


- හැඳින්වීම
- Medicare
- Health Care Card
- පුද්ගලික සෞඛ්‍ය රක්ෂණය
- වෛද්‍ය සහාය
- ගිලන්රථ ගාස්තු
- ඖෂධ
- ප්‍රාන්ත සහ පළාත් සෞඛ්‍ය සේවා
- ඖෂධ
- ආබාධිත සේවා
- වධහිංසා සහ කම්පනය සඳහා උපදේශන
- ළමාරක්ෂාව සහ අනතුරු වැළැක්වීම
- ප්‍රතිශක්තිකරණය
- දන්ත වෛද්‍ය සේවා
- ඕස්ට්‍රේලියාවේ වැඩිහිටි සත්කාර සේවා
- වැඩිහිටි හෝ සෞඛ්‍ය සත්කාර සේවා පිළිබඳ පැමිණිලි
- මරණයකින් පසුව


## හැඳින්වීම

ඕස්ට්‍රේලියාවේදී, හදිසි අවශ්‍යතාවක් හැර සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ අනෙක් සියලුම කාරණාවලදී ඔබේ පළමු උපදේශකයා වන්නේ general practitioner (GP - සාමාන්‍ය වෛද්‍යවරයාය). GP ඔබේ සෞඛ්‍ය අවශ්‍යතාව පිළිබඳ ඇගයීමක් කොට අවශ්‍ය ප්‍රතිකාර නියම කරයි. ඖෂධ නියම කිරීම, ව්‍යාධිවේදියෙකුට හෝ රෝග විනිශ්චය කරන ආයතනයකට යොමු කිරීම, හෝ ශෛල්‍ය වෛද්‍යවරයෙකු හෝ වෛද්‍ය උපදේශකයෙකුට හෝ විශේෂඥයෙකුට යොමු කිරීම යනාදිය මීට ඇතුළත් විය හැකිය. ඒ අනුව විශේෂඥ වෛද්‍යවරයා අතිරේක ව්‍යාධවේද හෝ වෙනත් පරීක්ෂාවන් නියම කරන අතර ඔබ රෝහලකට ඇතුළත් විය යුතුද නැද්ද යන්න තීරණය කරයි.

ඔබට GP කෙනෙකු තෝරාගත හැකි අතර GP සඳහා ගෙවන ගාස්තුවෙන් අඩක් හෝ සියල්ලම හෝ Medicare වෙතින් ආපසු ලබා ගැනීමට හැකිය. මෙය තීරණය වන්නේ GP ගාස්තු අය කරන ආකාරය මතය.

## Medicare

ඕස්ට්‍රේලියානු රජය Medicare නම් වූ ජාතික සෞඛ්‍ය ආරක්ෂක ව්‍යාපෘතියක් ඔස්සේ වෛද්‍ය සහ රෝහල් ගාස්තු පියවීමට ඔබට උපකාර කරයි. Medicare යටතේ, ඔබ රජයේ රෝහලක, එම රෝහල විසින්ම පත්කළ වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ලබන සාමාන්‍ය රෝගියකු නම්, ඔබට රෝහල් ගාස්තු සහ වෛද්‍ය ප්‍රතිකාර නොමිලේ හිමි වේ. (වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, අක්ෂි වෛද්‍යවරුන්, සමහර විට දන්ත වෛද්‍යවරුන් සහ ඊට සමාන වෙනත් වෛද්‍ය වෘත්තිකයන් වැනි) සෞඛ්‍ය වෘත්තිකයන් හමුවීමේ ගාස්තු පියවීමට Medicare ඔබට උපකාර කරයි. ඔබ නිරතුරුව වෛද්‍යවරයකු හමු වන්නේ නම්, හෝ වෛද්‍ය පරීක්ෂණ සඳහා යායුතු නම්, එවිට ඔබේ වෛද්‍ය වියදම් ඉතා අධික වෙයි. Medicare Safety Net සීමාව පසුකළ විට ඔබේ වෛද්‍ය හමු හෝ වෛද්‍ය පරීක්ෂණ සඳහා වන ගාස්තු අඩු වෙයි.

සංක්‍රමණිකයන්, සරණාගතයන් සහ මානුෂීය පදනම මත පැමිණියවුන්, ඔවුන්ගේ වීසා තත්වය අනුව, Medicare යටතේ වන සෞඛ්‍යාරක්ෂක පහසුකම්වලට නොපමාව හිමිකම් ලබයි. අනෙක් තාවකාලික සංක්‍රමණිකයන්ට පුද්ගලික වෛද්‍ය රක්ෂණයක් දැරීමට සිදුවෙයි.

සමහර වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය වෘත්තිකයන් තොග ක්‍රමයට (bulk bill) අය කරයි. තොග ක්‍රමයට අය කරන වෛද්‍ය හමුවලදී වෛද්‍යවරයා සම්පූර්ණ ගාස්තුව Medicare වෙතින් සෘජුවම අයකරගනු ලබන හෙයින් ඔබට කිසිදු ගෙවීමක් කිරීමට සිදු නොවේ. වෙනත් වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය වෘත්තිකයන් සේවා සඳහා ගාස්තුව ඔබෙන් අයකර ගත හැකිය. එවැනි අවස්ථාවකදී, ඔබේ සෞඛ්‍ය වෘත්තිකයා සමග කතා කරන්න, නැත්නම්, Medicare ප්‍රතිලාභයක් ලබා ගැනීම පිළිබඳව වැඩි විස්තර සඳහා www.humanservices.gov.au/medicare. වෙබ් අඩවියට යන්න. සෞඛ්‍ය වෘත්තිකයකු හමු වීමේදී ඔබ ඔබේ Medicare කාඩ්පත (සහ තිබේ නම් පමණක්, Health Care Card පත) රැගෙන යා යුතුය.

Pharmaceutical Benefits Scheme (PBS) යටතේ සමහර ඖෂධ වියදම් දැරීමටද ඕස්ට්‍රේලියානු රජය උපකාර කරයි. ඔබට බොහෝ ඖෂධ අවශ්‍ය නම්, නිර්දේශිත ඖෂධ සම්බන්ධ වියදම් දැරීමට PBS Safety Net ඔබට උපකාර කරයි. ඔබ PBS Safety Net සීමාව පසු කළේ නම් සහ ඖෂධවේදියා ඔබට PBS Safety Net Card පතක් නිකුත් කළේ නම්, ඔබේ PBS ඖෂධ, වසරේ ඉතිරි කොටස සඳහා ලාබෙට හෝ නොමිලේ ලැබෙනු ඇත. ඔබ වඩා මිල අධික ඖෂධ වර්ගයක් තෝරා ගත හොත්, හෝ ඔබේ වෛද්‍යවරයා එවැනි ඖෂධයක් නිර්දේශ කළහොත්, එවිටද ඔබට වැඩිපුර ගාස්තු ගෙවීමට සිදු වේ. PBS පිළිබඳ වැඩි විස්තර www.pbs.gov.au/pbs/home වෙබ් අඩවියෙන් ඔබට සොයා ගත හැකිය.

ගිලන්රථ වියදම්, දන්තවෛද්‍ය සහ එවැනි වෙනත් වෛද්‍ය සේවා, ඇස් කණ්ණාඩි හෝ පෞද්ගලික රෝගීන්ගේ රෝහල් ගාස්තු Medicare මගින් ආවරණය **නොකෙරේ.**

Medicare සමග ලියාපදිංචි වීමට ඔබට සුදුසුකම් ඇතිද යන වග දැන ගැනීම සඳහා, ඔබේ විදේශ ගමන් බලපත්‍රය හෝ Immicard පත මෙන්ම යෝග්‍යතා ලියකියවිලි වන Department of Immigration and Border Protection මගින් එවූ වීසා ලබා දීමේ ලිපිය, හෝ Visa Entitlement Verification Online වෙතින් ලද යම් සාක්ෂ්‍ය වැනිදෑ රැගෙන Medicare Service Centre වෙත යන්න. යෝග්‍යතාව ඇත්නම්, ඔබට Medicare අංකයක් නිකුත් කෙරේ. ඔබට ක්ෂණිකව සෞඛ්‍යාරක්ෂක සේවා ලබාගැනීම සඳහා මෙය භාවිත කළ හැකිය. ඔබේ Medicare අංකය, නම සහ එම කාඩ්පතට ඇතුළත්වන අනෙකුත් පවුල් සාමාජිකයන්ගේ නම්ද සමග Medicare කාඩ්පත තැපෑලෙන් ඔබ වෙත එවනු ඇත.

Medicare පිළිබඳ වැඩි විස්තර සඳහා www.humanservices.gov.au/medicare වෙබ් අඩවියට යන්න, නැතිනම්, ප්‍රාදේශීය Department of Human Services සේවා මධ්‍යස්ථානයක්, වෙත යන්න. මෙම සේවා මධ්‍යස්ථාන http://findus.humanservices.gov.au/ වෙබ් අඩවියෙන් සොයාගත හැකිය.

1 වන පරිච්ඡේදයේ පැමිණි වහාම කළයුත්තේ මොනවාද කොටසද කියවන්න.

## Health Care Card

ඔබට Centrelink දීමනා/ගෙවීම් ලැබෙන්නේ නම් හෝ ඔබ අඩු ආදායම්ලාභියෙකු නම්, ඔබට රජයේ Health Care Card (www.humanservices.gov.au/concessioncards බලන්න) සඳහා සුදුසුකම් තිබිය හැකිය. මෙම කාඩ්පත මගින් ඖෂධ වියදම්, වෛද්‍යවරුන්, දන්ත වෛද්‍යවරුන් සහ ගිලන්රථ ගාස්තු වැනි සෞඛ්‍ය සේවා සඳහා සහන ලබා දේ.

ඔබට Health Care Card පතක් ඇති නමුත්, සියලුම රෝහල් සහ වෛද්‍ය ප්‍රතිකාරවලදී, Health Care Card පත සමග ඔබේ Medicare කාඩ්පතද පෙන්වීමට සිදු වේ.

වැඩි විස්තර සඳහා 10 වන පරිච්ඡේදයේ ඔබේ පවුල කියවන්න.

### පෞද්ගලික සෞඛ්‍ය රක්ෂණ

පෞද්ගලික හෝ රජයේ රෝහල්වලදී පුද්ගලික රෝගියෙකු ලෙස ප්‍රතිකාර ලැබීමේ ගාස්තු පූර්ණ වශයෙන් හෝ අඩක් ආවරණය කරන පෞද්ගලික සෞඛ්‍ය රක්ෂණයක් සඳහා ගෙවීමට බොහෝ ඕස්ට්‍රේලියානුවෝ කැමති වෙත්. එය

Medicare මගින් ආවරණය නොවන බොහෝ දන්ත වෛද්‍ය සේවා, බොහෝ දෘෂ්ටි වෛද්‍ය සේවා සහ ගිලන්රථ සේවා ආවරණය කරයි.

රක්‍ෂණ වියදම සහ ආවරණයේ ස්වභාවය එකිනෙකට වෙනස් වේ, එමනිසා, ඔබ පෞද්ගලික රක්‍ෂණාවරණයක් ගැනීමට තීරණය කළහොත්, ඔප්පුවක් මිලදී ගැනීමට පෙර, විවිධ රක්‍ෂණ සමාගම් සංසන්දනය කිරීම සහ ආවරණ විස්තර ප්‍රවේශමෙන් කියවා බැලීම වැදගත්ය.

### දිරි දීමනා

ඕස්ට්‍රේලියානු රජය පුද්ගලයන්ට පෞද්ගලික රක්ෂණාවරණ ලබා ගැනීමට අනුබල දීම සඳහා මූල්‍යමය දිරිදීමනා ලබා දෙයි. ඔබ පෞද්ගලික රක්‍ෂණාවරණයක් මිලදී ගැනීමට සිතන්නේ නම්, පහත සඳහන් දෑ පිළිබඳව සැලකිලිමත් විය යුතුය:

- **Private Health Insurance Rebate -** ඔබට Medicare සඳහා සුදුසුකම් ඇත්නම්, සහ රෝහල් ප්‍රතිකාර සහ සාමාන්‍ය ප්‍රතිකාර යන දෙකම හෝ එකක් ආවරණය කරන අනුකූල සෞඛ්‍ය රක්‍ෂණාවරණයක්ද ඇත්නම්, ඔබට Private Health Insurance Rebate ලබා ගත හැකිය.
- **Medicare Levy Surcharge -** Medicare Levy Surcharge යනු පෞද්ගලික රක්‍ෂණාවරණ නැති සහ යම් ප්‍රමාණයකට (threshold) වඩා ඉහළ ආදායමක් ලබන අය විසින් ගෙවන අතිරේක සියයට එකක බද්දයි.
- **Lifetime Health Cover -** මෙම වැඩපිළිවෙළ පුද්ගලයන්ට අඩු වයසේදී ම රෝහල් ආවරණය ලබා ගැනීමට උනන්දු කරවයි. ඕස්ට්‍රේලියාවට පැමිණෙන නව සංක්‍රමණිකයන්ට Lifetime Health Cover ලබාගත හැකි අවසාන දිනය පහත දැක්වෙන දින දෙකින් එකකි:
    - ඔබේ 31 වැනි උපන් දිනයට පසුව පැමිණෙන ජූලි 1 වෙනි දා, හෝ
    - ඔබට වයස අවුරුදු 31ට වැඩි නම්, පූර්ණ Medicare ප්‍රතිලාභ සඳහා යෝග්‍ය අයකු ලෙස ලියාපදිංචි වූ දින සිට පළමු සංවත්සරය.

යම් පුද්ගලයකු Lifetime Health Cover එකක් ලබා ගැනීමට නියමිත දිනට පසුව රෝහල් ආවරණයක් මිලදී ගතහොත් ඔවුන්ට අවුරුදු 30 ඉක්මවූ පසු සෑම වසරකම අමතර 2%ක් ගෙවීමට සිදු වේ. උදාහරණයක් ලෙස, යම් අයෙකු පළමු වරට අවුරුදු 45දී පුද්ගලික සෞඛ්‍ය රක්‍ෂණයක රෝහල් ආවරණයක් මිලදී ගතහොත්, ඒ සඳහා ඔවුන්ට අමතර 30%ක් ගෙවීමට සිදු වේ. Lifetime Health Cover අධිභාරයක් ගෙවීම වැළැක්වීමට, Lifetime Health Cover එකක් මිලදී ගැනීමට නියමිත දින පසුවීමට පෙර ඕස්ට්‍රේලියාවේ ලියාපදිංචි සෞඛ්‍ය රක්‍ෂණ සමාගමකින් ඔබ රෝහල් ආවරණයක් මිලදී ගත යුතුය.

වැඩි විස්තර සඳහා:

| පෞද්ගලික සෞඛ්‍ය රක්‍ෂණ තොරතුරු | වෙබ් අඩවිය |
| --- | --- |
| පෞද්ගලික සෞඛ්‍ය රක්‍ෂණ | www.health.gov.au/internet/main/publishing.nsf/content/private-1 |
| Lifetime Health Cover | www.health.gov.au/internet/main/publishing.nsf/Content/health-privatehealth-lhc-providers-general.htm |
| Private Health Insurance Ombudsman | www.phio.org.au |
| සෞඛ්‍ය සමාගම් සහ ඔප්පු සංසන්දනය | www.privatehealth.gov.au |

## වෛද්‍ය සහාය

### පවුලේ වෛද්‍යවරයකු සොයා ගැනීම

ඔබට ඕස්ට්‍රේලියාවේ වෛද්‍යවරයකු සමග ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ. එසේ වුවත්, බොහෝ පුද්ගලයන්ට පවුලේ වෛද්‍යවරයෙක් ඇත. ඔවුහු ප්‍රතිශක්තිකරණ, ඖෂධ නිර්දේශ, වෛද්‍ය සහතික, සෞඛ්‍ය පරීක්ෂා, මානසික වෛද්‍ය අවශ්‍යතා සහ සෞඛ්‍ය උපදෙස් ඇතුළත් පොදු සෞඛ්‍ය අවශ්‍යතා සඳහා මෙම වෛද්‍යවරයා හමු වෙති.

මෙම වෛද්‍යවරුන් හැඳින්වෙන්නේ General Practitioners (GPs) යනුවෙනි. ඔවුහු කුඩා පෞද්ගලික සායනයක හෝ පොදු හෝ පුද්ගලික වෛද්‍ය ආයතනයක අනෙකුත් වෛද්‍යවරුන් සමග සේවය කරති. ඔබ හමුවන්නේ කිනම් වෛද්‍යවරයාද, යායුත්තේ කවර වෛද්‍ය මධ්‍යස්ථානයටදැයි තෝරා ගන්නේ ඔබය. GPලා ජාලගතව සහ දුරකථන නාමාවලියෙහි 'Medical practitioners' යටතේ ලැයිස්තුගත කර ඇත. ඔබව සැම විටම පරීක්ෂා කළ යුත්තේ එකම වෛද්‍යවරයා විසින්ද නැතහොත් එකම මධ්‍යස්ථානයක සිටින වෙනත් දොස්තරවරුන් විසින්දැයි ඔබට තීරණය කළ හැකිය.

ඔබට ගැළපෙන පවුලේ වෛද්‍යවරයකු සොයා ගැනීම සඳහා වෛද්‍ය මධ්‍යස්ථාන කිහිපයකට යාමට ඔබට සිදු විය හැකිය. සමහර වෛද්‍ය මධ්‍යස්ථාන අලුත් රෝගීන් භාර නොගනිති.

ඔබට ආසන්නතම General Practice සේවාව සොයා ගැනීම සඳහා www.healthdirect.gov.au හි ඇති healthdirect වෙබ් අඩවිය General Practice සෙවුමක් ඉදිරිපත් කරයි.

### දිගුකාලීන සෞඛ්‍ය තත්වයන්

ඔබට යම් අසනීපයක් ඇත්නම් සහ එය හදිසි තත්වයක් නොවේ නම්, පවුලේ වෛද්‍යවරයා වෙත හෝ වෛද්‍ය මධ්‍යස්ථානයකට යන්න. දොස්තරවරයකු හමුවීමට පෙර යම් කාලයක් රැඳී සිටීමට ඔබට සිදු විය හැකිය.

වෛද්‍ය මධ්‍යස්ථානයකට පැමිණීමට පෙර ජාලගතව හෝ දුරකථන ඇමතුමක් මගින් ඔබට වෛද්‍ය හමුවක් වෙන් කර ගැනීමට සිදු වනු ඇත. ඔබේ හමුවට නියමිත වේලාවට පැමිණීමට වග බලා ගන්න.

### ක්ෂය රෝගය

ඔබ ආසියාව, අප්‍රිකාව, ඉන්දියානු අර්ධ ද්වීපය, දකුණු ඇමෙරිකාව හෝ යුරෝපය වැනි රටකින් පැමිණෙන්නේ නම්, ඔබ ක්ෂය රෝගයට නිරාවරණය වී තිබිය හැකි අතර එය වැළඳීමට සහ අධික ලෙස රෝගාතුර වීමට ඇති ඉඩකඩ බොහෝය.

ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර ක්ෂය රෝග පරීක්ෂාවක් කරගෙන ඇති නමුත්, ළයෙහි X-කිරණ පරීක්ෂාවකින් අනාවරණය කරගත නොහැකි සියුම් ආසාදනයකට ඔබ ලක්ව සිටිනවා විය හැකිය.

ඔබට අසනීප ගතියක් දැනෙන්නේ නම් හෝ සක්‍රිය ක්ෂය රෝගී තත්වයකට ගොදුරු වීමේ අවදානම පිළිබඳ තැකීමක් කරන්නේ නම්, ඔබේ පවුලේ වෛද්‍ය වරයාට කතා කරන්න; නැත්නම්. පහත දැක්වෙන දුරකථන තොරතුරු සහ උපදෙස් සේවාව අමතන්න.

### විශේෂඥ වෛද්‍යවරු

ඔබට පළමුව සාමාන්‍ය වෛද්‍යවරයකු (පවුලේ වෛද්‍යවරයා) හමු නොවී වෛද්‍ය විශේෂඥයකු වෙත යා නොහැක. වැඩිදුර ප්‍රතිකාර සඳහා ඔබේ වෛද්‍යවරයා ඔබව වෛද්‍ය හෝ වෙනත් විශේෂඥයෙකුට යොමු කරනු ඇත.

### වෛද්‍යවරුන්ගේ භාෂණ පරිවර්තන ප්‍රමුඛතා සේවාව

අවශ්‍ය වුවහොත්, දොස්තරවරුන්ට TIS National භාෂණ පරිවර්තකයකු භාවිත කළ හැකිය. ඔබ ඕස්ට්‍රේලියාවේ නිත්‍ය පදිංචිකරුවකු හෝ පුරවැසියකු නම් හා ඔබේ වෛද්‍ය උපදේශක ගාස්තු Medicare මගින් ආවරණය වන්නේ නම්, මෙම සේවාව ඔබට නොමිලේ සැපයේ. අවශ්‍ය නම්, ඔබේ දොස්තරවරයාට වෛද්‍යමධ්‍යස්ථානය තුළදීම සේවය සපයන පරිවර්තකයකු කැඳවිය හැකිය. 3 වන පරිච්ඡේදයෙහි ඉංග්‍රීසි භාෂාව කියවන්න.

### හදිසි වෛද්‍ය තත්වයන්

රජයේ ආරෝග්‍ය ශාලාවල හදිසි ප්‍රතිකාර ඒකකයෙන් දවසේ පැය 24මත්, සතියේ දින හතේමත් හදිසි ප්‍රතිකාර සේවා ලබා ගත හැකිය. රජයේ රෝහල් White Pagesවල ‘Hospitals’ යටතේ ලැයිස්තුගත කර ඇත. සමහර වෛද්‍ය මධ්‍යස්ථානවල සහ පෞද්ගලික රෝහල්වලද හදිසි ප්‍රතිකාර සේවා ක්‍රියාත්මක කෙරේ.

ඔබ හෝ වෙනත් අයෙකු අනතුරුදායක ලෙස රෝගී වී ඇත්නම්, වහාම **000** අමතා **“Ambulance”** ඉල්ලන්න. ඔබ රෝහලකට යන විටදී, පාවිච්චි කරන බෙහෙත් වර්ග සහ ඔබේ Medicare, පුද්ගලික රක්‍ෂණ සාමාජිකත්ව, Health Care හෝ Pension Concession කාඩ්පත් රැගෙන යන්න.

තත්වය හදිසි අවස්ථාවක් නොවේ නම්, ඔබේ පවුලේ වෛද්‍යවරයා අමතන්න.

### දුරකථනමාර්ගික සෞඛ්‍ය තොරතුරු සහ උපදෙස් සේවාව

සියලු ප්‍රාන්ත සහ පළාත්වල දවසේ පැය 24 මත්, සතියේ දින හතේමත් ක්‍රියාත්මක වන දුරකථනමාර්ගික සෞඛ්‍ය සේවාවන් ඇත. ඔවුහු නොමිලේ මාර්ගෝපදේශ සපයන අතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා වෙත ඔබව යොමු කරති.

ඔබට සෞඛ්‍ය ප්‍රශ්නයක් ඇත්නම්, පළමුව ඔබේ පවුලේ වෛද්‍යවරයා ඇමතිය යුතුය. ඔවුන්ගේ සේවය ලබා ගත නොහැකි නම්, මෙම දුරකථනමාර්ගික සේවාවල සිටින පුහුණු හෙද/හෙදියන්ට ඔබට අවශ්‍ය වෘත්තීයමය වෛද්‍ය උපදෙස් ක්‍ෂණිකව ලබා දීමට පුළුවන.

| ප්‍රාන්තය හෝ පළාත | දුරකථන සෞඛ්‍ය උපදේස සේවා | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT, NSW, NT, Tas., SA සහWA | healthdirect | 1800 022 222 | www.healthdirect.gov.au |
| Qld | 13 HEALTH | 13 43 25 84 | www.health.qld.gov.au/13health/default.asp |
| Vic. | NURSE-ON-CALL | 1300 606 024 | www.health.vic.gov.au/nurseoncall |

## ගිලන්රථ ගාස්තු

ගිලන්රථ ප්‍රවාහන ගාස්තු Medicare මගින් ආවරණය නොකෙරේ. ඔබ වාසය කරන්නේ කිනම් ප්‍රාන්තයේද/පළාතේද යන්න මත ගිලන්රථ ගාස්තු වෙනස් වේ.

ක්වීන්සලන්තයෙහි (Queensland) සහ තස්මේනියා (Tasmania)වෙහි ගිලන්රථ සේවාව ප්‍රාදේශීය පදිංචිකරුවන්ට නොමිලේ සැපයේ. අනෙක් සියලුම ප්‍රාන්තවල සහ පළාත්වල ගාස්තුවක් අය කෙරෙනු ඇත. මෙම ගාස්තු ප්‍රවාහනය කරන දුර, ඔබේ අසනීප තත්වය සහ ඔබට සහනගාස්තු සඳහා යෝග්‍යතාව ඇතිද යන කාරණා මත අඩු-වැඩි විය හැකිය.

ඔබට ගිලන්රථ රක්‍ෂණයක් නැත්නම්, කෙටි දුරක් සඳහා වුවද ගිලන්රථ ගාස්තු මිල අධික විය හැකිය. ඔබ ක්වීන්ස්ලන්තයෙන් (Queensland) හෝ තස්මේනියා (Tasmania)වෙන් බැහැර ප්‍රදේශයක වාසය කරයි නම්, ඔබට රක්‍ෂණයක් ගැනීම අවශ්‍ය වනු ඇත.ගිලන්රථ සේවාව මගින් ලබාදෙන සාමාජිකත්වය හෝ පුද්ගලික සෞඛ්‍ය රක්‍ෂණයක් ලබා ගැනීමෙන් ඔබට මෙය කළ හැකිය.

වැඩි විස්තර සඳහා 2 වන පරිච්ඡේදයේ *උපකාර ලබා ගන්න* කියවන්න.

### ඖෂධ

ඔබට ඖෂධ අවශ්‍ය නම්, ඔබේ වෛද්‍යවරයා බෙහෙත් වට්ටෝරුවක් ඔබට ලියා දෙනු ඇත. එය ඔසුසලකට රැගෙන යන්න. ප්‍රතිජීවක වැනි බොහෝ ඖෂධ ලබා ගත හැක්කේ වෛද්‍ය නිර්දේශය මත පමණි. ඔබට Centrelink මගින් නිකුත් කළ Health Care Card හෝ Pension Concession Card ඇත්නම්, සමහර ඖෂධ සඳහා වට්ටම් ලබා ගැනීමට ඔබට හැකිය. ඔබ ඔබේ Medicare කාඩ්පතද ඔසුසලට රැගෙන යා යුතුය.

ඖෂධවල ලේබල් සහ උපදෙස් සැලකිල්ලෙන් කියවීම වැදගත් වන අතර ඔබට යම් සැකයක් ඇත්නම් දොස්තරවරයාගෙන් හෝ ඖෂධවේදියාගෙන් විමසන්න. ඖෂධ පිළිබඳ උපකාර සහ තොරතුරු සඳහා ඖෂධවේදියකුට කතා කරන්න, නැත්නම් 1300 633 424 ඔස්සේ Medicine Line අමතන්න.

ඔසුසල්වලට දුරකථන පරිවර්තකයෝ භාවිත කළ හැකිය. මෙය රජය මගින් නොමිලේ සපයන සේවාවකි.

| ඖෂධ සහ ඖෂධ වට්ටෝරු | දුරකථනය | වෙබ් අඩවිය |
| --- | --- | --- |
| [NPS MedicineWise Medicine Line](www.nps.org.au/contact-us/medicines-line) – ඖෂධ සහ නිර්දේශ පිළිබඳ තොරතුරු | 1300 633 424 සඳුදා- සිකුරාදා පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා | www.nps.org.au/contact-us/medicines-line |
| [Medicare Australia](www.medicareaustralia.gov.au/public/services/scripts/index.jsp) – PBS බෙහෙත් වට්ටෝරු සඳහා මුදල් ලබා ගැනීම පිළිබඳ තොරතුරු | | www.medicareaustralia.gov.au/public/services/scripts/index.jsp |

## ප්‍රාන්ත සහ පළාත් සෞඛ්‍ය සේවා

ප්‍රාන්ත සහ පළාත් රජයන් රෝහල්, ප්‍රජා සෞඛ්‍ය සහ වේදනා නාශක සාත්තු සේවා (palliative care) සපයයි.

### ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන

ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයන්ට අඩු ගාස්තුවකට සෞඛ්‍ය සේවා සපයයි. සියලුම මධ්‍යස්ථාන එකම සේවාව නොසපයයි. මෙම සේවාවන් අතරට හෙද සේවාව, සෞඛ්‍ය අධ්‍යාපන සහ ප්‍රවර්ධන, භෞත චිකිත්සාව, දන්ත වෛද්‍ය සේවාව, වෛද්‍ය සේවා, උපදේශන සහ සමාජ සුබසාධන සේවා ඇතුළත් වේ.

### කුඩා දරුවන් සහිත පවුල් සඳහා සෞඛ්‍ය සේවා

උපතේ සිට පාසල් යන වයස දක්වා ළමයින් සිටින පවුල්වලට මාතෘ සහ ළමා සෞඛ්‍ය සේවා නොමිලේ සැපයේ. ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සෞඛ්‍ය තොරතුරු, ප්‍රතිශක්තීකරණය, සහ ළමා සංවර්ධනය, මාපිය කටයුතු සහ කුඩා දරුවන් සඳහා පෝෂණය සපයයි.

### කාන්තා සෞඛ්‍ය සේවා

වනිතා සෞඛ්‍ය සේවය, ප්‍රජනන සෞඛ්‍ය ගැටලු, ගැබ්ගෙළ සහ පියයුරු පිළිකා පරීක්ෂණය, ඇල්කොහොල් සහ මත්ද්‍රව්‍ය ප්‍රශ්න, මානසික සෞඛ්‍ය ගැටලු සහ කාන්තා ලිංග ඡේදනය ඇතුළත් ලිංගික අඩන්තේට්ටම් සහ ගෘහස්ථ හිංසනය යනාදිය පිළිබඳ උපකාර සපයයි. [6 වන පරිච්ඡේදයේ *ඕස්ට්‍රේලියානු නීතිය*] කොටසද කියවන්න.

### විවිධ පසුබිම් සහිත පුද්ගලයන් සඳහා සේවා

බොහෝ රෝහල්වල සහ මහාපරිමාණ සෞඛ්‍ය මධ්‍යස්ථානවල දේශීය සංක්‍රමණික ප්‍රජාවන් සඳහා සේවා සපයන සෞඛ්‍ය වෘත්තිකයෝ සිටිති. උපදේශන, උපදෙස්, යොමු කිරීම් සහ සෞඛ්‍ය තොරතුරු සැපයීම මෙම සේවාවලට ඇතුළත් වේ.

ඔබේ භාෂාව කතා කරන පිරිස සඳහා වන Multicultural Health Worker කෙනෙකු සිටීද යන වග දැන ගැනීමට ඔබේ ප්‍රදේශයේ රෝහලට හෝ සෞඛ්‍ය මධ්‍යස්ථානයට හෝ අමතන්න.

සෞඛ්‍ය සේවාවක් සොයා ගැනීම සඳහා:

| ප්‍රාන්තය හෝ පළාත | සෞඛ්‍ය ආයතන | වෙබ් අඩවිය |
| --- | --- | --- |
| ACT | [ACT Health](http://health.act.gov.au/our-services/which-health-service-suits-you-best) | http://health.act.gov.au/our-services/which-health-service-suits-you-best |

| ප්‍රාන්තය හෝ පළාත | සෞඛ්‍ය ආයතන | වෙබ් අඩවිය |
| --- | --- | --- |
| NSW | NSW Ministry of Health | www.health.nsw.gov.au/hospitals/pages/default.aspx |
| NT | Department of Health | www.health.nt.gov.au/Service_Locator/index.aspx |
| Qld | Queensland Health | www.health.qld.gov.au |
| SA | SA Health | www.sahealth.sa.gov.au/wps/wcm/connect/Public+Content/SA+Health+Internet/ |
| Tas. | Department of Health and Human Services | www.dhhs.tas.gov.au |
| Vic. | Department of Health and Human Services | https://www2.health.vic.gov.au |
| WA | Department of Health | http://ww2.health.wa.gov.au |

## ආබාධිත සේවා

National Disability Insurance Scheme (NDIS) සුදුසුකම් ලත් යාවකාලික හෝ සැලකියයුතු ආබාධ සහිත පුද්ගලයන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ සාත්තුකරුවන්ට පුද්ගල විශේෂිත වූ උපකාර සපයයි. NDIS සහාය වත්කම් පරීක්ෂාවට අදාළ නොවන අතර ආබාධිත උපකාරී විශ්‍රාම දීමනා හෝ සාත්තු සේවක දීමනා වැනි ආදායම් උපකාරවලට බල නොපායි.

මෙම අවස්ථාවේදී, NDIS ආධාර ලබා ගැනීම සඳහා වයස සහ ස්ථාන පිළිබඳ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට සිදු වෙයි. යෝග්‍යතාව පිළිබඳ තොරතුරු www.ndis.gov.au/people-disability/access-requirements වෙබ් අඩවියෙහි ඇත.

ඔබ සිටින්නේ NDIS පිහිටුමක නොවේ නම්, ඔබට දැනට පවත්නා ආබාධිත සේවා ලබා ගැනීමට හැකි වෙයි. මෙම සේවා පිළිබඳ වැඩි විස්තර සඳහා www.ndis.gov.au/people-disability/other-services වෙබ් අඩවියට යන්න.

ප්‍රාන්ත සහ පළාත් සෞඛ්‍ය සේවා ආබාධ සහිත පුද්ගලයන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ සාත්තුකරුවන්ට විවිධාකර උපකාර සහ සේවා සපයයි.

| ප්‍රාන්තය හෝ පළාත | ආබාධිතයන් සඳහා වන ආයතන | දුරකථනය | වෙබ් අඩවිය |
| --- | --- | --- | --- |
| ACT | Disability ACT | 133 427 | www.communityservices.act.gov.au/disability_act |
| NSW | Department of Family and Community Services (වැඩිහිටි, ආබාධිත සහ ගෘහස්ථ සාත්තු සේවා) | | www.adhc.nsw.gov.au/individuals/support |
| NT | Northern Territory Government Office of Disability | 1800 139 656 | http://health.nt.gov.au/Aged_and_Disability/Office_of_Disability/index.aspx |

| ප්‍රාන්තය හෝ පළාත | ආබාධිතයන් සඳහා වන ආයතන | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| Qld | Department of Communities, Child Safety and Disability Services | 13 QGOV<br>හෝ<br>13 74 68 | www.communities.qld.gov.au/ndis |
| SA | Disability Information Service | 1300 786 117 | www.sa.gov.au/topics/community-support/disability |
| Tas. | Tasmanian Government Disability and Community Services | 1300 135 513 | www.dhhs.tas.gov.au/disability |
| Vic. | Department of Health and Human Services | 1300 650 172 | www.dhhs.vic.gov.au |
| WA | Disability Services Commission | (08)9426 9200<br>නොමිලේ ඇමතුම්<br>1800 998 214 | www.disability.wa.gov.au |

ආබාධිත සේවා පිළිබඳ වැඩි විස්තර සඳහා:

| ජාතික ආයතනය | වෙබ් අඩවිය |
|---|---|
| Department of Social Services – වැඩසටහන් සහ සේවා | www.dss.gov.au/our-responsibilities/disability-and-carers/programmes-services |
| Department of Human Services – ආබාධ සහිත පුද්ගලයන් සඳහා උපකාර | www.humanservices.gov.au/disability |
| ආබාධිතයන් සම්බන්ධ ආයතන සහ වෙබ් අඩවි | www.dss.gov.au/our-responsibilities/disability-and-carers/related-agencies-sites |
| ආබාධිතයන් සහ ඔවුන්ගේ සාත්තුකාරයන් සඳහා රාජ්‍ය උපකාර, ප්‍රතිලාභ සහ ගෙවීම් පිළිබඳ වැඩි විස්තර: | www.australia.gov.au/information-and-services/benefits-and-payments/people-with-disability |

## මානසික සෞඛ්‍ය සේවා

ඔබට මානසික සෞඛ්‍ය ගැටලු හෝ රෝගී තත්වයක් සම්බන්ධයෙන් උපකාර අවශ්‍ය නම්, ඔබේ පවුලේ වෛද්‍යවරයා හෝ ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථානය අමතන්න.

ඔබට හදිසි උපකාර අවශ්‍ය නම්, ඔබට ආසන්නම රෝහලේ මානසික වෛද්‍ය කණ්ඩායම අමතන්න, නැත්නම්, පහත සඳහන් උපකාර සේවා අමතන්න:

| මානසික සෞඛ්‍ය උපකාර | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| Lifeline – පැය 24 උපකාර සේවා | 13 1114 | www.lifeline.org.au/ |
| Kids Helpline – පැය 24 උපකාර සේවා | 1800 55 1800 | www.kidshelp.com.au/ |
| Mens Helpline Australia – පැය 24 උපකාර සේවා | 1300 789 978 | www.mensline.org.au/ |
| Suicide Call Back Service – රට පුරා ව්‍යාප්ත ගාස්තු රහිත උපදේශන සේවාව | 1300 659 467 | www.suicidecallbackservice.org.au |

පහත දැක්වෙන සේවාද ඇතුළත්ව, Department of Social Services මගින් මානසික සෞඛ්‍ය නගා සිටුවීම සඳහා ප්‍රජා මට්ටමේදී සැපයෙන සේවා සහ වැඩසටහන් පිළිබඳ වැඩි විස්තර සඳහා:

- Family Mental Health Support Service (FMHSS)
- Personal Helpers and Mentors (PHaMs)
- Mental Health Respite: Carers Supports (MHR:CS)

www.dss.gov.au/mental-health වෙබ් අඩවියට යන්න.

## වධ හිංසා සහ කම්පනය සඳහා උපදේශන

පහත සඳහන් විශේෂඥ සේවා කම්පනය සහ වධ හිංසාවලට ලක් වූ පුද්ගලයන්ට උපකාර සපයයි:

| ප්‍රාන්තය හෝ පළාත | කම්පන සහ වධහිංසා උපදේශන | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | Companion House – කම්පනය සහ වධ හිංසාවලට ලක් වී බේරුණ අයට උපකාර කරයි. | 02 6251 4550 | www.companionhouse.org.au |
| NSW | කම්පනයට සහ වධ හිංසාවලට ලක්වී බේරුණු අයට ප්‍රතිකාර සහ පුනරුත්ථාපන සේවා (STARTTS) | 02 9794 1900 | www.startts.org.au |
| NT | Melaleuca Refugee Centre – කම්පනය සහ වධ හිංසාවලට ලක් වී බේරුණු අයට උපකාර සපයයි. | 08 8985 3311 | www.melaleuca.org.au |
| Qld | Queensland Program of Assistance to Survivors of Torture and Trauma (QPASTT) | 07 3391 6677 | www.qpastt.org.au |
| SA | Survivors of Torture and Trauma Assistance and Rehabilitation Service (STTARS) | 08 8206 8900 | www.sttars.org.au |
| Tas. | Phoenix Centre – කම්පනය සහ වධ හිංසාවලට ලක් වී බේරුණු අයට උපකාර සේවා. | 03 6234 9138 | http://mrchobart.org.au/phoenix-centre/ |

| ප්‍රාන්තය හෝ පළාත | කම්පන සහ වධහිංසා උපදේශන | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| Vic. | Foundation House – Victorian Foundation for Survivors of Torture (VFST) | 03 9388 0022 | www.foundationhouse.org.au |
| WA | Association for Services to Torture and Trauma Survivors (ASeTTS) | 08 9227 2700 | www.asetts.org.au |

## ළමා නිරාපදාව සහ අනතුරු වැළකීම

Kidsafe, ඕස්ට්‍රේලියානු ළමා අනතුරු වැළකීමේ පදනම, යනු www.kidsafe.com.au වෙබ් පිටුව හරහා දෙමාපියන්ට සහ ප්‍රජා සංවිධානවලට ළමා නිරාපදාව සහ අනතුරු වැළැක්වීම පිළිබඳ තොරතුරු සහ සේවා සපයන රාජ්‍ය නොවන සංවිධානයකි. වෙබ් අඩවියෙහි බටහිර ඕස්ට්‍රේලියානු සහ වික්ටෝරියානු අංශවල සමහරක් පරිවර්තිත තොරතුරු පත්‍රිකා ඇත.

## ප්‍රතිශක්තිකරණය

ප්‍රතිශක්තීකරණය හානිකර ආසාදනවලින් සහ රෝගවලින් ළමුන් සහ වැඩිහිටියන් ආරක්ෂා කරයි. ප්‍රතිශක්තීකරණය අනිවාර්ය නොවේ. එහෙත් සියලුම ළමුන්ට සහ සමහර වැඩිහිටියන්ට එය නිර්දේශ කෙරේ. සමහර ප්‍රාන්ත හෝ පළාත්වල ළමයකු ළමා සුරැකුම් මධ්‍යස්ථානයකට හෝ පාසලකට ඇතුළත් කිරීමට පෙර ප්‍රතිශක්තීකරණ වාර්තාව ඉදිරිපත් කිරීමට සිදු වේ.

බොහෝ එන්නත් දෙනු ලබන්නේ ඔබේ පවුලේ වෛද්‍යවරයා හෝ ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථානය මගිනි. කෙසේ වෙතත්, සමහර එන්නත් දෙනු ලබන්නේ පාසැලේදීය. වැඩි විස්තර දැන ගැනීම සඳහා පවුලේ වෛද්‍යවරයා හෝ ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථානය අමතන්න.

www.humanservices.gov.au/acir හි ඇති Australian Childhood Immunisation Register (ACIR) යනු ළමුන්ට සහ වයස අවුරුදු 20ට අඩු යෞවන/යෞවනියන්ට ලබා දෙන එන්නත් පිළිබඳව වාර්තා තබා ගන්නා ජාතික ලේඛනයකි.

Medicare සමග ලියාපදිංචි වී ඇති ළමුන් සහ වයස අවුරුදු 20ට අඩු යෞවන-යෞවනියන් ACIR ට ස්වයංක්‍රීයවම ඇතුළත් කර ගනී. දොස්තර හමුවීමේදී ඔවුන්ගේ ප්‍රතිශක්තිකරණ වාර්තා රැගෙන එන්න, එවිට වෛද්‍යවරයාට ඔවුන්ගේ විදේශීය ප්‍රතිශක්තිකරණ විස්තර ලේඛනයට ඇතුළත් කළ හැකිය.

සමහර රාජ්‍ය දීමනා සඳහා ප්‍රතිශක්තීකරණය මූලික අවශ්‍යතාවකි www.humanservices.gov.au/immunisation). ප්‍රතිශක්තීකරණය නොකර සිටිය හැක්කේ ඊට බලපාන වෛද්‍ය තත්වයක් මත පමණි.

| ප්‍රතිශක්තිකරණය පිළිබඳ තොරතුරු | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| National Immunisation Information Line | 1800 671 811 | www.immunise.health.gov.au |
| Australian Childhood Immunisation Register | 1800 653 809 | www.humanservices.gov.au/acir |

## දන්ත වෛද්‍ය සේවා

සාමාන්‍ය සෞඛ්‍යාරක්ෂාව සහ යහපැවැත්ම විෂයෙහි යහපත් මුඛ සෞඛ්‍යය අතිශයින් වැදගත් වේ. දන්ත වෛද්‍ය සේවා සම්බන්ධ ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ පෞද්ගලික දන්ත වෛද්‍යවරුන්ය. පෞද්ගලික දන්ත වෛද්‍යවරු සාමාන්‍යයෙන් ඔවුන්ගේ සේවා සඳහා අය කරති. දුරකථන නාමාවලියෙහි ඔවුන් ලැයිස්තුගත කර ඇත. දන්ත වෛද්‍ය සේවා ගාස්තු ආවරණය කිරීම සඳහා ඔබට පෞද්ගලික සෞඛ්‍ය රක්ෂණයක් ලබා ගැනීමට ඔබ කැමති විය හැකිය.

වයස අවුරුදු 2 සිට 17 දක්වා වූ ළමුන්ටමූලික දන්ත වෛද්‍ය සේවා සඳහා වැය කිරීමට ඩොලර් 1000ක් දක්වා ලබා ගැනීමට Child Dental Benefits Schedule (www.humanservices.gov.au/childdental හි) ඉඩ සලසයි. මෙම ප්‍රතිලාභය එක දිගට අවුරුදු 2ක කාලයකට සීමා කර ඇත. ඔබට මේ සඳහා යෝග්‍යතාව ඇත්නම්, Department of Human Services ඔබව අමතනු ඇත.

ප්‍රාන්ත සහ පළාත් රජයන් සුදුසුකම් ලත් Centrelink කාඩ්පත් ධාරීන්ට සමහරක් මුඛ සෞඛ්‍ය සේවා (බොරු දත් සහ වේදනා නාශක) නොමිලේ සපයයි. ඔබේ ප්‍රදේශයේ ඇති සේවාවන් සඳහා ළඟම ඇති වෛද්‍ය මධ්‍යස්ථානය හෝ රෝහල අමතන්න. ඔබට යෝග්‍යතාව ඇතිද යන්න දැන ගැනීම සඳහා Centrelink අමතන්න.

## ඕස්ට්‍රේලියාවේ වැඩිහිටි සාත්තු සේවා

ඔබ වයස්ගත වීමේදී, ඔබව රැක බලා ගන්නේ කවුද යන්න සහ ඔබේම නිවසෙහි ජීවත් වෙනවාද නැත්නම් වැඩිහිටි සාත්තු නිවාසයකට යන්නේද යන කාරණය පිළිබඳ තේරීම ඇත්තේ ඔබටය. වැඩිහිටි සාත්තු නිවාස සැලසුම් කර ඇත්තේ ඔබට නිදහසේ ජීවත් වීමට උපකාරී වීමට සහ ඔබේ රැකවරණය පිළිබඳව විකල්පයන් ලබා දීමටය.

ඕස්ට්‍රේලියානු රජය ඕස්ට්‍රේලියාවේ වැඩිහිටි සාත්තු සේවා ගණනාවකට මූල්‍ය ආධාර සපයයි. ඔබේ පෞද්ගලික තත්වය මත, ඔබේ සාත්තු සේවාව වෙනුවෙන් ඔබ විසින් යම් දායක මුදලක් ගෙවීම අපේක්ෂා කෙරේ.

ඔබට ඇති විකල්ප සහ වැඩිහිටි සාත්තු සේවා ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ විස්තර www.myagedcare.gov.au හි My Aged Care වෙබ් අඩවියෙහි ඇත. ඔබට වැඩිහිටි සාත්තු සේවා පද්ධතිය සහ උපකාර සහ සේවා ලබා ගන්නේ කෙසේදැයි තේරුම් ගැනීමට එය ඔබට උපකාරී වනු ඇත. ඔබේ වැඩිහිටි රැකවරණ අවශ්‍යතා පිළිබඳ සාකච්ඡා කිරීමට ඔබට 1800 200 422 ඔස්සේ හෝ TIS National හරහා My Aged Care ඇමතිය හැකිය.

වැඩිහිටි සාත්තු සේවා සඳහා විකල්ප දෙකක් වන්නේ:

- ඔබට ඔබේ නිවසේම ජීවත් වීමට අවශ්‍ය නම්, විදුලි බුබුලු මාරු කිරීම, ගෙවතු අලංකරණය, දිය නෑම, ඇඳුම් ඇඳීම හෝ වෙළඳපළට යාම වැනි ඔබට තනියෙන් කළමනාකරණය කරගත නොහැකි දෛනික කටයුතු සඳහා උපකාර ලබාගත හැකිය. ඔබට තනිව ඇවිදීම සඳහා ඇවිදීමේ ආධාරක වැනි උපකරණද ලබා ගත හැකිය.
- ඔබට ඔබේ නිවසෙහි තවදුරටත් ජීවත් විය නොහැකි බව හැඟේ නම්, වැඩිහිටි නිවාසයකට යා හැකිය.

My Aged Care ට ඔබේ අවශ්‍යතාවන් සාකච්ඡා කළ හැකි අතර ඔබේ තත්වය ගැන වැඩිදුර කතාබහ කිරීම සඳහා මෙන්ම ඔබට රාජ්‍ය අනුග්‍රහය සහිත වැඩිහිටි සාත්තු සේවාව ලැබීමට යෝග්‍යතා ඇතිද යන්න සොයාබැලීම සඳහා පරීක්ෂණයක් පිළියෙළ කළ හැකිය. වැඩිදුර විස්තර සඳහා www.myagedcare.gov.au/eligibility-and-assessment වෙබ් අඩවියට යන්න, නැතිනම් 1800 200 422 අමතන්න.

## වැඩිහිටි සාත්තු සේවා හෝ සෞඛ්‍යාරක්ෂක සේවා පිළිබඳ පැමිණිලි

Aged Care නිවාස, ගෘහ සාත්තු සේවා පැකේජ හෝ Commonwealth Home Support Program සේවා පිළිබඳව යමෙකුට පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය නම්, ඔවුන්ට Aged Care Complaints Commissioner ඇමතීමේ අයිතිය ඇත. මෙය ගාස්තු රහිත සේවාවකි. ඔබට Aged Care Commissioner සම්බන්ධ කරගත හැකි මාර්ග:

ජාලගතව www.agedcarecomplaints.gov.au/

- දුරකථනයෙන් - 1800 550 552 අමතන්න
- ලිඛිතව - ඔබේ ලිඛිත පැමිණිල්ල පහත ලිපිනයට යොමු කරන්න:
  Aged Care Complaints Commissioner
  GPO Box 9848 (ඔබේ ප්‍රධාන නගරය සහ ප්‍රාන්තය/පළාත)

ඔබට ඔබේ My Aged Care පිළිබඳව යම් ගැටලුවක් වේනම්, 1800 200 422 අංකයෙන් හෝ www.myagedcare.gov.au/ හි ඇති MyAgedCare වෙබ් අඩවියට පිවිසීමෙන් My Aged Care ඇමතිය හැකිය.

ඔබට හෝ වෙනත් අයෙකුට සැපයෙන සෞඛ්‍යාරක්‍ෂාව පිළිබඳ යම් ගැටලුවක් වේනම්, ඔබේ ප්‍රාන්තයේ හෝ පළාතේ ඇති ස්වාධීන සෞඛ්‍ය පැමිණිලි කොමසාරිස්ට පැමිණිලි කළ හැකිය.

| ප්‍රාන්තය හෝ පළාත | සෞඛ්‍යාරක්‍ෂණ පැමිණිලි ආයතනය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | Human Rights Commission | 02 6205 2222 | http://hrc.act.gov.au/olderpeople |
| NSW | Health Care Complaints | 1800 043 159 | www.hccc.nsw.gov.au |
| NT | Health and Community Services Complaints Commission | 1800 004 474 | www.hcscc.nt.gov.au |
| Qld | Office of the Health Ombudsman | 133 646 | http://www.oho.qld.gov.au |
| SA | Health and Community Services Complaints Commissioner | 1800 232 007 | www.hcscc.sa.gov.au |
| Tas. | Office of the Health Complaints Commissioner | 1800 001 170 | www.healthcomplaints.tas.gov.au |
| Vic. | Office of the Health Services Commissioner | 1800 136 066 | www.health.vic.gov.au/hsc |
| WA | Health and Disability Services Complaints Office | 1800 813 583 | www.hadsco.wa.gov.au |

## මරණයකින් පසුව

ඕස්ට්‍රේලියාවේදී යමෙකු මරණයට පත්වූ විට, මරණය සනාත කොට දොස්තරවරයකු විසින් සහතිකයක් නිකුත් කළ යුතුය. මෙම සහතිකය නිකුත් කරන තෙක් ආදාහනය සම්බන්ධ කිසිදු පිළියෙල කිරීමක් නොකළ යුතුය.

ඕස්ට්‍රේලියාවේ ආදාහනෝත්සව මිල අධික විය හැකි අතර වියදම ඩොලර් 4000 සිට 15000 දක්වා විය හැකිය. මරණයකින් පසුව ආදාහන වියදම් සහ වෙනත් ගාස්තු ගෙවීම සඳහා රක්ෂණය උපකාරී වෙයි. සමහර විට මියගිය පුද්ගලයා විසින්ම ඔවුන්ගේ ආදාහනය සඳහා ගෙවීම් සැලසුම් කොට තිබිය හැකිය; සමහර විට ඔවුන්ගේ කැමැත්ත Will (අවසන් කැමති පත්‍රයේ) දක්වා ඇත.

Will එකක් යනු මරණයට පත් වූ පුද්ගලයාගේ දේපළ බෙදා දිය යුත්තේ කෙසේදැයි ද, ඔවුන්ගේ ළමයින් රැක බලා ගන්නේ කවුදැයි කියාද, සුබසාධන සංවිධාන සඳහා ත්‍යාග ද පැහැදිලි කෙරෙමින් ලියන ලද නීත්‍යානුකූල ලියවිල්ලකි. Will එකක් නීත්‍යානුකූල වීමට, එයින් ප්‍රයෝජනයක් නොලබන දෙදෙනෙකු සාක්‍ෂ්‍යයට අත්සන් කොට තිබිය යුතුය.

Will (අන්තිම කැමති පත්‍රයේ) Executor (බලය දරන්නා) අදාළ පුද්ගලයාගේ දේපළ, අන්තිම කැමති පත්‍රයේ නම් සඳහන් වන පුද්ගලයන් අතර බෙදා දීම, මිය ගිය පුද්ගලයාගේ බූදලය සම්බන්ධ බදු කළමනාකරණය කිරීම, අන්තිම කැමැත්තෙහි ඇති උපදෙස් අනුව කටයුතු කිරීම යනාදිය සම්බන්ධයෙන් වගකිව යුතුය. සෑම ප්‍රාන්තයකම සහ පළාතකම Public Trustee ආයතනයක් පවතින අතර ඔවුන්ට බූදලය සම්බන්ධ බලධාරියා වශයෙන් කටයුතු කළ හැකිය (මේ සඳහා ගාස්තුවක් අය කෙරේ).

යම් පුද්ගලයකු Will එකක් තබාගොස් නැත්නම්, නීතිය මගින් සකස් කළ ක්‍රමවේදයකට අනුව බූදල් බෙදනු ලැබේ. ළඟම ඥාතීන් කිසිවෙකුත් නොමැති නම්, බූදලය ප්‍රාන්ත හෝ පළාත් රජයන්ට පවරනු ලැබේ.

ශෝකය සහ ආදරණීයයකුගේ වියෝව දරා ගැනීම සඳහා උපකාර සේවා ඇත.

වැඩි විස්තර සඳහා:

| උපදෙස් | වෙබ් අඩවිය |
| --- | --- |
| මරණයකට පසුව කළ යුත්තේ මොනවාද | www.humanservices.gov.au/customer/subjects/what-do-following-death |
| Will එකක් සැකසීම | www.moneysmart.gov.au/life-events-and-you/over-55s/wills-and-power-of-attorney |
| අවමංගල්‍ය සඳහා ගෙවීම | www.moneysmart.gov.au/life-events-and-you/over-55s/paying-for-your-funeral |
| Public Trustees | www.australia.gov.au/information-and-services/family-and-community/wills-and-powers-of-attorney/wills |
| Organ Donation Register | www.humanservices.gov.au/customer/services/medicare/australian-organ-donor-register |
| නැතිවීම සඳහා උපකාර | www.australia.gov.au/information-and-services/family-and-community/death-and-bereavement |

# 10 ඔබේ පවුල

## මෙම කොටසේදී

- විවාහය සහ වෙනත් සම්බන්ධතා
- තරුණ-තරුණියන් සඳහා සේවා
- මාපියෝ
- ළමා උපකාර
- ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ
- ඥාතීන් සොයා ගැනීම
- ඔබේ පවුල සහ Centrelink

ඕස්ට්‍රේලියාවේදී, පවුල තුළ කාර්යභාරයන් ඔබට හුරුපුරුදු ඒවාට වඩා වෙනස් විය හැකිය. කාන්තාවන්ට සහ පුරුෂයන්ට සමාන අයිතිවාසිකම් සහ වගකීම් පැවරේ. කාන්තාවන් සහ පුරුෂයන් දෙපිරිසටම රැකියා කිරීම පිළිගත හැකි සහ පොදු තත්වයකි. දරුවන් බලා ගැනීම, ඉවීම සහ පිරිසිදු කිරීම වැනි ගෙදරදොර කටයුතු දෙදෙනාම බෙදා ගනිති.

සමහර පවුල් සාමාජිකයෝ ඕස්ට්‍රේලියාවේ නව ජීවිතයට අන් අයට වඩා ඉක්මණින් හුරු වෙති. උදාහරණයක් ලෙස, දූදරුවෝ මව්පියන්ට වඩා ඉක්මණින් ඉංග්‍රීසි උගනිති.

පවුලක් ලෙස සාමූහිකව ක්‍රියා කිරීමෙන් නව ජීවිතයට හැඩ ගැසීම වැදගත්ය. ඔබ උපකාර ලබා ගතයුතු අතර මෙම පර්ච්ඡේදය ලබාගත හැකි සමහර සේවා පිළිබඳ විස්තර සපයයි. ඕස්ට්‍රේලියාවේදී, ඔබේ පවුලට සහාය වීම පිණිස උපකාර ලබා ගැනීම අනුමත කෙරේ. රාජ්‍ය සහ ප්‍රජා උපකාර සඳහා සබැඳි www.humanservices.gov.au/servicefinder වෙබ් අඩවියෙන් ලබා ගන්න.

## විවාහය සහ වෙනත් සම්බන්ධතා

පවුල්, ගෘහස්ථ හිංසන සහ ලිංගික අතවර සම්බන්ධ තොරතුරු සහ උපකාර අවශ්‍ය පුද්ගලයන්ට 1800RESPECT උපදේශන, තොරතුරු සහ යොමු කිරීමේ සේවා සපයයි. වෘත්තීය උපදේශකයින්ගේ සේවය සතියේ දින හතේමත්, දවසේ පැය 24මත් ලබා ගත හැකිය. යහළුවෙකු, නෑදැයෙකු, එකට වැඩ කරන්නෙකු හෝ සේවාලාභියෙකු පිළිබඳ සැලකිල්ලක් දක්වන අය සඳහාද ඔවුන්ට උපකාර කළ හැකිය. 1800 737 732 අමතන්න, නැත්නම් www.1800respect.org.au වෙබ් අඩවියට යන්න.

Family Relationship Advice Line පවුල් සම්බන්ධතා ගැටලු, වෙන් වීමෙන් පසුව මාපිය කටයුතු පිළියෙළ කරගැනීමට උපදෙස් දීම, පවුල්වලට වඩා හොඳ සම්බන්ධතා ගොඩ නගා ගැනීමට හෝ වෙන් වීමට අදාළ ගැටලු විසඳා ගැනීමට උපකාරී වන ප්‍රාදේශීය සේවාවලට අමතන්නන් යොමු කිරීම පිළිබඳ තොරතුරු සපයයි. ජාතික නිවාඩු දිනවල හැර, සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 8.0 වන තුරුත්, සෙනසුරාදා පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 වන තුරුත් මෙම උපදේශන සේවාව ක්‍රියාත්මක වේ. 1800 050 321 (නිදහස් ඇමතුම්) දුරකථනයට අමතන්න, නැත්නම් www.familyrelationships.gov.au/BrochuresandPublications/Pages/family-relationships-advice-line.aspx වෙබ් අඩවියට යන්න.

Family Relationships Online පවුල් සම්බන්ධතා සහ වෙන් වීම පිළිබඳ තොරතුරු සපයයි. පවුල්වලට, සම්බන්ධතා ගැටලු කළමනාකරණය සහ වෙන්වීමෙන් අනතුරුව දරුවන් සඳහා විධිවිධාන පිළියෙළ කිරීම පිළිබඳ සේවා සොයා ගත හැකිය. www.familyrelationships.gov.au වෙබ් අඩවියට යන්න.

MensLine Australia තමන්ගේ පවුල් ජීවිතය පිළිබඳ හෝ පළමු සම්බන්ධතාවය පිළිබඳ ප්‍රශ්න ඇති පිරිමින්ට උපදේශන, තොරතුරු සහ යොමු කිරීමේ සේවා සපයයි. එය තමන්ගේ සහකරු, ස්වාමියා හෝ පියා පිළිබඳ සැලකිල්ලක් දක්වන කාන්තාවන්ට සහ පවුල් සාමාජිකයන්ටද උපකාර සේවා සහ තොරතුරු සපයයි. මෙම සේවය සතියේ දින හතේමත්, දවසේ පැය 24මත් ක්‍රියාත්මක වේ. 1300 789 978 අමතන්න, නැත්නම් www.mensline.org.au වෙබ් අඩවියට යන්න.

## යෞවන/යෞවනියන් සඳහා සේවා

වයස අවුරුදු 25ට අඩු පුද්ගලයන් සඳහා ප්‍රජා සංවිධාන වැඩසටහන් සපයයි. යොවුන් සේවකයෝ සුදුසුකම් ලද්දෝ සහ පලපුරුදු සහිත අය වන අතර යොවුන් මධ්‍යස්ථාන හෝ ප්‍රාදේශීය සභා වැනි ආරක්ෂිත ස්ථානවලදී ඔවුහු යෞවන/යෞවනියන්ට තොරතුරු, උපකාර සහ ක්‍රියාකාරකම් සපයයි.

වැඩිදුර උපකාර සඳහා:

| ජාතික යොවුන් සේවාව | දුරකථනය | වෙබ් අඩවිය |
| --- | --- | --- |
| Kids Helpline – වයස අවුරුදු 5-25 අතර පසුවන පුද්ගලයන් සඳහා පැය 24 පුරාම උපදේශන සේවා. | 1800 551 800 | www.kidshelpline.com.au |
| Headspace – වයස අවුරුදු 12-25 අතර පුද්ගලයන් සඳහා පූර්ව මැදිහත්වීමේ සේවා. | 1800 650 890 | http://headspace.org.au |
| YouthBeyondBlue – විෂාදය සහ මානසික රෝගවලින් පීඩා විඳින යෞවනයන් සඳහා පැය 24 පුරාම සේවය | 1300 22 4636 | www.youthbeyondblue.com |
| Department of Education and Training | | https://education.gov.au/youth |
| Generation Success – තරුණ වෘත්තිකයන් සඳහා උපකාරී සම්පත් | | www.employment.gov.au/generation-success-youth-employment-initiative |
| Youth Employment | | www.employment.gov.au/job-seekers-0 |
| Australian Institute of Family Studies වෙතින් සබැඳි | | http://aifs.gov.au/cfca/publications/helplines-and-telephone-counselling-services-children-y |
| Reconnect – නිවෙස් නැති හෝ නිවාස නැති වීමේ අවදානම සහිත වයස අවුරුදු 12-18 අතර පසුවන පුද්ගලයන් සඳහා උපකාර | | www.dss.gov.au/our-responsibilities/housing-support/programmes-services/homelessness/reconnect/reconnect-services |
| Office of the Children's eSafety Commissioner – වයස අවුරුදු 18ට අඩු ළමුන් ඉලක්ක කරගෙන අන්තර්ජාලය ඔස්සේ සිදුවන හිරිහැර වාර්තා කිරීම. | | www.esafety.gov.au/reportcyberbullying |

ප්‍රාන්ත සහ පළාත්ද යෞවන සේවා සපයයි:

| ප්‍රාන්තය හෝ පළාත | යෞවන සේවාව | වෙබ් අඩවිය |
| --- | --- | --- |
| ACT | Youth InterACT | www.youth.act.gov.au |

| ප්‍රාන්තය හෝ පළාත | යෞවන සේවාව | වෙබ් අඩවිය |
|---|---|---|
| NSW | Youth NSW | www.youth.nsw.gov.au |
| NT | Office of Youth Affairs | www.youth.nt.gov.au |
| Qld | Queensland Youth | www.communityservices.qld.gov.au/youth |
| SA | South Australia Youth Site | www.officeforyouth.sa.gov.au |
| Tas. | Office of Children and Youth Affairs | www.linkzone.tas.gov.au |
| Vic. | Youth Central | www.youthcentral.vic.gov.au |
| WA | Office for Youth | www.wa.gov.au/information-about/your-community/youth |

යෞවන/යෞවනියන් සඳහා පැවැත්වෙන විනෝද සහ වෙනත් වැඩසටහන් සඳහා ඔබේ ප්‍රාදේශීය කවුන්සිලය අමතන්න.

## දෙමාපියෝ

ඕස්ට්‍රේලියානුවෝ මාපිය මෙහෙය අගයති, එහෙත් "හොඳ" දෙමාපියන් වීම හැමවිටම පහසු නොවන බව දනිති. බොහෝ ආයතනවලින් මේ සම්බන්ධ තොරතුරු සහ උපකාර ලබා ගත හැකිය.

ළමුන් හික්මවීම මාපිය කටයුතුවල වැදගත් අංශයකි, එහෙත් ශාරීරික දඬුවම් ඕස්ට්‍රේලියාවේදී නීතිවිරෝධීය. වරප්‍රසාද ඉවත් කිරීම හෝ දරුවන් ඔවුන්ගේ කාමරවලට යැවීම වැනි වෙනත් උපක්‍රම ඔබට භාවිත කළ හැකිය. යහපත් හැසිරීම් සඳහා ඔබේ දරුවාට තෑග්ගක් දෙන්න; ඔබේ දරුවාට ආදර්ශයක් වන සේ හැසිරෙන්න.

ඔබේ දරුවා හික්මවීම සම්බන්ධ ඔබට ගැටලුවක් වේනම්, පවුල් උපදේශන හා මාපිය උපකාර සේවාවලින් උපකාර ලබා ගන්න:

| මාපිය කටයුතු පිළිබඳ තොරතුරු | වෙබ් අඩවිය |
|---|---|
| Family and Relationship Advice Line (1800 050 321 අමතන්න) | www.familyrelationships.gov.au |
| MyChild | www.mychild.gov.au/ |
| Raising Children Network | www.raisingchildren.net.au |
| Australian Childhood Foundation – පරිවර්තිත තොරතුරුද ඇතුළත්ව | www.kidscount.com.au/en |
| යොවුන් දෙමාපියෝ | www.abcdparenting.org |
| Kidsafe | www.kidsafe.com.au |
| ඕස්ට්‍රේලියානු රජයේ ඇඳුම් | www.australia.gov.au/information-and-services/family-and-community/caring-for-children |

## ළමා උපකාර

Department of Human Services, මගින් සැපයෙන Child Support ව්‍යාපෘතිය, වෙන් වූ දෙමාපියන්ට ඔවුන්ගේ දූදරුවන්ගේ ළමා සුබසාධනය පිණිස ළමා උපකාර ගෙවීම් කළමනාකරණය කරගැනීමට උපකාරී වෙයි. ඔබට ඇති ළමා උපකාර පිළිබඳ විකල්පයන් සාකච්ඡා කිරීම සඳහා දෙපාර්තමේන්තුව අමතන්න.

| ළමා උපකාර | ඇමතුම් විස්තර |
|---|---|
| Child Support වෙබ් අඩවිය | www.humanservices.gov.au/childsupport |
| දුරකථනය Child Support | 131 272 |
| වෙනත් භාෂාවලින් තොරතුරු | www.humanservices.gov.au/yourlanguage |
| සංක්‍රමණිකයන්, සරණාගතයන් සහ ආගන්තුකයින් සඳහා තොරතුරු | www.humanservices.gov.au/multicultural |

## ජ්‍යෝෂ්ට පුරවැසියෝ

වයස අවුරුදු 50 හෝ ඊට වැඩි පුද්ගලයන් සඳහා සේවා සපයන රාජ්‍ය, පුද්ගලික සහ ප්‍රජා ආයතන ගණනාවක් ඇත.

ඕස්ට්‍රේලියානු රජය පහත සේවාවන් සපයයි:

- Age Pension - ආදායම් උපකාර සහ සුදුසුකම් සහිත ඕස්ට්‍රේලියානුවන්ට සහන සේවා www.humanservices.gov.au/agepension
- My Aged Care - ඔබට ඇති විකල්පයන් සහ www.myagedcare.gov.au ඇති සේවාවන් ලබා ගැනීම.

9 වන පරිච්ඡේදයෙහි සෞඛ්‍ය සහ යහපැවැත්ම ද බලන්න.

සෑම ප්‍රාන්තයකට සහ පළාතකටම Seniors Card ව්‍යාපෘතියක් ඇත. මෙම කාඩ්පත නොමිලේ සැපයෙන අතර එහි හිමිකරුවාට සහන සහ හවුල්කාර ව්‍යාපාරවලින් වට්ටම් හිමි වෙයි.

වැඩි විස්තර සඳහා:

| ජ්‍යෝෂ්ට පුරවැසි තොරතුරු | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| Centrelink | 132 300 | www.humanservices.gov.au/olderaustralians |
| My Aged Care | 1800 200 422 | www.myagedcare.gov.au |
| Seniors Card ව්‍යාපෘතිය | | www.australia.gov.au/information-and-services/benefits-and-payments/older-australians/seniors-card |
| AusGov – වැඩිහිටි ඕස්ට්‍රේලියානුවන් | | www.australia.gov.au/information-and-services/benefits-and-payments/older-australians |

## නෑදෑයින් සොයා ගැනීම

යුද්ධය, සිවිල් කෝලාහල සහ ස්වභාවික විපත් මගින් වෙන් කරනු ලැබූ නෑදෑයින් සඳහා ඕස්ට්‍රේලියානු රතු කුරුස සංගමය (Australian Red Cross) සෙවීම් සහ පණිවුඩ සේවා සපයයි. රතු කුරුස සංගමයේ ලෝකව්‍යාප්ත ජාලය, සම්බන්ධතාවක් නැති විදේශීය පවුල් සාමාජිකයන් සොයා ගැනීමට උපකාරී වෙයි. එසේම විදේශීය පවුල් සාමාජිකයන්ට ඕස්ට්‍රේලියාවේ සිටින නෑදෑයින් සොයා ගැනීමට ද එය සහාය වෙයි.

රතු කුරුස සංගමයේ සෙවීම් සහ සරණාගත සේවාව (Red Cross International Tracing and Refugee Service) ඇමතීම සඳහා:

| ඕස්ට්‍රේලියානු රතුකුරුස සංගමය | ඇමතුම් විස්තර |
|---|---|
| විද්‍යුත් ලිපිනය | natinfo@redcross.org.au |
| රතු කුරුස වෙබ් අඩවිය | www.redcross.org.au |
| ජාතික | 03 9345 1800 |
| ACT | 02 6234 7600 |
| NSW | 02 9229 4111 හෝ නිදහස් ඇමතුම් 1800 812 028 |
| NT | 08 8924 3900 |
| Qld | 07 3367 7222 හෝ නිදහස් ඇමතුම් 1300 554 419 |
| SA | 08 8100 4500 |
| Tas. | 03 6235 6077 |
| Vic. | 03 8327 7700 හෝ නිදහස් ඇමතුම් 1800 131 701 |
| WA | 08 9225 8888 හෝ නිදහස් ඇමතුම් 1800 810 710 |

# ඔබේ පවුල සහ Centrelink

Department of Human Services, Centrelink සහ Medicare හරහා සමාජ, සෞඛ්‍ය සහ වෙනත් ගෙවීම් සහ සේවා සපයයි. එක් එක් පුද්ගලයාගේ සහ පවුලේ අවශ්‍යතාව මත මේවා වෙනස් වේ. ඔබේ වාතාවරණය වෙනස් වුවහොත්, උදාහරණයක් ලෙස ඔබට දරුවකු ලැබුණහොත්, රැකියාව අහිමි වුවහොත් හෝ අසනීප වුවහොත්, වහාම Centrelink අමතන්න.

අවශ්‍යතාවන් ඇති අයට උපකාර සපයන අතර පුද්ගලයන්ට වඩා ස්වයංපෝෂිත ජීවිතයක් ගෙවීමට සහ රැකියා සොයා ගැනීමට Centrelink සහාය වෙයි. විශ්‍රාම ලබා ගැනීම, හෝ අසනීප වීම හෝ ආපදා තත්වයකට පත්වීම වැනි ජීවිතයේ විවිධ ස්ථරවලදී විශේෂ උපකාර අවශ්‍ය වන අයට ද Centrelink සහාය වෙයි.

## මෙම කොටසේදී

- ඔබේ අනන්‍යතාව තහවුරු කිරීම
- වෙනත් භාෂාවලින් උපකාර
- Centrelink සමග ගනුදෙනු කිරීමේදී උපකාර
- Centrelink පොරොත්තු කාල
- Centrelink ගෙවීම් ලබා ගැනීම
- පවුල් සඳහා ගෙවීම්
- නවසීලන්ත පුරවැසියෝ (ඕස්ට්‍රේලියානු පුරවැසියන් නොවන)
- සරණාගතයින් සහ මානුෂීය පදනම මත පැමිණි අය සඳහා Crisis Payment
- වෙනත් Centrelink සේවා
- අඩු ආදායම්ලාභීන් සඳහා සහන
- අවස්ථාව වෙනස් වීම
- සහකරුවා/සහකාරිය අර්ථ දැක්වීම
- පුනරීක්ෂණ සහ අභියාචනා
- ඔබේ තොරතුරු පිළිබඳ රහස්‍යභාවය
- යෞවන යෞවනියෝ
- අනුග්‍රහය පිළිබඳ සහතිකය

## ඔබේ අනන්‍යතාව තහවුරු කිරීම

Centrelink හිදී ඔබේ ඔබේ අනන්‍යතාව තහවුරු කිරීමට ඔබට ලියකියවිලි අවශ්‍ය වනු ඇත (www.humanservices.gov.au/customer/enablers/proof-of-identity) - උදාහරණ ලෙස, විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් සංචාරක ලියකියවිලි, බැංකු ගිණුම් විස්තර හෝ පදිංචිය සම්බන්ධ විස්තර.

## වෙනත් භාෂාවලින් උපකාර

### වෙනත් භාෂාවලින් තොරතුරු

දීමනා/ගෙවීම් පිළිබඳව ඔබට කියවීමට, බැලීමට හෝ ඇසීමට හැකි Centrelink පරිවර්තිත තොරතුරු මූලාශ්‍ර ගණනාවක් Centrelink වෙබ් අඩවිය www.humanservices.gov.au/customer/information-in-your-language හි ඇත.

ගෙවීම්/දීමනා, රැකියාවක් සොයා ගැනීම, Medicare කාඩ් සහ Health Care Card වැනි මාතෘකා ආවරණය වන පරිදි *ඕස්ට්‍රේලියාවට අලුත්*මැයෙන් සැකසූ, භාෂා 10කින් සැපයෙන වීඩියෝ පෙළක් Centrelink හි ඇත. මෙම වීඩියෝ www.humanservices.gov.au/yourlanguage යන වෙබ් අඩවියෙන් ඔබට නැරඹිය හැකිය.

### බහුභාෂා දුරකථන සේවය

ඔබ ඉංග්‍රීසි භාෂාව නොවන වෙනත් භාෂාවක් කතා කරයි නම්, 131 202 ඔස්සේ (ප්‍රාදේශීය වෙලාවෙන් පෙ.ව. 8 - ප.ව 5) ඔබට අපගේ බහුභාෂා දුරකථන සේවය ඇමතිය හැකි අතර යමෙකුට ඔබේ භාෂාවෙන් Centrelink ගෙවීම් සහ සේවා පිළිබඳව කතා කළ හැකිය.

### භාෂණ පරිවර්තකයෝ (තෝල්කයෝ)

ඔබ ඉංග්‍රීසි කතා නොකරයි නම්, Centrelink ඔබේ හමුව සඳහා නොමිලේ තෝල්කයකු සපයයි. පරිවර්තකයකු පිළියෙළ කරගැනීම සඳහා 131 202 අමතන්න, නැත්නම් ඔබේ ප්‍රදේශයේ Centrelink Service Centre එකෙන් විමසන්න.

### ඔබේ ලියකියවිලි පරිවර්තනය කර ගැනීම

අපේ දීමනා සහ සේවාවන් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය ලියකියවිලි පරිවර්තනය කර ගැනීම සඳහා නොමිලේ පරිවර්තකයකු සැපයීමට Centrelink ට පුළුවන. 131 202 අමතන්න, නැත්නම් ඔබේ ප්‍රදේශයේ Centrelink Service Centre එකෙන් විමසන්න.

### බහුසංස්කෘතික සේවා නිලධාරීන්

බහුසංස්කෘතික සේවා නිලධාරීන් (http://www.humanservices.gov.au/mso වෙබ් අඩවිය බලන්න) සංක්‍රමණිකයන් සහ සරණාගත ප්‍රජාවන්ට Centrelink හි වැඩසටහන් සහ සේවාවන් පිළිබඳ තොරතුරු සපයයි. එසේම, සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා පුළුල් ලෙස අදහස් විමසයි.

## Centrelink වෙතින් ලැබෙන ලිපි

ඔබ Centrelink මගින් ඔබට එවන සියලු ලිපි කියවිය යුතු අතර අවශ්‍ය විටෙක පිළිතුරු යැවීම කළ යුතුය. යම් ලිපියක් ඔබේ භාෂාවෙන් තේරුම් කරනු ලැබීමට අවශ්‍ය නම් 131 202 අමතන්න.

## Centrelink සමග ගනුදෙනු කිරීම සඳහා උපකාර

ඔබ වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ඔබට යම් පුද්ගලයකු හෝ ආයතනයක් ('නියෝජිතයා'), නම් කළ හැකිය. www.humanservices.gov.au/nominees බලන්න.

| Centrelink | ඇමතුම් විස්තර |
|---|---|
| Centrelink | www.humanservices.gov.au/centrelink |
| සංක්‍රමණිකයන්, සරණාගතයන් සහ ආගන්තුකයන් සඳහා විස්තර | www.humanservices.gov.au/multicultural |
| වෙනත් භාෂාවලින් තොරතුරු | www.humanservices.gov.au/yourlanguage |
| වෙනත් භාෂාවලින් තොරතුරු ලබා ගැනීම සඳහා | 131 202 |
| හිමිකම් කීමේ අභිප්‍රාය | www.humanservices.gov.au/customer/enablers/intent-to-claim |
| ඔබේ අනන්‍යතාව තහවුරු කිරීම | www.humanservices.gov.au/customer/enablers/proof-of-identity |
| සේවාස්ථානයකට යන්න | www.humanservices.gov.au/findus |

## Centrelink පොරොත්තු කාල

මෑතක පැමිණි සියලුම නිත්‍ය පදිංචිකරුවන් හෝ (සරණාගතයන් සහ මානුෂීය පදනම මත පැමිණියවුන් හැර) තාවකාලික සංක්‍රමණිකයන් බොහෝ දීමනා සහ ප්‍රතිලාභ ලබා ගැනීමට පෙර සති 104 ක පොරොත්තු කාලයක් (Newly Arrived Resident's Waiting Period) සම්පූර්ණ කළ යුතුය. මෙම පොරොත්තු කාලය පවුල් සහනාධාර දීමනා සඳහා වළංගු නොවේ (පවුල් සඳහා දීමනා බලන්න). වැඩි විස්තර සඳහා www.humanservices.gov.au/families වෙබ් අඩවිය බලන්න.

පොරොත්තු කාලය සහ එය අදාළ වන්නේ කාටද යන්න ප්‍රතිලාභයෙහි ස්වභාවය සහ ඕස්ට්‍රේලියාවට පැමිණි දිනය අනුව වෙනස් වේ. ඔබේ ජීවිතයෙහි කවර අවධියක හෝ ඕස්ට්‍රේලියාවේ නිත්‍ය පදිංචිකරුවකු වශයෙන් ඕස්ට්‍රේලියාවේ ගත කළ කාලය පොරොත්තු කාලය ගණනය කිරීමේදී සලකනු ලැබේ.

පොරොත්තු කාලය තුළදී, රැකියාවක් සොයා ගැනීම සඳහා උපකාර ලබා ගැනීමට jobactive සමග ලියාපදිංචි විය හැකිය. ඔබට Centrelink Service Centres හිදී සැපයෙන රැකියා පිළිබඳ ස්වයං-උපකාර පහසුකම්ද භාවිත කළ හැකිය.

## Newly Arrived Resident's Waiting Period පිළිබඳ ව්‍යතිරේක

Newly Arrived Resident's Waiting Period පිළිබඳ ව්‍යතිරේක අදාළ වන්නේ:

- ඕස්ට්‍රේලියානු පුරවැසියන්ට
- ඕස්ට්‍රේලියානු පුරවැසියකුගේ පවුලේ සාමාජිකයන් හෝ දිගුකාලීන නිත්‍ය පදිංචිකරුවකුට
- මානුෂීය පදනම යටතේ පැමිණි පුද්ගලයකුට හෝ එවැනි පුද්ගලයකුගේ පවුලේ සාමාජිකයකුට
- සමහර වීසා උපවර්ගයන් දරන්නන්ට

සැලකිය යුතු මට්ටමේ තත්ව විපර්යාසයක් හේතුවෙන් ඔබ දැඩි පීඩාවකට පත්ව සිටී නම්, ඔබට ඉතා ඉක්මණින් විශේෂ ප්‍රතිලාභයක් ලබා ගැනීමට ඉඩක් තිබිය හැකිය. රැකියාව අහිමි වීම හෝ රැකියාවක් සොයා ගත නොහැකි වීම සැලකිය යුතු මට්ටමේ තත්ව විපර්යාසයක් ලෙස නොසැලකේ. ඔබට සුදුසුකම් ඇතිද යන්න දැන ගැනීමට Centrelink වෙත අයදුම්පත්‍රයක් යොමු කරන්න.

### පදිංචිය සඳහා සුදුසුකම් ලැබීමේ අවශ්‍යතා

විශ්‍රාම වැටුප් සහ සමහර දීමනාවලට අලුතින් පැමිණි නිත්‍ය පදිංචිකරුවන්ගේ පොරොත්තු කාලය අදාළ නොවේ. එහෙත්, ‘පදිංචිය සඳහා සුදුසුකම් ලැබීමේ’ පොරොත්තු කාලයක් ඇත.

- Parenting Payment and Widow Allowance: සති 104.
- Age Pension and Disability Support Pension: අවුරුදු 10.

මේ සම්බන්ධ සමහර ව්‍යතිරේකයන් ඇත, නිදසුනක් වශයෙන්, ඔබ සරණාගතයෙක් හෝ මානුෂීය පදනම මත පැමිණියෙක් නම්, හෝ ඕස්ට්‍රේලියානු නිත්‍ය වැසියකු වීමෙන් අනතුරුව වැන්දඹු වූවකු, ආබාධිත වූවකු හෝ තනි මව/පියකු බවට පත් වූවෙකු නම්, පොරොත්තු කාලය අදාළ නොවේ.

ඕස්ට්‍රේලියාව සමග ඔබ අයදුම් කරන දීමනාව ආවරණය වන අන්තර්ජාතික සමාජ ආරක්ෂණ ගිවිසුම ක් ඇති රටක ඔබ ජීවත් වී ඇති නම්, ඔබට විශ්‍රාම වැටුප් සඳහා සුදුසුකම් තිබිය හැකිය. www.humanservices.gov.au/issa හි දක්වා ඇති රටවල් 29 ක් සමඟ ඕස්ට්‍රේලියාව සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළඹ ඇත.

විදේශීය විශ්‍රාම වැටුප් ඉල්ලීම හෝ ඕස්ට්‍රේලියානු විශ්‍රාම වැටුප් ඉල්ලීම ඇතුළුව, විශ්‍රාම වැටුප් පිළිබඳ වැඩි විස්තර සඳහා www.humanservices.gov.au/international වෙබ් අඩවියට පිවිසෙන්න.

## Centrelink දීමනා ඉල්ලා සිටීම/ලබා ගැනීම

සමාජ ආරක්ෂණ දීමනාවක් ලබා ගැනීම සඳහා ඔබ 'Intent to Claim' (හිමිකම් කීමේ අභිප්‍රාය) ක් ලියාපදිංචි කළ යුතුය. ඔබ දීමනාවක් සඳහා අයදුම් කරන බව මෙමගින් Centrelink වෙත දැනුම් දේ. එය ඔබ විසින් හෝ ඔබේ නියෝජිතයකු විසින් ජාලගතව හෝ, කාර්යාලයකට යාමෙන් හෝ දුරකථනය ඔස්සේ හෝ සිදු කළ හැකිය.

ඔබේ අයදුම්පත අනුමත වුවහොත්, ඔබේ දීමනාව හෝ සහන කාඩ්පත ඔබ Intent to Claim ලියාපදිංචි කළ දින පටන් ආරම්භ වේ (ඔබ ගෙවීම් සඳහා හෝ සහන කාඩ්පත සඳහා එදින සුදුසුකම් ලැබුවහොත් සහ සම්පූර්ණ කළ අයදුම්පත දින 14 ක් ඇතුළත ආපසු යැවුව හොත් පමණි).

බොහෝ Centrelink ගෙවීම් සඳහා හිමිකම් ඇත්තේ ඕස්ට්‍රේලියාව තුළ ජීවත් වන පුද්ගලයන්ට සහ ඕස්ට්‍රේලියානු නිත්‍ය පදිංචිකරුවන්ට ය. (www.humanservices.gov.au/customer/enablers/residence-descriptions වෙබ් අඩවියට යන්න).

ගෙවීමේ ස්වභාවය අනුව සමහර තාවකාලික වීසා හිමියන්ද සුදුසුකම් ලැබිය හැකිය. ඔබව නිදහස් කොට නැත්නම්, පදිංචිය සඳහා සුදුසුකම් ලබන කාලය හෝ Newly Arrived Resident's Waiting Period සම්පූර්ණ කිරීමට ඔබට සිදු විය හැකිය. වෙනත් පොරොත්තු කාලයන්ද අදාළ විය හැකිය. *Centrelink පොරොත්තු කාල* බලන්න.

අඩු ආදායම් සහනාධාරයක් ලබා ගැනීම සඳහා ඔබට බදු ලිපිගොනු අංකයක් (TFN) තිබිය යුතුය.

ඔබේ තත්වය අනුව කවර ගෙවීමක් ලබා ගැනීමට ඔබ සුදුසුකම් ලබන්නේද යන්න පහත වගුවේ දැක්වේ:

| ඔබේ තත්වය | දුරකථනය | Centrelink ගෙවීම | මෙම ගෙවීම උපකාරී වෙයි |
|---|---|---|---|
| මම රැකියාවක් අපේක්ෂා කරමි | 132 850 | Newstart Allowance සහ/හෝ Youth Allowance | ඔබ වැටුප් සහිත රැකියාවක් සොයමින් සිටී නම් හෝ, ඔබට රැකියාවක් සොයා ගැනීමට ඇති හැකියාව වැඩි කරන අනුමත පුහුණුවක හෝ වෙනත් ක්‍රියාකාරකම්වල ඔබ නිරත වී සිටී නම්. |
| මම ඉගෙන ගනිමින්/පුහුණුවකට සහභාගී වෙමින් සිටිමි | 132 490 | Youth Allowance | ඔබ වයස අවුරුදු 16-24 අතර නම්, පූර්ණකාලීනව අධ්‍යාපනය ලබයි නම් හෝ පූර්ණකාලීන ඕස්ට්‍රේලියානු ආධුනික පුහුණුවක හෝ වෙනත් අනුමත ක්‍රියාකාරකමක නිරත වී සිටී නම්. |
| | | Austudy | ඔබට වයස අවුරුදු 25 හෝ ඊට වැඩි නම්, පූර්ණකාලීනව අධ්‍යාපනය ලබයි නම් හෝ පූර්ණකාලීන ඕස්ට්‍රේලියානු ආධුනික පුහුණුවක නිරත වී සිටී නම්. |
| මට අර්බුද අවස්ථාවක් සඳහා උපකාර අවශ්‍යයි | 132 850 | Crisis Payment | ඔබ පහත සඳහන් අයෙක් නම්, මෙය එක වරක් පමණක් ගෙවනු ලබන දීමනාවකි:<br>• සරණාගතයකු හෝ මානුෂීය පදනම යටතේ පැමිණෙන්නෙකු වශයෙන් මෑතකදී ඕස්ට්‍රේලියාවට පැමිණ තිබීම.<br>• ගින්නෙන් හෝ ගංවතුරෙන් හානි වීම හේතුවෙන් ඔබේ නිවසේ ජීවත් වීමට නොහැකි වීම.<br>• ගෘහස්ථ හිංසනය හේතුවෙන් ඔබ ඔබේ නිවෙස හැර ගියේ නම්,<br>• ඔබ සිරකඳවුරින් පිට වූයේ මෑතක නම් |

| ඔබේ තත්වය | දුරකථනය | **Centrelink** ගෙවීම | මෙම ගෙවීම උපකාරී වෙයි |
|---|---|---|---|
| | | Special Benefit | ඔබේ පාලනයෙන් බැහැර හේතු නිසා දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ පා සිටී නම්. |
| මම යමෙකු රැකබලා ගනිමි | 132 717 | Carer Payment | ඔබ රැකබලා ගැනීමේ කාර්යයයෙහි යෙදී සිටීම නිසාවෙන් සහ එහි ඇති වගකීම් හේතුවෙන් පඩි සහිත රැකියාවක නිරත වී ආදායමක් ලබා ගැනීමට නොහැකිව සිටී නම් |
| | | Carer Allowance<br><br>(ආදායම් ප්‍රතිපූරකයක්) | ඔබ මවක/පියකු හෝ රැකබලා ගන්නකු නම් සහ පහත සඳහන් අයෙකුට අතිරේක දෛනික රැකවරණ සහ සාත්තු සපයයි නම්:<br><br>- වැඩිහිටියෙකුට හෝ ආබාධිත හෝ වෛද්‍ය තත්වයක් සහිත ළමයෙකුට<br>- වයස්ගත හෝ දුර්වල වැඩිහිටියන් |
| මම රෝගියකු, තුවාලකාරයකු හෝ ආබාධිතයෙකි | 13 2717 | Disability Support Pension | ඔබට කායික, ආධ්‍යාත්මික හෝ මානසික දුබලතාවක් හේතුවෙන් අවම වශයෙන් ඉදිරි වසර දෙක තුළ රැකියාවක යෙදීමට නොහැකි නම් හෝ ඔබ නිත්‍ය අන්ධභාවය සහිත පුද්ගලයකු නම් |
| | | Sickness Allowance | ඔබ වෘත්තිකයකු හෝ පූර්ණකාලීන ශිෂ්‍යයකු වුවත් වෛද්‍ය තත්වයක් හේතුවෙන් තාවකාලිකව රැකියාවෙහි නියැලීමට හෝ ඉගෙනීමට නොහැකි නම් සහ සුව වූ පසු නැවත රැකියාවට හෝ අධ්‍යාපනයට යාමට සිදු වන්නේ නම්. |
| මම විශ්‍රාම ගැනීමට ආසන්න වූවෙකි/විශ්‍රාම ගත්තෙකි. | 13 2300 | Age Pension | ඔබ විශ්‍රාම දිවිය ගත කිරීමට ප්‍රමාණවත් තරම් ආදායමක් නොමැති පුද්ගලයකු නම්. |
| යම් අයකු මිය ගිය පසු මට උපකාර අවශ්‍යය | 13 2300 | Bereavement Payment | ඔබේ සහකරුවා, දරුවා හෝ ඔබේ රැකවරණයෙහි ජීවත් වූ අයෙකු මිය ගොස් ඇත්නම් සහ ඔබ Centrelink ගෙවීම් ලබයි නම්. |
| | | Bereavement Allowance | ඔබේ සහකරුවා/කාරිය මෑතකදී මිය ගියේ නම් සහ ඔබ Centrelink දීමනා නොලබන්නෙකු නම්. |

Centrelink ගෙවීම් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් www.humanservices.gov.au/centrelink වෙබ් අඩවියෙහි ඇත.

## පවුල් සඳහා ගෙවීම්

ඔබට පරායත්ත (ඔබෙන් යැපෙන) දරුවන් සිටියි නම්, පවුල්වලට ඔවුන්ගේ රැකියා සහ පවුලේ වගකීම් සඳහා උපකාරී වීමට Centrelink ගෙවීම් ගණනාවක් සපයයි.

වැඩි විස්තර සඳහා:

| Centrelink තොරතුරු | ඇමතුම් විස්තර |
|---|---|
| පවුල් සඳහා වෙබ්පිටුව | www.humanservices.gov.au/families |
| වෙනත් භාෂාවලින් තොරතුරු | www.humanservices.gov.au/yourlanguage |
| වෙනත් භාෂාවලින් උපකාර සඳහා | 131 202 |
| කාර්යාලයකට යන්න | www.humanservices.gov.au/findus |

ඔබට යෝග්‍ය වන සහනාධාරය කුමක්ද යන්න තීරණය වන්නේ දරුවන් ගණන, ඔවුන්ගේ වයස සහ ඔබේ පවුලේ ආදායමද ඇතුළත් ඔබේ පවුලේ වාතාවරණය මතය.

සාමාන්‍යයෙන්, පවුල් සහනාධාර ගෙවීම් ලැබීමට යෝග්‍ය වීමට ඔබ ඕස්ට්‍රේලියානු නිත්‍ය වීසාධාරියකු විය යුතු අතර ඕස්ට්‍රේලියාවේ ජීවත් විය යුතුය. එහෙත් මේ පිළිබඳ යම් ව්‍යතිරේකයන්ද ඇත.

| පවුල් සහාය දීමනා | මෙම ගෙවීම උපකාරී වෙයි... |
|---|---|
| Family Tax Benefit Part A | දරුවකු ඇති දැඩි කිරීමේ වියදම් සඳහා. |
| Family Tax Benefit Part B | පවුල් සඳහා අතිරේක උපකාර ලබා දීමෙන් - තනි මවු/පියන්, සහ මාපිය දෙදෙනාගෙන් එක් අයෙකු දරුවන් රැකබලා ගැනීම සඳහා නිවසේ නතර වීම හේතුවෙන් හෝ ළමා රැකවරණය පඩි සහිත රැකියාවක් හා තුලනය කිරීම හේතුවෙන් එක් ආදායම් ලාභියෙක් සහිත පවුල් මීට ඇතුළත් වේ. |
| Single Income Family Supplement | මාපිය දෙදෙනාගෙන් එක් අයකු සිටින පවුල් සහ එක් ආදායම් උපයන්නකු සිටින සමහර පවුල්. |
| Child Care Benefit | අනුමත හෝ ලියාපදිංචි ළමා සුරැකුම් ගාස්තු සඳහා. |
| Child Care Rebate | අනුමත ළමා සුරැකුම් සහිත සුදුසුකම් ලත් පවුල්. |
| Parental Leave Pay | අලුතින් උපන් දරුවකු හෝ මෑතකදී හදාවඩා ගැනීමට ගත් දරුවකු රැකබලා ගැනීමට නිවාඩු යන සුදුසුකම් ලත් දෙමාපියන්. |
| Newborn Upfront Payment and Newborn Supplement | ඔවුන්ට දරුවකු ඇති හෝ දරුවකු හදාවඩා ගන්නාසුදුසුකම් සහිත දෙමාපියන්ට උපකාර පිණිස Family Tax Benefit Part A වැඩි කිරීමෙන්. |
| Dad and Partner Pay | අලුතින් උපන් දරුවකුගේ හෝ මෑතකදී හදාවඩා ගැනීමට ගත් දරුවකුගේ පියවරුන් සහ සහකරුවන්. |
| Parenting Payment | ඔබ පරායත්ත දරුවකු/දරුවන්ගේ ප්‍රධාන භාරකරුවා නම්. |
| Double Orphan Pension | රැක බලා ගන්නන් සහ අනාථ දරුවන්. |

## නවසීලන්ත පුරවැසියන් (ඕස්ට්‍රේලියානු පුරවැසියන් නොවන)

නවසීලන්ත විදේශ ගමන් බලපත්‍රයකින් ඕස්ට්‍රේලියාවට පැමිණෙන පුද්ගලයන්ට සාමාන්‍යයෙන් මෙරටට ගොඩ බැසීමේදී Special Category Visa (SCV) නිකුත් කරනු ලැබේ. ඕස්ට්‍රේලියානු සමාජ ආරක්ෂණ අවශ්‍යතා සඳහා, 2001 පෙබරවාරි 26 වන දිනට පෙර පැමිණි SCV බලපත්‍ර ලාභීන් "රක්ෂිත" ("protected") SCV ධාරීන් ලෙස සලකනු ලැබේ. 2001 පෙබරවාරි 26 වන දිනට පසුව ඕස්ට්‍රේලියාවට පැමිණි පුද්ගලයෝ "රක්ෂිත" නොවන (not "protected") ලෙස සැලකේ.

- "රක්ෂිත" ("protected") SCV ධාරීන් ඕස්ට්‍රේලියානු වැසියන් වන අතර, ඔවුන් දැනට ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටී නම් සහ පොරොත්තු කාලයද ඇතුළත්ව යෝග්‍යතා නිර්ණායක සපුරාලයි නම්, Centrelink දීමනා සඳහා සුදුසුකම් ලබයි.
- "රක්ෂිත" නොවන (not "protected") SCV ධාරීන් ඕස්ට්‍රේලියානු වැසියන් නොවේ. ඔවුහු සාමාන්‍යයෙන් අඩු ආදායම් දීමනා ලැබීමට සුදුසුකම් නොලබති.

අදාළ රීති සහ පොරොත්තු කාලය සපුරාලයි නම්, සියලු SCV ධාරීන්ට පවුල් සහනාධාර සහ සහන කාඩ්පත් ලබා ගත හැකිය.

2001 පෙබරවාරි 26 වන දින සිට අවම වශයෙන් ඕස්ට්‍රේලියාවේ අවුරුදු 10ක් නොකඩවා පදිංචිව සිට ඇති "රක්ෂිත" නොවන (not "protected") SCV ධාරීන් එකවරක් පමණක් ගෙවනු ලබන Newstart Allowance, Sickness Allowance හෝ Youth Allowance යන දීමනාවලට හිමිකම් ලබයි. සුදුසුකම් ලබන්නන් සඳහා නොකඩවා මාස හයක උපරිමයකට යටත්ව ගෙවීම් සිදු කෙරේ.

ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය අතර පවතින සමාජ ආරක්ෂණ එකඟතාව මත සමහර SCV ධාරීහු, Age Pension, Disability Support Pension හෝ Carer Payment වලට සුදුසුකම් ලබති. "රක්ෂිත" හෝ "රක්ෂිත" නොවන බව මෙහිදී නොසැලකේ.

නවසීලන්ත පුරවැසියන් සඳහා වැඩි විස්තර www.humanservices.gov.au/paymentsfornewzealanders වෙබ් අඩවියෙහි ඇත.

## සරණාගතයින් සහ මානුෂීය පදනම මත පැමිණියවුන් සඳහා වන Crisis Payment

Crisis Payment යනු සීමාන්තික තත්වයන්ට මුහුණ පෑ පුද්ගලයන් සඳහා එක් වරක් පමණක් ගෙවනු ලබන දීමනාවකි. ඕස්ට්‍රේලියාවට පැමිණ දින හතක් ඇතුළත ඔබ මේ දීමනාව ඉල්ලා සිටිය යුතුය; නැත්නම්, 'ලබා ගැනීමේ අදහස' සහිතව පැමිණීමෙන් දින හතක් ඇතුළත Centrelink අමතා එයින් දින 14ක් ඇතුළත අයදුම්පත යොමු කළ යුතුය.

වැඩි විස්තර සඳහා www.humanservices.gov.au/crisispayment හි Crisis Payment තොරතුරු පත්‍රිකාව බලන්න.

## වෙනත් Centrelink සේවා

පහත සඳහන් දෑද ඇතුළත්ව, Centrelink බොහෝ සේවාවන් ලබා දෙයි:

| Centrelink සේවය | දුරකථනය | උපකාර ලබාගත හැකිය |
|---|---|---|
| Self Service | 136 240 | 1 පරිච්ඡේදයෙහි *ස්වයං සේවා* බලන්න. |
| Online Services Support | 132 307 | Centrelinkහි ජාලගත සේවා සම්බන්ධ උපකාර ලබාගන්න. |

| Centrelink සේවය | දුරකථනය | උපකාර ලබාගත හැකිය |
| --- | --- | --- |
| Centrelink International Services | 131 673 | ඕස්ට්‍රේලියාවෙන් බැහැර පදිංචියට හෝ සංචාරය සඳහා යාම, ඕස්ට්‍රේලියාවෙන් බැහැර සිටියදී ගෙවීම් ලබා ගැනීම, හෝ විදේශයකින් ගෙවීම් ලබා ගැනීම සම්බන්ධ විමසීම් සඳහා. |
| Financial Information Service (FIS) සේවාව කලින් වෙන් කරවා ගැනීම | 132 300 | Financial Information Service සම්මන්ත්‍රණයක් වෙන් කරවා ගැනීම. |
| පැමිණිලි සහ ප්‍රතිපෝෂණ | 1800 132 468 | ඇගයීම්, පැමිණිලි හෝ යෝජනා යොමු කිරීම සඳහා. |

## අඩු ආදායම්ලාභීන් සඳහා සහන ගාස්තු

ආදායම, රැකියාව, වයස හෝ Centrelink ගෙවීම්වල ස්වභාවය අනුව, අඩු ආදායම්ලාභී පුද්ගලයන් ෆෙඩරල්, ප්‍රාන්ත/පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩුවලින් මෙන්ම පෞද්ගලික ව්‍යාපාරවලින්ද සහන ගාස්තු සඳහා සුදුසුකම් ලැබිය හැකිය. සෞඛ්‍ය, ගෙදරදොර වියදම්, අධ්‍යාපන සහ ප්‍රවාහන වියදම් සහන ගාස්තු මගින් ආවරණය වේ. වැඩි විස්තර සඳහා www.humanservices.gov.au වෙබ් අඩවියට ගොස් "අඩු ආදායම්" යන්න සොයන්න.

## වාතාවරණය වෙනස් වීම

නිවැරදි දීමනා ලැබෙන්නේද යන්න තහවුරු කරගැනීම සඳහා ඔබේ පවුලේ, රැකියාවේ හෝ ජීවන තත්වයේ වෙනසක් සිදු වූ වහාම ඔබ Centrelink වෙත ඒ බව දැනුම් දිය යුතුය. ඔබේ යෝග්‍යතාවට වඩා ඔබ දීමනා ලබා තිබේ නම් ඉන් සමහරක් හෝ සියල්ලම හෝ ආපසු ගෙවීමට ඔබට සිදු විය හැකිය.

ඔබ Centrelink වෙත දැනුම් දිය යුතු වෙනස්වීම් සමහරක්:

- පුද්ගලික සහ ඇමතුම් විස්තර
- බැංකු විස්තර
- විවාහක/අවිවාහක තත්වය
- දූදරුවන් ඇතුළුව ඔබේ රැකවරණය යටතේ සිටින පුද්ගලයන් සඳහා වන රැකබලා ගැනීමේ විධිවිධාන
- රැකියා තත්වය
- තාවකාලිකව හෝ ස්ථිරව රට හැර යාම
- එකවර ගෙවීමක් ලැබීම
- ඔබේ සහකරු/සහකාරියගේ ආදායම සහ වත්කම්ද ඇතුළත්ව ආදායම් හෝ වත්කම්වල වැඩිවීම් හෝ අඩු වීම්
- අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම හෝ අවසන් කිරීම

## සහකරු/සහකාරිය අර්ථ ගැන්වීම

ඔබ හුදෙකලාව වාසය කරන්නෙක්ද නැතහොත් ඔබට සහකරුවකු/සහකාරියක් සිටීද යන්න Centrelink වෙත දැනුම් දීම වැදගත්ය. මෙය සමහර අවස්ථාවල 'යුවළක සාමාජිකයෙක්' ලෙස අර්ථ දක්වනු ලැබේ. බොහෝ දීමනා සම්බන්ධයෙන් දෙදෙනාගේම ආදායමේ එකතුව සහ වත්කම්වල වටිනාකම සලකනු ලැබේ. ඔබ තනි පුද්ගලයෙක්ද නැතහොත් ඔබට සහකරුවෙක්/සහකාරියක් සිටීද යන කාරණය මත සමහර දීමනාවල ප්‍රමාණය වෙනස් වේ. සමහර දීමනා වළංගු වන්නේ තනි පුද්ගලයන් සඳහා පමණි.

## පුනරීක්ෂණ සහ අභියාචනා

ඔබ යම් තීරණයක් පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබේ අයදුම්පත්‍රය පුනරීක්ෂණය කරවා ගැනීම සඳහා www.humanservices.gov.au/customer/reviews-and-appeals ඔස්සේ Centrelink අමතන්න.

## ඔබේ තොරතුරුවල රහස්‍යභාවය

Centrelink මගින් ඔබේ පුද්ගලික තොරතුරු අනාවරණය කරනු ලබන්නේ එසේ කිරීම නීත්‍යානුකූල නම් හෝ ඒ සඳහා ඔබේ අවසරය ලැබී ඇත්නම් පමණි.

## තරුණ/තරුණියෝ

ඔබට අවුරුදු 16 ට වැඩි දූදරුවන් ඇත්නම්, ඔවුන්ට Youth Allowance හෝ Family Tax Benefit වැනි දීමනා සඳහා සුදුසුකම් තිබිය හැකිය. යෞවන/යෞවනියන් සඳහා වන සේවා බලන්න.

## අනුග්‍රහය පිළිබඳ ආරක්ෂණය

අනුග්‍රහය පිළිබඳ ආරක්ෂණය ක් (www.border.gov.au/about/corporate/information/fact-sheets/34aos) බලන්න) යනු ඕස්ට්‍රේලියානු වැසියකු හෝ ආයතනයක් (රක්ෂකයා) සහ ඕස්ට්‍රේලියානු රජය අතර ඇතිවන නෛතික බන්ධනයක් ඇති කෙරෙන ගිවිසුමකි. රක්ෂකයා ඕස්ට්‍රේලියාවේදී සංක්‍රමණිකයා (රක්ෂිතයා)ට අනුග්‍රහ දැක්වීමට එකඟ වන අතර, ඒ හේතුවෙන් රක්ෂිතයාට රාජ්‍ය දීමනා මත යැපීමට අවශ්‍ය නොවේ.

ප්‍රදානය කෙරෙනු ලබන වීසා ප්‍රවර්ගය අනුව අනුග්‍රහය පිළිබඳ ආරක්ෂණයක් අවුරුදු දෙකක් හෝ අවුරුදු 10 ක් දක්වා පැවතිය හැකිය. අනුග්‍රහය පිළිබඳ ආරක්ෂණයකින් ආවරණය වෙද්දී ඔබ හෝ ඔබෙන් යැපෙන්නන් යම් යම් සුබසාධන දීමනා ලබාගත්හොත්, රක්ෂකයා එම සම්පූර්ණ මුදලම රජයට ගෙවිය යුතු වේ.

# 11 මුදල්

## මෙම කොටසෙහි අඩංගු දෑ


- මූල්‍ය සේවා
- මුදල් තේරුම් ගැනීම
- බැංකුකරණය
- බදු අය කිරීම/ගෙවීම
- සුළු ව්‍යාපාර
- ණය සහ ණයවර
- රක්‍ෂණ
- මූල්‍ය උපදෙස් ලබාගැනීම
- මූල්‍ය ප්‍රශ්න සම්බන්ධ උපකාර
- පරිභෝගිකයා ආරක්‍ෂා කිරීම


## මූල්‍ය සේවා

ඕස්ට්‍රේලියාව තුළ බොහෝ බැංකු, රක්‍ෂණ, විශ්‍රාම පාරිතෝෂික සහ ආයෝජන නිපැයුම් සහ සේවා ඇත. මූල්‍යමය සේවා සහ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා රජය මගින් ව්‍යාපාරයන්ට අවසර ලබාදී තිබිය යුතුය.

## මුදල් තේරුම් ගැනීම

ඔබේ පුද්ගලික මූල්‍ය පාලනය පිළිබඳ වැඩි විස්තර මෙන්ම කැල්කියුලේටර් සහ මෙවලම් සඳහා පිවිසෙන්න: www.australia.gov.au/information-and-services/money-and-tax/personal-finance

Australian Securities and Investment Commissionගේ Moneysmart (www.moneysmart.gov.au) වෙබ් පිටුවෙහි ගෘහස්ථ අයවැය, බැංකුකරණය, රක්ෂණාවරණ සහ ණය ඇතුළත්ව මූල්‍ය කළමනාකරණය සහ ආයෝජනය පිළිබඳ වැදගත් තොරතුරු අඩංගු වේ.

වංක මිනිසුන් ඔබේ මුදල් වංචා කර ගැනීමට උත්සාහ කළ හැකිය. මුදල් තැන්පත් කිරීම, ව්‍යාපාර ණය, රක්‍ෂණය, විශ්‍රාම පාරිතෝෂික, ආයෝජනය සහ මූල්‍ය උපදේශ පිළිබඳ පැමිණිල්ලක් ඇත්නම් හෝ ආයෝජනයක් සම්බන්ධයෙන් ඔබට විශ්වාෂයක් නැත්නම් හෝ සැකයක් ඇත්නම්, 1300 300 630 ඔස්සේ Australian Securities and Investments Commission (ASIC) අමතන්න, නැත්නම්, www.moneysmart.gov.au/tools-and-resources/how-to-complain වෙබ් පිටුවට පිවිසෙන්න.

## බැංකුකරණය

බැංකු, ණයදෙන සමිති සහ ණයවර සමාගම් බැංකු සේවා සපයති. මුදල් ආපසු ගැනීම සඳහා, බැංකුවක් තුළට යන්න, නැත්නම්, ATM (Automatic Teller Machine) යන්ත්‍රයකින් මුදල් ලබා ගැනීම සඳහා ඔබේ හර කාඩ්පත සහ PIN (Personal Identification Number) අංකය භාවිත කරන්න. ඔබ ඔබේ PIN එක ආරක්‍ෂා කළ යුතුය. ඔබේ PIN අංකය හරකාඩ්පතේ ලියා තැබීම හෝ අත් බෑගයෙහි, පසුම්බියෙහි හෝ දුරකථනය වැනි සොරකම් කරනු ලැබිය හැකි ස්ථානයක තබා ගැනීම හෝ නොකරන්න.

ඔබේ හර කාඩ්පත සොරකම් කරනු ලැබුවහොත් හෝ නැති වුවහොත්, වහාම ඔබේ බැංකුවට දන්වන්න.

ඔබට ඔබේ බැංකුව සමග විසඳා ගත නොහැකි ගැටළුවක් ඇත්නම්, www.fos.org.au ට යාමෙන් Financial Services Ombudsman අමතන්න.

වැඩි විස්තර සඳහා:

| බැංකුකරණ තොරතුරු | වෙබ් අඩවිය |
|---|---|
| Australian Bankers Association – බැංකු ගිණුම් පිළිබඳ මූලික විස්තර | www.bankers.asn.au/Consumers/Managing-Your-Money |
| ඔබේ බැංකු ගිණුම් කළමනාකරණය | www.moneysmart.gov.au/managing-your-money/banking |
| Australian Competition and Consumer Commission – අන්තර්ජාල බැංකු කටයුතු | www.accc.gov.au/consumers/online-shopping/internet-banking |
| MoneySmart පරිවර්තිත තොරතුරු | www.moneysmart.gov.au/tools-and-resources/publications |
| Financial Service Ombudsman | www.fos.org.au |

## බදු අය කිරීම

ඕස්ට්‍රේලියාවේදී, ඔබ රැකියාවකින්, ව්‍යාපාරයකින් හෝ ආයෝජනයකින් උපයන මුදලට සාපේක්ෂව රජයට බදු ගෙවයි. රෝහල්, පාසැල්, මහාමාර්ග සහ දුම්රිය මාර්ග වැනි අත්‍යවශ්‍ය සේවා සඳහා යෙදවීමට Australian Taxation Office (ATO)ය පුද්ගලයන්ගෙන් සහ ව්‍යාපාරවලින් බදු අය කරගනියි.

ඕස්ට්‍රේලියානු බදු සහ විශ්‍රාම පාරිතෝෂික ක්‍රමය තේරුම් ගැනීම පහසු කිරීම සඳහා ATO ය http://tv.ato.gov.au/ato-tv/channel?c=c-b8nuuyo වෙබ් පිටුවෙහි වීඩියෝ සපයා ඇත.

### භාණ්ඩ සහ සේවා බද්ද

ඕස්ට්‍රේලියාව, විකිණෙන හෝ පරිභෝජනය කරන බොහෝ භාණ්ඩ, සේවා සහ අනෙකුත් අයිතම සඳහා සියයට 10 ක භාණ්ඩ හා සේවා බද්දක් පණවා ඇත. මූලික ආහාර ද්‍රව්‍ය, මූලික අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා, නිර්දේශිත ළමා රැකවරණ සහ ගෘහාශ්‍රිත සාත්තු සේවා ආදිය GST වලින් නිදහස් වේ.

### බදු ලිපිගොනු අංකය

බදු ලිපිගොනු අංකයක් (TFN) යනු ATO මගින් පුද්ගලයන්ට හෝ ආයතනවලට නිකුත් කරනු ලබන අනන්‍ය අංකයකි. මෙම අංකයෙන් බදු සහ විශ්‍රාම පාරිතෝෂික සඳහා ඔබව හඳුනා ගැනේ. ඔබේ බදු ලිපිගොනු අංකය සඳහා හැකි ඉක්මණින් අයදුම් කරන්න.

බදු ලිපිගොනු අංකයක් (TFN) ලබා ගැනීමට ඇති වේගවත්ම ක්‍රමය නම්, www.ato.gov.au/tfn වෙබ් අඩවියට ගොස් ජාලගතව අයදුම් කිරීමයි. ජාලගත ලියාපදිංචි වීම් දවසේ පැය 24 තුළමත්, සතියේ දින හතේමත් විවෘතය. ඔබට ඔබේ විදේශ ගමන් බලපත්‍රය සහ ඕස්ට්‍රේලියානු ලිපිනයක් අවශ්‍ය වේ. අයදුම්පත් www.ato.gov.au/order-publications වෙබ් අඩවියෙහි ATO Publication Ordering Service වලින් හෝ නැත්නම්, 13 28 61 ඔස්සේ බදු ලිපිගොනු උපකාර සේවාව ඇමතීමෙන් ලබාගත හැකිය.

ඔබට ලබා ගත හැක්කේ එක් TFN කි. එය ජීවිත කාලය පුරාවටම ඔබට අනන්‍ය වන අතර එය රැක ගැනීම ඔබ සතුය. ඔබ ඔබේ නම හෝ රැකියාව වෙනස් කළත්, ප්‍රාන්ත අතර පදිංචිය මාරු කළත්, නොඑසේ නම් ඕස්ට්‍රේලියාව අතැර ගොස් නැවත පදිංචිය සඳහා පැමිණියත් ඔබේ TFN නොවෙනස්ව පවතී. හැම කෙනෙකුටම තමාගේම TFN එකක් අවශ්‍යය. ඔබේ TFN අංකය පවුලේ අනෙක් සාමාජිකයන් සමග බෙදා නොගන්න.

ඔබේ බදු ලිපිගොනු අංකය අත් බෑගයෙහි, පසුම්බියෙහි හෝ දුරකථනය වැනි සොරකම් කරනු ලැබිය හැකි ස්ථානයක තබා ගැනීම හෝ නොකරන්න.

ඔබේ TFN අංකය වෙනත් අයෙකුට භාවිත කිරීමට සැලැසීම හෝ එය විකිණීමෙන් හෝ පාවාදීමෙන් ඔබට බරපතළ ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු විය හැකිය. වංක පුද්ලයන් එය පහත සඳහන් දේ සඳහා භාවිත කළ හැකිය:

- ඔබේ බදු ප්‍රතිලාභ සොරකම් කිරීමට
- ඔබේ බැංකු ගිණුමට පිවිසීමට
- ඔබේ නමින් බැංකු ගිණුමක් විවෘත කිරීමට සහ ණයබර ඔබට පැවරීමට
- ඔබේ නමින් රාජ්‍ය දීමනා ලබා ගැනීමෙන් වංචා සිදු කිරීමට

Australian Taxation Office, Centrelink, ඔබේ විශ්‍රාම පාරිතෝෂික අරමුදල, බැංකු හෝ මූල්‍ය ආයතන සහ ඔබේ සේවායෝජකයා ඇතුළු කිහිප දෙනෙකුට පමණක් ඔබේ TFN අංකය ඉල්ලා සිටිය හැක.

ව්‍යාජ රැකියා අයදුම්පතක් මාර්ගයෙන් ඔබේ TFN එක ලබා දීමට ඔබව පෙළඹවිය හැකි වංචනිකයන්ගෙන් ප්‍රවේශම් වන්න. ඔබේ අනන්‍යතාව සොරකම් කිරීම අරමුණින් පළ කෙරෙන ව්‍යාජ රැකියා දැන්වීම් මාර්ගයෙන්ද ඔවුන් ඔබේ TFN අංකය ලබා ගැනීමට උත්සාහ කළ හැකිය. ඔබ නව රැකියාවක් ආරම්භ කිරීමෙන් අනතුරුව ඔබේ සේවාදායකයාට පමණක් TFN ය ලබා දෙන්න.

### ඔබ රැකියාවක් ලබා ගන්නා අවස්ථාව වන විට ඔබට TFN එකක් නොතිබුණොත් කුමක් සිදු වේද?

ඔබ රැකියාවක් ඇරඹීමෙන් අනතුරුව, ඔබේ සේවාදායකයා විසින් ඔබේ TFN අංකය ලිවිය යුතු බදු ලිපිගොනු අංකය පිළිබඳ ප්‍රකාශනයක් සම්පූර්ණ කිරීමට ඔබට පවරනු ඇත.

ඔබට TFN එකක් නොමැති නම්, නව රැකියාවක් ආරම්භ කිරීමෙන් පසුව අයදුම් කිරීමට සහ ඔබේම TFN එකක් ලබා ගැනීමට ඔබට දින 28ක කාලයක් ලැබේ. දින 28කට පසුවත් ඔබට ඔබේම TFN එකක් නැති නම්, ඔබේ සේවායෝජකයා විසින් ඔබට ගෙවන මුදලින් උපරිම බදු ප්‍රමාණයක් අය කළ යුතුය. ඔබට TFN එකක් නොමැතිව රැකියාවක් කළ හැකිය, එහෙත් ඔබේ පඩියෙන් සහ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අධික බදු ප්‍රමාණයක් අය කර ගනු ඇත. ඔබට TFN එකක් නොමැති නම්, ඔබට බදු ප්‍රතිලාභ සඳහා ඉලෙක්ට්‍රොනිකව අයදුම් කිරීමට හෝ රාජ්‍ය ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමට හෝ Australian business number (ABN) ක් ලබා ගැනීමට හෝ නොහැකි වනු ඇත.

#### ආදායම් බදු ප්‍රතිලාභ

මුදල් වර්ෂයක් (ජූලි 1 සහ ජූනි 30 අතර) ඇතුළත ඔබ කිසියම් ආදායමක් ඉපයුවේ නම්, එම මුදල් වර්ෂයේ ඔක්තෝබර් 31 වනදාට පෙර ඔබ ආදායම් බදු ප්‍රතිලාභ සඳහා ATO වෙත අයදුම් පත්‍රයක් යොමු කළ යුතුය.

ඔබ ඔබේ බදු ප්‍රතිලාභ සැකසීම සඳහා ලියාපදිංචි බදු නියෝජිතයකු භාවිත කරන්නේ නම්, ඔබට ඔක්තෝබර් 31ට පසුවද ඉල්ලුම්පත්‍රය යොමු කළ හැකිය. ඔවුන් ලිපිගොනු යොමු කරන දිනයන්ට අනුගත වීම සඳහා ඔබ ඔක්තෝබර් 31ට පෙර බදු නියෝජිතයකු සමග කතිකා කර ගත යුතුය.

www.ato.gov.au/Individuals/Lodging-your-tax-return වෙබ් අඩවියට ගොස් ඔබට ඔබේ බදු ප්‍රතිලාභ අයදුම්පත ජාලගතව ද යොමු කළ හැකිය. මෙය ATO මගින් සැපයෙන ගාස්තු විරහිත, පහසු සහ ආරක්ෂාසහිත ක්‍රමවේදයකි. එමගින් ඔබේ සේවායෝජකයා, බැංකු, සෞඛ්‍ය අරමුදල් සහ රාජ්‍ය ආයතන මගින් ලබා දෙන තොරතුරු භාවිතයෙන් ඔබේ අයදුම්පත්‍රයෙහි අඩක් සම්පූර්ණ කිරීමට ATO ට ඉඩ ලබා දෙයි.

ජාලගතව ඔබේ බදු ප්‍රතිලාභ අයදුම්පත්‍රය යොමු කිරීම සඳහා ඔබට myGov ගිණුමක් අවශ්‍යය. එය https://my.gov.au වෙබ් අඩවියට පිවිසීමෙන් සැකසිය හැකිය.

#### බදු උපකාර

බදු උපකාර (Tax Help) යනු අඩු අදායම්ලාභීන්ට සෑම වසරකම ජූලි සිට ඔක්තෝබර් දක්වා ලබාගත හැකි ගාස්තු විරහිත සේවාවකි. බදු උපකාර ආයතනයන්හි ATO මගින් පුහුණු කරන ලද ස්වේච්ඡා සේවකයන් සිටින අතර ඔවුන් myTax භාවිතයෙන් ජාලගතව ඔබේ බදු ප්‍රතිලාභ අයදුම්පත සම්පූර්ණ කිරීමට සහ යොමු කිරීමට උපකාරී වනු ඇත.

| ATO | ඇමතුම් විස්තර |
|---|---|
| දුරකථනය (Tax Helpද ඇතුළත්ව) | 13 2861 |
| ව්‍යාපාර සහ GST විමසුම් | 13 2866 |
| ජාලගතව බදුලිපිගොනු අංකයක් සඳහා අයදුම් කරන්න | www.ato.gov.au/TFN |
| කාර්යාලයකට පිවිසෙන්න | www.ato.gov.au/Visitus |
| ATO පරිවර්තන තොරතුරු | www.ato.gov.au/General/Other-languages |
| ATO වෙබ් අඩවිය | www.ato.gov.au |

### විදේශ දේපළ, ආයෝජන සහ ආදායම්

ඕස්ට්‍රේලියානු වැසියන් ඔවුන්ට ලොව කොහින් හෝ ලැබෙන සියලු ආදායම්වලට බදු ගෙවිය යුතු වන අතර ඔවුන්ගේ බදු ප්‍රතිලාභ අයදුම්පත්‍රයේ සියලු විදේශ ආදායම් නොවළහා සඳහන් කළ යුතුය. ඔබ ආදායම් බදු සඳහා ඕස්ට්‍රේලියානු වැසියෙක්ද යන්න තීරණය කෙරෙනුයේ එක් එක් තත්වයන්ට අනුවය.

Australian Taxation Office (ATO) වෙබ් අඩවියෙහි පහත සඳහන් දේවලින් ලැබෙන බදු ආදායමද ඇතුළත්ව බදු පිළිබඳ ඔබේ වගකීම් තේරුම් ගැනීමට උපකාරී වන තොරතුරු ඇත:

- සුරැකුම්පත් සහ කුලී දේපළ ආදී ආයෝජන
- පොලිය සහ පුරස්කාර
- විදේශීය ව්‍යාපාර කටයුතු
- විදේශීය විශ්‍රාම වැටුප්
- ජාලගතව භාණ්ඩ හා සේවා වෙළඳාම වැනි අන්තර්ජාතික ව්‍යාපාර ගණුදෙනු,

ඔබට විදේශීය ආදායමක් ඇත්නම්, එම ආදායම ඉපයූ රටට ඔබ බදු ගෙවා ඇති නමුත් එය හෙළිදරව් කළ යුතුය. විදේශීය ආදායම ඕස්ට්‍රේලියාවේදී බදුවලට යටත් ආදායමක් ලෙස ගැනේ නම්, සහ ඔබ දැනටමත් ඊට විදේශ බදු ගෙවා ඇත්නම්, ඔබ විදේශ බදු සඳහා පිළිගැනීමකට යෝග්‍ය විය හැකිය.

ඕස්ට්‍රේලියානු බදුවලින් නිදහස් කරන ලද විදේශීය ආදායම්ද ඔබ හෙළිදරව් කළ යුතුය. මෙම විදේශීය ආදායම, ඔබ ඕස්ට්‍රේලියාවේදී උපයා ඇති ආදායමට අනුව ගෙවිය යුතු බදු මුදල ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලැබිය හැකිය. අනෙක් රටේදී යම් ආදායමකට ඔබට බදු ගෙවීම අවශ්‍ය නොවූවත්, සියලු විදේශීය මූලාශ්‍ර ආදායම් ඔබ විසින් හෙළිදරව් කළ යුතුය,

සෑම වසරකම ATO ආදායම් බදු ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු තුන්වැනි පාර්ශ්වයන් විසින් ATO වෙත සපයන විදේශීය ගණුදෙනු හා සසඳයි. මෙම තොරතුරු සහ ඔබේ ආදායම් බදු ප්‍රතිලාභයෙහි ඇතුළත් ගණන්වල වෙනසක් ඇත්නම්, ATO ඔබව අමතනු ලැබිය හැකි අතර ඔබේ ආදායම් බදු ප්‍රතිලාභ සංශෝධනය කරනු ලැබිය හැකිය.

ඔබේ මූල්‍ය ගනුදෙනු සංකීර්ණ නම්, ඔබට ලියාපදිංචි බදු නියෝජිතයකු භාවිත කිරීමට හෝ ATO වෙතින් උපදෙස් පැතීම අවශ්‍ය වනු ඇත.

### කුඩා ව්‍යාපාර

කුඩා ව්‍යාපාර ඕස්ට්‍රේලියානු ආර්ථිකයේ වැදගත් කොටසකි. ඔබේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබට අවශ්‍ය නම්, ඒ සඳහා උපකාර ලබාගත හැකිය. කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබ සිතන්නේ නම්, www.business.gov.au/business-topics/starting-a-business/Pages/default.aspx වෙබ් අඩවියට පිවිසෙන්න. Australian Competition and Consumer Commission මගින් මෙහෙයවන

Small Business Education Program පිළිබඳ විස්තර සඳහා www.accc.gov.au/about-us/tools-resources/small-business-education-program වෙබ් අඩවියට පිවිසෙන්න.

ඔබට ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය නම්, ඔබට Australian business number (ABN) සඳහා අයදුම් කිරීමට ඔබේ TFN අංකය අවශ්‍ය වනු ඇත. පහත සඳහන් දෑ ඇතුළත්ව වෙනත් ලියාපදිංචි වීම්ද අවශ්‍ය වනු ඇත:

- GST ලියාපදිංචිය (ඔබේ වාර්ෂික ආදායම ඕස්ට්‍රේලියානු ඩොලර් 75000 ඉක්මවයි නම් හා/හෝ ඔබ කුලී රථ ගමන් විස්තර සපයයි නම්.
- සේවායෝජකයෙක් ලෙස ලියා පදිංචි වීම
- වෙනත් රාජ්‍ය ආයතන විසින් ඉල්ලා සිටින ලියාපදිංචි වීම්

Australian business number එකක් ඔබ සතුවීමෙන් අදහස් වන්නේ ඔබ වාපාරයක් පවත්වාගෙන යන වගයි. ඔබ ‘ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේදැ’යි ඔබට විශ්වාෂයක් නැත්නම් හෝ වෘත්තියක යෙදීම සඳහා ABN එකක් ලබා ගැනීමට ඔබට බල කෙරෙයි නම්, 132 866ට අමතන්න. ඔබේ ව්‍යාපාරයෙන් ඔබට ලැබෙන ආදායමට ඔබ බදු ගෙවන අතර ඔබ ඔබේ ව්‍යාපාරය හෝ දේපළක් විකුණුවහොත් ඉන් ලැබෙන ප්‍රාග්ධන ලාභ සඳහාද බදු ගෙවීමට ඔබට සිදුවිය හැකිය. ඔබේ ව්‍යාපාර ආදායම් ඉපයීම සඳහා කළ වියදම් වෙනුවෙන් ඔබට අඩුකිරීම් ඉල්ලා සිටිය හැකිය.

ඔබට සේවකයන් සිටී නම්, ඔවුන්ට විශ්‍රාම පාරිතෝෂික ගෙවීමට ඔබට සිදුවන අතර ඔවුන්ගේ වේතනයෙන් බදු අඩු කර ATO වෙත යැවීමටද ඔබට සිදු වනු ඇත. ඔවුන් ඔබේ පවුල් සාමාජිකයන් වුවද මෙය කිරීමට ඔබට සිදුවනු ඇත.

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබට රාජ්‍ය ආයතනවලින් අවසර ගැනීමට සිදු වේ. තීරණයක් සම්බන්ධයෙන් බලපෑම් කිරීමට හෝ එය වේගවත් කිරීමට මුදල් හෝ ත්‍යාග පිරිනැමීම නොකරන්න. එවැනි දිරිදීමනා ලබා දීම නීතිවිරෝධී වන අතර ඒවා වාර්තා කරනු ලැබේ. ව්‍යාපාර සහ පුද්ගලයන්ගේ බදු හිමිකම් සහ බැඳීම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම පහසු කරවීම සඳහා උපකාර සහ තොරතුරු ඉංගීසි භාෂාවෙන් මෙන්ම පරිවර්තිත ප්‍රකාශන වශයෙන්ද ATOහි ඇත. Australian Business License and Information Service (ABLIS) හට ඔබේ වෙනත් අනුවෘත්‍ය වගකීම් ඉටු කිරීමට සහාය විය හැකිය.

වැඩි විස්තර සඳහා:

| කාරණය | වෙබ් අඩවිය |
|---|---|
| කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම | www.business.gov.au/small-business/Pages/starting-and-running-your-small-business.aspx |
| ව්‍යාපාර සඳහා රාජ්‍ය තොරතුරු | www.australia.gov.au/information-and-services/business-and-industry |
| කුඩා ව්‍යාපාර සඳහා ප්‍රදාන | https://www.business.gov.au/assistance |
| ව්‍යාපාර අවසරපත්‍ර සහ ලියාපදිංචිය | http://ablis.business.gov.au/pages/home.aspx |
| කුඩා ව්‍යාපාර බදු තොරතුරු | www.ato.gov.au/Business/Starting-your-own-business |
| Fair Work රැකියා ස්ථාන සම්බන්ධතා පද්ධතිය - ඔබට සේවකයන් ඇත්නම් | www.fairwork.gov.au/find-help-for/small-business |

| කාරණය | වෙබ් අඩවිය |
|---|---|
| ප්‍රාන්ත සහ පළාත් අනුග්‍රහය සහ තොරතුරු | www.business.gov.au/business-topics/starting-a-business/Pages/advice-and-support-in-your-state-or-territory.aspx |
| Australian Business License and Information Service | https://ablis.business.gov.au/pages/home.aspx |

## ණය සහ ණය මුදල්

ණයක් ගැනීම හෝ ණයවර භාවිතය යනු පොළිය නමින් හැඳින්වෙන අමතර මුදලක්ද සමග පසු දිනෙකදී ගෙවීමේ පොරොන්දුව මත මුදල් ණයට ගැනීමයි. විවිධ වූ ණය වර්ග අතරට ගැනෙන සමහර ණය වන්නේ පුද්ගල ණය, නිවාස ණය, ණය කාඩ්පත් සහ බැංකු අයිරාවන්ය.

ණයේ ප්‍රමාණය, ණය දෙන්නා, එය ආපසු ගෙවීමට ඔබ ගන්නා කාලය, පොළී අනුපාතිකය සහ ගාස්තු සහ අය කිරීම් යන කරුණු මත ණයක මිළ ගණන් විවිධ විය හැකිය. පියවීමට නොහැකි නම් ඔබ ණයක් ගැනීම හෝ ණයපත් පාවිච්චි කිරීම නොකළ යුතුය. ණයවර, ණය සහ අතමාරු පිළිබඳ විස්තර සඳහා www.moneysmart.gov.au/borrowing-and-credit වෙබ් අඩවිය බලන්න.

## රක්‍ෂණය

රක්‍ෂණය යනු අලාභයක් හෝ හානිවීමක් පියවා ගැනීම සඳහා මූල්‍යමය ආවරණයක් ලබා ගැනීමට වසරක් පාසා ඔබ යම් මුදලක් ගෙවීමයි. ඔබට යම් අලාභයක් සිදු වුවහොත් ඒ අලාභය ඔබ දරා ගන්නවා වෙනුවට, ඒ සඳහා වන්දියක් ගෙවීමට රක්‍ෂකයා ඔබ හා ගිවිසුමකට එළඹෙයි.

බහුල රක්‍ෂණාවරණ වන්නේ සෞඛ්‍ය (9 වන පරිච්ඡේදයේ සෞඛ්‍යය සහ යහපැවැත්ම බලන්න), නිවාස ගොඩනැගිලි රක්ෂණ, නිවසේ බඩු-භාණ්ඩ රක්‍ෂණය, සංචාරක, ජීවිත සහ මෝටර් රථ රක්‍ෂණය යි. රක්‍ෂණ ප්‍රතිපත්තිය සහ ඊට වැයවන මුදල කොපමණදැයි ගිවිසුමකට එළඹීමට පෙර තේරුම් ගැනීම වැදගත්ය.

විවිධ ආකාරයේ මෝටර් රථ රක්‍ෂණ ඇත. ඔබට මෝටර් රථයක් අයත් නම්, ඒ සඳහා තෙවැනි පාර්ශ්ව රක්‍ෂණාවරණයක් තිබීම ("CTP") අනිවාර්යය. හදිසි අනතුරකදී ඔබ වෙනත් පුද්ගලයකුට තුවාල සිදු කළහොත්, මෙම රක්‍ෂණය ඔබව ආවරණය කරයි. අනතුරකදී ඔබේ මෝටර් රථයට (හෝ ඔබ අතින් වෙනත් අයකුගේ මෝටර් රථයකට) සිදුවන කවර හෝ හානියක් ආවරණය කරන, එමෙන්ම, මෝටර් රථය නැති වූයේ නම් ඒ සඳහා වන්දි ගෙවන වඩා පුළුල් රක්ෂණාවරණයක් සපයන පූර්ණ මෝටර් රථ රක්‍ෂණයක් ලබා ගැනීමටද ඔබ කැමති වනු ඇත.

රක්‍ෂණ පිළිබඳ වැඩි විස්තර සඳහා www.moneysmart.gov.au/insurance වෙබ් අඩවියට යන්න.

## මූල්‍ය උපදෙස් ලබා ගැනීම

Financial Information Service (FIS) මූල්‍යමය ගැටලු පිළිබඳ උපදෙස් සපයයි. FIS යනු දුරකථන ඔස්සේ, පෞද්ගලිකව හෝ මූල්‍ය අධ්‍යාපන සම්මන්ත්‍රණ හරහා නොමිලේ සැපයෙන ස්වාධීන සේවාවකි. මෙම ආයතනය මගින් සැපයෙන සේවා පිළිබඳව වැඩි විස්තර සඳහා 132 300 අමතන්න, නැත්නම්, FIS වෙබ් අඩවිය www.humanservices.gov.au/fis ට පිවිසෙන්න.

සම්මන්ත්‍රණයකට සහභාගී වීමට, 136 357 අමතන්න.

## මූල්‍ය ප්‍රශ්න සම්බන්ධ උපකාර

ඕස්ට්‍රේලියාවේදී, ඔබ මූල්‍යමය ප්‍රශ්නයකට මුහුණ පාන්නේ නම්, ඒ සම්බන්ධ උපකාර සෙවීම පිළිගැනේ; එය සාමාන්‍ය කාරණයකි.

මූල්‍ය උපදේශකයෝ මූල්‍යමය දුෂ්කරතා සහිත පුද්ගලයන්ට තොරතුරු සපයති. ඔවුහු පුද්ගලයන්ගේ හෝ පවුල්වල තත්වය පිළිබඳව ඇගයීමක් කරන අතර ඒ අනුව විවිධ විසඳුම්වල ඇති වාසි සහ අවාසි හඳුනා ගනිති.

1800 007 007 අමතන්න, නැතිනම්, www.moneysmart.gov.au/managing-your-money/managing-debts/financial-counselling වෙබ් අඩවියට යන්න.

## පාරිභෝගික ආරක්ෂණය

ඕස්ට්‍රේලියාවේදී. ජාලගතව කරන මිලදී ගැනීම්ද ඇතුළත්ව, ඔබ භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමේදී, Australian Consumer Law (ඕස්ට්‍රේලියානු පාරිභෝගික නීතිය) යටතේ ඔබේ අයිතිවාසිකම් ආරක්ෂා කෙරේ. උදාහරණයක් ලෙස, ඔබ මිලදී ගන්නා භාණ්ඩය හෝ සේවාව පිළිබඳව නිවැරදි සහ සත්‍ය තොරතුරු ලබා ගැනීමේ අයිතිය ඔබ සතුය. ඔබ මිලදී ගත් භාණ්ඩයේ යම් දෝෂයක් හේතුවෙන් ඔබ අපහසුතාවට පත් වන්නේ නම්, එය අලුත්වැඩියා කරගැනීමේ, ඒ වෙනුවෙන් නව භාණ්ඩයක් ලබා ගැනීමේ හෝ භාණ්ඩය ලබා දී ඒ වෙනුවෙන් ගෙවූ මුදල ආපසු ලබා ගැනීමේ අයිතිය ඔබට හිමි වේ. භාණ්ඩය පාවිච්චි කිරීමට තරම් ආරක්ෂිත බව අපේක්ෂා කිරීමට ඔබට අයිතියක් ඇත. දුරකථනය ඔස්සේ හෝ ඔබේ නිවසට පැමිණ විට හෝ වෙළෙන්දන් විසින් අනුගමනය කළයුතු නීතිරීති ඇත. උදාහරණයක් ලෙස, ඔබ ඉල්ලා සිටියහොත් ඔවුන් නිවසින් බැහැර විය යුතුය.

ඔබ මිලදී ගත් භාණ්ඩයක් පිළිබඳ ගැටලුවක් ඇත්තේ නම්, ඔබේ අයිතිවාසිකම් සහ ඔබට ඇති විකල්ප සම්බන්ධ විස්තර සඳහා ඔබේ ප්‍රාන්තයේ හෝ පළාතේ පාරිභෝගික ආරක්ෂණ ආයතනය අමතන්න. කුලී නිවෙස් සහ වාසස්ථාන, ගෙයක් මිලදී ගැනීම හෝ විකිණීම, ගොඩනැගීම හෝ අලුත්වැඩියා කිරීම, මෝටර් රථයක් මිලදී ගැනීම, සාප්පු යාම, වගකීම් සහතික, කොටස් වශයෙන් ගෙවීම්, මුදල් ආපසු ලබා ගැනීම, ණයපත් සහ වෙළඳාම් යනාදියට සම්බන්ධ ප්‍රශ්න සඳහා ඔවුන්ට ඔබට උදව් කළ හැකිය. ඔවුන්ට ප්‍රශ්නයක් නිරාකරණය කිරීම සඳහා ඔබ සහ වෙළෙන්දා අතර සමාදානයක් (සාකච්ඡාවක්) ඇති කිරීමට ක්‍රියා කළ හැකිය.

Australian Competition and Consumer Commission (ACCC) ය මිල ලකුණු කිරීමේ අසාධාරණ ව්‍යාපාරික ක්‍රම, තරඟකාරීත්වයට එරෙහි සහ අසාධාරණ වෙළඳපළ භාවිතයන් සහ නිෂ්පාදන නිරාපදාව සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානුවන් ආරක්ෂා කරයි.

වැඩි විස්තර සඳහා:

| කලාපය | පාරිභෝගික ආයතනය | වෙබ් අඩවිය |
|---|---|---|
| ජාතික | Australian Competition and Consumer Commission - දුරකථනය 1300 302 502 | www.accc.gov.au |
| ජාතික | ACCC ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවලින් තොරතුරු | www.accc.gov.au/about-us/information-for/non-english-speaking-background. |
| ACT | Office of Regulatory Service (Access Canberra) | www.ors.act.gov.au |
| NSW | NSW Fair Trading | www.fairtrading.nsw.gov.au |
| NT | Consumer Affairs | www.consumeraffairs.nt.gov.au/ForConsumers/ConsumerRights/Pages/default.aspx |
| Qld | Office of Fair Trading | www.fairtrading.qld.gov.au/consumers.htm |
| SA | Office of Consumer and Business Affairs | www.cbs.sa.gov.au/wcm/consumers/consumer-advice/ |

| කලාපය | පාරිභෝගික ආයතනය | වෙබ් අඩවිය |
|---|---|---|
| Tas. | Consumer Affairs and Fair Trading | www.consumer.tas.gov.au |
| Vic. | Consumer Affairs Victoria | www.consumer.vic.gov.au |
| WA | Consumer Protection | www.commerce.wa.gov.au/ConsumerProtection/ |

ඔම්බුඩ්ස්මන් (දුක්ගන්නා රාළ) කාර්යාල ස්වාධීන ආයතන වන අතර ඒවා මගින් රාජ්‍ය ආයතන සහ සමහර කර්මාන්තවලට අදාළ පුද්ගලික සමාගම් පිළිබඳ පැමිණිලි විමර්ෂණය කරයි. ඔවුන්ට නීතිවිරෝධී , අසාධාරණ හෝ වෙනස්කම් සැලකීම් නැවැත්වීමට ක්‍රියා කිරීමට මෙන්ම ඔබ වෙනුවෙන් වඩා සාධාරණ විසඳුමක් ලබා ගැනීමට ක්‍රියා කළ හැකිය. 1300 362 072ට අමතන්න, නැත්නම්, ප්‍රාන්ත, පළාත් හෝ කර්මාන්ත ඔම්බුඩ්ස්මන් කාර්යාල සඳහා www.ombudsman.gov.au වෙබ් අඩවියට යන්න.

Australian Communications and Media Authority (ACMA) රූපවාහිනී සහ ගුවන්විදුලිය වැනි විකාශනය කිරීමේ සේවාවල නුසුදුසු අන්තර්ගතයන් පිළිබඳ පැමිණිලි විමර්ෂණය කරයි. පළමුව, මෙම සේවාවන් අයිති පුද්ලයාට හෝ සේවා සැපයුම්කරුට පැමිණිල්ල ඉදිරිපත් කළ යුතුය. එම පැමිණිල්ලට ප්‍රතිචාර නොලැබුණහොත්, www.acma.gov.au වෙබ් අඩවියට පිවිසෙන්න. අයථා විද්‍යුත් පණිවුඩ (ඊමේල්) සහ දුරකථනමාර්ගික අලෙවි කටයුතු සම්බන්ධ පැමිණිලිද ACMA විමර්ෂණය කරයි. එසේම, “Do Not Call” නාමලේඛනය නඩත්තු කරන්නේද ඔවුන්ය.

www.esafety.gov.au හි ඇති Office of the Children’s eSafety Commissioner ජාලගත ක්‍රියාකාරකම්වලදී ආරක්ෂාව පිළිබඳ තොරතුරු සහ මූලාශ්‍ර සපයයි. අන්තර්ජාල හිංසනය, සාපරාධී සහ නීතිවිරෝධී ජාලගත අන්තර්ගතයන් පිළිබඳ පැමිණිලිද ඔවුහු විමර්ෂණය කරති.

ඔබේ දරුවා අන්තර්ජාල හිංසනයට ලක්වේ නම්, හෝ ඔබට සාපරාධී හෝ නීතිවිරෝධී යැයි සිතිය හැකි අන්තර්ගතයන් හමුවුවහොත් www.esafety.gov.au/complaints-and-reporting වෙබ් අඩවියට ගොස් පැමිණිල්ලක් කළ හැකිය.

# 12 ප්‍රජා සහභාගීත්වය

## මෙම කොටසෙහි අන්තර්ගතය

ඕස්ට්‍රේලියානු රේගුව සහ නීති දැන ගැනීම සහ තේරුම් ගැනීම ඕස්ට්‍රේලියානු ප්‍රජාවට අනුගත වීම සඳහා ඔබට උපකාරී වනු ඇත.


- [ඕස්ට්‍රේලියාව ගැන]
- [වගකීම් සහ සාරධර්ම]
- [සමානාත්මතාව සහ වෙනස්කම් සැලකීමට විරුද්ධත්වය]
- [ස්වේච්ඡා සේවය]
- [පුද්ගලයන් මුණගැසීම]
- [පුද්ගලයන් හමු වීම]
- [ආචාරශීලී ඇවතුම් පැවතුම්]
- [ඇඳුම් පැළඳුම්]
- [පොදු ඕස්ට්‍රේලියානු ප්‍රකාශයන්]
- [එළිමහන් ක්‍රියාකාරකම් සහ නිරාපදාව]
- [පරිසරය]
- [සතුන් සහ සුරතල් සතුන්]
- [පරිසරය]
- [සතුන් සහ සුරතල් සතුන්]
- [පුවත්පත්, රූපවාහිනිය සහ ගුවන්විදුලිය]
- [සුදුව]
- [අධික ශබ්දය]
- [ප්‍රාදේශීය ආණ්ඩු සේවා]


## ඕස්ට්‍රේලියාව ගැන

ඕස්ට්‍රේලියාවේ ආදිවාසීන් වූයේ අඩුම තරමින් වසර 40,000කටවත් පෙර මෙහි ජනාවාස ඇතිකරගත් ඇබොරිජිනල් සහ ටොරස් සමුද්‍ර සන්ධිය ආසන්න දූපත්වාසී පුද්ගලයන්ය. ආදිවාසී ඕස්ට්‍රේලියානුවන්ට ඔවුන්ටම ආවේණික වූ ආධ්‍යාත්මික විශ්වාෂයන්, භූමිය හා ගැඹුරු සම්බන්ධතාවක්, සාරවත් සහ විචිත්‍ර වූ සංස්කෘතියක් මෙන්ම ඉදිරියට පවත්වාගෙන යන ලෝකයේ පැරණිතම කලා සම්ප්‍රදායන්ගෙන් එකක් හිමිය. ආදිවාසී සංස්කෘතීන් ඕස්ට්‍රේලියාවේ ජාතික අනන්‍යතාවෙහි අත්‍යවශ්‍ය අංගයක් වන අතර ඇබොරිජිනල් සහ ටොරස් සමුද්‍ර සන්ධිය ආසන්න දූපත්වාසී පුද්ගලයන් ඕස්ට්‍රේලියානු කලාව, මාධ්‍ය, ශාස්ත්‍රඥාණය, ක්‍රීඩාව සහ ව්‍යාපාර යනාදියට සැලකිය යුතු මට්ටමින් දායක වෙති. ඕස්ට්‍රේලියාවේ [ඉතිහාසය, උරුමය සහ ආදිවාසී සංස්කෘතිය] පිළිබඳ තොරතුරු www.australia.gov.au/information-and-services/culture-and-arts හි ඇත.

ඕස්ට්‍රේලියාව යනු බොහෝ සංස්කෘතීන්, ආගම් සහ වාර්ගික පසුබිම් සහිත පුද්ගලයන්ගෙන් සෑදුම් ලත් පිළිගැනීමට කැමති, විවිධත්වයෙන් යුත් සමාජයකි. ඕස්ට්‍රේලියානුවෝ ලෝකයේ හැම දෙසකින්ම පැමිණියෝ වෙති. ඕස්ට්‍රේලියානුවන්ගෙන් සියයට 46ක් පමණ එක්කෝ විදේශයක ඉපදී ඇත, නැත්නම් ඔවුන්ට විදේශජ දෙමාපියන් සිටිති. ඉංග්‍රීසි භාෂාව ඕස්ට්‍රේලියාවේ ජාතික භාෂාව වුණත්, ආදිවාසී භාෂාවන්ද ඇතුළත්ව භාෂා 300ක් පමණ එහි කතා කෙරෙයි. ලෝකයේ ප්‍රධාන ආගම් සියල්ලම පාහේ මෙහි ඇදහෙයි.

ඕස්ට්‍රේලියානු නීතියට අනුගත වනතාක්, හැම කෙනෙකුටම ඕස්ට්‍රේලියාව තුළදී තමන්ගේ සංස්කෘතීන් සහ ආගම් අනුගමනය කිරීමට සහ සැමරීමට නිදහස ඇත. ඕස්ට්‍රේලියානුවෙක් ලෙස හැම කෙනෙකුටම එහි ප්‍රජාවට සහභාගී වීමට සහ ඇතුළත් වීමට හැකියාව ඇත. පළමුව, එවැනි විවිධත්වයක් ඔබට ආගන්තුක විය හැකිය. කෙසේ වුවත්, ඔබ විවෘත නම් සහ අනෙක් පුද්ගලයන්, ඔවුන්ගේ අදහස් සහ සම්ප්‍රදායයන් කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත නම්, ඔබ ඔවුන් හා මුහු වනු ඇති අතර නව ජීවිතය සාර්ථක කරගනු ඇත.

ඕස්ට්‍රේලියානු රජය රටේ ජනවාර්ගික විවිධත්වය අගය කරන අතර, හැම කෙනෙකුම අයත් වන එසේම හැම කෙනෙකුටම ජාතියේ ජීවනය සඳහා උර දිය හැකි සංස්කෘතික විවිධත්වයෙන් යුතු ජාතියක් කෙරෙහි එහි කැපවීම නැවතත් අවධාරණය කර ඇත. ඕස්ට්‍රේලියාව ගැන වැඩි දුර අවබෝධයක් ලබා ගැනීම සඳහා www.australia.gov.au/about-australia වෙබ් අඩවියට පිවිසෙන්න.

## වගකීම් සහ සාරධර්ම

ඕස්ට්‍රේලියාව තුළදී අපි අත්විඳින නිදහස සහ සමානාත්මතාව හැම කෙනෙක්ම තමාගේ වගකීම් ඉටු කිරීම මත රඳා පවතී. ඕස්ට්‍රේලියාව කෙරෙහි ඔබගේ හිතෛෂීභාවය සහ අපේ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාව අනුමත කිරීම ඔබෙන් අපේක්ෂා කෙරේ. එසේම පිළිගැනීම, අන්තර්ගතකරණය (inclusion) සහ සාධාරණත්වය පිළිබඳ ඕස්ට්‍රේලියානු සාරධර්ම සහ සම්ප්‍රදායයන් ඉදිරියට පවත්වා ගැනීමට සහාය වීමද මීට ඇතුළත්ය.

ඕස්ට්‍රේලියාවේ නිදහස් සහ ප්‍රජාතාන්ත්‍රික සමාජයේ පදනම වන්නේ අපේ පුරවැසි සාරධර්මයන්ය. පහත සඳහන් දේ සම්බන්ධ සහයෝගය ඊට ඇතුළත් වේ:

- පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය
- නීතියේ ආධිපත්‍යය
- සාමකාමීව ජීවත් වීම
- පසුබිම කුමක්ද යන්න නොසලකා සියලු දෙනාටම ගෞරව කිරීම
- අසරණ අය කෙරෙහි දයානුකම්පාව
- කතා කිරීමේ නිදහස සහ ප්‍රකාශ කිරීමේ නිදහස
- ඇසුරු කිරීමේ නිදහස
- ආගමික නිදහස සහ ආගමික නොවූ පාලනය
- ආබාධිත බව හෝ වයස වැනි ලක්ෂණ නොතකන පුද්ගල සමානාත්මතාව
- පිරිමි සහ ගැහැණු පිළිබඳ සමානාත්මතාව
- අවස්ථාවන් පිළිබඳ සමානාත්මතාව

ඕස්ට්‍රේලියානු පුරවැසියන්ගේ වගකීම් අතරට පහත දෑ ඇතුළත් වේ:

- නීතියට අවනත වීම
- ෆෙඩරල්, ප්‍රාන්ත හෝ පළාත් ඡන්ද විමසීම්වලදී සහ ජනමත විචාරණවලිදී ඡන්දය දීම
- අවශ්‍ය වූ විටෙක ඕස්ට්‍රේලියාව ආරක්ෂා කිරීම
- සේවය ඉල්ලා සිටිනු ලැබුවහොත් ජූරි සභාවට සහභාගී වීම

ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය පිළිබඳ වැඩි විස්තර සඳහා www.citizenship.gov.au වෙබ් අඩවියට ගොස් ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය පිළිබඳ පරීක්ෂණයේ මූලාශ්‍ර පොත *ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය: අපේ පොදු බැඳීම* කියවන්න.

## සමානාත්මතාව සහ වෙනස්කම් සැලකීමට විරුද්ධ වීම

අනෙක් අයට මෙන් ඔබටද ගරු කරනු ලැබීමට මෙන්ම ඔබේ අවශ්‍යතාවන් සලකනු ලැබීමට අයිතියක් ඇත. එසේම, ඔබද ඕස්ට්‍රේලියාවේ උපන් හෝ රටට සංක්‍රමණය වූ පුද්ගලයන් විය හැකි අනෙක් අයටද ගරු කළ යුතුය. ජාතිවාදය හෝ කවරාකාර වූ හෝ වෙනස්කම් සැලකීම ඕස්ට්‍රේලියාව තුළදී අනුමත නොකෙරේ.

වෙනස්කම් සැලකීමට එරෙහි නීති යටතේ, වයස, ජාතිය, රට හෝ සම්භවය, ස්ත්‍රී-පුරුෂ භාවය, වෛවාහිකත්වය, ගර්භණීභාවය, දේශපාලන හෝ ආගමික ඇදහීම්, ආබාධිතත්වය හෝ ලිංගික අභිරුචිය මත කිසිවෙකුටවත් අනෙකෙකුට වඩා අවාසිදායක ලෙස නොසැලකිය යුතුය. මෙය රැකියා නියුක්තිය, අධ්‍යාපනය, වාසස්ථාන, භාණ්ඩ මිළදී ගැනීම, සහ වෛද්‍ය, බැංකු සහ හෝටල වැනි සේවාවන් ලබා ගැනීමද ඇතුළත්ව බොහෝ අංශවලට අදාළ වේ. නීතිය යටතේ මෙන්ම අනෙකුත් සියලු කාරණා සම්බන්ධයෙන්ද ස්ත්‍රීන් සහ පුරුෂයන් සමාන වේ.

නිදහස් කථනය ඕස්ට්‍රේලියාවේ සම්ප්‍රදායයි. එසේ වුවත්, වයස, ජාතිය, රට හෝ සම්භවය, ස්ත්‍රී-පුරුෂ භාවය, වෛවාහිකත්වය, ගර්භණීභාවය, දේශපාලන හෝ ආගමික ඇදහීම්, ආබාධිතත්වය හෝ ලිංගික අභිරුචිය මත තවත් අයෙකුට අපහාස කිරීම, අවමන් කිරීම, තරහ ගැන්වීම හෝ තර්ජනය කිරීම නීතිවිරෝධීය.

Australian Human Rights Commission මානව හිමිකම්, වෙනස්කම් සැලකීමට එරෙහි වීම සහ සමාජ සාධාරණත්වය යන අංශයන්හි ෆෙඩරල් නීතිය ක්‍රියාත්මක කරවයි.

| Australian Human Rights Commission | ඇමතුම් විස්තර |
|---|---|
| පොදු විමසීම්<br>පෙ.ව 9.00-ප.ව. 5.00 AEST | 1300 369 711 |
| පැමිණිලි තොරතුරු සේවාව පෙ.ව 9.00-ප.ව. 5.00 AEST (අඟහරුවාදාවන්හි ප.ව. 1.00 සිට වසා ඇත) | 1300 656 419 |
| TTY – ඇසීමේ සහ කතා කිරීමේ දුබලතා ඇති අය සඳහා | 1800 620 241 |
| පරිවර්තිත තොරතුරු - මානව හිමිකම් | www.humanrights.gov.au/about/translated-information |
| Human Rights වෙබ් අඩවිය | www.humanrights.gov.au |

සෑම ප්‍රාන්තයකම සහ පළාතකම ඊට අයත් වෙනස්කම් සැලකීමට එරෙහි නීති සහ රාජ්‍ය ආයතන ඇත:

| ප්‍රාන්තය හෝ පළාත | මානව හිමිකම් ආයතනය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| ACT | ACT Human Rights Commission | 02 6205 2222 | www.hrc.act.gov.au |
| NSW | Anti-Discrimination Board of NSW | 02 9268 5544 හෝ NSW පළාත්බද ඇතුම් නොමිළේ 1800 670 812 | www.lawlink.nsw.gov.au/adb |
| NT | NT Anti-Discrimination Commission | 08 8999 1444 හෝ NT නොමිලේ ඇමතුම් 1800 813 846 | www.adc.nt.gov.au/ |
| Qld | Anti-Discrimination Commission Queensland | 1300 130 670 | www.adcq.qld.gov.au |
| SA | Equal Opportunity Commission | 08 8207 1977 හෝ SA පළාත්බද ඇමතුම් නොමිළේ 1800 188 163 | www.eoc.sa.gov.au |
| Tas. | Office of the Anti-Discrimination Commissioner | 03 6165 7515 හෝ Tas. ඇමතුම් නොමිළේ 1300 305 062 | www.antidiscrimination.tas.gov.au |

| ප්‍රාන්තය හෝ පළාත | මානව හිමිකම් ආයතනය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|---|
| Vic. | Victorian Equal Opportunity and Human Rights Commission | 1300 292 153 | www.humanrightscommission.vic.gov.au |
| WA | Equal Opportunity Commission | 08 9216 3900 or WA නොමිලේ ඇමතුම් 1800 198 149 | www.equalopportunity.wa.gov.au |

## ස්වේච්ඡා සේවය

ස්වේච්ඡා සේවය නව නිපුණතාවන් ප්‍රගුණ කිරීමට, ඔබේ ප්‍රජාව තුළ ජීවත් වන සහ රැකියා කරන පුද්ගලයන් දැන හඳුනා ගැනීමට සහ අනෙක් අයට උදව් කිරීමට කදිම මාර්ගයකි. බොහෝ ඕස්ට්‍රේලියානුවෝ ස්වේච්ඡා සේවයෙහි නිරත වෙති. ස්වේච්ඡා සේවකයෝ ඔවුන්ගේ කාලය සහ නිපුණතා ප්‍රජාවේ සහ තමාගේ සුභසිද්ධිය කෙරෙහි යොදවන හෙයින් ඔවුහු ගෙවීමක් නොලබති. ස්වේච්ඡා සේවය ඉදිරිපත් වීම මත සිදුවන්නක් මිස අනිවාර්ය වූවක් නොවේ.

ස්වේච්ඡා සේවය වැටුප් සහිත වෘත්තීන් සඳහා ආදේශකයක් නොවුණත්, එය ඔබට රැකියාවක් ලබා ගැනීමට අවශ්‍ය නිපුණතා සහ රැකියා පුහුණුව ලබා ගැනීමට මඟ සලසයි. ස්වේච්ඡා සේවයෙහි නිරත වීමෙන් ඔබ ඔබේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කර ගනු ඇත, සමාජ සහ ප්‍රජා සම්බන්ධතා ගොඩ නගා ගනු ඇත, එසේම ඔබේ ආත්ම විශ්වාෂය වර්ධනය කර ගනු ඇත.

ස්වේච්ඡා සේවය සඳහා අවස්ථාව ලබා දෙන ආයතන සහ වෙබ් අඩවි ගණනාවක් ඇත. Volunteer Resource Centres ඕස්ට්‍රේලියාව පුරා පිහිටා ඇති අතර ඒවා මගින් ස්වේච්ඡා සේවා තොරතුරු, ගැළපීම සහ සම්බන්ධීකරණ සේවා සැපයෙයි. ඊට අමතරව, ඔවුහු ස්වේච්ඡා සේවකයන් අපේක්ෂා කරන ආයතනවලට උපකාර කරති.

වැඩි විස්තර සඳහා:

| කලාපය | ආයතනය | වෙබ් අඩවිය |
|---|---|---|
| ACT | Volunteering ACT | www.volunteeringact.org.au |
| NSW | The Centre for Volunteering | www.volunteering.com.au |
| NT | Volunteering SA-NT | www.volunteeringsa.org.au |
| Qld | Volunteering Queensland | www.volunteeringqld.org.au |
| SA | Volunteering SA-NT | www.volunteeringsa.org.au |
| Tas. | Volunteering Tasmania | www.volunteeringtas.org.au |
| Vic. | Volunteering Victoria | www.volunteeringvictoria.org.au |
| WA | Volunteering WA | www.volunteeringwa.org.au |
| ඕස්ට්‍රේලියාව පුරා ස්වේච්ඡා සේවා අවස්ථා | GoVolunteer | www.govolunteer.com.au |
| ඕස්ට්‍රේලියාවෙහි ස්වේච්ඡා සේවය සඳහා වූ ජාතික සංගමය | Volunteering Australia | www.volunteeringaustralia.org |

## පුද්ගලයන් හමු වීම

පළමු වරට යමෙකු මුණ ගැසීමේදී, එම පුද්ගලයාගේ දකුණතට ඔබේ දකුණත යොමා සෙළවීම සාමන්‍ය සිරිතය. එකිනෙකාව හොඳින් නොහඳුණන පුද්ගලයෝ පළමු වරට හමු වීමේදී සිප ගැනීම හෝ වැළඳ ගැනීම නොකරති.

අලුතෙන් කෙනෙකු මුණු ගැසීමේදී, බොහෝ ඕස්ට්‍රේලියානුවෝ ඔවුන්ගේ වයස, ආගම, විවාහය, දරුවන් හෝ මුදල් ගැන අසනු ලැබීමෙන් අපහසුවට පත් වෙති. වැඩ බිමේදී සහ මිතුරු හමුවලදී ඕස්ට්‍රේලියානුවෝ පළමු නාමයෙන් ඔවුනොවුන් අමතති.

තමන් ගෞරවය පෙන්වීමට සහ තමන් ඇහුම්කන් දෙන බව ඇඟවීමට බොහෝ ඕස්ට්‍රේලියානුවෝ තමන් කතාබහ කරන පුද්ගලයන්ගේ ඇස් දිහා බලා කතා කරති.

## ආචාරශීලී හැසිරීම

ඕස්ට්‍රේලියානුවෝ යමක් ඉල්ලීමේදී “කරුණාකර” (please) යන්න භාවිත කරන අතර යමෙක් උපකාරයක් කළ විට හෝ යමක් දුන් විට “ස්තූතියි“ (thank you) කියති. “කරුණාකර” සහ “ස්තූතියි“ යන වචන භාවිත නොකිරීම අවිනීත හැසිරීමක් ලෙස සලකනු ලැබිය හැකිය.

කෙනෙකුගේ අවධානය තමා වෙත යොමු කරගනු වස් ඕස්ට්‍රේලියානුවෝ නිතරම “excuse me” (සමාවන්න) යැයි පවසන අතර හදිසියේ යමෙකුගේ ඇගේ හැපුණහොත් “sorry” (කණගාටුයි) යැයි කියති. පෝලිමක් ඇති විටෙකදී, එහි කෙළවරට සම්බන්ධ වීම සහ ක්‍රමානුකූලව ඉදිරියට යාම ආචාරශීලී වේ.

රැස්වීම් සහ වෙනත් හමුවීම් සඳහා ඔබ නිසි වේලාවට යා යුතුය. ඔබ පමා වන්නේ නම්, ආදළ පුද්ගලයාට දුරකථන ඇමතුමක් දී, සමාව අයැද ඔබ පැමිණෙන වේලාව දන්වන්න. වෘත්තීය හමුවීම් සඳහා (උදාහරණයක් ලෙස වෛද්‍ය හමු) මෙය ඉතා වැදගත්ය. මන්ද, පමා වීම වෙනුවෙන් ඔබෙන් මුදලක් අය කළ හැකි අතර පමා වන බව කලින් නොදැන්වීමෙන් අදාළ හමුව ඔබට අහිමි වීමට ඉඩ ඇත. නිරතුරුව පමා වන පුද්ගලයකු විශ්වාෂ කළ නොහැකි පුද්ගලයකු සේ සැලකීමට ඉඩ ඇත.

ඔබට ලිඛිත ආරාධනාවක් ලැබුණොත් එහි යම් නිශ්චිත දිනයක් සමග “RSVP” යන අකුරු ඇතුළත් විය හැකිය. ඉන් අදහස් වන්නේ ආරාධනාව කරන පුද්ගලයා ඔබ පැමිණෙන හෝ නොපැමිණෙන වග දැන ගැනීමට කැමති බවයි. එමනිසා, අදාළ දිනයට පෙර ඔවුන්ට දැනුම් දීම සුදුසුය.

සමහර හැසිරීම් අවිනීත වනවා පමණක් නොව නීතිවිරෝධීද වෙයි. දිවිරීම සහ පොදු ස්ථානවල කෙළ ගැසීම, කසළ දැමීම, සහ පොදු හෝ පෞද්ගලික වැසිකිළියක හැර වෙනත් තැනක මුත්‍ර කිරීම හෝ මළපහ කිරීම යනාදිය මීට නිදසුන්ය.

ඉහත දැක්වූ සමානාත්මතාව සහ වෙනස්කම් සැලකීමට එරෙහි වීම බලන්න.

## ඇඳුම්-පැළඳුම්

ඕස්ට්‍රේලියාව විවිධත්වයෙන් යුතු රටකි. විවිධාකාර වූ ඇඳුම් මේ විවිධත්වය කියාපායි. පහසුව සඳහා හෝ සමාජ අවස්ථාව හෝ දේශගුණය අනුව බොහෝ මිනිසුන් අනියම් හෝ අවිධිමත් ලෙස අඳිති. තවත් අය විශේෂ අවස්ථාවන්හි, ආගමික හෝ චාරිත්‍රානුකූලව, සාම්ප්‍රදායික ඇඳුම් ඇඳීම ප්‍රිය කරති.

විවිධ වෘත්තීය ආයතනයන්හි සහ විශේෂ ස්ථානවලදී සමහර ඇඳුම් ඇඳීම අත්‍යවශ්‍ය වුවත්, ඇඳුම්-පැළඳුම් පිළිබඳවද නීති කිහිපයක් ඇත. උදාහරණයක් ලෙස, ඉදිකිරීම් වැඩ පළක නම් නිරාපදා හේතු මත ආරක්ෂක සපත්තු සහ සණකම හිස්වැසුම් පැළඳීම අනිවාර්යය; එසේම පොලීසිය, හමුදාව සහ සමහර ව්‍යාපාරවල කාර්යමණ්ඩලයට නිල ඇඳුම් ඇඳීම අනිවාර්යය.

නිවාරණය කළ හැකි සම් පිළිකා සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාව ඉහළ අගයක් උසුළයි. ආරක්ෂක ඇඳුම් සහ හිස් වැසුම් සම් පිළිකා පිළිබඳ අවදානම අඩු කරයි. බොහෝ පාසල්වල ඔවුන්ගේ නිල ඇඳුමේ කොටසක් වශයෙන් හිස්වැසුම් පැළඳීම අනිවාර්යය. සූර්ය තාපයෙන් ආරක්ෂා වීම පිළිබඳ වැඩි විස්තර සඳහා www.cancer.org.au/preventing-cancer/sun-protection වෙබ් අඩවියට පිවිසෙන්න.

සමාජ ශාලා, සිනමාහල් සහ වෙනත් ස්ථාන ඔවුන්ගේ අනුග්‍රාහකයන් (පාරිභෝගිකයන්) කඳිමට, පිරිසිදු ඇඳුමින් සැරසී, සුදුසු පාවහන් පැළඳ සිටීම අපේක්ෂා කළ හැකිය.

ස්ත්‍රීන් සහ පුරුෂයන් ඔවුන්ගේ සර්වාංගයම ආවරණය නොවන ඇඳුම් ඇඳ සිටිය හැකිය. මෙය බටහිර රටවල සාමාන්‍ය තත්වයක් වන අතර ඔවුන් විශේෂ ආකර්ෂණයක් අපේක්ෂා කරන බවක් ඉන් අදහස් නොවේ.

## ඕස්ට්‍රේලියාවේ බහුල/පොදු කියමන්

බොහෝ ඕස්ට්‍රේලියානු ප්‍රකාශයන් හෝ එදිනෙදා ව්‍යවහාරයන් සමහර විට ආගන්තුක විය හැකිය. ඕස්ට්‍රේලියානුවෝ බොහෝ විට යෙදුම් කෙටි කරති (උදාහරණයක් ලෙස 'football' (පාපන්දු) වෙනුවට 'footy' යන්න වහරති. යම් ප්‍රකාශනයක තේරුම කුමක්දැයි ඔබට නොතේරේ නම්, එය විමසීම සුදුසුය. පොදු නිදර්ශන කිහිපයක් මෙසේය:

- Bring a plate (ආහාර බඳුනක් ගෙනෙන්න) - ඔබට සමාජීය හෝ වැඩපළේ සාදයක් සඳහා ආරාධනා කරන විට "bring a plate" යයි කිවහොත්, ඉන් අදහස් වන්නේ 'අන් අය සමග බෙදා ගැනීමට ආහාර බඳුනක් රැගෙන එන්න' යන්නයි.
- BYO - මෙයින් අදහස් වන්නේ "bring your own" (බීම ජාති රැගෙන එන්න) යන්නයි. උදාහරණ ලෙස ඇල්කොහොල්, පළතුරු බීම, සිසිල් බීම, සහ ජලය ගත හැකිය. සමහර ආපන ශාලාද BYO ය. එනම්, ඔබට බෝතල් කළ බීම වර්ග රැගෙන යා හැකි බවයි. ඔබ බීම වර්ග රැගෙන ආපන ශාලාවකට යන්නේ නම්, සාමාන්‍යයෙන් වීදුරු සඳහා ගාස්තුවක් ගෙවීමට සිදු වේ. මෙය හැඳින්වෙන්නේ "corkage" යනුවෙනි.
- Open door policy (දොර විවෘතව තැබීමේ ප්‍රතිපත්තිය) - වෘත්තීය ආයතනයක "open door policy" එකක් තිබීම යන්නෙන් අදහස් වන්නේ ඔබ සහ අනෙක් සේවකයන්ට ආයතන ප්‍රධානියා සමඟ වෘත්තීය ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමට වේලාවක් යොදා ගැනීම අවශ්‍ය නොවන බවයි.
- See you later (පසුව හමුවෙමු) - මෙය "goodbye" යන්න වෙනත් ආකාරයකින් පැවසීමකි. එම පුද්ගලයා ඉතා ඉක්මණින් ඔබ හමු වීමට ආපසු එන බවක් ඉන් අදහස් නොවේ.

ඔබේ ඉංග්‍රීසි භාෂා උපකාර සේවාව ඕස්ට්‍රේලියානු ව්‍යවහාරයන් පිළිබඳව ඔබව දැනුවත් කරනු ඇත. 3 වන පරිච්ඡේදය, ඉංග්‍රීසි භාෂාව කියවන්න.

## එළිමහන් ක්‍රියාකාරකම් සහ නිරාපදාව

ඕස්ට්‍රේලියාව පිහිනීම, කැළෑවල ඇවිදීම, කඳවුරු බැඳීම සහ ක්‍රීඩා වැනි එළිමහන් ක්‍රියාකාරකම් වලට ඉතා යෝග්‍යය. එම ක්‍රියාකාරකම් වලදී නිරාපදාව සම්බන්ධ රීතීන් මතක තබා ගැනීම වැදගත්ය.

### පිහිනීම සහ එළිමහන් නිරාපදාව

- ඔබට හෝ ඔබේ දරුවන්ට පිහිනීමට නොහැකි නම් පිහිනුම් සහ ජලාශ්‍රිත නිරාපදාව සම්බන්ධ පන්තිවලට සහභාගී වන්න.
- මුහුදෙහි පිහිනීම අතිශයින් අනතුරුදායක විය හැකිය. ආපදාවකින් තොරව මුහුදු වෙරළේ විනෝද වීම සඳහා පහත සඳහන් උපදෙස් පිළිපදින්න:
    - ජීවිතාරක්ෂකයින් විසින් අධීක්ෂණය කරනු ලබන රතු සහ කහ කොඩිවලින් සලකුණු කර ඇති ප්‍රදේශයේ පමණක් පිහිනන්න.
    - නිරාපදා සලකුණු පිළිබඳ සැලකිලිමත් වන්න.
    - ඔබ කරදරයකට පත් වුවහොත්, කලබල නොවී සිටින්න, අත් ඔසවා උදව් ඉල්ලා කෑ ගසන්න.
    - රතු සහ කහ කොඩි නොමැති වෙරළතීරවල හෝ පිහිනීම අනතුරුදායක බවට හෝ වෙරළතීරය වසා ඇති බවට හෝ සංඥා ඇති වෙරළ තීරවල පිහිනීම නොකරන්න;
- මුහුද අනපේක්ෂිත පරිදි හැසිරිය හැකිය. මුහුදුපරවල ලිස්සා වැටීම හෝ විශාල රළ හෝ වඩදියට ගසාගෙන යාම වැනි හදිසි අනතුරු වැළැක්වීම සඳහා අනතුරු සංඥා පිළිබඳ හැමවිටම පරීක්ෂාකාරී වන්න. බොහෝ පුද්ගලයන් විශාල රළිවලට ගසාගෙන ගොස් දියේ ගිලී ඇති බැවින් ගල්පර මත හිඳ මාලු බෑමේදී අතිශයින්ම ප්‍රවේශම් වන්න.
- ගංගා, වැව් සහ ජලාශවල පිහිනීමේදී පරෙස්සම් වන්න:
    - ජලයට බැසීමට පෙර ජලයේ ගැඹුර සහ එහි ගිල්වා ඇති දේ පිළිබඳව පරීක්ෂාකාරී වන්න.
    - (කිඹුලන් හෝ අපද්‍රව්‍ය වැනි) ආපදා සංඥාවන් පිළිබඳ සැලකිළිමත් වන්න; ඒවාට අවනත වන්න.

- ගෘහස්ථ නානතටාක ද ඇතුළත්ව, ජලයේ සහ ජලය ආසන්නයේ සිටින ළමුන් පිළිබඳ හැම විටම සුපරීක්ෂාකාරී වන්න. නාන තටාක වටේ ආරක්ෂක වැටක් තිබිය යුතුය.
- තනිව පිහිනීමට, මාලු බෑමට හෝ කැලෑවල ඇවිදීමට යාමෙන් වළකින්න. එසේ යන්නේ නම්, ඔබ යන දිශාව සහ ආපසු පැමිණීමට අපේක්ෂා කරන වේලාව යමෙකුට පවසන්න. අවශ්‍ය තරම් ආහාර සහ ජලය රැගෙන යන්න.
- ඕස්ට්‍රේලියාවේ සිටින සමහර මකුළුවන් සහ සර්පයන් අධික විෂ සහිතය. දෂ්ට කරනු ලැබුවහොත්, එම බාහුව/පාදය නොසොල්වා තබා ගන්න; **000** (triple zero) ඇමතීමෙන් වෛද්‍ය ආධාර ලබා ගන්න.
- වසන්ත කාලයේදී, මැග්පයිස් යනුවෙන් හැඳින්වෙන ගී කියන කුරුල්ලන් පදිකයන්ගේ සහ පාපැදිකරුවන්ගේ හිස වටා බමමින් ඔවුන්ගේ වාසස්ථාන ආරක්ෂා කරති. මෙම පක්ෂීන් රක්ෂිතය, එම නිසා ඔවුන්ගේ වාසස්ථාන මග හැරීමෙන්, හිස්වැසුම් සහ අව් කණ්ණාඩි පැළඳීමෙන් හෝ කෝට්ටුවක් හෝ කුඩයක් හිස මතින් වැනීමෙන් ඔවුන්ගේ ප්‍රහාරයන් වැළැක්වීමට උත්සාහ කරන්න.
- ඕස්ට්‍රේලියාවෙහි හිරු එළිය ඉතා සැඩය. හිරු දැවීම් (sunburn) වැළකීම සඳහා, හිරු රශ්මිය සහිත දිනවලදී හිස්වැසුම්, ආරක්ෂක ඇඳුම් සහ අව්වෙන් සම ආරක්ෂා කරන ආලේපන භාවිතර කරන්න. කුඩා ළමුන් සම්බන්ධයෙන් මෙය ඉතා වැදගත්ය.
- කාලගුණ අනාවැකි පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් වන්න. ගිනිදැල්වීම් සපුරා තහණම් දිනවලදී විවෘත ගිනිමෙළවීම් සහ බාබකියු දැමීමට ඉඩ නොලැබේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව www.bom.gov.au/index.php වෙබ් අඩවියෙහි ලා කාලගුණ අවවාදයන් සපයයි.
- ඕස්ට්‍රේලියාවේ නගරවල, ලෝකයේ බොහෝ නගරවල මෙන්, විශේෂයෙන් රාත්‍රී කාලයේදී, කලකෝළාහල ඇති විය හැකිය. ඔබේ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ අවධානයෙන් සිටින්න. උද්‍යාන, අඳුරු ස්ථාන සහ කලකෝලාහළවලට ප්‍රසිද්ධ ස්ථානවල රැඳීමෙන් වළකින්න.

වැඩි විස්තර සඳහා:

| තොරතුරු මූලාශ්‍රය | වෙබ් අඩවිය |
|---|---|
| Bureau of Meteorology – කාලගුණ අනාවැකි සහ ගිනි තහණම් කිරීම් | www.bom.gov.au/weather |
| Royal Life Saving Society – පිහිනීම සහ ජලාශ්‍රිත නිරාපදාව | www.royallifesaving.com.au |
| Surf Life Saving Australia | www.slsa.asn.au |
| Beach Safety – පරිවර්තිත තොරතුරුද ඇතුළත්ව | www.beachsafe.org.au |
| Rip Current Safety Tips – ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවලින් සැපයෙන් තොරතුරුද ඇතුළත්ව | www.ripcurrents.com.au |
| Australian Cancer Council – හිරු එළියෙන් ආරක්ෂා වීම | www.cancer.org.au |

## නිවසේදී නිරාපදාව

### නිවසේ ආරක්ෂාව

නිවසින් පිටවීමේදී, හැම විටම දොර ජනෙල් අගුළු දමන්න. හැකිනම්, ප්‍රධාන දොරට පිටින් දැල් සහිත දොරක් සවි කරගන්න, නැත්නම් දොරට ආරක්ෂක දම්වැලක් යොදන්න. එවිට දෙර ඇරීමට ප්‍රථමයෙන් දොරකඩ සිටින්නේ කවරෙක්දැයි දැකීමට ඔබට හැකි වනු ඇත. ඔබේ ඉදිරි දොර අබියස විදුලි පහනක් දල්වා තබන්න, නැත්නම් සංවේදක විදුලි පහනක් සවි කරන්න. එවිට දොර අබියස යමෙකු ඇති විට ඔබට පෙනෙන අතර අඳුරු අවස්ථාවක නිවසට ඇතුළ වන විටදී දොර විවෘත කර ගැනීමට පහසු වනු ඇත. එය අනවසරයෙන් ඇතුළු වන්නන්ටද බාධා කරනු ඇත.

### ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය

නිවෙස ආශ්‍රිතව නිතර හමුවන සමහර ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය හානිකර විය හැකි අතර දැඩි අසනීප තත්වයන්ටද හේතු විය හැකිය.

- සියලු ඖෂධ ළමයින්ට සහ සුරතල් සතුන්ට ළඟා විය නොහැකි ස්ථානයක හෝ ළමුන්ට සොයාගත නොහැකි ස්ථානයක තබන්න.
- ඔබ ඖෂධයක් පාවිච්චි කිරීම නැවැත්වූයේ නම් හෝ ඒවා කල් ඉකුත් වී ඇත්නම්, ඒවා කසළ ගොඩට හෝ කාණුවට නොදමන්න. එම ඖෂධ ආරක්ෂාකාරීව සහ නොමිලේ ඉවත ලීමට ඔබේ ඖෂධවේදියා උපකාරී වනු ඇත.
- සියලු පවිත්‍රකාරක ද්‍රව්‍ය ළමුන්ට සහ සුරතල් සතුන්ට ළඟා විය නොහැකි ස්ථානයක අගුළු දැමිය හැකි රාක්කයක තබන්න.

ළමා ආරක්ෂක උපකාරණ (අල්මාරි අගුළු වැනි) බොහෝ ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැල්වලින් ලබාගත හැකිය.

### නිවසේදී ගිනි නිරාපදාව

ගෙවල් ගිනිගැනීම් මගින් 50කට ආසන්න මරණ සංඛ්‍යාවක් සහ බොහෝ බරපතළ තුවාල වීම් සෑම අවුරුද්දකම ඕස්ට්‍රේලියාවේ සිදු වේ.

ගිනි අනතුරු ඇඟවීමේ සංඥා ඔබේ ජීවිතය අනතුරින් වළකන අතරම හානිය පැතිරීමට පෙර හදිසි සේවා කැඳවීමටද අවශ්‍ය පූර්ව අනතුරු ඇඟවීම් සපයයි. මෙම අනතුරු ඇඟවීම් විශේෂයෙන්ම මිනිසුන් නිදා සිටින හෙයින් රාත්‍රී කාලයට වැදගත් වේ. සෑම නිවසකම සෑම මහලකම අඩුම තරමේ එක් ගිනි අනතුරු ඇඟවීමේ සංඥාවක් සවිකර තිබීම අත්‍යවශ්‍යය. සෑම මාස හයකට වරක්ම බැටරිය පරීක්ෂා කොට අවශ්‍ය නම් මාරු කරන්න.

ගෙවල් ගිනි ගැනීම් බොහෝ විට ආරම්භ වන්නේ මුළුතැන් ගෙයින්, දෝෂ සහිත විදුලි රැහැන් මගින්, විදුලි උපකරණ අවභාවිතයෙන් හෝ විදුලි උපකරණ ක්‍රියාත්මක කර තබා ඉවත යාමෙනි. පහත සඳහන් ආරක්ෂණ පිළිවෙත් අනුගමනයෙන් ගෙවල් ගිනි වළක්වා ගන්න:

**ගෙදරදී:**

- අධික ලෙස රත්වීම වැළැක්වීමට විදුලි උපකරණ අවට ඉඩක් තිබේදැයි තහවුරු කර ගන්න.
- විදුලි කෙවෙනි පුවරු මත වැඩි බර පැටවීමෙන් වළකින්න - එක් කෙවෙණියකට (socket) එක් පේනුවක් (plug) පමණක් යොදන්න.
- පේනු සහ කෙවෙණිවල ඇති දූවිලි සහ පළුදු සහ වෙනත් ගැටලු නොපමාව පිළිසකර කරන්න. විදුලි උපාංග පිළිබඳ සියලු අලුත්වැඩියාවන් කළ යුත්තේ ප්‍රවීණ විදුලි කාර්මික ශිල්පියකු විසිනි.
- දොර-ජනෙල් තිර, රෙදි සහ ඇඳ ඇතිරිලි ඉටිපන්දම් සහ තාපක (heaters) වලින් ඈත් කොට තබන්න.
- ඔබ කාමරයකින් බැහැර යන විට ඉටි පන්දම් වැනි විවෘත ගිනිසිළු දැල්වීමට සලස්වා නොයන්න.
- ඔබ නිවසේ සිටින විට, දොරවල් ඇතුළෙන් අගුළු නොදමා තබන්න. එවිට හදිසි අවස්ථාවකදී ඔබට ඒවා පහසුවෙන් විවෘත කරගත හැකිය.
- ඇඳ මතදී දුම් පානය නොකරන්න.
- ගිනි දල්වන (lighters) සහ ගිනි පෙට්ටි දරුවන් අතට පත් නොවන තැන්වල තබන්න.

**මුළුතැන්ගෙහිදී:**

- කිසි විටෙක කුඩා දරුවන් මුළුතැන්ගෙයි දමා නොයන්න.
- ඉවුම්-පිහුම් අතරමගදී ඉවත නොයන්න - ඔබට ඉවත යාමට අවශ්‍ය වුවහොත් නැවත එනතුරු උඳුන නිවා දමා යන්න.
- උඳුන් තැටි (hotplates), ගිනි උඳුන් (stovetops) සහ පෝරණු (ovens) අසළින් දරුවන් ඈත් කොට තබන්න.
- භාජනවල අඬු උඳුනේ ඇතුළු පැත්තට වන්නට තබන්න. එවිට ඒවායේ ගැටීමෙන් වන පෙරළීම් වැළකේ. උණුවතුර ද පිළිස්සුම්කාරකයක් විය හැකිය.
- ගිනිගන්නාසුළු දෑ රස්නයෙන් ඈත් කොට තබන්න.

- ලෝහ භාජන, ඇලුමිනියම් ලෝපත් (foil) සහ ලෝහ උපකරණ ඇතුළත්ව ලෝහමය දෑ කිසිවක් කිසිවිටෙක මයික්‍රොවේව් උඳුන තුළ නොතබන්න.
- සමහර මුළුතැන්ගේවල සහ බාබකියු සඳහා ගෑස් භාවිත කරයි. භාවිතයෙන් පසුව ගෑස් උඳුන් සහ ලිප් නිවා තැබීමට වගබලා ගන්න. ඔබට ගෑස් ගඳ දැනේ නම්, කිසි විටෙක ගිනි කූරක් නොදල්වන්න; ගිනි දලු ගෑස් පුපුරා යාමට හේතු විය හැකි බැවිනි. ගෑස් කාන්දු වන ස්ථානය සොයාගෙන වහාම එය අක්‍රිය කරන්න. ඔබට එය කළ නොහැකි නම්, **000** අමතා "Fire Brigade" ඉල්ලන්න. දුරකථනය විසන්ධි නොකරන්න වගබලා ගන්න.

**ගින්නක් ඇති වුවහොත් කළ යුත්තේ කුමක්ද:**

- අසල්වැසියකුගේ දුරකථනයකින්, පොදු දරකථනයකින් හෝ ජංගම දුරකථනයකින් **000** අමතා "Fire Brigade" ඉල්ලන්න. ගින්න ඇති වී ඇත්තේ කොහිද යන්නත්, කිසිවෙකු හෝ ඇතුළේ සිටිද යන්නත් ඔවුන්ට පවසන්න. දුරකථනය විසන්ධි කරන්න එපා.
- ප්‍රාන්තයේ ගිනි නිවීම් සේවාව ගිනි ගැනීමකදී කළ යුතු දෑ පිළිබඳ විස්තරාත්මක උපදෙස් සපයයි. 2 වන පරිච්ඡේදයෙහි *උපකාර ලබා ගැනීම* බලන්න.

## ලැව්ගිනි නිරාපදා සැලසුම්

ඕස්ට්‍රේලියාවේ සමහර ප්‍රදේශවල ඇති වන ලැව් ගිනි ඔබේ නිවසේ ආරක්ෂාවට බලපෑ හැකිය. ඔබ ලැව්ගිනි ආපදා සහිත ප්‍රදේශයක ජීවත් වේනම්, ලැව්ගින්නෙන් ආරක්ෂා වීමේ සැලසුමක් සකස් කර ගන්න. මේ සඳහා ප්‍රාදේශීය ගිනි නිවීම් සේවාවෙන් තොරතුරු සහ මාර්ගෝපදේශ ලබා ගත හැකිය.

ඔබේ සැලසුමට ලැව්ගිනි සමයට පෙර කළයුතු කටයුතු, ලැව්ගිනි සමයේ කළ යුතු දෑ,ලැව්ගිනි අනතුරු සහිත දිනවල කළයුතු කටයුතු සේම උපස්ථ සැලසුමක් (back-up plan) ද ඇතුළත් විය යුතුය. ඊට පහත සඳහන් දේ පිළිබඳ විස්තරාත්මක පිරික්සුම් ලැයිස්තුවක්ද ඇතුළත් විය යුතුය: ඔබේ දේපළෙහි නඩත්තුව, ගින්නක් ඇති වුවහොත් ඒ සඳහා ඔබේ දේපළ සූදානම් කිරීම, ගිනි උවදුරක් ඇති වුවහොත් පුද්ගලික ඇමතුම් ලැයිස්තු, ආපදා මෙවලම් කට්ටලයෙහි අඩංගු විය යුතු දෑ, විශේෂ අවශ්‍යතා (ළදරුවන් හෝ මහල්ලන් ප්‍රවාහනය වැනි) සැලකිල්ලට ගෙන නිවසේ ජීවත් වන සියලු දෙනාම සඳහා සැකසූ සැලසුම්, සුරතල් සතුන් හා/හෝ පශු සම්පත් සඳහා සැලසුම්, පිටත් වීමේ වේලාව, ප්‍රවාහන අවශ්‍යතා, උපස්ථ සැලසුම, සහ නිවසට නැවත පැමිණීමේ සැලසුම යනු ඒවායි.

ලැව්ගිනි පිළිබඳ වැඩි විස්තර සහ ප්‍රාදේශීය ගිනි නිවීම් සේවාවල ඇමතුම් විස්තර සඳහා 2 වන පරිච්ඡේදයෙහි *උපකාර ලබා ගන්න* කියවන්න.

## පරිසරය

පිරිසිදු පරිසරයක් සහ ස්වභාව ධර්මය සුරැකීම ඕස්ට්‍රේලියානුවන්ට වැදගත් වේ. කුණු දැමීම, අපවිත්‍ර කිරීම හෝ අවසරයකින් තොරව කසළ දැමීම නීතිවිරොධීය. අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා www.australia.gov.au/information-and-services/environment/pollution-and-waste-management හෝ Clean Up Australia හෝ (www.cleanup.org.au/au) හෝ Keep Australia Beautiful (http://kab.org.au) වැනි කුණු දැමීම් විරෝධී වෙබ් අඩවිවලට පිවිසෙන්න.

දේශීය සතුන්, මාලුන්, සිප්පි බෙල්ලන් සහ පැල වර්ග නීතිය මගින් ආරක්ෂා කර ඇත. ඔබට අවසර පත්‍රයක් අවශ්‍ය වන්නේද යන්න තහවුරු කර ගැනීමට පළමුව දඩයම් කිරීම, මාලු බෑම හෝ පැල වර්ග හෝ සිප්පි එකතු කිරීම නොකිරීමට වග බලා ගන්න.

ජාතික වනෝද්‍යාන දූෂණයෙන් වළක්වා ගැනීම සඳහා ඒවාට අදාළව යම් යම් නීති-රීති පණවා ඇත. සමහර විට එවැනි වනෝද්‍යාන නැරඹීම සඳහා ඇතුළු වීමේ ගාස්තු අය කෙරේ.

වැඩි විස්තර සඳහා:

| කලාපය | ආයතනය | වෙබ් අඩවිය |
|---|---|---|
| ජාතික | Department of Environment – Parks Australia | www.environment.gov.au/topics/national-parks |
| ACT | Parks and Conservation | http://www.environment.act.gov.au/parks-conservation/parks-and-reserves |
| NSW | NSW National Parks and Wildlife Service | www.environment.nsw.gov.au/nationalparks |
| NT | NT parks and reserves | https://nt.gov.au/leisure/parks-reserves |
| Qld | Queensland National Parks, Sport and Racing | www.nprsr.qld.gov.au |
| SA | National Parks South Australia | www.environment.sa.gov.au/parks |
| Tas. | Parks and Wildlife Service Tasmania | www.parks.tas.gov.au |
| Vic. | Parks Victoria | www.parkweb.vic.gov.au |
| WA | Parks and Wildlife | www.dpaw.wa.gov.au |

## සතුන් සහ සුරතල් සතුන්

ප්‍රාන්ත සහ පළාත් ආණ්ඩු සත්ව සුබසාධනය සහ ඊට අදාළ නීති සම්බන්ධයෙන් වගකීම දරන අතර ප්‍රාදේශීය සභා ගෘහස්ථ සහ සහචර සතුන් කළමනාකරණය කරයි.

ඔබට සුරතල් සතෙක් ඇත්නම්, එම සතාට ආහාර -පාන දීමත්, පිරිසිදුව තබා ගැනීමත් ඇතුළත්ව ඔවුන් මනාව රැකබලා ගැනීමේ වගකීම ඔබට පැවරේ. ඔවුන්ගේ මළපහ අපද්‍රව්‍ය පිරිසිදු කළ යුත්තේද ඔබමය. බොහෝ සුරතල් සතුන් ක්‍රමවත්ව එන්නත් කළයුතු අතර ඔවුන් රෝගී වූ අවස්ථාවලදී හෝ අනතුරකට පාත්‍ර වූ විටෙකදී පශු වෛද්‍යවරයකු මගින් ප්‍රතිකාර ලබා දිය යුතුය. ගෘහස්ථ සුරතල් සතුන් කෘත්‍රිමව නිසරු කිරීම සහ ඔවුන්ට මයික්‍රොචිප් පැලඳවීම අපේක්ෂා කෙරෙන අතර එය නීතිමය අවශ්‍යතාවක්ද වේ. මේ සියල්ල අයිතිකරුගේ වගකීමය. වැඩි විස්තර සඳහා ඔබේ ප්‍රාදේශීය පශුවෛද්‍යවරයා විමසන්න, නැතහොත් www.rspca.org.au හි Royal Society for the Prevention of Cruelty to Animals (RSPCA) වෙබ් අඩවියට පිවිසෙන්න.

සමහර ගෘහස්ථ සුරතල් සතුන් ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කළ යුතුය. ඔබට ඇති කළ හැකි සුරතල් සතුන් ගණන සහ වර්ග සම්බන්ධයෙන්ද සීමා ඇති අතර ඔවුන් තබා ගත යුත්තේ කෙසේද, සහ කොහේද යන්නට අදාළ රෙගුලාසි ඇත. බොහෝ කුලී දේපළයන්හි සුරතල් සතුන් ඇති කිරීමට අවසර නැත.

ඔබට ඔබේ සුරතලාව තවදුරටත් රැකබලාගත නොහැකි නම්, ඔබ ඔවුන් අතැර දැමීම හෝ නිදහස් කිරීම නොකළ යුතුය. එම සතා හදා ගත හැකිදැයි ඔබේ අසල්වැසියන්ගෙන් හෝ යහළුවන්ගෙන් අසන්න. සුරතල් සතුන් හදා ගැනීම පිළිබඳ වෙබ් අඩවිවල දැන්වීමක් පළ කරන්න නැත්නම්, ඔබේ පශු වෛද්‍යවරයාගෙන් උපදෙස් සහ උපකාර පතන්න.

ඔබට සතුන් තබා ගැනීම හෝ ඔවුන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් ප්‍රශ්න ඇතිනම්, www.agriculture.gov.au/animal/welfare/state වෙබ් අඩවියට යන්න, නැත්නම් ඔබේ පශු වෛද්‍යවරයාගෙන් විමසන්න.

6 වන පරිච්ඡේදයෙහි, ඕස්ට්‍රේලියානු නීතිය ද බලන්න.

## පුවත්පත්, රූපවාහිනිය සහ ගුවන්විදුලිය

ප්‍රධාන පෙළේ සාප්පු සංකීර්ණවල ඇති බොහෝ පුවත්පත් අළෙවි නියෝජිත ආයතනවල විවිධ භාෂාවල පුවත්පත් අළෙවි කෙරේ. ඔවුන් ළඟ ඔබට අවශ්‍ය භාෂාවෙන් පළවන පුවත්පත් නැතිනම්, එය ඇණවුම් කළ හැකිදැයි අලෙවි නියෝජිතයාගෙන් අසන්න.

රාජ්‍ය විකාශන ආයතන දෙක Australian Broadcasting Corporation (ABC - www.abc.net.au) සහ Special Broadcasting Service (SBS - www.sbs.com.au) ද ඇතුළුව නොමිලේ සැපයෙන රූපවාහිනී සේවා ගණනාවක් ඇත. මෙම “ගාස්තුවෙන් නිදහස්” සේවා නැරඹීම සඳහා ඔබට රූපවාහිනී බලපත්‍රයක් හෝ ග්‍රාහක මිලක් ගෙවීම අවශ්‍ය නොවේ.

අනෙකුත් රූපවාහිනී සේවාවන් (“pay television” or “pay TV”) නැරඹීම සඳහා ගෙවා ලබාගත් දායකත්වයක් අවශ්‍ය වේ. සන්නිවේදන සේවා සඳහා කිසිදු කොන්ත්‍රාත්තුවකට එළඹීමට පෙර, එම සේවාවට අදාළ ගාස්තු ඔබට දරාගත හැකිද යන්න සහ එය ඔබේ අවශ්‍යතාවන්ට සහ දිවිපෙවෙතට ගැළපේද යන්න තහවුරු කරගන්න. ඔබ කෙටි කාලයකට නිවසක් කුලියට ගන්නේ නම් දිගුකාලීන කොන්ත්‍රාත්තුවලට එළඹීමෙන් වළකින්න. ගාස්තුවලින් නිදහස් free-to-air දර්ශන නැරඹීම සඳහා ගෙවන රූපවාහිනියට ලියාපදිංචි වීමෙන් වළකින්න.

බොහෝ රූපවාහිනී නාළිකාවන් ඔබට නැරඹීමට නොහැකි වූ වැඩසටහන් ජාලගතව නැරඹීමට ඉඩ සලසන පසු නැරඹුම් (“catch up”) වැඩසටහන්කරණ ඉදිරිපත් කරයි. කෙසේ වුවත්, ජාලගතව වැඩසටහන් නැරඹීමට විශාල දත්ත ප්‍රමාණයක් වැය වන අතර ඔබ ඔබේ දත්ත ප්‍රතිභාගය ඉක්මවුවහොත් එය ඉතාමත් මිල අධික විය හැකිය.

Netflix, Presto සහ Stan වැනි ප්‍රවාහ (“Streaming”) සේවා ද ඕස්ට්‍රේලියාවේදී ලබාගත හැකිය. වැඩසටහන් ගොනුවට පිවිසීම වෙනුවෙන් මෙම සේවාවන් මාසික ගාස්තුවක් අය කරයි. මෙම සේවාවවන් නැරඹීම සඳහා ඔබට අධිවේගී බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතාවක් අවශ්‍ය වෙයි. ඒවා නැරඹීමට විශාල වශයෙන් දත්ත වැය වන බව මතක තබා ගන්න, විශේෂයෙන්ම ජංගම දුරකථනයකින් නැරඹීම මිළ අධික විය හැකිය.

Special Broadcasting Service (SBS) රූපවාහිනී සහ ගුවන්විදුලි මධ්‍යස්ථාන විසින් ප්‍රජා භාෂාවන් ගණනාවකින් වැඩසටහන් විකාශනය කරයි. සතිපතා වැඩසටහන් ප්‍රධාන පුවත්පත්වල සහ ජාලගතව ප්‍රසිද්ධ කෙරේ.

ජනවාර්ගික ගුවන්විදුලි මධ්‍යස්ථාන National Ethnic and Multicultural Broadcasters’ Council (www.nembc.org.au වෙබ් පිටුවෙන් හෝ 03 9486 9549 දුරකථන අංකය ඇමතීමෙන් සොයාගත හැකිය).

## සූදුව

සූදුවට යෙදවිය යුතු කාලය සහ/හෝ මුදල පිළිබඳ සීමාවක් නොදත් සමහර පුද්ගලයන් සූදුව හේතුවෙන් සැලකිය යුතු පාඩු සිදු විය හැකිය. සූදුව බරපතළ මූල්‍ය ප්‍රශ්න ඇති කළ හැකි අතර මානසික සහ ශාරීරික සෞඛ්‍යය, රැකියාව සහ සම්බන්ධතා වැනි පුද්ගලයකුගේ ජීවිතයේ අනෙකුත් අංශ කෙරෙහිද බලපෑ හැකිය. සූදුව නිසා ඇතිවන ගැටළු එහි යෙදෙන්නාට පමණක් නොව, පවුලේ උදවියට සහ සමීප යහළුවන්ටද බලපායි.

සූදුවට ඇබ්බැහි වී පුද්ගලයන් මෙන්ම ඔවුන්ගේ පවුලේ උදවිය සහ සමීප සගයන් සඳහා උපදේශන, මූල්‍ය උපදේශන සහ නීති උපදෙස් ඇතුළත් උපකාර සේවාවන් ඇත.

| ආයතනය | දුරකථනය | වෙබ් අඩවිය |
|---|---|---|
| National Problem Gambling Hotline | 1800 858 858 | www.gamblinghelponline.org.au |
| Lifeline | 131 114 | www.lifeline.org.au |
| Gamblers Anonymous | 02 9726 6625 | http://gaaustralia.org.au/ |

## අධික ශබ්දය/ඝෝෂාව

බල්ලන් බිරීම, අසල්වැසියන් මහ හඬින් සංගීත වාදනය කිරීම, හෝ විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍ර භාවිතය වැනි පුද්ගලයන්ට බාධා වන විදිහේ අධික ශබ්දයන් මීට අයත් වේ.

අධික ශබ්දයෙන් ඕස්ට්‍රේලියානුවන් ආරක්‍ෂා කිරීමට නීති ඇත. ප්‍රාන්ත සහ පළාත් අනුව පැණවීම් වෙනස් විය හැකි නමුත් ඝෝෂා සහිත ක්‍රියාකාරකම් උදේ 7.00ට පෙර හෝ රාත්‍රී 11ට පසුව නොකළ යුතුය.

ඔබේ අසල්වැසියන්ගේ ඝෝෂාව ඔබට බාධාවක් නම්, ඔවුන්ට කතා කරන්න. ඔබේ අසල්වැසියන්ට ඔවුන්ගේ ඝෝෂාවෙන් ඔබට හිරිහැරයක් වන බව නොදැන සිටිනවා විය හැකියි. සාමාන්‍යයෙන් ඕස්ට්‍රේලියානුවන් විටින් විට ඇතිවන ඝෝෂාවන් ඉවසීමට පුරුදුව සිටින අතර ඒ පිළිබඳ ගැටලු කතාබහ කිරීමෙන් විසඳා ගනිති. කෙසේ වුවත්, ඝෝෂාව නිරතුරුව ඇති වේනම්, එය අධික ලෙස ඝෝෂාකාරී නම්, හෝ පාන්දර හෝ රෑබෝ වූ පසු ඇසේ නම්, එසේම කතාබහ කිරීමෙන්ද තත්වය සමනය නොවේ නම්, ඔබට මේ පිළිබඳව ප්‍රාදේශීය සභාවට, ප්‍රාන්ත හෝ පළාත් පරිසර අධිකාරියට, හෝ පොලීසියට පැමිණිලි කළ හැකිය.

ඔබ අලුත්වැඩියා කිරීමක් හෝ සාදයක් වැනි ඝෝෂාකාරී ක්‍රියාකාරකමක් සැලසුම් කරන්නේ නම්, ඒ පිළිබඳව ඔබේ අසල්වැසියන් දැනුවත් කරන්න. ඝෝෂාවක් ආරම්භ වන්නේ සහ අවසන් වන්නේ කවර වේලාවකද යන්න සහ එය කරදරකාරී වූ විට දැන්විය යුත්තේ කාටදැයි දැන සිටින විට පුද්ගලයෝ සාමාන්‍යයෙන් අඩුවෙන් කුපිත වීම ස්වභාවයයි. 6 වන පරිච්ඡේදයෙහි *ඕස්ට්‍රේලියා නීතිය* කියවන්න.

## පළාත් පාලන සේවා

ප්‍රාදේශීය සභා/කවුන්සිල ළමා සෞඛ්‍ය මධ්‍යස්ථාන, ළමා සුරැකුම් මධ්‍යස්ථාන, යොවුන් වෘත්තිකයෝ, සහ වැඩිහිටි සුරැකුම් මෙන්ම ආබාධිත සේවා වැනි බොහෝ උපකාර සේවාවන් සපයයි. ඔබ ඕස්ට්‍රේලියාවේ ජීවිතයට හුරු වන අවස්ථාවේදී අවශ්‍ය වන වටිනා උපදෙස් සහ උපකාර සැපයිය හැකි බහුසංස්කෘතික හෝ ප්‍රජා සේවකයන් කවුන්සිලයන්හි සිටිති. මීට අමතරව ප්‍රාදේශීය කවුන්සිල මගින් ප්‍රජා සංවිධානවල ප්‍රයෝජනය පිණිස ප්‍රජා ශාලා, ක්‍රීඩාගාර, විනෝද උයන් සහ සංස්කෘතික උත්සව සඳහා පහසුකම් නිරතුරුව සැපයෙයි.

ප්‍රාදේශීය සභා මගින් ප්‍රාදේශීය මාර්ග නඩත්තුව, පොදු වැසිකිළි සැපයීම, සහ සාප්පු සහ ආපනශාලා නියම සෞඛ්‍යාරක්‍ෂක ප්‍රමිතීන් අනුගමනය කරන්නේද යන්න තහවුරු කිරීම සිදු කරයි. ඔවුහු ගොඩනැගිලි සංවර්ධනය පාලනය කරති. ඔබට ඔබේ දේපළෙහි වෙනස්කමක් කිරීමට අවශ්‍ය නම්, ඔබ ඔබේ ප්‍රාදේශීය සභාවෙහි අනුමැතිය ඒ සඳහා ලබා ගත යුතුය.

සමහර ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා ගෙවීම් කිරීමට ඔබට සිදු විය හැකිය. අදාළ ගාස්තු ප්‍රාදේශීය සභා ප්‍රකාශනවල හෝ වෙබ් අඩවියෙහි පළ කෙරේ. යම් තීරණයක් හෝ අනුමැතියක් ලබා ගැනීම වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන්ට අතිරේක මුදලක් හෝ ත්‍යාග ලබා දීමක් ඔබ නොකළ යුතුය. ප්‍රදාන හෝ අල්ලස් ලබා දීමනීතිවිරෝධ වන අතර එය වාර්තා කරනු ලැබේ.

ප්‍රාදේශීය සභා පිළිබඳ වැඩි විස්තර සඳහා 2 වන පරිච්ඡේදයෙහි *උපකාර ලබා ගන්න* කොටස කියවන්න.

### පුස්තකාල

බොහෝ ප්‍රදේශවල පුද්ගලයන්ට ලියාපදිංචි වීමෙන් අනතුරුව නොමිලයේ පොත් බැහැර ගෙන යාහැකි මහජන පුස්ලකාල පිහිටා ඇත. මෙම පුස්තකාලවල ඉංග්‍රීසි භාෂාවට අමතර වෙනත් භාෂාවලින් ලියවුණු පොත්ද ඇත. එසේ නැත්නම්, ඒවා ඇණවුම් කර ගෙන්වා ගැනීමේ හැකියාව ඇත. බොහෝ පුස්තකාලවල නොමිලේ සැපයන අන්තර්ජාල පහසුකම්ද ඇත.

පුස්තකාලයක් සොයා ගැනීම සඳහා වෙබ් www.nla.gov.au/libraries අඩවියට පිවිසෙන්න

### කසළ එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය

කුණු-කසළ එකතු කිරීමේ සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වගකීම පැවරෙන්නේ ප්‍රාදේශීය ආණ්ඩුවලටය. බොහෝ ප්‍රාදේශීය සභා මගින් සාමාන්‍ය අපද්‍රව්‍ය සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය (පත්තර, ප්ලාස්ටික්, වීදුරු සහ යකඩ) සඳහා වෙන වෙනස් කසළ බඳුන් සපයන අතර සමහර ප්‍රාදේශීය සභා මගින් හරිත අපද්‍රව්‍ය (තණකොළ ආදිය) සහ ඉවත ළැමේදී පාර අද්දර තබන විශාල භාණ්ඩ සඳහා ද කසළ බඳුන් සපයයි.

කසළ එකතු කිරීමේ වේලාවන් සහ නිසිලෙස කසළ ඉවත් කරන ආකාරය දැන ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් හෝ ඔබේ අසල්වැසියන්ගෙන් විමසන්න. ඔබේ අපද්‍රව්‍ය සපයා ඇති කසළ භාජනවලට දැමීමට නොහැකි තරම් විශාල නම්,

ඔබට එය කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානයකට හෝ කසළ ප්‍රතිචක්‍රීකරණය කරන ස්ථානයකට රැගෙන යාමට සිදු වන අතර ඒ වෙනුවෙන් ගාස්තුවක් ගෙවීමටද සිදුවේ. පොදු දේපළක හෝ පෞද්ගිලක ඉඩමක කසළ දැමීම නීතිවිරෝධීය.

### පොදු වැසිකිළියක්

ඕස්ට්‍රේලියාවේ පොදු වැසිකිළිවල සේවකයන් යොදවා නැති අතර පාවිච්චිය සඳහා මුදල් අය කිරීමක් සිදු නොකෙරේ. වැසිකිළිවල බිළිඳුන්ගේ ඉණකඩ (nappy) මාරු කිරීමේ පහසුකම් සහ ආබාධිතයන් සඳහා විශේෂිත වූ පහසුකම්ද ඇත. මෙම වැසිකිළි සාමාන්‍යයෙන් හිඳින වැසිකිළි වන අතර උක්කුටිකයෙන් වාඩිවන ඒවා නොවේ. සමහර වැසිකිළි ස්වයංක්‍රීය සහ ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම පොදු වන අතර බොහෝමයක් වැසිකිළිවල ස්ත්‍රීන් සහ පුරුෂයන් සඳහා වෙන්කළ පහසුකම් ඇත.

පාවිච්චියෙන් පසුව වැසිකිළිය/කැසිකිළිය පිරිසිදුව සහ පිළිවෙළට තබා යන්න. ඕස්ට්‍රේලියාවේ ඇති සමහර වැසිකිළි බහිස්‍රාවීය කොටස් සොදා හැරීම වෙනුවට කොම්පෝස්ට් (පොහොර) සෑදීම සඳහා භාවිත කරයි. එමනිසා, ඔබ වැසිකිළි වළට දාන්නේ මොනවාද යන්න ගැන සැළකිලිමත් වෙන්න.

පොදු වැසිකිළියක් සොයා ගැනීම සඳහා https://toiletmap.gov.au අඩවියට යන්න.

### වතුර භාවිතය

ඕස්ට්‍රේලියාවේ වතුර සාමාන්‍යයෙන් හොඳ තත්වයේ පවතී. එහෙත් සමහර ස්ථානවල ළිංවතුර හෝ බීමට යෝග්‍ය නොවන වතුර පාවිච්චි කෙරෙන බැවින් ඒවා බීමෙන් වැළකිය යුතුය. මෙම ස්ථාන පහත සඳහන් සලකුණෙන් හඳුනා ගත හැකිය.



ප්‍රාදේශීය කලාපවල ජල භාවිතය පිළිබඳ සීමාවන් පණවා තිබිය හැකිය. මෙයින් අදහස් වන්නේ ඔබේ වතුර භාවිතය විශේෂිත කාල සීමාවකට හෝ ක්‍රියාකාරකම් කිහිපයකට සීමා කොට ඇති බවයි. උදාහරණයක් ලෙස, ඔබට ගෙවත්තට වතුර දැමීමට හෝ, වාහනය සේදීමට හෝ ජනෙල් වීදුරු සේදීමට වතුර භාවිත කිරීමට නොහැකි වනු ඇත. ඔබේ ප්‍රාදේශීය සභාව ඇමතීමෙන් හෝ www.bom.gov.au/water/restrictions වෙබ් අඩවියට පිවිසීමෙන් තොරතුරු දැනගන්න.

### වීසා

Department of Immigration and Border Protection (DIBP) ස්ථිර හෝ තාවකාලික පදිංචිය සඳහා වීසා නිකුත් කරනු ලබන අතර පුරවැසිභාවය පිළිබඳ අයදුම්පත් සම්බන්ධයෙන් ද තීරණ ගනු ලැබේ (www.border.gov.au).

ඔබට සුදුසු වීසාව කුමක්දැයි සොයා ගැනීම සඳහා www.border.gov.au/Trav/Visa-1 හි ඇති Visa Finder මෙවලම භාවිත කරන්න.

ට බොහෝ වීසා වර්ග සඳහා www.border.gov.au/Trav/Visa/Appl ඔස්සේ ජාලගතව අයදුම් කළ හැකිය.

## Resident Return (නිත්‍ය පදිංචිකරුවන් නැවත පැමිණීමේ) වීසා

ඔබ දැනට පුරවැසිභාවය දරන්නෙක් නම් හෝ කලින් දැරුවෙක් නම් සහ විදේශ සංචාරය සඳහා ගොස් නිත්‍ය පදිංචිකරුවකු සේ නැවත පැමිණීමට අවශ්‍ය නම්, ඔබට Resident Return වීසා (RRV)අයදුම් කිරීමට සිදු වනු ඇත.

ඔබට මෙම වීසාව අවශ්‍ය වන්නේ දැනට ප්‍රදානය කොට ඇති නිත්‍ය පදිංචි වීසා බලපත්‍රයෙහි විදේශ ගමන් කාලය අවසන්ව ඇත්නම් හෝ අවසන් වීමට ළංව ඇත්නම් පමණි.

RRV යනු ඔබට විදේශයන්හි සංචාරය කොට සංචාරක බලපත්‍රය වළංගු කාලසීමාව ඇතුළත නිත්‍ය පදිංචිකරුවකු වශයෙන් නැවතත් ඕස්ට්‍රේලියාවට පැමිණීමට අවසරය ලබා දෙන ස්ථාවර වීසාවකිමෙම . වීසා බලපත්‍රය එය දරන්නාට , දින නියමයක් රහිතව ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට ඉඩ ලබා දෙයිරයක යෙදීමට අදහස් නොකරන්නේ ඔබට විදේශ සංචා . නම්RRV සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවේ .RRV පිළිබඳ වැඩි විස්තර www.border.gov.au/Trav/Visa-1/155- හි ඇති DIBP වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

## ඕස්ට්‍රේලියාව නැරඹීමේ වීසා

[තාවකාලික අමුත්තන්] ඔවුන් ඕස්ට්‍රේලියාවේ ගත කිරීමට බලාපොරොත්තු වන සම්පූර්ණ කාලය ආවරණය වන වීසා බලපත්‍රයකට අයදුම් කළ යුතුය. ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමට අපේක්ෂා කරන කාරණය අනුව වීසා ගණනාවක් ඇත. සෑම වීසාවකටම විශේෂ කොන්දේසි ඇත. වැඩි විස්තර සඳහා www.border.gov.au/about/corporate/information/fact-sheets/46temporary-entry වෙබ් අඩවියට යන්න.

## නිත්‍ය පදිංචිය සඳහා සංක්‍රමණය වීමට වීසා

ඕස්ට්‍රේලියාවට කෙරෙන නිත්‍ය සංක්‍රමණ තුන් වර්ගයකි:

- පවුල් සංක්‍රමණය - අයදුම්කරුට අනුග්‍රහය දැක්වීම සඳහා යෝග්‍යතාවය සහිත ඥාතියකු ඕස්ට්‍රේලියාවේ සිටිය යුතුය.
- නිපුණතා පදනම මත හෝ ව්‍යාපාරික සංක්‍රමණය - අයදුම්කරුට ඕස්ට්‍රේලියානු ආර්ථිකයට හෝ වෙනත් ක්ෂේත්‍රවලට දායක විය හැකි නිපුණතාවන් හෝ විශේෂ හැකියාවන් තිබිය යුතුය.
- මානුෂීය පදනම මත කෙරෙන සංක්‍රමණය - අයදුම්කරු ඔවුන්ගේ මව් රටේදී මානව හිමිකම් උල්ලංඝනය වන තරමේ හිංසනයට ලක්වූ පුද්ගලයකු හෝ ලෙස වෙනස් කොට සැලකීම හේතුවෙන් පීඩාවට ලක්වූවකු විය යුතු අතර ප්‍රති-ස්ථාපනය අවශ්‍ය පුද්ගලයකු ලෙස නිර්දේශ කරනු ලැබූවකු ද විය යුතුය.

සෑම වීසා කාණ්ඩයක් සඳහාම සැපිරිය යුතු නියමිත අවශ්‍යතා ඇත. www.border.gov.au හි [DIBP වෙබ් අඩවියෙහි] වීසා පිළිබඳ නවතම තොරතුරු ඇතුළත් වන අතර ඔබට ගැළපෙන වීසා වර්ගය තෝරා ගැනීමට උපකාරී වීම සඳහා එහි “Visa Finder” නම් මෙවලමක්ද ඇත.

## ලියාපදිංචි සංක්‍රමණ නිලධාරීන්

සංක්‍රමණ නියෝජිතයෙකු යනු සංක්‍රමණික කරුණු පිළිබඳව උපදෙස් දෙමින්, වීසා අයදුම්පත්‍රයක් සකස් කිරීමට සහ ඉදිරිපත් කිරීමට උපකාරී වන, සේවාදායකයා වෙනුවෙන් DIBP සමග ගනුදෙනු කරන පුද්ගලයෙකි. ඔවුන් සාමාන්‍යයෙන් ගාස්තුවක් අය කරයි.

ඔබට සංක්‍රමණ නියෝජිතයකු භාවිත කිරීම අත්‍යවශ්‍ය නොවේ. ඔබට තනියෙන් අයදුම්පත්‍රයක් යොමු කිරීමට තරම් විශ්වාසයක් නැත්නම් හෝ ඔබේ තත්වය සංකීර්ණ නම්, ඔබට ලියාපදිංචි සංක්‍රමණ නිලධාරියකු භාවිත කළ හැකිය.

ඕස්ට්‍රේලියාව තුළ ක්‍රියාත්මක වන සියලු සංක්‍රමණ නියෝජිතයන් Office of the Migration Agents Registration Authority (OMARA)හි ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයකු සොයා ගැනීම සඳහා www.mara.gov.au/search-the-register-of-migration-agents/ හි [OMARA වෙබ් අඩවියට] යන්න.

## ජාලගතව ඔබේ වීසා තත්වය පරීක්ෂා කිරීම

[Visa Entitlement Verification Online] (VEVO) (ජාලගතව වීසා යෝග්‍යතාවය පරීක්ෂා කිරීම) යනු වීසා බලපත්‍රයක් දරන්නන්ට සහ ආයතනවලට www.border.gov.au/vevo ඔස්සේ වීසාධාරීන්ගේ තොරතුරු පරීක්ෂා කළ හැකි නොමිලේ සැපයෙන ජාලගත පහසුකමකි.

ඇපල් නිෂ්පාදන සඳහා භාවිත කළ හැකි එමෙන්ම ඇපල් ස්ටෝර් වෙතින් නොමිලේ බාගත කළ හැකි myVEVO යෙදවුමක්ද ඇත.

## ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය

පුරවැසියකු වීම යන්නෙන් අදහස් වන්නේ ඔබ ඕස්ට්‍රේලියාව වෙනුවෙන් සහ එය පෙනී සිටින සියලු දේ වෙනුවෙන් ඔබ දිගටම කැප වන බවයි. ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය යනු ඔබට ප්‍රතිලාභ රැසක් සහ අපේ ප්‍රජාතන්ත්‍රීය සමාජය තුළ පූර්ණ වශයෙන් සහභාගී වීමට අවස්ථාව උදාකරන වරප්‍රසාදයකි.

පුරවැසිභාවය අයදුම් කිරීමට අපේක්ෂා කරන බොහෝ ස්ථිර පදිංචිකරුවන් ඒ සඳහා අයදුම් කිරීමට පෙර අවශ්‍යතා කිහිපයක් සම්පූර්ණ කළ යුතුය. නිශ්චිත කාල සීමාවක් ඕස්ට්‍රේලියාව තුළ ජීවත් වීමත් සහ යහපත් කල්කිරියාවත් මීට ඇතුළත් වේ.

[පුරවැසිභාවය පිළිබඳ විස්තර](http://www.border.gov.au/Trav/Citi), යෝග්‍යතාව සහ අයදුම්පත්‍ර www.border.gov.au/Trav/Citi වෙබ් අඩවියෙහි ඇත.

ඕස්ට්‍රේලියානු පුරවැසිභාවයට අයදුම් කරන බොහෝ අයට පුරවැසිභාවය සම්බන්ධ පරීක්ෂණයකින් සමත් වීමට සිදු වේ. පුරවැසිභාවය පිළිබඳ පරීක්ෂණය අලුත් ඕස්ට්රේලියානුවන් විසින් පුරවැසියන් වීමේදී සිදු කරනු ලබන Pledge of Commitment හි ඇති සාරධර්ම මත පදනම් වේ. ප්‍රජාතන්ත්‍රීය සමාජයක් පිළිබඳ ඕස්ට්‍රේලියාව තබා ඇති විශ්වාසය, පුරවැසිභාවයට අදාළ වගකීම් සහ වරප්‍රසාදයන්, සහ රාජ්‍යත්වය සහ නීතිය එමගින් ආවරණය කෙරේ. මෙම පරීක්ෂණය සඳහා සූදානම් වීමට www.border.gov.au/Trav/Citi/pathways-processes/Citizenship-test හි ඇති [පුරවැසිභාවය පරීක්ෂණය සඳහා මූලාශ්‍ර ඇතුළත් පොත](http://www.border.gov.au/Trav/Citi/pathways-processes/Citizenship-test) කියවන්න.

ඔබ පරීක්ෂණය සමත් වුවහොත්, සහ ඔබේ අයදුම්පත සාර්ථක නම්, පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ උත්සවයක් සඳහා ඔබට ආරාධනා කරනු ලැබේ. මෙම උත්සවයේදී බොහෝ වැඩිහිටි අයදුම්කරුවන්ට Pledge of Commitment (කැපවීමේ පොරොන්දුව) ලබා දීම අවශ්‍ය වනු ඇත.

ඕස්ට්‍රේලියානු පුරවැසියකු වීමෙන් අනතුරුව ඔබට ඕස්ට්‍රේලියානු විදේශ ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කළ හැකිය. ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සේම වෙනත් රටක පුරවැසිභාවයත් පවත්වාගෙන යන්නේ නම්, ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත යාම සහ යළි රටට පැමිණීම කළ යුත්තේ ඕස්ට්‍රේලියානු විදේශ ගමන් බලපත්‍රය භාවිතයෙනි.

වැඩි විස්තර සඳහා හෝ [ඕස්ට්‍රේලියන් විදේශ ගමන් බලපත්‍රයක්](http://www.passports.gov.au/Pages/home.aspx) සඳහා අයදුම් කිරීමට www.passports.gov.au/Pages/home.aspx වෙබ් අඩවියට පිවිසෙන්න.

### අනාගත දරුවන් සහ ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය

බොහෝ අවස්ථාවලදී, ඔබ ඕස්ට්‍රේලියාවේ නිත්‍ය පදිංචිකරුවකුව සිටියදී ඔබට දාව උපදින ළමයා/ළමයින්ට උපතේදීම නිතැතින්ම පුරවැසිභාවය හිමි වේ. මෙම දරුවන්ට ඕස්ට්‍රේලියානු විදේශ ගමන් බලපත්‍රයක් අවශ්‍ය වෙනම්, Form 119 - ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය පිළිබඳ සාක්ෂ්‍ය සඳහා අයදුම්පත්‍රයක් යොමු කර ඔවුන්ගේ පුරවැසිභාවය පිළිබඳ සනාථනයක් ලබා ගත යුතුය. දරුවා සමග විදේශ සංචාර යාමට කලින් ඔබ මෙය කළ යුතුය.

වැඩි විස්තර සහ Form 119 ආකෘති පත්‍රයක් ලබා ගැනීම සඳහා www.border.gov.au හි [DIBP වෙබ් අඩවියට](http://www.border.gov.au) පිවිසෙන්න.

### ඡන්දය දීම

අවුරුදු 18 ට වැඩි ඕස්ට්‍රේලියානු පුරවැසියන් ඡන්ද සඳහා ලියාපදිංචි වීම අනිවාර්යය. ඔබට පුරවැසිභාවය ප්‍රදානය කරන උත්සවයේදීද මේ සඳහා ලියාපදිංචි වීමට පුළුවන. වයස අවුරුදු 18 වන විට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඔබට වයස 17දීද ලියාපදිංචි විය හැකිය.

ඡන්ද සඳහා ඇතුළත් වීමේ අයදුම්පත් තැපැල් කාර්යාලවල, Australian Electoral Commission කාර්යාලවල සහ Australian Electoral Commission වෙබ් අඩවියෙහි ඇත. ෆෙඩරල්, ප්‍රාන්ත, පළාත් සහ බොහෝ ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණ සඳහා ලියාපදිංචි වීමට එක් අයදුම්පත්‍රයක් පිරවීම ප්‍රමාණවත්ය.

ඔබ ඔබේ ලිපිනය වෙනස් කරන සෑම අවස්ථාවකදීම නව ලියාපදිංචි වීමේ පත්‍රයක් සම්පූර්ණ කළ යුතුය.

වැඩි විස්තර සඳහා 13 2326 ඔස්සේ [Australian Electoral Commission](http://www.aec.gov.au) අමතන්න, නැත්නම් www.aec.gov.au වෙබ් අඩවියට පිවිසෙන්න.